ජාතික හරිත පෙරමුණ

ප්‍රතිපත්ති ප්‍රකාශනය

රට හදන හරි හාර

හරිත රටකට **පෙරවදනක්**...

රට හදන හරි පාර

ජාතික හරිත පෙරමුණ

පිටුම

ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය වෙනස් වන ඓතිහාසික මංසන්ධියකට පිවිස සිටින මේ මොහොතේ මේ මව්බිමට නායකත්වය දෙන ඊළඟ පරම්පරාවේ නායකයින් බිහිකරන තිඹිරිගෙය වන ජාතික හරිත පෙරමුණේ සුවිශේෂී දිනයට ඔබ සැම සාදරයෙන් පිළිගන්නෙමු.

අපේ රට ලෝක සිතියම තුළ කුඩා දූපතක් වුවද එය ලෝක ශිෂ්ඨාචාරය තුළ යළිත් වරක් අභිමානයෙන් ඉහළට ඔසවා තබන වගකීම අප කර මත තිබේ. ඒ වගකීම කල් ඇතුව හඳුනාගෙන එයට සූදානම් වෙමින් ආ වසර පහකට අධික කාලය නිමා කරමින්, එම සූදානම් වීමේ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් අප අපගේ දේශපාලන ගමන්මගේ මීළඟ අදියරට මෙසේ පා තබන්නෙමු. වසර පහක් පුරාවට මේ රටේ ජනතාව සමඟ ගැවසෙමින්, මහ පොළොව සමග ගැටෙමින්, එක ම හුස්ම පොද බෙදා ගනිමින් මේ මව්බිමේද, එහි වෙසෙන ඔබගේ ද හද ගැස්ම හඳුනා ගැනීමට අප වෙහෙස වූයෙමු.

එසේ ඇති කරගත් අවබෝධයත්, ලෝකය පිළිබඳව ඇති අධ්‍යයනයත් අනුසාරයෙන් මේ රට සාර්ථක රාජ්‍යයක් බවට පත් කිරීමට ඇති මාර්ගය සොයා අපි නොකඩවා ගමන් කළෙමු. ඒ අනුව රට සාර්ථකත්වය කරා ගෙන යෑමට මේ රටට ගැළපෙන දේශපාලන මතවාදයත් ඒ දේශපාලන මතවාදය මත පිහිටමින් නිර්මාණය කළ දේශපාලන දර්ශනයත් අනුව සකස් කළ අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ''රට හදන හරි පාර'' ලෙස මෙසේ ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු.

මේ ඔබ පැතූ නව දේශපාලන වෙනසයි. අලුත් දේශපාලන ක්‍රමයයි. එය දේශපාලන හා ආර්ථික විද්‍යාත්මකව ඔබට සරලව ගෙන හැර පෑමට මේ ලියවිල්ල මඟින් අපි කටයුතු කළෙමු. ප්‍රංශ ජාතික ගත්කතුවරයෙකු වූ වික්ටර් හියුගෝ කියූ පරිදි ''යම් අදහසක් මල්ඵල ගැනීමට නියමිත කාලය එළැඹී පසු, එය නැවැත්වීමට ලෝකයේ කිසිඳු බලයකට හැකියාවක්

නොමැතිය." මේ ඒ රට වෙනස් කරන අදහස රැගත් ලියවිල්ලයි. මෙය ක්‍රියාත්මක වීම වැළැක්වීමට ලොව කිසිම බලයකට හැකියාවක් නොමැත.

ස්වභාවධර්මයේ ආශීර්වාදයත්, මේ මව්බිමේ වාසය කරන මිලියන 22 ක් වූ මිනිසුන්ගේ ආශීර්වාදයත් මෙම අලුත් දේශපාලන ක්‍රමයට ලැබෙන බව ප්‍රත්‍යක්ෂය. ඒ ඔබ පතනා, ඔබ සොයනා වෙනසයි. මේ රටේ අනාගතය භාර ගැනීමටත්, මෙම නව දේශපාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීමටත් අප අධිෂ්ඨාන පූර්වකව කටයුතු කරන්නෙමු.

එන්න, මේ අපේ රටේ අලුත් දේශපාලන ක්‍රමය ජනගත වන දවසයි. රට හදන වගකීම අපි තවත් පරම්පරාවකට ඉතුරු නොකරන්නෙමු. ඒ අපගේ සිහිනය මෙන්ම, අද දවසේ ඔබට ලබා දෙන හෘද්‍යාංගම පොරොන්දුවයි.

''රට හදන හරි පාර'' අපේම ආදරණීය මහජනතාව වෙත මෙසේ ගෞරවයෙන් යුතුව පුද කරන්නෙමු.

බොහෝම ස්තුතියි!

පැතුම් කර්නර්
නායක
ජාතික හරිත පෙරමුණ

හැඳින්වීම

සමස්තයක් ලෙස ලෝකයේ හරිත දේශපාලන ධාරාවන් බිහිවී ඇත්තේ සංවර්ධනයේ අනිසි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන පාරිසරික හානිය වළක්වා ගැනීම සඳහා, පවතින දේශපාලනයට බලපෑම් කිරීම පිණිස වේ. කෙසේ වෙතත් එලෙස බිහිවන කණ්ඩායම් වර්ගීකරණය වී තිබෙන්නේ වාමාංශික දේශපාලන කණ්ඩායම් ලෙසයි. ඊට හේතුවන්නේ ඉතා වේගයෙන් සංවර්ධනය වන රටවල් ඒවායේ සංවර්ධනය ළඟා කරගෙන තිබෙන්නේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරමින් වීමත්, ඊට එරෙහිව ගොඩනැගෙන දේශපාලන කණ්ඩායම් නිරායාසයෙන්ම වාමාංශික වීමත් නිසාය.

එසේ ගොඩනැගුණු හරිත දේශපාලන ව්‍යාපාර සියල්ලම පාහේ සිදුකරනු ලබන්නේ සංවර්ධනයේ නොවැළැක්විය හැකි අතුරු ඵලයක්වන පාරිසරික හානි සිදුවූ පසු, එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දේශපාලන තම ව්‍යාපාර ගොඩනගා ගැනීම සහ මෙහෙයවීමයි. එවැනි හරිත දේශපාලන ව්‍යාපාර reactive movements ලෙස හැඳින්විය හැක.

කෙසේ වෙතත් 2018 වර්ෂයේදී ජාතික හරිත පෙරමුණ පිහිටවනු ලබන්නේ සංවර්ධනය වූ රටක නොව, රට එහි පතුළේ තිබෙන අවධියකයි. හරිත ව්‍යාපෘති රාශියකින් අනතුරුව රටෙහි සංවර්ධනයට යන මාර්ගය සකස්විය යුත්තේ පරිසරය පිළිබඳව සවිඥානය සහිතව බව අවබෝධ කරගත් කණ්ඩායමක් විසින් ජාතික හරිත පෙරමුණ ආරම්භ කරන ලදි.

සංවර්ධනය සඳහා සකස් කරන්නා වූ ප්‍රතිපත්තිවල සිට ක්‍රියාත්මක වීම දක්වාම පාරිසරික සංවේදීතාවය සහිතව රාජ්‍ය පරිපාලනය කිරීමේ වැදගත්කම මෙම දේශපාලන ව්‍යාපාරයේ අභ්‍යන්තර සාරය වී ඇත. එය ලෝකයේ වෙනත් රටවල පවතින පසු ප්‍රතිචාර දැක්වීමේ reactive මොඩලයක් නොවන අතර සංවර්ධනයට පෙර, පාරිසරික සුරක්ෂිතතාව වෙනුවෙන්

සූදානම්වීමේ පෙර දැක්මක් ඇතිව කටයුතු කරනා Pro Active දේශපාලන ආකෘතියක් වේ. එබැවින් ජාතික හරිත පෙරමුණ ලෝකයේ අනෙකුත් හරිත දේශපාලන ව්‍යාපාරයන්ගෙන් වෙනස් වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයක් තුළ කටයුතු කරනු ලබන හරිත දේශපාලන ව්‍යාපාරයක් ලෙස හඳුනාගැනීම වැදගත් වේ.

මෙම ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ ප්‍රථම හරිත දේශපාලන ව්‍යාපාරය වන ජාතික හරිත පෙරමුණේ හරිත ප්‍රතිපත්ති අන්තර්ග්‍රහණය කරගත් ''රට හඳන හරි පාර'' නම් වූ ජාතික වැඩපිළිවෙල වන්නේය.

පටුන

1.	ප්‍රවේශය	1
2.	ජනාවාසකරණය	5
3.	අධ්‍යාපනය	17
4.	ප්‍රවාහනය	32
5.	සෞඛ්‍යය	45
6.	කෘෂි කර්මාන්ත සහ වාරිමාර්ග	55
7.	පරිසරය	70
8.	වංචා දූෂණ වැළැක්වීම	80
9.	රාජ්‍ය සේවකයන් අඩුකිරීම	86
10.	රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ	90
11.	විදේශ	102
12.	බලශක්තිය	117
13.	ආර්ථිකය	139
14.	නූතන අර්බුදය සහ එතෙර වීම	181

ප්‍රවේශය

රටක් ගොඩනැගෙන්නේ විද්‍යාත්මකව තෝරාගත් ප්‍රායෝගික හා නිවැරදි ප්‍රතිපත්ති සමූහයක් වෙහෙසක් දරා ක්‍රියාත්මක කරවීමෙනි. එම ප්‍රතිපත්ති නූතන ගෝලීය ශිෂ්ඨාචාරයේ දේශපාලන හා ආර්ථික සංකල්ප තුළ, පොදු සම්මතය හා එකඟවන, ඒ තුළින් තරඟකාරීව අප රටට ශක්තිමත් අඩිතාලමක් දමන්නක් ද ගෝලීය වෙළඳපොළ ආර්ථිකය හා මුහු කිරීමට පහසුවන්නක් ද විය යුතුය.

ශ්‍රී ලංකාව ස්වෛරී ජාතියක් ලෙස මේ පසු කරමින් සිටින්නේ ඇයගේ ඉතිහාසය තුළ තවත් එක් ඓතිහාසික මංසන්ධියකි. ඉතිහාසයේ කලින් කල පැමිණියාවූ ද, යළිත් අප පවතින දේශපාලන ක්‍රමයකින් නික්ම අලුත් ක්‍රමයකට ගමන් කරන්නාවූ ද මේ මංසන්ධිය මේ රටේ ජීවත් වන කාගෙත් අනාගතය තීරණය කරන්නකි. පවතින ක්‍රමය කඩා වැටෙන කාලවලදී ඒ රට ඉතා දුෂ්කර කාලපරිච්ඡේදයක් තුළින් ගමන් කළයුතු වෙයි. එය රාජ්‍යය, ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වයකට පත්කරවන අතර එයට ප්‍රතික්‍රියාවක් ලෙස ඇති වන ජනතා නැගිටීමක් මගින් පවතින ක්‍රමය ප්‍රතික්ෂේප කර අලුත් ක්‍රමයක් සඳහා මාර්ගය සකසයි.

ඒ ජනතා නැගීටීම ප්‍රජාතන්ත්‍රවාදී මෙන්ම අවිහිංසාවාදී හා සාමකාමී නම්, මේ දේශපාලන ක්‍රමයේ පරිවර්තනය ඉතා ඉක්මනින් කායක්ෂම ලෙස සිදු කරගත හැකිය. ඔබ ශ්‍රී ලංකාවේ මේ අත්විඳිමින් සිටින්නේ එම පරිවර්තනයයි. ජනතා නැගිටීම ප්‍රභල වී පාලකයන් අභිබවා ගොස් ඓතිහාසික මහා අරගලයක් සිදුවන මේ කාලය කලබලකාරී විය හැකිය. ආර්ථික හානි මෙන්ම මිනිසුන්ගේ ජීවත් වීමේ මානව අයිතීන් උල්ලංඝනයවන මේ සමයට අප ධෛර්යමත්ව මුහුණ දිය යුතුය. ඒ අමාරු කාලයට මුහුණදෙන ගමන්, ජනතාව ලෙස අප විසින් සිදුකළ යුතු වැදගත්ම කාර්‍යභාරය නම් මේ අර්බුදය තුළින් පන්නරය ලැබූ අලුත් නායකයන් සහ දේශපාලන කණ්ඩායම් බිහිකිරීම ය. ඒ අලුත් නායකයෝ මේ දුෂ්කර කාලය තුළින් රට ගෙනයාමට දක්ෂයෝ විය යුතුය. ඔවුන් අලුත් දේශපාලන ක්‍රමය නිර්මාණය කරන දැක්මක් ඇති නිර්මාණශීලි පෙරගමන් කරුවෝ විය යුතුය.

එවන් නායකයන් රටේ ප්‍රශ්නය හඳුනාගෙන ඒවාට ස්ථිරසාර, ප්‍රායෝගික, දීර්ඝකාලීන විසඳුම් ඉදිරිපත් කරයි. ඒ විසඳුම්, ප්‍රතිසංස්කරණ සහ යෝජනා ලෙස මහ ජනතාවට ඉදිරිපත් කිරීම ඔවුන්ගේ වගකීමක් වෙයි. එම විසඳුම් වලට ජනතාව එකඟ නම්, එම නායකයන් සමග එක්ව රට ඉදිරියට ගෙන යෑමට ජනතාවගේ ආශිර්වාදය ලබාගත හැකිය.

මෙසේ ලියා තැබීමට උත්සහ කරන්නේ අප දකින ඒ විසඳුම් මාලාවයි. එම විසඳුම් රටේ සැබෑ ප්‍රශ්නය ආමන්ත්‍රණය කළ යුතු අතර, ප්‍රායෝගිකව ක්‍රියාත්මකකර , රටේ පවතින වත්මන් අර්බුදයෙන් එය මුදවා, ඉන් ඔබ්බට සංවර්ධනය තෙක් රට රැගෙන යෑමට සමත්විය යුතුය. එය හුදෙක් රටේ ප්‍රශ්න පමණක් නොව ලෝකයේ අනාගත අභියෝග වලට ද පිළිතුරු අන්තර්ගත වූවක් වියයුතුය. තිරසාර පැවැත්ම, දේශගුණික විපර්යාස, තාක්ෂණික පුනරුදය, ගෝලීය බලතුලනය, ආදී රාජ්‍යයේ පැවැත්මට අන්තර්ජාතිකව, ගෝලීයව බලපවත්වන අභියෝගයන් ද සැළකිල්ලට ගනිමින් නිර්මාණය වූවක් වියයුතුය.

තිරසාර සංවර්ධනය ද පාරිසරික විඥානය ද කැටි කොට, නූතන ගෝලීය ශිෂ්ඨාචාරය සමග ශ්‍රී ලංකාව සාර්ථකව මුහුකිරීමත් එමගින් ධනය උත්පාදනය කරගෙන ලෝකයේ සාර්ථක රාජ්‍යයක් ලෙස නුදුරු අනාගතයේ දී ගෞරවය දිනා ගැනීමත් අරමුණු කරගෙන අප මේ විසඳුම් ලියැවිල්ල ඔබට ඉදිරිපත් කරන්නෙමු. එය බහුජන සහභාගීත්වයෙන් නිර්මාණය කොට, බහුතර ජනතාවට ගෝචරවන අයුරින් සරළ බසින් සකස් කොට මෙසේ ඔබ වෙත ඉදිරිපත් කරමු.

හරිත දේශපාලන මතවාදය සහ දළ දේශීය සතුට

අධිවේගයෙන් සිදුවන නූතන මානව සමාජ පරිවර්තනය විසින් ගෝලීය ශිෂ්ඨාචාරය මෙතෙක් අත්නොදුටු අර්බුද රැසකට තල්ලුකර තිබේ. ස්වාභාවික වරණයෙන් නික්ම වර්ධනය වන මිනිස් ගහණයත් ඔවුන් විසින් ලෝකයේ වූ සීමිත සම්පත් වලින් සංසිඳුවා ගැනීමට උත්සහ කරන අසීමිත අවශ්‍යතාවයනුත් එක්ව ඇතිකර ඇති පාරිසරික අර්බුදය ඉන් ප්‍රධාන වේ. එම විනාශයේ ආරම්භය මීට ශතවර්ෂ තුනකට පෙර සිදු වූවත් වත්මන් මිනිසා විසින් එම අර්බුදය තේරුම් ගෙන තිබීම පිළිබඳව අප සතුටු විය යුතුය. මේ වන විටත් පරිසරයේ ඇති වී තිබෙන පාරිසරික වෙනස්කම් මිනිසාගේම පැවැත්මට තර්ජනයක් වී තිබේ. එනයින් එම පාරිසරික සාධක හඳුනාගෙන අනාගත රාජ්‍යයන් සිය පරිපාලනය සකස්කර ගැනීම සියළු මානව සමාජයන්ගේ සුබසිද්ධියට හේතු වේ. එම නිසා පරිසරය පිළිබඳව යහපත් දැක්මක්, විඥානයක් රාජ්‍ය යාන්ත්‍රණය තුළ අන්තර්ගත වී තිබීම නූතන දේශපාලන දැක්මක අත්‍යාවශ්‍ය සාධකයක් වෙයි.

ඒ නිසාවෙන්ම ලෝකයේ ඇති නැඹුරුවකින් නිර්මාණය වූ හරිත දේශපාලන මතවාදයක් පසුගිය දශක කිහිපයක සිට ගෝලීය දේශපාලනයට එක් වී තිබේ. එම ගෝලීය හරිත දේශපාලන ව්‍යාපාරය මගින් පිළිගත් විද්‍යාත්මක දේශපාලන ප්‍රතිපත්තීන් ගොන්න අපගේ රට හඳන වැඩපිළිවෙල තුළ අන්තර්ගතකර තිබීම ඉතා අත්‍යාවශ්‍ය සාධකයක් බව අපි විශ්වාස කරන්නෙමු. ජාතික හරිත පෙරමුණ බිහිවන්නේ ද හරිත දේශපාලනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම වෙනුවෙනි. ඒ අප ද නූතන ලෝකය මුහුණ දෙන අධික ජන ගහන වර්ධනය, දේශගුණික විපර්යාස ආදී අභියෝගවලට මුහුණදීමට විසඳුම්, රට කරවන දේශපාලන ක්‍රමය තුළින්ම නිර්මාණය කරගත යුතු බැවින් රට හඳන වැඩපිළිවෙළ එම හරිත ප්‍රතිපත්තීන් මත රඳා පවතිමින් නිර්මාණය කර ඇත්තෙමු. එම හරිත ප්‍රතිපත්තීන් පහත අයුරින් දැක්විය හැකිය.

- සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය
- සමාජ සාධාරණත්වය
- අවිහිංසාවාදය
- විවිධත්වයට ගරු කිරීම
- තිරසාර පැවැත්ම
- පාරිසරික විඥානය

අප මේ ඉදිරිපත් කරන රට හඳන දැක්ම තුළ මේ හරිත දේශපාලන මතවාදය අන්තර්ගත කිරීමට අපි කටයුතුකර ඇත්තෙමු. එම හරිත දේශපාලන මතවාදයත්, තිරසාර සංවර්ධන ඉලක්කත් මුහුවූ විට වඩා සාර්ථක පාරිසරික ආරක්ෂණයක් අනාගතය තුළ තහවුරු කෙරෙනු ඇත.

රටක් සංවර්ධනය කිරීමෙන් අපි අවසානයේ බලාපොරොත්තු වන්නේ ඒ රටේ සිටින ජනතාවගේ ජීවිතවල ගුණාත්මකභාවය සහ සතුට වැඩි කිරීමටයි. එසේ ජනතාවගේ සමස්ථ සතුට ගණනය කළහැකි භෞතිකයක් නොවූවත්, එය රටේ සංවර්ධනය මැනිය හැකි දාර්ශනික මිම්මක් බව භූතානය විසින් ලෝකයට හඳුන්වා දුන්නේ 1972 දී ය. එතැන් පටන් එම සංකල්පය ලෝකය තුළ විවිධ සාකාච්ඡාවන්ට බඳුන් ව වසර 2008 දී භූතාන රාජ්‍යයේ ව්‍යවස්ථාවට පවා එක්කිරීමට කටයුතු කරන ලදි. එම මැනීම වෙනුවෙන් යොදා ගනු ලබන ප්‍රධාන සාධක හතර වන ආර්ථික සංවර්ධනයත්, යහපත් රාජ්‍ය පරිපාලනයත්, පරිසරයේ පැවැත්මත්, සංස්කෘතියේ පැවැත්මත් යන කරුණු මූලික කරගෙන ගොඩනගා ඇති දර්ශකයක් වන මෙය අප ජීවිතවල ගැඹුරේ ඇති මානුෂීය අවශ්‍යතාවය යැයි අපි විශ්වාස කරන්නෙමු. එනයින් ජාතික හරිත පෙරමුණ විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිර්මාණය කිරීමට යොදාගනු ලබන සංකල්ප අතර දළ දේශීය සතුට දර්ශකයටත් ප්‍රධාන තැනක් ලබා දෙන්නෙමු. අප තෝරා ගන්නා ප්‍රතිපත්තීන් තුළ ශ්‍රී ලාංකික ඔබගේ දළ දේශීය සතුට ඉහළ දැමීම ඉලක්ක කර ගැනීම සිදු කරන්නෙමු.

ජනාවාසකරණය සම්බන්ධ ප්‍රතිපත්ති

භූමිය (LAND)

භූමිය සඳහා වන සැලැස්ම

ශ්‍රී ලංකාව සතුව වර්ග කිලෝමීටර් 65610 ක ඉඩම් සම්පතක් පවතින අතර මිලියන 22ක මුළු ජනගහනයක් ජීවත්වන මෙහි ජන ඝණත්වය එක් වර්ග කිලෝමීටරයකට මිනිසුන් 341 කි. ඉන්දියානු සාගරයේ මැදට වන්නට පිහිටි ආර්ථික කළාප 7 කට ද මහද්වීප 4 කට ද මැදිව පිහිටි මෙම කුඩා දූපත වර්තමානය වනවිට ලෝක භූ දේශපාලනයේ වැදගත්ම භූමි කොටසක් බවට පත්ව තිබේ.

ගොඩනැගීගෙන එන මීළඟ ලෝක බලවතා වන චීනයේ නූතන සේද මාවත බඳු **BRI** (Belt and Road Initiative) හි ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස ඔවුන් විසින් මැදිහත්ව ගොඩනගාගෙන ඇති ආර්ථික කළාපයේ ප්‍රධාන නැව් මාර්ගයට මායිම්ව ශ්‍රී ලංකාව පිහිටා තිබීම අප සතුව ඇති ප්‍රධානම ආර්ථික ශක්තියයි. එනම්, ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ශක්තීන් අතර ප්‍රභලම සාධකය නම් අප සතු භූමියේ ගෝලීය පිහිටීමයි. එලෙසම වේගයෙන් සංවර්ධනයවන තවත් අනාගත ලෝක ප්‍රභලයෙකුවන ඉන්දියාව අපගේ අසල්වැසියා වීම නිසා ඉන්දීය වෙළඳපොළ මගින් අපිට ලබාගතහැකි ප්‍රතිලාභ භූ පිහිටීමේ තවත් වාසියකි.

මේ ගෝලීය පිහිටීමේ වැදගත්කම අවබෝධ කරගත් විට, එමගින් අපට ලැබී ඇති ශක්තිය තවත් වර්ධනය වන ආකාරයට ලෝක ආර්ථිකය තුළ ශ්‍රී ලංකාව ස්ථානගත කළයුතු ආකාරය පිළිබඳව අපට කියවාගත හැකිය. එබැවින් අප සතු මේ කුඩා භූමිය නිවැරදිව කළමනාකරණය කර ගැනීම අප කළයුතු මුල්ම කාර්යය යි.

ඉඩමක් සංවර්ධනය කර නිවසක් සැදීමට හොඳ සැළසුමක් අවශ්‍යවන්නා සේම, රටක් ඉදිරියට යෑමටත් දීර්ඝකාලීන දැක්මකට අනුව සැළසුම් කරන ලද සැළසුමක් අපට අවශ්‍යය. නගරයක් නිර්මාණය කිරීමට ආසන්නව වසර 20ක් වත් ගතවියහැකි බැවින්, යම් රටක යටිතල පහසුකම් ආදිය ඒ ඒ අනාගත අවශ්‍යතාවයන්ට අනුව සකස් කිරීමට අපට ප්‍රධාන සැළසුමක් අවශ්‍ය වෙයි. ලෝකය මෙන්ම, ලෝක ආර්ථිකයද වේගයෙන් වෙනස් වන විට එයට අනුවර්තනයවන මිනිසුන්ගේ ද අවශ්‍යතාවයන් වෙනස්වී යා හැකිය. රටක සැළසුම් තිබිය යුත්තේ මේ මිනිස් හා ආර්ථික

අවශ්‍යතාවයන් හැකිතාක් දීර්ඝව අනාගතය දෙසට ප්‍රක්ෂේපණයකර එයට ගැළපෙන ලෙස රට නිර්මාණය කර ගැනීම සඳහා ය.
ඒ අනුව අපි රටට ගැළපෙන, වසර 25ක් පමණ ඉදිරියට දිවෙන නිර්මාණශීලි භූමි සැළසුමක් සකස්කර ගත යුත්තේ ය. එය රටේ අනාගත ආර්ථික අවශ්‍යතාවයන් ඉටුකරන, ලෝක ආර්ථිකය තුළ හොඳින් ස්ථානගතවන, නම්‍යශීලී දීර්ඝකාලීන සැළැස්මක් විය යුතුය. අපි අපේ රටට ගැලපෙන Blueprint එකක් නිර්මාණය කර ගැනීම රට හදන ප්‍රතිපත්තියක මූලික කරුණක් සේ දකින්නෙමු.

රටක භූමිය අපි මූලික කොටස් 4කට බෙදා වෙන් කර ගනිමු.

- ජනාවාස - Residential Lands
- කාර්මික - Industrial Lands
- කෘෂිකාර්මික - Agricultural Lands
- වනාන්තර - Forest Cover

ඉඩම් වර්ගකර ගැනීම විද්‍යාත්මකව ගණනය කළ ක්‍රමවේදයක් ඔස්සේ සිදුකළ යුතුය. එම ගණනය කර ගැනීම වත්මන් සංඛ්‍යා දත්තවලට අනුව, ඉදිරි වසර 30 කාලයකට තොරතුරු පූරෝකතනය කොට, ඒ කාලය තුළ තාක්ෂණයේ, ආර්ථිකයේ සහ සමාජයේ සිදුවන වෙනස්කම් නිවැරදිව උපකල්පනය කොට සකස් කළ යුතුය.

වර්තමානය වනවිට රටතුළ ජනාවාසවීම සිදුව ඇත්තේ අක්‍රමවත් ආකාරයකටය. එය හුදෙක් මධ්‍යගත සැළසුමකින් තොරව, අතීතයේ පටන් ගලා ආ සාමාන්‍ය මිනිස් අවශ්‍යතාවයන් අනුව, තනි තනි පුද්ගල හා වෙළඳ අවශ්‍යතාවයන් මත සකස් වූවකි. ඒවා සමස්ථයක් ලෙස ගත් කල සමාජයට ලබා දෙන ප්‍රතිලාභ ප්‍රමාණවත් නැත. එනම්, අකාර්යක්ෂම ය. එබැවින් මේ ජනාවාස හා නගර සැළසුම් ජාතික සැළසුමක් ඔස්සේ ගොඩනැගිය යුතුය.

එලෙසම රටේ නූතන ආර්ථික අවශ්‍යතාවය වන්නේ කාර්මික නිෂ්පාදන ආර්ථිකයකට යොමු වීමයි. එනයින් රටේ භූමියද යටිතල පහසුකම් ද එම කර්මාන්ත ඉලක්කකර ගොඩ නැංවීම කළ යුතුය. කාර්මික ප්‍රදේශ වෙන්කොට හඳුනාගෙන ඒවා ජාතික සැළසුමක් තුළට අන්තර්ග්‍රහණය කිරීමෙන් රටේ අනාගත ආර්ථික ප්‍රතිපත්තියට විශාල රුකුලක් ලැබෙන අතර එය ආයෝජකයන්ට මෙන්ම ව්‍යවසායකයන්ට ද, රජය විසින් ලබා දෙන ශක්තිමත් පදනමකි.

අප රටේ භූමිය සමස්ථ ශ්‍රී ලාංකිකයන්ට අවශ්‍ය සියළු ආහාර නිපදවා ගැනීමට ප්‍රමාණවත් නොවුණත්, රටේ ආහාර සුරක්ෂිතතාවය රැකෙන අයුරින් කෘෂි කර්මාන්තය සැළසුම්කොට, නව්‍යකරණය කර, රටට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය වෙන් කොට තැබීම යුගයේ අවශ්‍යතාවයකි. එවිට රටේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් වෙන්කොට ඇති භූමිය හඳුනා ගැනීමත් ඒවායේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීමට වාරිකර්මාන්ත ආදිය සැළසුම් කිරීමත් සිදුකරගත හැකිය.

අනෙක් වැදගත්ම සාධකය නම් ස්වාභාවික වනාන්තර ප්‍රමාණය හඳුනාගෙන ඒවාට අවශ්‍ය ආරක්ෂාව ලබා දීමයි. දැනට පවතින භූමියෙන් 28% වන වනාන්තර ප්‍රමාණය අනාගතයට ප්‍රමාණවත් දැයි අපි ප්‍රශ්න කළ යුතුය. දේශගුණික විපර්යාස මග හරවා ගැනීමටත්, ජල සුරක්ෂිතතාවය රැකීමටත්, වන සත්ත්ව ගහණයේ විවිධත්වය පවත්වා ගැනීමටත් අපට කෙතරම් වනාන්තර ප්‍රමාණයක් අවශ්‍ය දැයි ගණනය කිරීමකට ලක්කොට එම වනාන්තර ප්‍රමාණය ආරක්ෂාකර ගැනීම පිණිස භූමි සැළැස්මෙන් නියමිත කොටස වෙන්කළ යුතුය.

මේ ප්‍රධාන කොටස් 4 තුළ රටේ භූමිය වර්ග කොට, විද්‍යාත්මක පදනමක් මත වෙන්කර ගත්විට ඒ ඔස්සේ යමින් රට ගොඩ නැගීම කරගත හැකිය. එවිට වසර 30 කින් සැළසුමේ ආකාරයට ගොඩනැගුණු සාර්ථක රටක් අපිට හිමිකරගත හැකිය.

ඒ අනුව පරිසරය සම්බන්ධ ජාතික අරමුණු මත, පැතිකඩ කිහිපයක් යටතේ කටයුතු කිරීමට බලාපොරොත්තු වේ (Goals)

1. සංරක්ෂණය (Conservation) සහ ප්‍රතිවනගහනය (Reforestation) හරහා 40% ක් දක්වා වනගහනය වර්ධනය කිරීම.

    - ගැසට් කරන ලද සංරක්ෂිත වනාන්තර ගහනය සුවිශේෂී උපක්‍රම යොදාගනිමින් ආරක්ෂා කිරීමත්, ශ්‍රී ලංකාවේ සමස්ථ වනාන්තර ගහනය 28% සිට අවම 35% ත් උපරිම 40% ක් දක්වා ඉහළ නැංවීමටත් කටයුතු කිරීම.

    - ගැසට් කරන ලද අවභාවිතා වූ සියලු වනාන්තර භූමි හඳුනාගැනීම, රජයට පවරා ගැනීම සහ ප්‍රතිවනගත කිරීම.

    - පරිසරයේ සහ ජීවයේ සමතුලිත බව බිඳවැටෙන ආක්‍රමණික ශාක ක්‍රමයෙන් ඉවත්කර, වනය ප්‍රතිනිර්මාණය කිරීම.

2. භූමියේ ජල සංචිතය/ ජල තලය (Water Level) ආරක්ෂා කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය (Quality of Water) රැකගැනීම.

   කුඩාවැව් නිර්මාණය කිරීම, තෙත්බිම් (මුතුරාජවෙල වැනි) සංරක්ෂණය සහ අලුතින් නිර්මාණය කිරීම, ජල පෝෂක ආරක්ෂා කිරීම, නීති ස්ථාපනය.

3. හෙක්ටයාර 12700 ක ප්‍රමාණයක් දක්වා පහතගිය පවතින කඩොලාන ගහනය සුරක්ෂිත කිරීම සහ විනාෂ වූ කඩොලාන පරිසර පද්ධතිය ඊළඟ දශකය තුළ ප්‍රතිනිර්මාණය කිරීම.

4. භූමියේ සම්පත් සඳහා ඇති අනවශ්‍ය ඉල්ලුම පහත හෙළීම.

   - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍යතාවය සහ පරිසර සාධක සැළකිල්ලට ගෙන පමණක් ව්‍යාපෘතිවලට අවසර දීම වෙනුවෙන් නීති සම්පාදනය.

   - 3R (අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය)

   - අනාගත දැව ඉල්ලුම හඳුනාගෙන, එකී අවශ්‍යතාවයෙන් සැළකියයුතු ප්‍රමාණයක් කර්මාන්තයේ යෙදෙන්නන් හරහාම නැවත වගා කරවීම.

5. කසළ කළමනාකරණය

   - පාසල් හරහා දැනුවත් කිරීම

   - නීති පනත් සම්මත කිරීම

   - පරිසරයේ සමතුලිතය බිඳවැටෙන ආකාරයෙන් යොදාගන්නා අමුද්‍රව්‍ය හරහා සිදුකරන නිෂ්පාදන වෙනුවට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හෝ දිරායන පරිසර හිතකාමී අමුද්‍රව්‍ය/ නිශ්පාදන භාවිතයට දිරිමත් කිරීම.

6. ජෛව විවිධත්වය ආරක්ෂා කරගැනීම

   - වනජීවී, වනසංරක්ෂණ අංශ වෙත දැනුම සහ අත්දැකීම් සහිත නව කණ්ඩායම් බඳවා ගැනීම.

   - වනජීවින් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබාදීම හා අවිබලය වැඩි කිරීම.

   - වනජීවී සහ වන අපරාධ වෙනුවෙන් දැඩි නීතී ක්‍රියාත්මක කිරීම

   - වන භූමීන්වලට ආසන්න ගම්මානවල ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට කටයුතු කිරීම.

   - අලි මිනිස් ගැටළුවට විසඳුම් ලෙස ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමග දිගුකාලීන මෙහෙයුමක් සකස් කිරීම.

7. වන්නි හත්පත්තුවේ, විල්පත්තුවේ සිට යාල පානම්පත්තුවට වන භූමි යා වන (Pan Island wildlife corridor network) වනාන්තර ජාලයක් නිර්මාණය.

8. ශ්‍රී ලංකාවේ සියළු නගර තිරසාර හරිත නගර සංකල්පය යටතේ නැවත සැළසුම් කිරීම

ජනාවාස භූමි, නගර සහ නිවාස.

ශ්‍රී ලංකාවේ මිලියන 22 ක් වූ ජනගහනයට සතුටින් ජීවත් විය හැකි ජනාවාස නිර්මාණය කිරීම රජයක වගකීමකි. අප සතු කුඩා භූමිය මැනැවින් කළමනාකරණය කරගෙන දීර්ඝකාලීන සැළැස්මක් නිර්මාණය කරගැනීමේ වැදගත්කම අප ඔබට පැහැදිළි කළෙමු.

අප ජනාවාස ගොඩනැගීමට බලාපොරොත්තු වන්නේ ඒ දැක්ම සහිත තිරසාර වැඩපිළිවෙළ යටතේ නූතන තාක්ෂණය සහ නවීන සංකල්ප භාවිතා කරමින් ය.

ජනාවාසවල සැකැස්ම

අප ජනාවාස සඳහා භූමිය තෝරා ගන්නේ ජීව විද්‍යාත්මක සහ ආර්ථික විද්‍යාත්මක පදනමක් යටතේ ය. ආර්ථිකයේ දියුණුව සමග මිනිසුන් පහසුකම් සහිතව නාගරිකව ජීවත් වීමට රුචියක් දක්වන බැවින් කාර්මික හා වෙළඳ නගරවල මෙන්ම ඒවාට ආසන්නයේ කුඩා නගර ජනාකීර්ණ වීමේ හැකියාව ද ඉහළය. එනයින් එම නගර සහ අවට කලාප, ජල බැස්ම, ස්වාභාවික තත්ත්වයන්, ආපදා වලින් ආරක්ෂා වීමේ හැකියාව, ස්වාභාවික පරිසර කලාප ආදිය සැළකිල්ලටගෙන තෝරා ගත යුතුය.

අප ජනාවාස නිර්මාණය කරනු ලබන්නේ එම නගරයේ මිනිස්සුන්ට සංචරණය අවමවන, ජාතික පොදු ප්‍රවාහන පද්ධතියට පහසුවෙන් සම්බන්ධ විය හැකි, මූලික ජීවන අවශ්‍යතා සිය ජනාවාසය තුළින්ම ඉටුකරගත හැකි, පරිසරයට අනුබද්ධව සිය ජීවිතය ගුණාත්මකව ගෙවාගත හැකි ආකාරයකට ය.

එවන් පදනමකින් තෝරා ගන්නා ජනාවාස නගර, හරිත නගර සංකල්ප අනුව වැඩි දියුණු කළ යුතුය. ජනාවාසයක් තුළ එහි ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් ඉටු කෙරෙන ආයතන ඇතුළත් කළ යුතුය. ඒවායේ පාසල්, රෝහල්, බැංකු, තැපැල් සේවා, විදුලි සැපයුම, ජල සැපයුම, සන්නිවේදන තාක්ෂණික සේවා සැපයුම් ආදිය අන්තර්ගත විය යුතු අතර, කසළ බැහැර කිරීමේ යටිතල පහසුකම්, මළ අපද්‍රව්‍ය කළමනාකරණය, ජල බැස්ම, නිදහස් අවකාශ හා උද්‍යාන, බයිසිකල් මංතීරු ආදියෙන් සමන්විත විය යුතුය.

නාගරික නිවාස සංකල්පය තට්ටු නිවාස ක්‍රමයකට සකස් කෙරේ. එම තට්ටු නිවාසවලට වර්ගීකරණයන් ලබා දෙන අතර, පුරවැසියන් හට සිය

ආදායම් මට්ටම පරිදි නිවාස මිල දී ගැනීමේ හැකියාව ලබා දේ. එම ගොඩනැගිලි නූතන ගෘහ නිර්මාණ ශිල්පීය ඥානය භාවිතා කරමින් උසස් තත්ත්වයෙන් ඉදිකෙරෙන අතර අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව සැළසුම් කෙරේ.

එසේම කෘෂිකාර්මිකව සහ ප්‍රාදේශීයව ජීවත් වන ජනතාවට කුඩා මාදිලියේ තට්ටු නිවාස ගම්මාන ක්‍රමයක් ද, වෙන් වෙන් වූ නිවාස ක්‍රමයක් ද හඳුන්වා දෙනු ලැබේ. මිනිසුන් තෝරා ගන්නා එම ප්‍රදේශ, ප්‍රාදේශීය බිම් හා ජනාවාස සැකැස්මට අනුගත විය යුතු අතර, පොදු සැළසුමකට අනුකූලව ඒවා ඉදිකිරීමට කටයුතු කෙරේ. ග්‍රාමීය ජනාවාස තුළ ද පෙර කී පොදු ජීව ගුණය සුරකින සංකල්ප අඩංගු කළ යුතුය. ඒවා ද හරිත හෙවත් තිරසාර සංකල්ප මත පදනම්ව නිර්මාණය කෙරේ.

මේ ආකාරයට පොදු තිරසාර සැළැස්මකට අනුව නගර සහ ගම්මාන නිර්මාණය කරගැනීමෙන් වඩා කාර්යක්ෂම ලෙස සේවා සැපයීමත්, සම්පත් අවමව භාවිතා කරමින් ලාභදායී ලෙස නිවාස ඉදිකර ගැනීමටත්, වඩාත් සංවිධානාත්මක වාසස්ථාන නිර්මාණය කරගැනීමටත් සමාජයට හැකියාව ලැබේ.

එනයින් මේ වැඩපිළිවෙලට රාජ්‍ය මැදිහත්වීම හා නියාමනය ඉතා අත්‍යාවශ්‍ය ය. කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනයක් ද නීතියේ පරමාධිපත්‍ය ද රටතුළ ක්‍රියාත්මක වන්නේ නම්, වංචා දූෂණ පිටුදැක මෙවන් වගකීමක් සාර්ථකව ඉෂ්ඨ කිරීමේ හැකියාව රාජ්‍යයට ලැබේ.

ප්‍රධාන නගර යා කරන මාර්ග සංවර්ධනය කෙරෙන අතර, ඒවා ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය අනුව සකස් කෙරේ.

සෑම නගරයක්ම මිනිසුන්ට සතුටින් ජීවත් වීමට අවශ්‍ය උද්‍යාන, නිදහස් අවකාශ, විවෘත භූමි, ව්‍යායාම පහසුකම්, ක්‍රීඩාංගන, බයිසිකල් පැදීමේ පහසුකම් ආදිය සහිතව නිර්මාණය කෙරේ.

සෑම නගරයක්ම, ගොඩනැගිල්ලක්ම , පොදු සේවා ස්ථානයක්ම ආබාධිත ප්‍රජාවට පිවිසිය හැකි අයුරින් අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව ඉදි කෙරේ. එසේම වැඩිහිටි ජනතාවට හා දරුවන් හට හැකිතරම් ආරක්ෂිතව ජීවත් විය හැකි ඉදිකිරීම් තාක්ෂණික උපක්‍රම හා සම්මතයන් භාවිතා කෙරේ.

සෑම නගරයක්ම පොදුවේ විවෘත උද්‍යානයක් ලෙස පවත්වා ගෙන යා හැකි නගර නිර්මාණ ශිල්ප ක්‍රම භාවිතා කරන අතර, දීර්ඝකාලීන දැක්මක්

මගින් ක්‍රමයෙන් එම උයන් නගරය තුළ ඇතිකර ගැනීමට කටයුතු සකස් කෙරේ. එසේම හරිත නගර තාක්ෂණික උපක්‍රම මගින් අපජල වහනය හා පෙරා ගැනීම, අවම ශක්ති පරිභෝජනය ආදී සංකල්ප නගර නිර්මාණයට යොදා ගැනේ.

කසළ කළමනාකරණයට ජාතික වැඩපිළිවෙලක් නිර්මාණය කෙරෙන අතර, ඒ පොදු වැඩ පිළිවෙල අනුව ජාතික මට්ටමෙන් කසළ ඉවත් කෙරේ. එම සැළසුම්වලට අනුව නගරයේ ඒ සඳහා යටිතල පහසුකම් සකස් කෙරේ. ජනාවාසවල ජල දූෂණය හා වායු දූෂණය වළක්වා ගැනීමට නීතිමය පියවර සකස් කරන අතර, ඒවා නියාමනයට රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කෙරේ.

නිවාස

- සෑම පුරවැසියෙකුටම හිසට සෙවණක්ද සෑම පවුලකටම නිවසක් ද හිමි කර දීම අපගේ දැක්මයි.

- එනයින් ලංකාවේ දැනට සිටින මෙන්ම අනාගතයේදී බිහි වන සියළුම පවුල් සහ පුරවැසියන් සඳහා මූලික අවශ්‍යතාවයක් වන නිවාස ඉදිකිරීම අපි ප්‍රධාන වගකීමක් ලෙස සළකන්නෙමු.

- ශ්‍රී ලංකාවේ වාර්ෂික නිවාස ඉල්ලුම විද්‍යාත්මකව ගණනය කර ගැනීමත්, එම පවුල් ජීවත් වීමට තෝරා ගන්නේ නාගරිකව ද ග්‍රාමීයවද යන්න සමීක්ෂණ මගින් තෝරා ගැනීමත් සිදුකෙරේ.

- ඒ අනුව රටේ නිවාස අවශ්‍යතාවය ගණනය කොට පුරෝකතනය කිරීමෙන් අපේ නිවාස සැළසුම් සකස්කළ හැකිය.

- නිවාස සංවර්ධන අධිකාරිය නව දැක්මට අදාළ නව පනතකින් බලාත්මක කර, වෙළෙඳපොළ මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණයකර ගැනේ.

- මෙම නිවාස වැඩපිළිවෙල යටතේ මුලින්ම ඉලක්ක කළ යුත්තේ දීර්ඝකාලීන ණය ගෙවීමේ හැකියාව ඇති මධ්‍යම පන්තියයි.

- රාජ්‍ය සංවර්ධන බැංකුවල මැදිහත්වීම මත අලුත් නිවාස ව්‍යාපෘති වෙනුවෙන් විදෙස් මූල්‍ය වෙළෙඳපොළෙන් ආයෝජන කැඳවෙන

අතර නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වූ පුද්ගලික සමාගම් මගින් මෙම ඉදිකිරීම් සිදු කරනු ලැබේ.

- මූලික වියදමෙන් 10% ක් වැනි කුඩා මූලික ගෙවීමක් කර නිවසක් ලබාගැනීමේ හැකියාව පුරවැසියන් හට ලැබෙන අතර, වසර 30 ක දීර්ඝකාලීන ණය පදනම මත නිවසේ මුළු වටිනාකම ගෙවීම කරගෙන යාමට අවස්ථාව සැළසේ.

- මේ ආකාරයට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වන ප්‍රබෝධයෙන් ආර්ථික වර්ධනයට රුකුළක් ලැබෙන අතර ඉන් ජනනය වන රැකියාවලින් අඩු ආදායම් ලාභීන්ට ක්‍රමයෙන් ආදායම් ජනනය වේ.

- ආර්ථිකය යම් දියුණු තත්වයකට පත් වූ පසුව, මේ නිවාස වැඩපිළිවෙලම අඩු ආදායම් ලාභී පවුල් වෙතට මිල අඩු නිවාස ක්‍රමයක් ඇතිකර, වඩා සහන මිලට ඒවා ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් සකස් කෙරේ.

- මීට අමතරව කොළඹ සහ නුවර ආදී ප්‍රධාන නගර සංවර්ධනය කිරීමේදී අත්‍යාවශ්‍යවන ඉඩම් සහ පැරණි පැල්පත් නිවාස ඉවත් කිරීමට විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. ඒවාට ඉහත කී ණය ක්‍රම වලින් ඔබ්බට ගිය, රජය ඇපවූ ක්‍රමවේදයක් සකස්කොට එම ජනතාව පැල්පත් වලින් ඉවත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් සකස් කරනු ලැබේ.

- උක්ත වැඩපිළිවෙල කළමනාකරණය කිරීම සහ නියාමනය කිරීමට නව පනත යටතේ බලාත්මක කරන ලද නිවාස සංවර්ධන අධිකාරියට, දක්ෂ, සුදුසුකම් සහිත නිර්මාණශීලී නිලධාරීන් පත්කර ගන්නා අතර, ඔවුන්ට ඉලක්ක ලබා ගැනීමේදී KPI (KEY PERFOMANCE INDICATOR) අනුව සොයා බලා වැටුප් හා උසස්වීම් ලබා දීමට කටයුතු කෙරේ.

- එම නිවාස සහ කුඩා ජනපද පරිපාලනය හා නඩත්තුවට වෙන් වූ යාන්ත්‍රණයක් නිර්මාණය කරනු ලබන අතර, ඒ නිවාස සඳහා නිවාස සහ ණය රක්ෂණ ක්‍රමයක් අනිවාර්යය කෙරේ.

- ඒ අනුව දීර්ඝකාලීන ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගෙන යමින් මූල්‍ය වෙළෙඳපොළ අධීක්ෂණය කරමින් කටයුතු කිරීමට සුදුස්සන් නිවාස සංවර්ධන අධිකාරියට අනුයුක්ත කෙරේ.

- නිවාස වැඩපිළිවෙල, මීළඟ වසර 10-15 තුළ අවශ්‍යතාවය සළකා බලා සැළසුම් කරන අතර, වසර 25 කින් සංවර්ධිත රාජ්‍යයක් බවට පත්වීමේ ඉලක්කය සපුරා ගැනීමට මේ වැඩපිළිවෙල මගින් පදනම සකස් කෙරේ.

- කෙසේ වුව ද සිය ඉඩම්වල කැමති අයුරින් සිය නිවාස තනා ගැනීමට පුරවැසියන් හට ඇති අයිතිය වෙනස් නොකෙරේ. එහෙත් නාගරිකව එසේ කරයි නම්, රාජ්‍යයේ පොදු වැඩපිළිවෙලට සහ දැක්මට හානියක් නොවන අයුරින් ඒවා කර ගැනීමට අවශ්‍ය කටයුතු සකස් කෙරේ.

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් හට ද නූතන සංවර්ධිත රටක පුරවැසියන් භුක්ති විඳින මට්ටමේ සම්මතයෙන් උසස් සැපවත් ජීවිතයක් උරුම කිරීම පිණිස ඔවුන්ගේ නිවස, ඔවුන්ගේ සිහින අපි ශක්තිමත්ව නිර්මාණය කිරීමට බැඳී සිටින්නෙමු.

කැළිකසළ

ශ්‍රී ලංකාව සතුව මෙතෙක් ජාතික මට්ටමේ කසළ බැහැර කිරීමේ වැඩපිළිවෙළක් නොමැත. දැනට පවතින නගර සභා/ ප්‍රාදේශීය සභා මට්ටමෙන් ක්‍රියාත්මක වන නියාමනය නොවූ කුණු එකතුකර ගෙනගොස් තැන තැන ගොඩගසන ක්‍රමය අපට රටක් ලෙස ඉදිරියට යෑමට ඇති බාධාවකි. විශේෂයෙන් අප ඉදිරියට වේගවත් දියුණුවක් අත්කර ගැනීමට ඉලක්ක කරන්නේ නම්, ඒ සමග ඉහළ යන ජනගහණය ද පරිභෝජනය ද අපට එක්කරන ප්‍රධාන අභියෝගයක් වන්නේ කැළිකසළ යි. එනයින් කැළිකසළවලට නිසි විසඳුම් පිළියෙල කිරීම රට හඳන රජයක ප්‍රමුඛ වගකීමකි.

ශ්‍රී ලංකාවේ දැනට දිනකට නිපැයෙන කුණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 7000ක් ලෙස ගණන් බලා තිබේ. එයින් ඉහත කී ක්‍රමයට අනුව එකතුකර ගනු ලබන කුණු ප්‍රමාණය ඉන් හරි අඩකි. එකතු නොවන කුණු ප්‍රාදේශීයව ගෘහස්ථව විවිධ මට්ටමෙන් පරිසරයට මුදාහැරෙන අතර මේ එකතුවන කුණු ද නියමිත ක්‍රමවේදයකට කළමනාකරණය නොවේ. එබැවින් ඒවා ස්වාභාවික පරිසරය තුළ කාලයක් රඳාපවතින අතර වනාන්තර, ගංගා, මහමුහුදු ආදියට එකතු වෙයි. මින් සිදුවන පාරිසරික බලපෑම අතිමහත් වනඅතර අප නියමිත ආකාරයට කසළ කළමනාකරණ ක්‍රමවේදයක් සකසා නොගන්නේ නම්, එය දැවැන්ත ප්‍රශ්නයක් බවට පරිවර්තනය වීම නොඅනුමානය.

විසඳුම්

- කසළ නිෂ්පාදනය අවම කරන ප්‍රතිපත්ති හඳුන්වා දීම සහ ඒවා අනුගමනය කිරීමට වෙළඳපල බලවේගයන් යොමු කරවීම.

- පොලිතින් සහ දිරා නොයන අපද්‍රව්‍ය නිෂ්පාදනයට සීමා පැනවීම. රටේ ආර්ථිකයට වඩාත් ගැලපෙන අන්දමින් සහ භාණ්ඩවල මිල ට විශාල වෙනසක් නොවන අයුරින් මේ සීමා පැනවීම් ආර්ථික විද්‍යාත්මකව සැකසිය යුතුය.

- කුණු නිෂ්පාදනයවන තැනින්ම එම කුණු වර්ග බැහැර කිරීමේ උපදෙස් ජාතික වැඩපිළිවෙලට අදාළව මුද්‍රණයකර ලබාදීම. උදාහරණයක් ලෙස බිස්කට් නිෂ්පාදකයන් එම ඇසුරුමේ එය බැහැර කළයුතු ආකාරය පිළිබඳව කරුණු දක්වා තිබිය යුතුය.

- ජනතාවට කසල කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳව දැනුම ලබාදීම. මෙය කුඩා පත්‍රිකා මගින් හා දැන්වීම් මගින් පුළුල් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මකකොට දැනුම ඉහළ නැංවිය යුතුය.

- නගර සහ ජනාවාස, වාසස්ථාන නිර්මාණය කිරීමේදී කුණු කළමනාකරණයට අදාල යටිතල පහසුකම් අන්තර්ගත කිරීම.

- කුණු බැහැර කිරීමේ යාන්ත්‍රණය නගර සහ ප්‍රාදේශීය සභා වලින් බැහැරට ගෙන ජාතික මට්ටමේ වැඩපිළිවෙලකට යටත් කිරීම.

- කසළ කළමනාකරණයට පුද්ගලික අංශය කැඳවීම. කුණු එකතු කිරීම, වර්ග කිරීම, බැහැර කිරීමට සමාගම් යොදා ගැනීම.

- කසළ කළමනාකරණය පෞද්ගලික අංශයේ සමාගම් කීපයක් වෙත කොන්ත්‍රාත් ක්‍රමයට පැවැරීම.

- එම සමාගම්වලට නියමිත අයුරින් ගෙවීම් කිරීමට ජනතාවගෙන් පොදු මිලක් අය කිරීම සහ ඒ වෙනුවෙන් මෙතෙක් නගර සභා/ ප්‍රාදේශීය සභා වෙත ගෙවනලද බදු අඩු කිරීම.

- රටේ ප්‍රධාන පළාත් මට්ටමෙන් කසළ කළමනාකරණ මධ්‍යස්ථාන ඇතිකිරීම සහ ඒ මධ්‍යස්ථානවල නියමිත පාරිසරික ක්‍රමවේදයන්

යටතේ කසළ ප්‍රතිචක්‍රිකරණය, කොම්පෝස්ට් තැනීම සහ දහනය වෙනුවෙන් පහසුකම් සකස් කිරීම.

- සුදුසු භූමි ගොඩකිරීමේ ක්‍රමවේදයක් සකස් කොට, දහනයෙන් ඉතිරි වන අබලි හා අළු, ගොඩනැගිලි කොටස්, නොපිළිස්සෙන සණ කොටස් බැහැර කිරීමට Land Filling හෙවත් නිශ්චිතව හඳුනාගත් ගොඩ කිරීම් ස්ථාන ඇති කිරීම.

- එම කසළ බැහැරකරන ස්ථාන පුද්ගලික අංශයේ ආයෝජන මත හෝ පුද්ගලික/රාජ්‍ය සබඳතාවය මත පවත්වාගෙන යෑම.

- කසළ බැහැර කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, නියමිත නියාමනයක් දියත් කිරීම සහ පැරණි අණ පනත් සංශෝධනය කිරීම රජයේ වගකීම් වන අතර එම නියාමන කටයුතු කර ගෙන යෑමට මධ්‍යම පරිසර අධිකාරියට පවරාගැනීම.

අධ්‍යාපන ප්‍රතිපත්තිය

රටක අධ්‍යාපනය යනු ඒ රටේ වැදගත්ම ආර්ථික ප්‍රතිපත්තිය බව පිළිගත් කියමනකි. ඒ මක් නිසා ද යත් රටක් සතු වටිනාම සම්පත වන්නේ ඒ රටේ පුරවැසියන් නිසාත්, ඒ පුරවැසියන් දියුණු මානව සම්පතක් බවට පත් කළ හැක්කේ නිවැරැදි අධ්‍යාපනයකින් බවත් සරළව තේරුම්ගත හැකි නිසා ය.

නිදහස් අධ්‍යාපනයත් අධ්‍යාපනයේ නිදහසත් තහවුරු කෙරෙන ගෝලීය ප්‍රවණතාවයන්ට හැඩගැසුණු යාවත්කාලීන ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම අරමුණයි.

රාජ්‍ය අංශය හරහා වඩා තරඟකාරී ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමත් අවශ්‍ය ඕනෑම අයෙකුට පුද්ගලික අංශයේ අධ්‍යාපනය ලබාගැනීමට ඇති අවස්ථා තහවුරු කිරීමත් මෙයින් සිදුවේ.

නූතන ශ්‍රී ලාංකික පවුලක් සිය දරුවන්ගේ අධ්‍යාපනයට විශාල ප්‍රමුඛතාවක් ලබා දේ. ඒ, මේ පවතින සමාජ ක්‍රමය තුළ ගෞරවය ලබාගත හැකි, ආර්ථිකව ඉහළ නැගිය හැකි, සමාජ තත්ත්වය දියුණුකර ගතහැකි පහසුම ක්‍රමය අධ්‍යාපනය නම් මාර්ගය ඔස්සේ වැටී තිබෙන නිසා ය. මෙරට පුරවැසියන් රටේ නිදහස් අධ්‍යාපනයක් පවත්වා ගෙන යෑමට බදු ගෙවන්නෝ ය. එම බදු යොදා ගනිමින් පැවති රජයන් විසින් මහජනතාව වෙනුවෙන් පොදු අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කර පවත්වාගෙන යති. අපි පොදුවේ නිදහස් අධ්‍යාපනය යැයි හඳුන්වන මෙය, තවමත් පවතින පිළිගත් අධ්‍යාපන ක්‍රමයයි. එහි ප්‍රතිපත්ති නිර්මාණය කිරීම හා එම සේවය පවත්වාගෙන යෑමේ සම්පූර්ණ වගකීම රජය විසින් දරණ අතර, ඒ රාජ්‍ය මූලික අධ්‍යාපන ක්‍රමයෙන් ස්වායක්ත වූ පුද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයක් ද රට තුළ බිහිවී ඇත්තේ ය. එම පුද්ගලික අධ්‍යාපනය පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වාම විහිදී යයි.

මේ රටේ වත්මන් මානව සම්පත නිර්මාණය වන්නේ මේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස ය. එම මානව සම්පතේ ගුණාත්මකභාවය පිළිබඳව පාසල් දරුවන්, ගුරුවරුන්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින්නන් මෙන්ම පොදු මහජනතාවගේද ප්‍රමාණවත් පැහැදීමක් නොමැත. එමගින් නූතන ලෝකයට ගැළපෙන දක්ෂ පුරවැසියෙකු නිර්මාණය කරනවා ද යන්න විමර්ශනය කිරීමේ දී එයට ලැබෙන පිළිතුර සතුටුදායක නොවන්නකි. එනයින් අප විසින් යාවත්කාලීන වූ නිවැරදි වූ අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම නොපිරිහෙළා කළ යුත්තකි.

ගෝලීයව පිළිගත් තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති මාලාවට අනුව යමින් , එහි හතර වන (SDG 4) ප්‍රතිපත්තිය වන අධ්‍යාපනය වෙනුවෙන් සකස් වූ කරුණු මුල්කර ගනිමින් සහ හරිත දේශපාලන සංකල්ප වලට එකඟව යමින් අපි අපගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරන්නෙමු. ඒ අනුව රටේ සියළුම පුරවැසියන්ට, සමාන අවස්ථාවකින් ලබා ගත හැකි ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමටත්, ජීවිත කාලය පුරා අවශ්‍ය ඕනෑම මොහොතක අධ්‍යාපනයේ නියැලීමට අවකාශය නිර්මාණය කිරීමටත් අප වග වන්නෙමු.

අපගේ අධ්‍යාපන ක්‍රමයක මූලික අරමුණු.

1. ඉහත මූලධර්ම පෙරදැරි කරගෙන රටේ මිනිසුන් දියුණු කිරීමේ මූලික අභිලාෂයන් ලෙස රටේ දරුවන් ගුණාත්මක පුරවැසියන් බවට පත්කිරීමටත්, ආර්ථිකයට හා එහි දියුණුවට අත්‍යාවශ්‍ය ගුණාත්මක මානව සම්පතක් නිර්මාණය කිරීමටත්, පුරවැසියන්ට දැනුම සොයා යෑමේ හා ළඟාකර ගැනීමේ උපරිම හැකියාව රට තුළ නිර්මාණය කිරීමටත්, ජනතාවගේ විඥානය ඇති කර ගැනීමටත්, සත්‍යය සොයා යෑමටත් ජනතාවට ඇති පරම අයිතියට රුකුලක් වීමට අවශ්‍ය නිවැරැදි අධ්‍යාපන ක්‍රමයක් බිහි කිරීම.

2. නූතන ලෝකයේ අධ්‍යාපන ක්‍රමයකින් අප බලාපොරොත්තු වන නිර්මාණශීලීත්වය උද්දීපනයවන, ප්‍රශ්න නිරාකරණය කර ගැනීමේ හැකියාව දියුණුකළ, විශ්ලේෂණාත්මක චින්තනයකින් හෙබි පුරවැසියෙකු නිර්මාණය කිරීම සඳහාවූ අභිලාෂය සාක්ෂාත් කරගැනීම.

3. ලෝකය වෙනස් වෙමින් යන වේගයට සාපේක්ෂව මිනිසුන් වෙනස් කර ගැනීම ප්‍රමුඛතාව බැවින් කෘතිම බුද්ධිය, දැවැන්ත දත්ත විශ්ලේෂණය(Big data), යාන්ත්‍රික ඉගෙන ගැනීම් වලින් මානව ශිෂ්ඨාචාරය අභියෝගයට ලක්වී ඇති කාලයක, එම නූතන තාක්ෂණික පෙරළියන්ට ඉදිරියෙන් සිටිමින්, වඩාත් මානව වාදී , උසස් මානව ගුණාංග වලින් හා සිහි බුද්ධියෙන් යුතු පුරවැසියන් නිර්මාණය කිරීම.

4. ඉදිරියේදී නිර්මාණයවන අතිශයින්ම ගෝලීයකරණයට ලක්වූ ලෝකයට ගෝලීය චින්තනය පෙරදැරි කරගත්, ගෝලීය පුරවැසියන්

නිර්මාණය කිරීමට, රට පමණක් නොව ලෝකය එකට ගෙන සිතිය හැකි අලුත් පරම්පරාවක් බිහිකිරීම.

5. නිදහස අගය කරන, වේගයෙන් මුහුවන ජාතීන් සහ සංස්කෘතීන් අතර සිය අනන්‍යතාවය රැක ගනිමින්, එකිනෙකාගේ වෙනස් කම් ඉවසමින් හා ඒවාට ගෞරව කරමින් එහෙත් සහජීවනයෙන් ජීවත් විය හැකි පුරවැසියෙකු නිර්මාණය කිරීම.

6. නූතන ලෝකයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පාසල් තුළට කොටු නොවූ, සීමාවන්වල හිර නොවූ, වඩාත් නම්‍යශීලී හා වෙනස් වීමට/කිරීමට විවෘත, දැනුමින් පෝෂණය වන ලෝකයේ සියල්ල සොයා බලා ඉගෙන ගැනීමට බුද්ධිමත් නව පරම්පරාවක් තැනීමට කටයුතු කිරීම.

නිදහස් අධ්‍යාපනය

අප නිදහස් අධ්‍යාපනය පිළිගන්නා අතර, එය ඉදිරියට පවත්වා ගෙන යෑමටත්, ආරක්ෂා කරගෙන එය දියුණුවට පත් කිරීමටත් වග වන්නෙමු.

වර්තමානයේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය ඉතා කුඩා බැවින්, රට දියුණු කිරීමට නම් රටේ අධ්‍යාපනය හොඳම ආයෝජනය ලෙස තේරුම් ගෙන, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති සම්පත් ප්‍රමාණය ඉතා ඉක්මනින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතුවේ.

රටක අධ්‍යාපනය යනු පොදු සේවාවක් බව සිද්ධාන්තමය වශයෙන්ම අප මූලිකව පිළිගන්නා අතර, එය රජයක ප්‍රධාන වගකීමකි.

පුද්ගලික අංශය

රටක අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කිරීමෙහිලා පුද්ගලික අංශයට ඇත්තේ ඉතා වැදගත් කාර්යභාරයකි. නිදහස් අධ්‍යාපනයෙන් පොදු සේවාවක් ලෙස කරගෙන යනු ලබන මූලික අධ්‍යාපන වැඩපිළිවෙලට අමතරව පුද්ගලික අධ්‍යාපනය සඳහා ද රට තුළ සමාන තත්ත්වයක් නිර්මාණය කෙරේ.

එම පුද්ගලික අංශය විසින් ලබාදෙන අධ්‍යාපනය නියාමනය කිරීමටත්, ඒවායේ ගුණාත්මකභාවය තහවුරු කිරීමටත්, පුද්ගලික පාසල් මෙන්ම උසස් අධ්‍යාපන හා තාක්ෂණික ආයතන සඳහා නව පනතක් නිර්මාණයකර සම්මත කළ යුතුවේ. දැනට පවතින අධ්‍යාපන පනත මගින් පුද්ගලික අංශය නියාමනය වන්නේ ඉතා සීමිතව බැවින්, යාවත්කාලීන කරන ලද අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව නව පනත සකස් කරගත යුතු අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ නව අංශයක් ඇති කිරීම මගින් එම අංශයේ ගුණාත්මකභාවය මැන, නියාමනය කිරීමට පියවර ගැනේ.

පුද්ගලික අංශයේ පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය මෙන්ම තාක්ෂණික අධ්‍යාපනය පුරවැසියන්ට මෙන්ම විදේශිකයන් හට ලබා දීමේ අවස්ථාව ලැබේ. එමගින් අධ්‍යාපනය ලබනු පිණිස විදෙස් සිසුන් ගෙන්වා ගැනීමටත්, එනයින් අධ්‍යාපන ක්‍රමය තුළ සේවා සැපයීමෙන් විදෙස් ආදායම් ඉපයීමටත් අවසර ලැබේ. එසේ කළ හැක්කේ නව අධ්‍යාපන පනත යටතේ ගෝලීයව පිළිගත් සම්මතයන්ට මෙන්ම දේශීය අධ්‍යාපන විධිවිධාන වලට යටත්ව ය.

රටේ මුළු මහත් ජනතාවගේ සියළු අධ්‍යාපන අවශ්‍යතා රජය මගින් ඉටුකරලීම අසීමාන්තික කටයුත්තක් බැවින්, ඒ සඳහා පුරවැසියන්ට ඇති අයිතිය මෙන්ම නිදහස සීමා නොකොට පුද්ගලික අංශයේ මැදිහත්වීම, ආයෝජන හා ධාරිතාවයෙන් රට තුළ වැඩි අධ්‍යාපන අවස්ථා ඇති කිරීමට කටයුතු කරනු ලැබේ. එමගින් පුරවැසියන් හට **අධ්‍යාපනයට ඇති තෝරා ගැනීමේ නිදහස හා අයිතිය ආරක්ෂා කරනු ලැබේ**. පහසුකම් සැපයීමට රජයට නොහැකිවීම පුරවැසියාට ඉගෙන ගැනීමට ඇති අයිතිය නැති කිරීමට හේතුවක් විය නොහැකිය. එනයින් පුද්ගලික අංශයේ මැදිහත්වීම රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පුළුල් කරන අතර රාජ්‍ය අංශය සමග තරඟකාරීව සේවා සැපයීම තුළින් එම අංශ දෙකේම දියුණුවක් ඇතිකරලීමට කටයුතු කෙරේ.

අධ්‍යාපනයේ භාෂාව

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය මේ වන විටත් භාෂා කීපයකින් ක්‍රියාත්මක වන අතර මවු භාෂාවට ඒ අතරින් මූලිකත්වය හිමි වී තිබේ. අර්බුදකාරී රාජ්‍ය භාෂා සංකල්පය සමග අධ්‍යාපනය ද අර්බුදයකට යොමුවී ඇති අතර ඉන් ප්‍රධානව ඇතිවී ඇති ගැටළු දෙක නම් අදහස් හුවමාරු කිරීමට පොදු භාෂාවක් නොමැති වීම තුළ වර්ගවාදය උත්සන්න වීමත්, අන්තර්ජාතිකව මුහු වීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂාවේ හැකියාව අඩු වීමත් ය. අපි ලෝකයේ කුඩා ජාතියක් බැවින් ලෝකය සමග ගණුදෙනු කිරීමත්, ලෝකයේ ජනනය

වන දැනුම වඩා කාර්යක්ෂමව උකහා ගැනීමට හැකිවීමත් අපට ලැබෙනුයේ ඉංග්‍රීසි භාෂාව මගිනි. සහජ හැකියාවකින් ඉංග්‍රීසි භාෂාව හැසිරවිය නොහැකි නම් පුරවැසියන්ට ලැබෙන අධ්‍යාපන අවස්ථා මෙන්ම රැකියා අවස්ථාද සීමිත වන බව අප බොහෝ විට තේරුම් ගෙන ඇති සත්‍යයකි.

එසේම ඕනෑම පුරවැසියෙකුට මව් භාෂාවෙන් ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරීමේ අවශ්‍යතාවයක් තිබේ. ඒ ප්‍රධාන කොට ඒ පුරවැසියාට ජාතික හැඟීමත්, සංස්කෘතික දායාදයත් ලබාදිය හැක්කේ මවු භාෂාව ඔස්සේ වීම බව සනාථ කර ඇති බැවිනි. මේ සියල්ල සැළකිල්ලට ගෙන අප අධ්‍යාපනයේ භාෂා ප්‍රතිපත්තිය සකස්කර ගත යුත්තේ ය.

එය පහත පරිදි දැක්විය හැකිය.

- රජයේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ මවු භාෂාවෙන් සියළු ඉගැන්වීම් ආරම්භ කළ යුතුය.

- සියළුම පාසල් වල පළමු වසරේ සිටම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම අනිවාර්යය වෙයි.

- ඉංග්‍රීසි භාෂාව උගන්වන ප්‍රමාණය වසරකට කොටස බැගින් වැඩි කර ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන අවසන් වර්ෂය වන විට වැඩිපුර ඉංග්‍රීසියෙන් ඉගැන්වීම කළ යුතුය.

- මෙමගින් රටේ සියළුම දරුවන්ට මවු භාෂාවෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබීමත්, කුමන මට්ටමක සිටියත් ක්‍රමිකව ඉංග්‍රීසි භාෂාවට හුරුකර ගැනීමත් කළ හැකිය.

- 6 වන ශ්‍රේණියේ පටන් විද්‍යාව, ගණිතය, හා තාක්ෂණික විෂයයන් ආදිය ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වෙන අතර, මවු භාෂාව, ඉතිහාසය, හා ආගම මවු භාෂාවෙන් ඉගැන්විය හැකිය.

- උසස් අධ්‍යාපනය හා ඉන් ඔබ්බට ද සියළුම තාක්ෂණික විෂයයන්, විද්‍යාව ගා ගණිත විෂයයන් ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්විය යුතු අතර, මවු භාෂාව මූලික වන විෂයයන් ඒ ඔස්සේ සකස් කර ගත හැක්කේ ය.

- ඒ අනුව මවු භාෂාවත්, ඉංග්‍රීසි භාෂාවත් උගත් පුරවැසියන් පිරිසක් නිර්මාණයකර ගැනීමට අපට හැකියාව ලැබෙනු ඇත.

- මේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට වසර 5ක පරිවර්තන කාලයක් ලබාදෙන අතර ක්‍රමිකව එයට අනුවර්තනය වීමට පාසල් හා ගුරු මණ්ඩලය සූදානම් කෙරේ.

අධ්‍යාපනය පහත පරිදි කොටස් කිහිපයක් යටතේ හඳුනා ගනී.

- මූලික අධ්‍යාපනය
- ප්‍රාථමික අධ්‍යාපනය
- ද්විතීයික අධ්‍යාපනය
- තෘතීක/ වෘත්තීය අධ්‍යාපනය

රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති තුළට STEAM අධ්‍යාපන ප්‍රතිපත්ති ඇතුළත් කෙරේ. ඒ අනුව නූතන ලෝකයේ පිළිගත් න්‍යායන්ට අනුකූල ප්‍රායෝගික හා නිර්මාණශීලී ක්‍රියාකාරකම් මත පදනම්වූ, නව විෂය නිර්දේශයක් සකස් කරමින් හා එය යාවත්කාලීන කරමින් රටේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණයට ලක් කෙරේ.

අපගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ විභාග මත දරුවන් අසමත් කිරීමේ ක්‍රමය අහෝසි කරනු ලබන අතර සියළුම විභාගයන් දරුවන්ගේ දක්ෂතා ඇගයීමේ සහ දිශාගත කිරීමේ ක්‍රමවේදයක් බවට පරිවර්තනය කෙරෙනු ඇත.

ඒ අනුව දරුවකුගේ වයස අවුරුදු 16 වන විට පාසල් අධ්‍යාපනය අවසන්කර කුසලතා සම්පන්න පුරවැසියකු සමාජගතවන අයුරින් පාසල් පද්ධතිය යාවත්කාලීන කෙරෙනු ඇත.

සාමාන්‍ය පෙළ වයස අවුරුදු 14 දීත් උසස් පෙළ වයස අවුරුදු 16 දීත් ලබාදිය හැකිවන පරිදි විෂය පද්ධතිය සකස් කෙරෙනු ඇත.

රටෙහි ඉදිරි ආර්ථික සහ සාමාජීය සැලසුම් අනුව යමින් තාරුණ්‍යය වේගයෙන් රටට සම්පත් උපයන පරපුරක් හා දියුණු මානව සම්පතක් ලෙස සමාජගත කිරීමත් **යැපුම් සමාජ තීරුවෙන් ඉක්මනින් නිදහස් වීමේ පදනම සැකසීමත් මේ මඟින් ඉටුවනු ඇත.**

පෙර පාසල් අධ්‍යාපනය/ මූලික අධ්‍යාපනය

- වසර 3 සිට වසර 5 දක්වා දරුවන් පෙර පාසල් අධ්‍යාපනයට යොමු කරවියයුතු වෙයි.

- එය දැනට පවතින රාජ්‍ය හා පුද්ගලික අංශය මගින් සපයන සේවාවක් ලෙස ඉදිරියට ද පවත්වා ගෙනයනු ලබන අතර තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන ක්‍රමයක් යටතේ රාජ්‍ය අනුග්‍රහය ලබාදීමට අරමුදලක් ඇති කෙරේ.

- පෙරපාසල් නියාමනය කිරීමටත් ඒවායේ ගුණාත්මකභාවය තහවුරු කිරීමටත් විශේෂ විධිවිධාන සහිත පනතක් සකස් කරනු ලැබේ.

- එම පනතෙහි බලතල අධ්‍යාපන අමාත්‍යාංශයේ පෙරපාසල් ඒකකය වෙත ලබා දෙනු ලැබේ.

- පෙරපාසල් සඳහා දැනට ක්‍රියාත්මක වන විෂය මාලාව යාවත්කාලීන කොට, සියළු දරුවන්ට වඩාත් නූතන හා දියුණුකළ ආරම්භයක් අධ්‍යාපනය මගින් ලබා දීමට කටයුතු කෙරේ.

- පෙරපාසල් ගුරුවරුන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවනු ලබන අතර, පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමත්, අධීක්ෂණය කිරීමත් අමාත්‍යාංශයේ නියාමනය හා මග පෙන්වීම යටතේ සිදුකෙරෙනු ලැබේ. ඒ ඔස්සේ පෙරපාසල් ගුරු වරුන් හට පිළිගත් වැටුප් තලයක් නිර්මාණය කොට එය පිළිගත් වෘත්තීයක් බවට හඳුනා ගෙන, එහි නියැළෙන ගුරුවරුන් හට වෘත්තීය ඉදිරි ගමනක් නිර්මාණය කිරීමට කටයුතු කෙරේ.

- පෙර පාසල් මෙන්ම දිවා සුරැකුම් මධ්‍යස්ථාන දරුවන් සඳහා වඩාත් සුරක්ෂිත ස්ථාන බවට පත්කිරීමට උසස් සම්මතයෙන් පහසුකම් ඇති කිරීමට රජයේ මැදිහත්වීම ලබා දීමට සැලසුම් කෙරේ.

පාසල් අධ්‍යාපනය/ ප්‍රාථමික සහ ද්විතීයික

- පාසල් අධ්‍යාපනය දරුවන්ට ලබා දීම රජයේ වගකීමකි.

- තව ද එය දෙමාපියන් සතු වූ ද අනිවාර්යය වගකීමක් බවට පත් කරන අතර, දෙමාපියන් හට එම වගකීම දැරීමට නොහැකිවන අවස්ථාවකදී එහි වගකීම රජය වෙත පැවරෙයි.

- පාසල් සඳහා පූර්ණ පහසුකම් සැළසීම, වසරක් පාසා පෙළපොත් ලබා දීම හා නිල ඇඳුම් ලබා දීම ට රජය බැඳී සිටියි.

- ශිෂ්‍යත්ව විභාගය වසර 5 කින් ක්‍රමිකව ඉවත් කිරීමට කටයුතු කරන අතර, පාසල් ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කොට සැමට හොඳ අධ්‍යාපන අවස්ථා ලබා දීමේ වැඩ පිළිවෙල යටතේ ප්‍රාදේශීය පාසල් දියුණු කිරීම මගින් සම්පත් බෙදී යෑම සමථයකට පත් කෙරේ.

- පාසල් තුළ වාර විභාග ක්‍රමය අවලංගු කොට ගුරුවරයා විසින් නොකඩවා කරනු ලබන නිරීක්ෂණ හා විශ්ලේෂණයන්ට අනුකූලව දරුවන්ගේ හැකියාවන් මැන බලනු ලබන ඇගයීම් ක්‍රමයක් ඇති කරනු ලබන අතර, දැනට පවතින වසර අවසාන සමත් අසමත් ක්‍රමය අහෝසි කෙරේ. දරුවන්ගේ එම හැකියාවන් හඳුනා ගෙන ඒවා දියුණු කිරීමටත්, දුර්වල තැන හඳුනා ගෙන ඒවාට වැඩපිළිවෙලක් දෙමාපියන් සමග සාකච්ඡා කොට ඇතිකර ගැනීමටත් අවශ්‍ය වගකීම පාසල් පද්ධතිය වෙත පැවරේ.

- පාසල් අවදියෙන් පසු සිසුන් හට තව දුරටත් අධ්‍යාපනය කරගෙන යෑමට තාක්ෂණික විද්‍යා විශ්වවිද්‍යාල ඇති කෙරේ. එමගින් රටට අවශ්‍ය තාක්ෂණික ශිල්පීන් නිර්මාණය කරගැනීමටත්, පුරවැසියන්හට පුහුණු ශ්‍රමිකයෙකු වීමට සුදුසුකමත් සකස් කෙරේ.

- උසස් පෙළ ගණිත, විද්‍යා, පරිසරණක හා තාක්ෂණික විෂයයන් ඉගෙන ගන්නා දරුවන් ප්‍රමාණය ඉහළ දමනු ලැබේ. උසස් පෙළ පාසල් තුළ ඒ සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කොට, පහසුකම් නිර්මාණයකර දරුවන් වැඩි පිරිසක් එම විෂයය පථයන්ට යොමු කර ගනු ලැබේ.

- එම ක්ෂේත්‍ර වලින්ම අනාගත වෘත්තිකයන් නිර්මාණය කිරීමට පාසල් අධ්‍යාපනය තුළින්ම පසුබිම නිර්මාණය කර ගැනේ.

- උසස් පෙළ අවසාන විභාගයෙන් අනතුරුව වැඩි පිරිසකට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාදීමට පහසුකම් පුළුල් කෙරේ.

- එහෙත් විශ්වවිද්‍යාලවලට පිවිසීමට නොහැකි වන සිසුන් හට කාර්මික හා තාක්ෂණික විද්‍යාල තුළ උසස් වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට හා තාක්ෂණික ශිල්පීන් බවට පත්වීමට මාර්ගය සකස් කෙරේ.

- එවන් බාහිර උපාධි විශ්ව විද්‍යාල මෙන්ම තාක්ෂණික විද්‍යා ආයතන අලුතින් ඇති කිරීමට රජය බැඳී සිටින අතර, පවතින ධාරිතාවය රටේ ඉල්ලුමට සරිලන ලෙස වැඩි කරගැනීම හැකි ඉක්මනින් සපුරා ගැනීමට බලාපොරොත්තුවනු ලැබේ.

- එමගින් පාසල් හැරයන සියළුම පුරවැසියන් රැකියා ඉලක්ක කර ගත් පිළිගත් වෘත්තීය සුදුසු කමක් ඇති ශ්‍රමිකයන් හා තාක්ෂණික ශිල්පීන් බවට පත් කෙරේ.

විශ්වවිද්‍යාලය

- රජයේ පාසල්වලින් උසස් පෙළ සමත් වන සිසුන් හට විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබේ.

- විශ්වවිද්‍යාල තුළ නූතන ආර්ථිකයට ගැළපෙන පාඨමාලා ඇති කිරීමට කටයුතු කෙරෙන අතර, ආර්ථිකය මගින් සකස් කරනු ලබන රැකියා අවස්ථාවල ඉල්ලුමට සරිලන වෘත්තිකයන් නිර්මාණය කිරීම විශ්වවිද්‍යාල පද්ධතියේ මූලික කාර්යභාරයයි.

- එනයින් නිරන්තරයෙන් යාවත්කාලීනවන, ලෝකයේ අනෙකුත් විශ්වවිද්‍යාල සමග තරඟකාරීව නව පාඨමාලා හඳුන්වා දෙන, උසස් පහසුකම් වලින් යුක්ත විශ්ව විද්‍යාල පද්ධතියක් සකස් කරනු ලැබේ.
- පුද්ගලික විශ්වවිද්‍යාල ඇති කිරීමට අවස්ථා සැළසෙන අතර, ඒවා නව පනතක් මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියාමනයට ලක් කරනු ලැබේ. එම ආයතනයට මෙම පුද්ගලික

විශ්වවිද්‍යාල ද අධීක්ෂණය කිරීමේ හා ගුණාත්මකභාවය පවත්වා ගෙන යෑමේ වගකීම පැවරෙන අතර, ඒවායේ පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය වෙළෙඳපොළ මූලධර්ම අනුව පැවරේ.

- විශේෂයෙන් රටේ ඇති වී තිබෙන විශාල පුද්ගලික පාසල් ප්‍රමාණයට සාපේක්ෂව පුද්ගලික විශ්වවිද්‍යාල රට තුළ ඇති කිරීම ඉතා අත්‍යාවශ්‍ය කරුණකි. මේ වන විට විදෙස් අධ්‍යාපනය වෙනුවෙන් රටෙන් වසරකට පිටවෙන ඩොලර් ප්‍රමාණය බිලියන 2 කට ආසන්නය. එනයින් එම මුදල් රට තුළ රඳවා ගැනීමටත්, ඒ මානව සම්පත රට තුළ රඳවා ගැනීමටත් අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව විදේශ විශ්වවිද්‍යාල සමග බැඳීමෙන් කටයුතු කරන විශ්ව විද්‍යාල පද්ධතියක් රට තුළ බිහි කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

- රටේ අධ්‍යාපන ක්‍රමයත් ආර්ථිකයත් අතර ඇති සහසම්බන්ධය අපි අවබෝධ කරගෙන සිටින්නෙමු. එනයින්, ආර්ථිකය මගින් සපයන රැකියා අවස්ථා ඉලක්කකර ගත්, ගණනය කරන ලද ක්‍රමවේදයකට අනුකූලව වඩාත් නූතන විෂයයන් විශ්වවිද්‍යාල තුළ ඇති කිරීමට කටයුතු කෙරේ.

- අප දැනට සිටින නුපුහුණු ශ්‍රමය මූලික කරගත් ආර්ථික ක්‍රමයක සිට දැනුම මූලික කරගත් ආර්ථික ක්‍රමයක් දක්වා යෑමට අප අපේ විශ්වවිද්‍යාලය පද්ධතිය දැවැන්ත පරිවර්තනයකට ලක්කළ යුතුය. ඒ සඳහා සැලසුම් සහගතව සහ ඉලක්ක ගතව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

- එලෙසම ඒ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ සඳහා සුවිශේෂී දිරිගැන්වීම් පැකේජ හඳුන්වා දෙනු ලබන අතර, විශ්වවිද්‍යාලවල පර්යේෂණ ක්‍රියාකාරිත්වය ඉහළ නංවාලීමට රජය මගින් අරමුදල් වෙන් කරනු ලැබේ.

දුරස්ථ අධ්‍යාපන අවස්ථා

රටක් කොතරම් සංවර්ධනය වෙත ගමන් කළ ද විවිධ හේතූන් මත පාසල් වෙත ළඟා විය නොහැකි දරුවන් රට තුළ සිටිය හැකි බව අපගේ විශ්වාසයයි.

ආර්ථික හෝ වෙනත් හේතුවක් මත පාසල වෙත පැමිණීමට නොහැකිවන දරුවන් අධ්‍යාපනය සමග සම්බන්ධකර ගැනීමේ ප්‍රතිපත්තිය මත සිට ඕනෑම දරුවෙකුට පාසල් වේලාව තුළම මාර්ගගතව පාඩම් කටයුතුවලට සම්බන්ධ වීමේ අවස්ථාව හිමිවේ.

ඒ සඳහා සියලුම ජාලගත සන්නිවේදන ආයතනවල සහය ලබා ගැනෙන අතර සමස්ථ අධ්‍යාපන පද්ධතියටම වෙන්වූ මෘදුකාංගයක් හරහා නොමිලේ එම අවස්ථාව සිසු දරුදැරියන් වෙත ලබා දෙනු ඇත.

ඒ අනුව සැමට අධ්‍යාපනය හිමිවන රටක් නිර්මාණය කිරීමට දෙමාපියන් ලෙස අපට හැකිවනු ඇත.

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ටත් ගුණාත්මක අධ්‍යාපනයක්

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඒ අනුව, සෑම කළාපයක් තුළම විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා අංග සම්පූර්ණ පහසුකම් ඇති කෙරෙන පරිදි එක් පාසලක් අනිවාර්යය ලෙස සලකා සංවර්ධනය කෙරෙනු ඇත.

විශේෂ හුවමාරු අධ්‍යාපන අවස්ථා

විදෙස් සිසුන් හට ලංකාව තුළ අධ්‍යාපනය ලැබීමේ අවස්ථා පුළුල් කෙරෙන අතර ඉහළ ශ්‍රේණියේ අන්තර්ජාතිකව පිළිගත් විශ්වවිද්‍යාල සඳහා මෙරට තුළ ආයෝජන අවස්ථා පුළුල් කෙරෙනු ඇත. මෙරට සිසුන්හට විදෙස් විශ්වවිද්‍යාල වෙත ප්‍රවේශ වීමේ අවස්ථා ශිෂ්‍ය හුවමාරු ක්‍රමය යටතේ පුළුල් කිරීම සිදුවේ. එමෙන්ම තෝරාගත් වෘත්තීයවේදීන් හටද මෙම හුවමාරු ක්‍රමයම භාවිතා කරමින් සිය අධ්‍යාපන අවස්ථා පුළුල් කරගැනීමේ අවස්ථාව ලබා දේ.

ගුරු පුහුණුව හා වෘත්තීය

විශ්වවිද්‍යාල වලින් පිටවන දක්ෂයන් මෙන්ම ඩිප්ලෝමා ධාරීන් ගුරු සේවයට ගෙන්වා ගැනීමට ආකර්ෂණීය ක්ෂේත්‍රයක් ලෙස ගුරු වෘත්තිය සකස් කෙරේ. ගුරුවරුන් නිරන්තරයෙන් යාවත්කාලීනවන පරිදි පුහුණු වැඩමුළු අවශ්‍ය පරිදි පැවැත්වීමට කටයුතු කරනු ඇත. ඒවා විදෙස් පුහුණු දක්වා පුළුල් කිරීමට කටයුතු සැලසේ. එමෙන්ම ගුරුවරුන්ගේ නිරන්තර ඇගයීම් ක්‍රියාවලියක් සිදුවන අතර මාර්ගගතව එම කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදුකරනු ඇත.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී හැකියාවන් සලකා බැලෙන අතර බඳවා ගැනීමෙන් පසු ක්‍රමිකව විදෙස් පුහුණු ලබා දීමට කටයුතු කරනු ඇත. ඒ තුළින් යාවත්කාලීන ගුණාත්මක අධ්‍යාපනයක් අනාගත පරපුර වෙත දායාද කිරීමේ හැකියාව හිමිවේ.

සමස්ථ ගුරුවරුන් විදේශයන් සඳහා ගොස් පුහුණු කටයුතු සිදු කිරීමට වඩා විදෙස් පුහුණුකාර කණ්ඩායම් මෙරටට කැඳවා එම කාර්යය වඩාත් ඵලදායී ලෙස සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ඒ අනුව යමින් වෘත්තීය ගුරුවරුන් වෙත සිය වෘත්තීය ජීවිතය සාර්ථක කරගැනීමට උසස් වැටුප් ක්‍රමයක් හා දක්ෂතා මත උසස් වීම ලබා ගත හැකි ක්‍රමයක් සකස්කර ඔවුන්ගේ ජීවිත වඩාත් යහපත් කර ගැනීමට ක්‍රමවේදයන් නිර්මාණය කෙරේ.

නීතිය හා මානව හිමිකම් පාසලට

පාසල් අධ්‍යාපනය තුළ නීතිය පිළිබඳව හැදෑරීමේ අවස්ථාව අනාගත පරපුර වෙත ලැබිය යුතුය. විනය ගරුක සහ නීති ගරුක පුරවැසියන් ලෙස සමාජයේ කටයුතු කිරීම සඳහා එය අනිවාර්යය වේ.
ඒ අනුව නීතිය විෂයයක් ලෙස විෂය පද්ධතියට ඇතුළත් කෙරේ.

එමෙන්ම මානව හිමිකම් අගයන, මානව හිමිකම් හඳුනන අනාගත පරපුරක් රටක පැවැත්මට අත්‍යාවශ්‍ය කාරණයකි.

ඒ අනුව යමින් ජාත්‍යන්තර මානව හිමිකම් ආයතන හා ඒකාබද්ධව මෙරට පාසල් පද්ධතිය තුළ මානව හිමිකම් පිළිබඳව අධ්‍යාපනය ලබා දීමත් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නිළධාරීන් පාසල්වෙත

යොමුකිරීමටත් කටයුතු කරනු ලබන අතර ගුරුවරුන් වෙත ඒ සම්බන්ධ දැනුම සම්ප්‍රේෂණය වන අවස්ථාවන් වැඩි වශයෙන් උදාකර දෙනු ඇත.

පිරිවෙන් අධ්‍යාපනය හා දහම් අධ්‍යාපනය

මෙරට අධ්‍යාපන ක්ෂෙත්‍රයේ වැදගත් අංගයක් ලෙස පිරිවෙන් සහ දහම් අධ්‍යාපනය සැලකේ. පවතින පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සඳහා තාක්ෂණය හා වැඩි සම්පත් ප්‍රමාණයක් ලබාදී එහි ධාරිතාවය සහ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.

තවද දහම් පාසල් වෙත අවශ්‍ය ඉගෙනුම් සම්පත් ප්‍රමාණවත් පරිදි ලබාදීමටත්, දහම් පාසල් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය ඉහළ නංවා පිළිගත් වෘත්තීයක් ලෙස කටයුතු කිරීමේ අවස්ථාව සැලසීමටත්, සංස්කෘතික අමාත්‍යාංශය හා එක්ව ජාතික ප්‍රතිපත්තියක් මත පිහිටා සිට කටයුතු කරනු ලැබේ.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම උදෙසා මනෝවිද්‍යාත්මක සංකල්ප භාවිත කිරීම

මනෝවිද්‍යාව යන විෂයයේ එක් කාණ්ඩයක්වන අධ්‍යාපන මනෝවිද්‍යාව මඟින් දරුවන්ගේ ඉගෙනීම, පෞරුෂ සංවර්ධනය, චිත්තවේගී යහපැවැත්ම පිළිබඳව අවධානය යොමුකරයි.

මෙහිදී ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ද්විතීයික අධ්‍යාපනය ලබන දරුවන් සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබයි.

ප්‍රායෝගිකව පාසල් ගුරුවරුන්ට සහ දෙමාපියන්ට ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග සංවර්ධනය කිරීම, දරුවන් තුළ ධනාත්මක වෙනසක් ඇති කරන පරිසරයක් නිර්මාණය කිරීමට ගුරුවරුන් සහ දෙමාපියන්ගේ දායකත්වය ලබාගැනීම, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා එකඟ වූ ක්‍රියාපටිපාටියක් ද නිර්මාණය කිරීම සිදුවේ.

ටියුෂන් අධ්‍යාපනය නියාමනයට

මෙරට ටියුෂන් අධ්‍යාපන ක්‍රමය තුළ වෙනම ආර්ථිකයක් නිර්මාණය වී ඇත. ඒ මගින් ප්‍රතිලාභ ලබන ප්‍රමාණය කුඩා වුවද පාසල් පද්ධතිය අඩපණකර එම ආර්ථිකය ඉහළට මතු වී ඇත.

ටියුෂන් අධ්‍යාපනය ලබාදීම නියාමනය කළ යුතු බව අපගේ අදහසයි. ඒ අනුව උපකාරක පන්ති පවත්වන ආයතන පවත්වාගෙන යායුතු අනිවාර්යය පහසුකම් රාමුවක් නීතිගත කෙරෙන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයට එම ආයතන යටත් කෙරෙනු ඇත.

ඒ අනුව උපකාරක පන්ති පැවැත්වෙන ආයතන සඳහා සිසුන් ප්‍රමාණය මත අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු සනීපාරක්ෂක පහසුකම්, විවේකී ස්ථාන, ආහාර ලබාගැනීමේ ස්ථාන, ඉගෙනුම් අවස්ථාවලදී සිසුන් සහ ගුරුවරයා අතර සන්නිවේදනය සඳහා ඇති ඉඩ යනාදී කාරණා ඇතුළු තවත් කරුණු පිළිබඳව සලකා බැලේ.

ඒ සඳහා අධ්‍යාපනය අමාත්‍යාංශය තුළ නියාමන ඒකකයක් පිහිටුවීමට කටයුතු කෙරේ.

අප විසින් සංවර්ධනය කරනු ලබන පාසල් අධ්‍යාපනය පද්ධතිය තුළ එහි ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීමෙන් ටියුෂන් සඳහා දරුවන් යොමුකිරීමේ දැඩි අවශ්‍යතාවයක් වසර කිහිපයකින් පසු පැන නොනැගෙනු ඇති. එම අවශ්‍යතාවය ක්‍රමයෙන් හීන වන අධ්‍යාපන පද්ධතියක් ස්ථාපිත කිරීම අරමුණයි.

එබැවින් උපකාරක පන්ති සඳහා මෙරට දෙමාපියන් විසින් දැරිය යුතු බර සැහැල්ලු වන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ හැකිය.

ඩිජිටල් පෙළ පොත් ක්‍රමයක්

පාසල් පද්ධතිය තුළ භාවිතා කෙරෙන සාම්ප්‍රදායික පෙළපොත් ක්‍රමය වෙනුවට ඩිජිටල් පෙළපොත් ක්‍රමයක් හඳුන්වාදීමට කටයුතු කරනු ඇත.

වසර කිහිපයක් තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත මෙම ක්‍රියාවලිය හරහා සෑම දරුවකුටම පොත් කියවිය හැකි Digital උපාංගයක් ලබාදීමට කටයුතු කෙරේ.

ඒ අනුව ඕනෑම අවස්ථාවක යාවත්කාලීන කළහැකි පරිදි එම පෙළපොත් නිර්මාණය වේ. සෑම පන්ති කාමරයකම ඩිජිටල් පෙළපොත් මෙන්ම සාමාන්‍ය මුද්‍රිත පෙළපොත්ද පවතින අතර දරුවන්ට තම නිවෙස්වලට රැගෙන යාම සඳහා අවශ්‍ය වන්නේ Digital පෙළපොත් පමණි. ඒ අනුව අධික බරක් දරාගෙන පෙළපොත් පාසල වෙත රැගෙන ඒමට දරුවන්ට සිදු නොවනු ඇත.

අධ්‍යාපනය රූපවාහිනීයට

අධ්‍යාපනික රූපවාහිනී නාලිකා සඳහා වැඩි ඉඩක් හිමිවන අතර එකී නාලිකා සඳහා අමාත්‍යාංශයේ අනුග්‍රහය ලබාදෙනු ඇත.

අප, නව ලෝකය දකින්නන් වන්නෙමු. නූතන මානව ශිෂ්ඨාචාරයක් වෙනුවෙන් ගෝලීය පුරවැසියන් බිහි කිරීමට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් නිර්මාණය කළ යුතු වෙයි.

එය නූතන ප්‍රතිපත්ති තුළ ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින්, කිසිවෙකුත් මග නොහැර ගොස් සියල්ලන්ටම ගෝචරවන එහෙත් ලෝකය සමග තරඟකාරී පුරවැසියෙක් තනන අභියෝගාත්මක කටයුත්තක අප නියැලෙන්නමු. ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග අපට පහසුවන ඒවා නොවේ. එනයින් අපේ සීමාවන් අභියෝගයට ලක් කොට වෙනස් වීමට නොබියව, දීර්ඝකාලීන අනාගතය දෙස බලා අපේ ජාතිය සුරක්ෂිත කොට අපගේ පැවැත්ම තහවුරු කර ගැනීමට සාමූහිකව කටයුතු කරමු.

ප්‍රවාහන ප්‍රතිපත්තිය

රටක ආර්ථිකය යනු එම රටේ ගොඩනැගෙන සම්පත් ජනතාව අතර බෙදා ගැනීමේ යාන්ත්‍රණය නම්, එම යාන්ත්‍රණයේ මූලික පදනම වැටෙනුයේ රටේ ප්‍රවාහන පද්ධතිය ඔස්සේ ය. පුරවැසියාට සිය ගමන් බිමන් යෑමේ පහසුව මෙන්ම රටේ නිෂ්පාදනයවන භාණ්ඩ හා සේවා බෙදා හැරීමේ යාන්ත්‍රණය සුරක්ෂිත කිරීම, පහසු කරවීම හා කාර්යක්ෂම කරවීම රජයක මූලික වගකීමක් සේ සැළකිය හැකිය. එබැවින් රටේ ප්‍රවාහන පද්ධතිය යනු රාජ්‍ය අනුග්‍රහය, රාජ්‍ය කළමනාකරණය සහ රාජ්‍ය නියාමනය සහිතව ක්‍රියාත්මක විය යුතු පොදු අවශ්‍යතාවයකි.

විශේෂයෙන් ලෝකයේ ප්‍රවාහන ක්ෂේත්‍රය දැවැන්ත පරිවර්තනයකට ලක් වෙමින් පවතින යුගයකට අප පැමිණ සිටී. ලෝකය යළිත් වරක් බලශක්ති ක්ෂේත්‍රයේ සිදුවන විශාල පරිවර්තනයකට මුහුණ දෙමින් පොසිල ඉන්ධන වලින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදවලට අනුගතවන මේ යුගය ප්‍රවාහන ක්ෂේත්‍රයේ රාජ්‍ය මැදිහත්වීම වඩාත් මැනවින් විද්‍යාත්මකව සකස් විය යුතු මංසන්ධියක අප සිටින්නෙමු. එනයින් ඒ වැදගත් මංසන්ධිය නිසි ලෙස කළමනාකරණය කළහැකි හරිත දැක්මක් රාජ්‍ය පරිපාලනය තුළ පැවතීම අත්‍යාවශ්‍ය බව අප විශ්වාස කරන්නෙමු. ඒ ගෝලීය පරිවර්තනය පෙරදැරි කරගෙන, තිරසාර සංවර්ධනයකට අවශ්‍ය පදනම දමා ගනිමින්, ශ්‍රී ලංකාව ලෝකයේ තවත් සාර්ථක රටක් ලෙස ගොඩනැගීමට යන ආර්ථික ක්‍රියාවලියකට ගැළපෙන අයුරින් රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය සකස් කරගැනීම අප දකින රට හඳන සැළසුමක මූලික අංගයකි. එනයින් අප දකින අලුත් ශ්‍රී ලංකාවක ප්‍රවාහනය කෙසේ සකස් වියයුතු දැයි ඔබට මෙසේ ඉදිරිපත් කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ ප්‍රධානම අභ්‍යන්තර ප්‍රවාහන මාධ්‍ය නම් ගොඩබිම් ප්‍රවාහනයයි. අප රටේ ජල ප්‍රවාහනය සිදු නොවන තරම් කුඩා එකකි. පැවැති සිවිල් යුද්ධය නිසා ද අඩු ආදායම්ලාභී රටක් වීම නිසා ද දේශීය සිවිල් ගුවන් සේවා ද සිදු වනුයේ ඉතා කුඩා මට්ටමෙනි. එනයින් අපේ දැක්ම තුළින් මූලික ලෙස ගොඩබිම් ප්‍රවාහනයට අවධානය යොමු කෙරේ.

ප්‍රවාහනය පිළිබඳව ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේදී ඒ ක්ෂේත්‍රය ප්‍රධාන කොටස් 03 කට බෙදා ගත හැකිය. එනම්

1. මාර්ග
2. වාහන
3. රියැදුරු

මෙම ප්‍රතිපත්ති මාලාව තුළ මේ එක් එක් කරුණ ගෙනහැර පාමින් ඉදිරිපත් කෙරෙනු ඇත.

ගොඩබිම් ප්‍රවාහනයේ මූලික අංග කොටස් 02 කට බෙදා වෙන් කරගත හැකිය.

1. පොදු ප්‍රවාහනය
   - බස් සේවා
   - දුම්රිය සේවා
   - ටැක්සි සේවා

2. පුද්ගලික ප්‍රවාහනය

පොදු ප්‍රවාහනය

රටක පොදු ප්‍රවාහනය යනු ඒ රටේ පූර්ණ රාජ්‍ය කළමනාකරණය යටතේ ක්‍රියාත්මක විය යුතු, සෑම පුරවැසියෙකුටම සිය අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට හැකියාව ලැබිය යුතු පොදු සේවාවකි. මේ පොදු සේවාව රටේ සෑම අස්සක් මුල්ලකටම ගලා යා යුතු, දවසේ ඕනෑම වෙලාවක පවතින, ආර්ථිකමය වශයෙන් පුරවැසියන්ට දැරිය හැකි ක්‍රමවේදයකට සකස් විය යුත්තකි. එනයින් රජයක් ලෙස රටේ ඇති සම්පත් කළමනාකරණය කරගනිමින් නිර්මාණය කළ යුත්තේ ඒ පොදු ප්‍රවාහන ක්‍රමවේදයයි.

ඒ මූලික පදනම හරය කරගෙන අපි පොදු ප්‍රවාහන සේවය මෙසේ සකස් කරන්නෙමු.

දැනට පවතින ජාතික ප්‍රවාහන කොමිසම අවලංගු කොට ජාතික ප්‍රාවහන අධිකාරියක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වේ. එම අධිකාරියට නූතන රාජ්‍ය සේවා ක්‍රමවේදයන් අඩංගු කර ගනිමින් රටේ පොදු ප්‍රවාහන සේවා සියල්ල කළමනාකරණය සහ නියාමනය කළහැකි බලතල සහිත නව පනතක් තුළින් බලාත්මකකර පිහිටුවීමට කටයුතු කෙරේ. රටේ මූලිකව ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාලව තීන්දු තීරණ ගැනීම, සේවා කළමනාකරණය කිරීම සහ නියාමනය මෙම අධිකාරියට පැවරේ.

දුම්රිය සේවා

- අප ගෙන එනු ලබන කාර්යක්ෂම රාජ්‍ය පරිපාලන ක්‍රමයක් අනුව දුම්රිය සේවාව ද කළමනාකරණයට ලක්කෙරෙන අතර, දැනට පවතින දෙපාර්තමේන්තු ක්‍රමය අහෝසිකර ස්වයං පාලිත ස්වාධීන මණ්ඩල ක්‍රමයකට දුම්රිය සේවය පරිවර්තනය කෙරේ. එම මණ්ඩලය ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ පවතින අතර, එය නියාමනය කිරීම ජාතික ප්‍රාවාහන අධිකාරියට පැවරේ.

- දුම්රිය සේවාවන් ආර්ථිකයේ මුල් සංවර්ධන කාල පරාසය තුළ රාජ්‍ය අංශය සතුව පවත්වා ගෙනයනු ලැබේ.

- දැනට පවතින දුම්රිය සේවා තවත් පුළුල් කිරීම යුගයේ අවශ්‍යතාවයකි. එනයින් දැනට පවතින දුම්රිය මාර්ග තවදුරටත් දීර්ඝ කොට,
    - රත්නපුර දුම්රිය මාර්ගය නිර්මාණය කිරීම හා එය ඇඹිලිපිටිය, හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම.
    - පුත්තලම් මාර්ගය මන්නාරම දක්වා දීර්ඝ කිරීම.
    - මුහුදු බඩ මාර්ගය කතරගමටත්, අනතුරුව මොණරාගල හා අම්පාර දක්වාත් දීර්ඝ කිරීමට කටයුතු කෙරේ.

- එලෙස දිවයින පුරා ආවරණයවන පුළුල් දුම්රිය සේවාවක් මගින් රටේම ප්‍රවාහනයට ලාභදායීම ක්‍රමය සකස් කිරීම ඉලක්කයයි.

- පවතින දුම්රිය සේවා යාවත්කාලීන කර නවීන උපකරණ සහ තාක්ෂණයෙන් බලගැන්වීමට කටයුතු කෙරේ.

- සියළුම දුම්රිය නැවතුම් නවීකරණය කොට, වැසිකිළි ඇතුළු පොදු පහසුකම් සකස්කොට නූතන කළමනාකරණ ක්‍රමවේදයන් මගින් වඩාත් ගුණාත්මක සේවාවක් ලබාදෙන ආයතන බවට පත් කෙරෙනු ඇත.

- දුම්රිය සේවා ද ක්‍රමිකව වියදම් පියවා ගත හැකි සේවා ක්‍රමයක් යටතේ මිළ තීරණය වන ක්‍රමයකට ගෙනඑනු ලබන අතර, පාඩු ලබන තත්ත්වය නවත්වා ගැනීමට කටයුතු කෙරේ.
- කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින් බලවේග කට්ටල ධාවනය වන මෙට්‍රෝ දුම්රිය ක්‍රමයක් සැළසුම් කර එය public private

partnership ක්‍රමයක් යටතේ ක්‍රමයෙන් ගොඩනැගීමට බලාපොරොත්තු වේ. එය එක් ජාලයක් බවට පත්කර නගරයේ ඕනෑම ප්‍රධාන තැනකට මෙට්‍රෝ මගින් යා හැකි ඒකාබද්ධ ජාලයක් බවට සකස් කෙරෙනු ඇත. ඒවා කණු මතින් භූමියට ඉහළින් හෝ පොළොව ගැඹුරේ වූ උමං මාර්ග ඔස්සේ සකස් කරනු ලැබේ.

- අලුතින් නිර්මාණයවන මෙට්‍රෝ සේවා පොදු/පුද්ගලික මිශ්‍ර ක්‍රමවේදයකට කළමනාකරණය කෙරෙන අතර ඒවා පවතින දුම්රිය සේවා සමග බද්ධ නොකොට වෙනත් ආයතන ව්‍යුහයක් බවට පත් කෙරේ.

බස්රථ සේවා

- ලංකා ගමනා ගමන මණ්ඩලය වෙනුවට බස්රථ සේවා පොදු සමාගම් ව්‍යුහයක් යටතට පත් කෙරේ.

- ඒවා සමාගම් කළමනාකරණ මොඩලයකින් පරිපාලනය කෙරේ.

- එම සමාගම්වල කොටස් වෙළෙඳපොළට නිකුත් කෙරෙන අතර එම කොටස් වලින් කොටසක් ලාභාංශ ලබා ගැනීම වෙනුවෙන් සේවකයන් වෙත පිරිනැමේ.

- පුද්ගලික බස්රථ හිමියන් එක් කොට පුද්ගලික බස් සමාගම් නිර්මාණය කෙරේ. ඒ පුද්ගලික බස්රථ හිමියන්හට එම සමාගම් වල කොටස් හිමිකරුවන් වීමේ අවස්ථාව හිමිවේ.

- මේ සියලු සමාගම් පොදු වර්ණයක්, පොදු ක්‍රම වේදයක්, පොදු ප්‍රවේශපත්‍ර ක්‍රමයක් යටතට පත් කෙරේ.

- සියලුම බස්රථ රියැදුරන් හට වෙනමම වෘත්තීය පුහුණුවක් ලබා දෙන අතර, විශේෂ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ඔවුන්ට පමණක් වෘත්තීය බලපත්‍රයක් පිරිනැමේ. පොදු ප්‍රවාහන සේවා බස්රථ රියැදුරෙක් විය හැක්කේ එම වෘත්තීය බලපත්‍රය ඇති අයෙකුට පමණකි. එම කාර්යය ජාතික ප්‍රවාහන අධිකාරියට පැවරෙයි.

- මෙම රජයේ සහ පොදු, පුද්ගලික සමාගම් සියල්ල එක් ජාතික ප්‍රතිපත්තියකට අනුව සකස් කෙරුණු ප්‍රවාහන සේවයක් බවට පත්කොට ලබා දීමට කටයුතු කෙරේ.

- එම පොදු සැකැස්මට අනුව කාලසටහන්, ගමන් මාර්ග සහ ගමනාන්තයන් රටේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකස් කෙරේ.

- නූතන වෙළෙඳපොළ ආර්ථිකයක නියාමනයන්ට අනුකූලව බස්රථ සේවා දියුණු කෙරේ.

- ප්‍රවාහන සේවාව මෙලෙස ක්‍රමවේදයකට සකස් කිරීම තුළ, එම සේවා ඩිජිටල්කරණයට ලක්කොට, ඒවා මාර්ගගත ක්‍රමයකට යොමු කෙරේ. එමගින් බස්වල කාලසටහන්, නැවතුම්පල, ආසන වෙන් කිරීම්, ටිකට් මිලදී ගැනීම් ආදිය අන්තර්ජාලයට ගෙන ඒමට හැකිවේ.

- එම සේවා දුම්රිය සේවා හා ඒකාබද්ධ කොට ජනතාවට වඩාත් සම්බන්ධීකරණය වූ සේවාවක් ලබා දීමට කටයුතු කෙරේ.

- බස් සේවා සඳහා ගෙවීම් කිරීමට ඩිජිටල් කාඩ් පත් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

- බස් ගමනාගමන මාර්ග අතර විවිධ සමාගම් තෝරා ගැනීම මගින් බස් අතර ඇති එකිනෙකා පරයා යෑමේ තරඟය සීමා කොට මගී සේවය වඩා ගුණාත්මක කෙරේ.

ටැක්සි සේවා.

- මාර්ගගත යෙදවුම් (App) මගින් කරනු ලබන ටැක්සි සේවා සඳහා යටිතල පහසුකම් සැළසේ. එම ටැක්සි සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීම වෙනුවෙන් අලුත් නීති සම්පාදනයකොට, එම සේවාවන් නියාමනයට ලක් කෙරේ.

- ත්‍රීරෝද රථ සේවාව පොදු ප්‍රවහනයේ වැදගත් අංගයක් ලෙස හඳුනා ගැනේ.

- ත්‍රීරෝද රථ සඳහා වෙනමම මීටර් ක්‍රමයක් ජාතික ප්‍රවාහන අධිකාරිය මගින් හඳුන්වා දෙනු ලැබේ.

- එම මීටර් මගින් සාධාරණව ජාතික ප්‍රාවාහන අධිකාරිය මගින් නියාමනය කළ මිල ගණන් අනුව ටැක්සි සේවා පවත්වා ගෙන යා යුතු වෙයි.

- සියළුම ටැක්සි රියැදුරන් එම රැකියාව තෝරා ගැනීමට පෙර ජාතික ප්‍රවාහන අධිකාරිය මගින් ලබා දෙන වෘත්තීය පුහුණුවක් ලබාගතයුතු අතර, අනතුරුව නිකුත් කෙරෙන වෘත්තීය බලපත්‍රයක් හිමිකර ගත යුතුය.

- එම බලපත්‍රය ලබා දීමට පෙර රියැදුරු බලපත්‍රය ලබාගෙන අවම වසර 03 ක් වත් වාහන ධාවනය කර අත්දැකීම් ලබා තිබීම ටැක්සි රියැදුරෙකු වීමට මූලික සුදුසුකමක් ලෙස සැලකේ.

- එසේම ටැක්සි සේවා සපයන කාර් හා ත්‍රීවිල් රථවල ගුණාත්මකභාවය ද ජාතික ප්‍රාවහන අධිකාරිය මගින් නියාමනය කෙරේ. ටැක්සි සේවාවේ යොදවන රථ, ජාතික ප්‍රවාහන අධිකාරියේ ලියාපදිංචි කළයුතු අතර, එම ලියාපදිංචිය ලබා ගැනීමට එම වාහනය හොඳ තත්වයෙන් සම්මත අංගෝපාංගයන් සහිතව තිබිය යුතුය.

- පාරිභෝගික/මගී පැමිණිළි බාරගැනීම හා පරීක්ෂණ කිරීමත්, ඒවාට නිසි පියවර ගැනීමත් කළ හැකි පාරිභෝගික සේවා අංශයක් ජාතික ප්‍රවාහන අධිකාරිය තුළ ස්ථාපිත කෙරේ.

පුද්ගලික ප්‍රවාහනය

පොදු ප්‍රවාහනය කෙතරම් සාර්ථකවුව ද රටක පුද්ගලික ප්‍රවාහනය යනු අනිවාර්යයෙන් පවතින ප්‍රවාහන ක්‍රමයකි. මිනිසුන් වාහන උරුම කරගැනීමට ද පුද්ගලිකව ගමන් බිමන් යෑමට ද රුචියක් දක්වන්නෝ ය. රටේ ආර්ථික දියුණුව ඇතිවන විට එයට සාපේක්ෂව ජනතාවගේ අදායම් ද ඉහළ යන බැවින් ඔවුහූ වැඩිපුර වාහන මිලදී ගනිමින් පුද්ගලික ප්‍රවාහන ක්‍රම වලට හුරු වෙති.

- එසේ නම් රටේ ආර්ථික දියුණුවට සාපේක්ෂව මාර්ග පුළුල් විය යුත්තේ ය. වාහන ගාල් කිරීමේ පහසුකම් සකස්විය යුත්තේ ය. වාහන අබලි කළමනාකරණ මධ්‍යස්ථාන බිහිවිය යුත්තේ ය. මේ සියල්ල සහිත දැක්මකින් රටෙහි ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් වී තිබිය යුත්තේ ය.

- ඉතා විශාල රාජ්‍යයන් වල පොදු ප්‍රවාහනය සෑම තැනකටම එක වාගේ ලබා දිය නොහැකි බැවින් එම රටවල පුද්ගලික ප්‍රවාහනය දිරිමත් කෙරෙති. එහෙත් කුඩා රටවල පොදු ප්‍රාවහනය ලාභදායි සහ සැප පහසුව ඇතුව තනා පුද්ගලික වාහනවලට අධික බදු අයකර පොදු ප්‍රවාහනය දිරිමත් කෙරේ. අපේ රටට ද එවන් වූ ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය වෙයි. එහිදී අප ද කුඩා රාජ්‍යයක් බැවින් පොදු ප්‍රවාහන සේවයට වැඩි බරක් තබා පොදු ප්‍රවාහනය දිරිමත් කරන ජාතික ප්‍රතිපත්තියකට යොමුවිය යුතුය.

- එසේ වූවද රට ගොඩ නැගෙන අලුත් සැළසුම් වලට අනුව, නව නගර, නව කාර්මික කළාප ආදිය බිහි කිරීමේදී වඩාත් පුළුල් වූ තිරසාර මාර්ග පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ජාතික සැළැස්මක් නිර්මාණය කෙරේ. එමෙන්ම අලුත් ගොඩනැගිලි හා සේවා ස්ථාන වලට ප්‍රමාණවත් වාහන ගාල් කිරීමේ හා නතර කිරීමේ පහසුකම් ඇතිව සැළසුම් සකස් කිරීම අනිවාර්ය වේ.

- වාහනයක් මිලදී ගැනීමේ හැකියාව ආර්ථිකයේ වර්ධනය අනුව ජනතාවට ලබා දෙන අතර, මූල්‍ය වෙළෙඳපොළ කළමනාකරණය මගින් අවශ්‍ය ණය පහසුකම් සුරක්ෂිතව ලබා ගත හැකි ක්‍රමවේදයන් සකස් කෙරේ.

- සියළුම වාහන වාර්ෂිකව ලියාපදිංචිය අලුත් කිරීමට ප්‍රථම ධාවන තත්ත්ව පරීක්ෂණයකට යොමු කළ යුතුය. එය දැනට පවතින

EcoTest හෙවත් දුම් පරීක්ෂාවෙන් ඔබ්බට ගොස් මුළු වාහනයේම ධාවන තත්ත්ව පරීක්ෂාවක් සිදු කළයුතු අතර, වාහනය මාර්ගයක ධාවනයට ආරක්ෂිත හා සුදුසු දැයි සොයා බැලීමකට ලක් කෙරේ.

මාර්ග

- දැනට සැළසුම් කරඇති අධිවේගී මාර්ග පද්ධතිය හැකි ඉක්මනින් සාදා නිම කිරීමට කටයුතු කෙරේ. ඒවා සඳහා Public Private Partnerships හෝ Build Operate Transfer ක්‍රමවේදයන් යොදා ගැනේ.

- දිවයිනේ සියළුම ප්‍රධාන මාර්ග සඳහා අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව මාර්ග නීති හා සංඥා ක්‍රම පද්ධතියක් සකස් කෙරේ.

- ඒවා නිසි ලෙස නඩත්තුව සහ පවත්වා ගෙන යෑමට දැනට පවතින ක්‍රමවේදයන් වෙනුවට වංචා හා දූෂණ වලින් තොර පාරදෘෂ්‍ය ක්‍රමවේදයක් සකස් කෙරේ.

- මාර්ග පද්ධතියේ වේග සීමාවන් යළි නිර්ණය කෙරෙන අතර, දැනට පවතින නීතිය වෙනස් කොට අලුත් ක්‍රමවේදයකට මාර්ගවල වේග සීමා නිර්ණයකර නව නීති සකස් කෙරේ.

- නාගරික මාර්ග දෙපස පදික වේදිකා ද හරිත ශාක තීරුවක් ද නිර්මාණය කිරීමට කටයුතු කෙරේ.

- මාර්ග දෙපස උයන්ගත කිරීම මාර්ග නිර්මාණ ව්‍යාපෘතියෙහිම කොටසක් ලෙස එක් කෙරේ.

යතුරුපැදි

- යතුරුපැදි සඳහා ඇති එන්ජින් ධාරිතා සීමා ඉවත් කෙරේ.
- සම්පූර්ණ මූහුණු වැස්ම සහිත හිස් ආවරණ පැළඳීමේ නිදහස යතුරුපැදිකරුවන්ට ලැබේ.

පා පැදි

- රට පුරා පා පැදි භාවිතය ප්‍රචලිත කෙරේ.
- ඒ සඳහා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී පා පැදි මංතීරු නිර්මාණය කිරීමට කටයුතු සකස් කෙරේ. එම මංතීරුවලට අදාල නීති රීති සකස් කිරීම, යටිතල පහසුකම් සැළසීම රජය මගින් සිදු කෙරේ.
- රැකියා කරන ස්ථාන සහ පොදු ස්ථානවල පා පැදි භාවිතා කරන්නන් හට විශේෂ පහසුකම් නිර්මාණය කෙරේ.
- විනෝදාශ්වාදය හා ව්‍යායාම පිණිස පා පැදි භාවිතය ප්‍රචලිත කරවයි.
- රට පුරා පොදු ජාලයකින් පා පැදි මංතීරු එක්කොට දැවැන්ත ජාලයක් ඇති කෙරේ.
- වනෝද්‍යාන ආශ්‍රිතව Off Road Bicycle Tracks ඇති කරනු ලබන අතර, පා පැදි සවාරි සංචාරකයන් අතර ප්‍රචලිත කෙරේ.
- පා පැදිය බහුල ප්‍රවාහන මාධ්‍යක් බවට පත් කිරීමට අවශ්‍ය දිරිදීම රජය මගින් ලබා දී පා පැදි සංස්කෘතියක් ඇති කිරීමට කටයුතු කෙරේ.

ආබාධිතයන් සඳහා යෝග්‍ය බව

රටේ සියළුම පොදු ප්‍රවාහන සේවාවන් සහ මාර්ග ආබාධිත පුරවැසියන් හට සුදුසු හා ආරක්ෂිත ලෙස සකස් කෙරේ.

ආබාධිත පුරවැසියන් හට ගමන් කළහැකි බස්රථ නාගරික ප්‍රවාහනයට එක් කරන අතර මාර්ග, බස් නැවතුම්, පදික වේදිකා ආදීය අන්තර්ජාතිකව පිළිගත් ආබාධිතයන් හට භාවිතා කළ හැකි ක්‍රමවේද අනුව සකස් කෙරේ.

ප්‍රවාහන සේවා ඩිජිටල්කරණය

රටේ මූලික වෙනස්කමක් වන e Governance ක්‍රමවේදය ඔස්සේ වේගයෙන් ඩිජිටල්කරණයට ලක්කිරීම තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයද එයට අන්තර්ගත කෙරේ. ඒ අනුව ප්‍රවාහන තොරතුරු මෙන්ම මගී සේවා සඳහා ද නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ඇති කරගැනීමත්, එම එක් එක් සේවා අතර සම්බන්ධීකරණයකර ගැනීමත් පහසුවෙන් කරගැනීමට අපේක්ෂා කෙරේ.

රියදුරු පුහුණුව සහ බලපත්‍රය

- රියැදුරු පුහුණු ක්‍රමවේදයන් සම්පූර්ණයෙන් වෙනස් කිරීමකට බඳුන් විය යුතුය.

- වෛද්‍ය පරීක්ෂණය, ලිඛිත පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණ එකිනෙකින් වෙන් කෙරෑ කොටස් බවට පත්කර ඒවායේ ඇතැම් සේවා සැපයීම තෝරාගත් බාහිර පාර්ශව වෙත ලබා දෙයි.

- එහිදී වැඩි අවධානය ප්‍රායෝගික පරීක්ෂණයට ලබාදෙන අතර, එය පවතින කෙටි ක්‍රමය නොව, වඩාත් ගැඹුරින් රියදුරු හැකියාවන් මැන බලන යථාර්තවාදී පරීක්ෂණයක් බවට පත් කළ යුතුවේ.

- රියදුරු බලපත්‍ර ලබා දීමේදී සිදුවන අක්‍රමිකතා, වංචා දූෂණ, අල්ලස් ගැනීම් ආදිය නවතා දැමීමට නව තාක්ෂණික උපක්‍රම භාවිතා කෙරේ.

මාර්ග නීති සහ දඩ ක්‍රමය

- රටේ මාර්ග නීති යාවත්කාලීන කෙරේ.

- රටේ නූතන ආර්ථික අවශ්‍යතා හඳුනාගෙන එයට ගැළපෙන අයුරින් මාර්ග නීති හා දඩ ක්‍රම වෙනස් කෙරේ.

- පොලීසිය විසින් රියදුරු බලපත්‍රය තබා ගැනීමේ ක්‍රමය අහෝසි කෙරෙන අතර, දඩ ගෙවීම ඕනෑම ස්ථානයකින් කරගැනීමේ මාර්ගගත ක්‍රම ඇති කෙරේ.

- නීතියේ පරමාධිපත්‍ය ඇතිකළ රාජ්‍යයක දඩ ගෙවීම පැහැර හැරීමට නොහැකි බැවින්, බලපත්‍ර තබා ගැනීමක් අවශ්‍ය නොවේ.

- යම් පොලිස් නිලධාරියෙකුහට යම් දඩයක් පැනවීමට අවශ්‍ය නම් රියදුරා වරද කළ බවට සනාථ කළ හැකි සාක්ෂි ලබා දීම අවශ්‍ය වේ. හුදෙක් දැනට පවතින එම වැරැද්ද නිරීක්ෂණය කිරීම තව දුරටත් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා රථවාහන පොලිස් නිලධාරීන් හට තාක්ෂණික උපකරණ ලබා දිය යුතුය.

විද්‍යුත් වාහන පහසුකම්

- ශ්‍රී ලංකාව ගෝලීය බලශක්ති පරිවර්තන වැඩපිළිවෙල සමග එක් කරමින් විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන මිලදී ගැනීම දිරිමත් කෙරේ.

- එම වාහන සඳහා සහන බදු ක්‍රමයක් ඇති කෙරේ.

- විද්‍යුත් වාහන මිලදී ගන්නන් හට සිය නිවසේ වහලයට සූර්ය පැනල සවිකර ගැනීම සඳහා පහසුකම් සැලසෙන අතර, බදු සහන යෝජනා කෙරේ.

- විද්‍යුත් වාහන බැටරි ආරෝපණය (Charge) කරන සේවා ස්ථාන ජාලයක් දිවයින පුරා ඇතිකිරීමට පුද්ගලික ව්‍යවසායකයන් මගින් ආයෝජන කැඳවන අතර, ඒ සඳහා යටිතල පහසුකම් සැපයීමට රජය කටයුතු කරයි.

භාණ්ඩ ප්‍රවාහනය

- කුරුණෑගල සහ කළුතර තෝරාගත් ස්ථාන දෙකක දුම්රිය මාර්ගය යාබදව වියළි වරායන්/ Dry Port දෙකක් නිර්මාණය කෙරේ.

- එම වියළි වරායන්ගේ සිට කොළඹ සහ හම්බන්තොට වරායන් දක්වා දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට කටයුතු කෙරේ.

- වියළි වරායන් වෙත බහාලුම් බාර ගැනීම හා ඒවා මගින් පිට කිරීම වරායේදී මෙන් සිදු කෙරෙන අතර, ඒවා දුම්රිය මගින් නැව් තටාකාංගනය වෙතම ප්‍රවාහනය කිරීමට කටයුතු සකස් කෙරේ.

- එලෙසම රට පුරා ගොඩනැගෙන දුම්රිය මාර්ග පද්ධතිය හා තාක්ෂණය යොදා ගනිමින් කාර්යක්ෂම භාණ්ඩ ප්‍රවාහන සේවාවක් නිර්මාණය කිරීමට කටයුතු කෙරේ.

- ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනයේ ගුණාත්මකභාවය ඉහළ දැමීමට සම්මතයන් හඳුන්වා දී ඒවා නියාමනය කෙරේ.

- වරායන් ගුවන් තොටුපල හා සියළුම වෙළඳ නගර මෙලෙස ප්‍රවාහන ජාලයක් මගින් සම්බන්ධ කෙරේ.

- එලෙස භාණ්ඩ ප්‍රවාහනයේ වියදම සීමා කරගනු ලබන අතර, ඒ සඳහා ගත වල කාලය අඩුකර සේවාව වඩා කාර්යක්ෂම කර ගැනේ.

අභ්‍යන්තර ගුවන් සේවා

- අභ්‍යන්තර ගුවන් සේවා සඳහා ගැළපෙන අයුරින් යටිතල පහසුකම් දියුණු කෙරේ.

- දේශීය ගුවන්පථ ප්‍රමිති ගතකර, දේශීය ගුවන් සේවා සැපයීම සඳහා පුද්ගලික අංශයට පහසුකම් සැළසේ.

- විශේෂයෙන් සංචාරක කර්මාන්තය ගුවන් ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් සඳහා මෙම පහසුකම් විවෘත කෙරේ.

- දිය මත ගුවන් යානා නවත්වන තොටුපළ පහසුකම් වර්ධනය කිරීම මගින්, එම ක්ෂේත්‍රය රට තුළ වැව් පද්ධතිය ඔස්සේ විහිදී යෑම ප්‍රවර්ධනය කෙරේ.

දැනට පවතින පළාත් සභා ක්‍රමය යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රය අනවශ්‍ය පරිපාලනය ව්‍යුහයක් සමග මුහු කොට තිබේ. එමගින් ප්‍රවාහනයට හෝ ජනතාවට ලැබුණු ප්‍රතිලාභයක් නොමැත. ඉන් සිදුව ඇත්තේ තවත් අකාර්යක්ෂම රාජ්‍ය පරිපාලන තලයක් තුළ ප්‍රවාහනය ද සිරකිරීම පමණකි. එනයින් පවතින මේ අකාර්යක්ෂම බෙදුණු ක්‍රමය වෙනුවට අලුත් ජාතික වැඩපිළිවෙලක් මේ සඳහා ක්‍රමිකව නිර්මාණය කිරීම වැදගත්වේ. එය සංවර්ධන මාවතේ ගමන් කරන විට ක්‍රමිකව සිදු වන්නකි. එය අපේ දීර්ඝකාලීන බලාපොරොත්තුවයි.

සෞඛ්‍යය ප්‍රතිපත්තිය

රටක රජයක් විසින් එහි ජනතාවට සැලසිය යුතු ප්‍රධාන ම සේවයක් ලෙස සෞඛ්‍යය සේවාව හැඳින්විය හැකිය. පුරවැසියන් හට ගුණාත්මක ජීවිතයක් උරුම කර දීමටත්, පුරවැසියන්ගේ ජීවිත සුවයෙන් තැබීමටත් රටක කොඳු නාරටිය බඳු සෞඛ්‍යය සේවය මගින් ඉටුකළ යුතු සේවාව අතිමහත් ය. එබැවින් සියලුම සාර්ථක රටවල අතිසාර්ථක සෞඛ්‍යය සේවයක් දක්නට ලැබෙන අතර, රටේ සාර්ථකත්වයත් සෞඛ්‍යය ක්ෂේත්‍රයේ දියුණුවත් එකිනෙකට සමාන්තරව ගමන් කරනු අපට දක්නට ලැබෙයි.

නිසි පෝෂණයෙන් යුක්ත, රෝගාබාධවලින් වියුක්ත, ශක්තිමත් අනාගත පරපුරක් මෙන්ම ශ්‍රම බලකායක් නිර්මාණය කර ගැනීමත්, විශ්‍රාමික පරම්පරාවට සිය බලාපොරොත්තු මුදුන් පමුණුවාගෙන ජීවිතයේ සැඳෑ සමයේ සුන්දර විශ්‍රාම දිවියක් ගත කිරීමට රුකුලක් වීමත්, උපදින දරු පරම්පරාවට නූතන ලෝකයේ සුරක්ෂිතම සෞඛ්‍යය සේවයක් උරුම කර දීමත් අරමුණු කරගෙන රටක සෞඛ්‍යය ප්‍රතිපත්තිය හැසිරවීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

ලෝකයේ සංවර්ධනය මනින එක මිම්මක් වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මානව සංවර්ධන දර්ශකය අනුව ශ්‍රී ලංකාව සිටින්නේ රටවල් 191 කින් 73 වන ස්ථානයේ ය. එහි ප්‍රධාන අංගයක් වන පුරවැසියන්ගේ සෞඛ්‍යය තත්ත්වය මෙහිදී මැනෙන අතර අප වැනි අඩු අදායම් රටකට එය බෙහෙවින් සතුටු විය හැකි තත්වයකි. එහෙත් එසේ වූව ද අප තවමත් ශ්‍රී ලාංකීය පුරවැසියන් හට තෘප්තිමත් විය හැකි සෞඛ්‍යය පහසුකම් සලසනවා දැයි ප්‍රශ්න කළ විට අපිට ලෙහෙසියෙන්ම තවමත් අපි ගැන තෘප්තිමත් නොවන බව තහවුරු වනු ඇත. අප මේ රට දියුණු කර සාර්ථක රටක් බවට පත් කරයි නම්, එහි සෞඛ්‍යය සේවාව ද එයට සාපේක්ෂව වෙනස් කර දියුණු කළ යුතු බව ඔබට පසක්වනු ඇත.

එනයින් ජාතික හරිත පෙරමුණ ලෙස අපි දකින සාර්ථක ශ්‍රී ලංකාවේ පුරවැසියන් හට ලෝක සම්මතයෙන් පිළිගැණුන, තාක්ෂණයෙන් දියුණු, උසස් ගණයේ සෞඛ්‍යය සේවාවක් ලබා දීමට අප සිහින දකින්නෙමු.

සෞඛ්‍යය සේවාවේ දියුණුවට ප්‍රතිසංස්කරණය කළ යුතු අනෙකුත් රාජ්‍ය සේවා.

අතිශයින් ම අකාර්යක්ෂම ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය පරිපාලනය තුළ තවත් එක කොටසක් වන සෞඛ්‍යය සේවය වැඩිදියුණු කිරීමට නම් සෞඛ්‍යය සේවයට පිටතින් ඇති තවත් සේවා දෙකක් ප්‍රතිසංස්කරණය කොට කාර්යක්ෂම කළ යුතුය. ඒවා නම්,

1. අධිකරණය සහ නීතිය
2. රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය

රටක සෞඛ්‍යය ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමට නීතිය නිවැරැදිව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන අධිකරණය පද්ධතියක් තිබීමත්, ජනතාවට එයට අනුගත විය හැකි පහසු ක්‍රමවේදයන් තිබීමත් අත්‍යාවශ්‍ය ය. සෞඛ්‍යය ක්ෂේත්‍රයේ සේවයේ නියැළෙන ව්‍යක්තිකයන්ගේ හා සේවකයන්ගේ වගවීම හා වගකීම ඉහළ දමා ගත හැක්කේ කාර්යක්ෂම ලෙස නීතිය ක්‍රියාත්මක වන වාතාවරණයක් යටතේ පමණකි. එබැවින් නීතියේ පරමාධිපත්‍ය ඇති කිරීමෙන් තොරව සෞඛ්‍යය ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන් උපරිම වගවීමෙන් කටයුතු කිරීම බලාපොරොත්තු විය නොහැකි ය.

සෞඛ්‍යය ක්ෂේත්‍රය ද අත්‍යාවශ්‍ය පොදු සේවයක් බැවින් එය කළමනාකරණය කරනු ලබන්නේ රාජ්‍ය සේවය මගිනි. එබැවින් රාජ්‍යයයේ පරිපාලන ක්‍රමවේදයම සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ආයතන තුළත් පවතියි. එනම්, ශ්‍රී ලංකාවේ මේ වන විට පවතින යල් පැන ගිය රාජ්‍ය පරිපාලන ක්‍රමවේදය තුළ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ආයතන ද සිරවී තිබේ. එහෙත් එම රාජ්‍ය අකාර්යක්ෂමතාවයෙන් වෙන් කොට එක් ක්ෂේත්‍රයක් පමණක් දියුණු කිරීම අපහසු කටයුත්තකි. අප පක්ෂයක් ලෙස රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පූර්ණ වෙනසක් බලාපොරොත්තු වන්නෙමු. රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ ඔස්සේ රජයේ ක්‍රියාත්මක වන ක්‍රමවේදයක් පූර්ණ වෙනසකට භාජනය කොට යාවත්කාලීන වූ වඩා කාර්යක්ෂම රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයක් අප නිර්මාණය කරන්නෙමු. එම රාජ්‍ය පරිපාලන ක්‍රමවේදය යටතේ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ආයතන පිහිටුවීමෙන් මේ වනවිට පවතින පරිපාලන දුර්වලතා සියල්ල මග හරවා ගැනීමට කටයුතු කෙරේ.

සෞඛ්‍යය ක්ෂේත්‍රය තුළ ඇති කළ යුතු සුවිශේෂී පරිවර්තන.

සෞඛ්‍යය ක්ෂේත්‍රය දියුණු කිරීමේදී එය අංග තුනක් ඔස්සේ විස්තර කෙරේ.

1. සෞඛ්‍යය සේවය ලබා දීම
2. සෞඛ්‍යය වෘත්තීය අධ්‍යාපනය
3. සෞඛ්‍යය සම්බන්ධ පරීක්ෂණ සහ සමීක්ෂණ

සෞඛ්‍යය සේවය ලබා දීම

පොදු නිදහස් සෞඛ්‍යය සේවය

ශ්‍රී ලංකාවේ දැනට පවතින නිදහස් සෞඛ්‍යය සේවය එලෙසම මහජන සේවාවක් ලෙස පවත්වා ගෙන යෑමට කටයුතු කෙරෙනු ඇත. අප වෙළෙඳපොළ ආර්ථිකයක් නිර්මාණය කිරීමට කටයුතු කරන්නන් වුව ද සෞඛ්‍යය ක්ෂේත්‍රය යන්න වෙළෙඳපොළට පූර්ණ ලෙස ලබා දීමක් ප්‍රායෝගිකව සිදු වන්නේ නොමැත. එය ලොව පිළිගත් සිද්ධාන්තයක් ලෙස සෞඛ්‍යය යනු රජය විසින් ලබා දිය යුතු පොදු සේවයක් බවට අප පිළිගන්නා අතර එය තව දුරටත් දියුණු කළ වඩාත් කාර්යක්ෂම සෞඛ්‍යය සේවයක් බවට පත් කිරීම අනිවාර්යයයෙන් සිදුවිය යුතු ය.

දැනට පවතින සෞඛ්‍යය සේවාවේ අකාර්යක්ෂමතාවයට බලපා ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ රජය මගින් නිදහස් සෞඛ්‍යයට වෙන් කරන මුදල් ප්‍රමාණවත් නොවීමයි. එනයින් මෙම ක්ෂේත්‍රයේ දුර්වලතා රැසක් හට ගෙන ඇත. කෙටි කාලීන සෞඛ්‍යය සැලැස්මක පළමු පියවර ලෙස සෞඛ්‍යය ක්ෂේත්‍රයට වෙන් කරන මුදල් ප්‍රමාණය ඉහළ දැමීමට කටයුතු කරන අතර, දියුණුවන රටක ක්‍රමිකව ඉහළ යන රාජ්‍ය ආදායමෙන් එම පිරිවැය දරා ගැනීමට බලාපොරොත්තු වෙයි.

පුද්ගලික සෞඛ්‍යය සේවය

ශ්‍රී ලංකාවේ දැනටමත් පුද්ගලික සෞඛ්‍යය සේවය ඉතා ප්‍රචලිත වී තිබේ. විශාල පුද්ගලික රෝහල් ජාලයකින් ද ඩිස්පෙන්සරි සහ කුඩා ප්‍රමාණයේ සෞඛ්‍යය සැපයුම් සේවා ද රටේ සෑම තැනකම පාහේ දක්නට ලැබේ. එම ආයතනවලින් රටේ සමස්ත සෞඛ්‍යය ක්ෂේත්‍රයට ලැබෙන දායකත්වය ඉතා විශාල වෙයි. එනයින් එම ක්ෂේත්‍රයේ දියුණුව ද

සැලකිල්ලට ගෙන රටේ ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම රජයක වගකීම වෙයි.

ඉහතින් සඳහන් කළ නීතියේ පරමාධිපත්‍ය ඇති කිරීමේ හා රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණවලින් පුද්ගලික සෞඛ්‍යය සේවාවන්හී ද කාර්යක්ෂමතාව හා සේවා ගුණාත්මකභාවය ඉහළ යෑම බලාපොරොත්තු විය හැකිය.

එහෙත් විශේෂ විධිවිධාන සහිත නව පනතක් මගින් පුද්ගලික රෝහල් හා සෞඛ්‍යය සපයන ආයතන නිසිලෙස ලෝක සම්මතයට අනුකූලව පවත්වා ගෙන යෑම නියාමනය කිරීමට සිදු කෙරෙනු ඇත. එමගින් එම ආයතන වලින් සපයන සේවා සෞඛ්‍යය අමාත්‍යාංශය යටතේ වෙන ම ඒකකයක් වෙත පැවරෙන අතර, ලබා දෙන සේවා වල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීමත්, අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව තරගකාරී මිල ගණන් යටතේ සේවා පවත්වාගෙන යෑමත් ඉන් නිසි ලෙස නියාමනය කිරීම සිදුවේ.

පොදු සේවයේ සැකැස්ම

දැනට පවතින රෝහල් වර්ගකිරීමේ ක්‍රමය දැන් පැරණි ය. රටෙහි ප්‍රවාහනය, මාර්ග සංවර්ධනය, සන්නිවේදනය සහ ජනතාවගේ දැනුම හා හැකියාවන් වෙනස් වීම ඔස්සේ පුළුල් වී තිබේ. එනයින් දශක ගණනාවකට පෙර රටේ රෝහල් වර්ගීකරණය සහ බෙදී යෑම සකස් කර ඇති පිළිවෙල වෙනස් කළ යුතු බව අපගේ අදහසයි.

1. දැනට පවතින රෝහල් සංවිධානය වී ඇති ව්‍යුහය වෙනස් කොට ජාතික රෝහල් මට්ටමේ සියලු පහසුකම් සහිත රෝහල් රටේ සෑම ප්‍රධාන පළාතක ම ඇති කිරීමට බලාපොරොත්තු වෙමු. දැනට පවතින කොළඹ සහ මහනුවර ජාතික රෝහල්වලට අමතරව කුරුණෑගල, අනුරාධපුරය, යාපනය, අම්පාර, ගාල්ල, රත්නපුර, මාතර ද ජාතික රෝහල් බවට පත් කොට සියලුම විශේෂඥ සේවා, යටිතල පහසුකම් සහ තාක්ෂණික පහසුකම් සහිත අංග සම්පූර්ණ රෝහල් බවට පත් කෙරේ.

2. දැනට පවතින මූලික රෝහල්වල කාර්යභාරයන් අඩුකර ඒවායේ ලබා දෙන සේවාවන් යළි විමර්ශනය කර, එම සේවාවන් හැකිතාක් දුරට ජාතික රෝහල් වෙත අනුයුක්ත කිරීමට බලාපොරොත්තු වේ.

3. වෙනත් කුඩා රෝහල් ලබා දෙන සේවා විශ්ලේෂණය කොට ඒවායේ සේවා බාහිර රෝගී සහ සායන බවට පරිවර්තනය කොට, නේවාසික සේවා හැකි අයුරින් විශාල රෝහල් වෙත අනුයුක්ත කෙරේ.

4. ඒත් සමගම වඩාත් කාර්යක්ෂම ගිලන් රථ සේවාවක් මගින් ප්‍රධාන රෝහල් වෙත රෝගීන් ප්‍රවාහනය කෙරෙන යාන්ත්‍රණයක් නිර්මාණය කර, රෝගීන්ගේ ගලා යෑම කාර්යක්ෂම කෙරේ.

5. සුවසැරිය ගිලන් රථ සේවාව පුළුල් කර සියලුම නගරවල වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යා හැකි සේවාවක් බවට එය පත් කෙරේ.

6. නව රෝහල් පරිපාලනයට සෞඛ්‍යය පරිපාලනය මෙන්ම විශේෂඥ වෛද්‍යවරුන් අතර මනා සම්බන්ධතාවයක් ඇති කරවන යාන්ත්‍රණයක් බිහි කෙරේ. සෑම රෝහලකටම එම රෝහලේ සේවය කරන විශේෂඥ වෛද්‍යවරුන් අතරින් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ගනු ලබන අතර, රෝගීන් සහ සේවා සම්බන්ධ සායනික තීන්දු තීරණ එම අධ්‍යක්ෂක මණ්ඩලය මගින් ගැනීමට කටයුතු කෙරේ. එම වෛද්‍ය අධ්‍යක්ෂක මණ්ඩලය රෝහලේ ප්‍රධාන ප්‍රතිපත්ති තීරකයා වන අතර, රෝහල් පරිපාලනය පිළිබඳව විශේෂඥ වෛද්‍යවරයෙකු එහි කළමනාකරණ අධ්‍යක්ෂකවරයා ලෙස පත් කෙරේ. සියලු ම රෝහල් වෙත සිය වෛද්‍ය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පාලනය වන ස්වාධීනත්වයක් පිරිනැමේ. එහෙත් සෞඛ්‍යය අමාත්‍යාංශය මගින් රෝහල් නියාමනයට හා අධීක්ෂණයට ලක් කෙරේ.

7. අවයව බද්ධය පිළිබඳව ඇති නීතිරීති යාවත්කාලීන කෙරෙන අතර, එම ශල්‍යකර්ම සඳහා ම සුවිශේෂී අලුත් ප්‍රධාන රෝහල් 02 ක් ඇති කිරීමට කටයුතු කෙරේ. එමගින් අවයව සොයා ගැනීම වඩාත් කාර්යක්ෂම සහ වඩාත් හොඳින් සම්බන්ධීකරණය වූ සේවාවක් බවටත්, එවන් බරපතළ රෝගීන්ට අවශ්‍ය සුවිශේෂී රැකවරණය ලබා දීමටත් කටයුතු කෙරේ.
8. සියලු ම මූලික සහ ජාතික රෝහල්වල ප්‍රමාණවත් හදිසි අනතුරු සහ හදිසි රෝග සේවා සඳහා ඇති අංශ පුළුල් කරවනු ලැබේ. ප්‍රධාන රෝහල් වෙතින් බාහිර රෝගී අංශ ඉවත් කරනු ලබන අතර, ඒවා ප්‍රාදේශීයව ඇති කුඩා රෝහල් සහ සායන මාර්ගයෙන්

ලබා දෙනු ලැබේ. එම කුඩා රෝහල් සහ සායන දීර්ඝකාලීන ක්‍රමයකට බහුවිධ සායන හෙවත් polycyclic ජාලයක් බවට පත් කරනු ලැබේ. රෝහල් වලින් සේවා ලබා ගැනීමෙන් අනතුරුව සිදුවන පසු සායන පරීක්ෂා කිරීම්, සහ MOH සායන හරහා ලබා දෙන සියලු ම සායනික සේවා මෙම polycyclic යටතට පත් කෙරේ.

9. දිවයිනේ දැනට පවතින වෛද්‍යවරුන් පුද්ගලිකව කරගෙන යනු ලබන ඩිස්පෙන්සරි සහ සායන ලියාපදිංචි කර ඒවායේ ගුණාත්මකභාවය තහවුරු කරවන නියාමනයකට ලක් කෙරේ. එම සේවා පුද්ගලික සේවා ලෙසට ම පවත්වා ගෙන යන අතර, එම බාහිර වෛද්‍යවරුන් හට වෘත්තීය පවුලේ වෛද්‍යවරුන් වීමට අවශ්‍ය වෘත්තීය ගමන් මග, පුහුණුව සහ ඉහළ අධ්‍යාපනය සකස් කෙරේ. එම සායන පොදු හා පුද්ගලික රෝහල් සමග යා කරමින් රෝගීන්ට ඒවා අතර ගලා යමින් සිය සේවා ලබා ගත හැකි සබඳතාවයන් සහිත සෞඛ්‍යය සේවා ජාලයක් නිර්මාණය කෙරේ.

10. සියලුම රෝහල් වෙත සේවා ඩිජිටල්කරණය කරවන e Governance යාන්ත්‍රණයක් නිර්මාණය කෙරේ. එය අදියර කීයපයකින් සේවයට අනුයුක්ත කෙරෙන අතර, සම්පූර්ණ රෝහල් පද්ධතියම එම ඩිජිටල්කරණ පද්ධතිය තුළට ලබා ගැනීමට පියවරෙන් පියවර කටයුතු කෙරේ. දීර්ඝකාලීනව නිසි සංවර්ධනය සමගින් නුදුරු අනාගතයේදී එය සියලු ම රජයේ රෝහල් සඳහා වන ජාලයක් දක්වාත්, අනතුරුව ජාතික මට්ටමේ පොදු/පෞද්ගලික ඒකාබද්ධ ජාලයක් ලෙසත් නිර්මාණය කිරීමට කටයුතු කෙරේ. එවිට සියලු ම පුරවැසියන්ගේ සෞඛ්‍යය වාර්තා එකම දත්ත ගබඩාවක් ඔස්සේ රටේ ඕනෑම සෞඛ්‍යය සේවාවක සිට ලබා ගැනීමටත්, ඒ අනුව රෝග පිළිබඳව තීන්දු තීරණ ගැනීමටත් පහසු ක්‍රමවේදයන් සකස් කෙරේ.

11. වෛද්‍ය කවුන්සිලය හා එක්ව වෛද්‍යවරුන් හා හෙදියන් හට අඛණ්ඩ වෙද/හෙද අධ්‍යාපනයක් ලබා ගැනීමේ වාර්ෂික ලකුණු ලබා ගැනීමේ ක්‍රමයක් හෙවත් Continuing Medical Education ක්‍රමයක් දියත් කෙරේ. ඒ අනුව සිය ලියාපදිංචිය වසර දෙකෙන් දෙකට යාවත්කාලීන කිරීමට පෙර එම ලකුණු ලබා ගැනීම ඔවුන් කළ යුතු වෙයි. එමගින් එම ක්ෂේත්‍රවල දැනුම යාවත්කාලීන වීම අපේක්ෂා කෙරේ.

12. රටේ ප්‍රධාන නගරවලින් ඈත දුෂ්කරතා සහිත ප්‍රදේශවල සේවය කරන සෞඛ්‍යය කාර්යමණ්ඩල වලට අමතර දිරි දීමනා ලැබෙන වැටුප් ක්‍රමයක් සකස් කෙරේ. එම දිරි දීමනා තුළින් රටේ සෑම ස්ථානයකම හොඳ සේවාවක් පවත්වා ගෙන යෑමට සෞඛ්‍යය කාර්යමණ්ඩලය ධෛර්යමත් කෙරේ.

13. සෞඛ්‍යය ක්ෂේත්‍රයේ වැටුප් අක්‍රමිකතා ඉවත් කොට නව වැටුප් ක්‍රමයක් නිර්මාණය කිරීමට කටයුතු කෙරේ. එමගින් සෞඛ්‍යය කාර්යමණ්ඩලය වෙත ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් මත නිර්ණය වන වැඩිදියුණු කළ නව වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. එමගින් සෞඛ්‍යය ක්ෂේත්‍රයේ සියලුම සේවා අංශවල ආදායම් ඉහළ නැංවීමට බලාපොරොත්තු වෙයි.

14. රජයේ රෝහල් තුළ ගෙවන වාට්ටු ක්‍රමයක් ඇති කෙරේ. එහි කළමනාකරණයට වෙනම කළමනාකරණයක් පත් කරනු ලබන අතර, එය ද ඉහතින් කී වෛද්‍ය අධ්‍යක්ෂක මණ්ඩලයේ මගින් නියාමනය කෙරේ. එම සේවාව පුද්ගලික අංශය සමග තරඟකාරීව පවත්වා ගෙන යෑමටත් ගුණාත්මක සේවාවක් ලබා දීමටත් වඩාත් සාර්ථක ක්‍රමවේදයන් සකස් කෙරේ.

ඖෂධ නිෂ්පාදනය සහ නියාමනය

- ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය ප්‍රචලිත කෙරේ. දේශීයව නිෂ්පාදනය කරගත හැකි සියලුම ඖෂධ හා උපකරණ දේශීයව ලබා ගැනීමට ප්‍රමුඛතාවක් ලබා දේ.

- විදේශයෙන් ගෙන්වන සියලුම ඖෂධවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට ශක්තිමත් යාන්ත්‍රණයන් ස්ථාපිත කෙරේ.

- ඖෂධ මිලදී ගැනීමේ ක්‍රියාවලිය විවෘත හා පාරදෘශ්‍ය ක්‍රමවේදයක් ඔස්සේ සිදු කෙරෙන අතර වංචා හා දූෂණ වළක්වා ගැනීමට ක්‍රියා කෙරේ.

- සියලුම ඖෂධ තොග පාලනයට ඩිජිටල්කරණය වූ ක්‍රමවේදයක් යොදා ගනේ. එමගින් වඩාත් යහපත් වගවීමේ හා වගකීමේ ක්‍රමයන් ඇති කෙරේ. සෞඛ්‍යය අමාත්‍යාංශයේ පටන් රෝහල

දක්වා එකම මාර්ගගත ජාල ක්‍රමයකට ඖෂධ නිකුත් කිරීම් ක්‍රමවත් කෙරේ.

- නීතියේ පරමාධිපත්‍ය ද නව රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ ද එක්වූ කල මෙම දූෂිත ක්ෂේත්‍රය ඉක්මනින් පිරිසිදු කර ගැනීමේ හැකියාව ලැබේ. එවිට රෝගීන් වෙනුවෙන් වඩාත් යහපත් සේවාවක් ලබා දීමට අවශ්‍ය අරමුදල් තවත් ශක්තිමත්ව ලැබෙනු ඇත.

සෞඛ්‍යය වෘත්තීය අධ්‍යාපනය

වෛද්‍ය, දන්ත වෛද්‍ය, හෙද, ඖෂධවේද සහ අනෙකුත් තාක්ෂණික සෞඛ්‍යය සේවා අධ්‍යාපනය අන්තර්ජාතිකව පිළිගත් උසස් සම්මතයෙන් කරගෙන යෑමට නියාමනයන් සකස් කෙරේ.

එම සේවා සඳහා රාජ්‍යය අංශයේ මෙන්ම පුද්ගලික අංශයේ සහභාගිත්වය ලබා ගන්නා අතර, වෛද්‍ය කවුන්සිලය, වෛද්‍ය සංගමය පශ්චාත් වෛද්‍ය ආයතනයේ පොදු එකඟතාවය සහ සහභාගිත්වය මත පොදු නියාමනයක් ක්‍රියාත්මක කිරීමටත්, එම ආයතනවල ගුණාත්මකභාවය තහවුරු කිරීමටත් විධිවිධාන සකස් කරනු ලැබේ. රටේ සෞඛ්‍යය ක්ෂේත්‍රය ගුණාත්මකභාවයෙන් කරගෙන යෑමට නම් එහි නියැලෙන වෘත්තීකයන් මෙන්ම තාක්ෂණික ශිල්පීන් උසස් ගණයේ අධ්‍යාපනයක් ලබා තිබීම අත්‍යාවශ්‍ය කරුණක් බැවින්, රටේ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ප්‍රගමනයට අවශ්‍ය මානව සම්පත රට තුළින් නිර්මාණය කර ගැනීමට රටේ අධ්‍යාපන ක්‍රමය සකස් කෙරේ. රටේ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ අනාගත මානව අවශ්‍යතාවය ගණනය කර එයට ගැළපෙන අයුරින් පුහුණු වෘත්තිකයන් සහ ශ්‍රමිකයන් නිර්මාණය කර ගැනීමට පහසුකම් සකස් කෙරේ.

වෛද්‍ය පර්යේෂණ සහ සමීක්ෂණ

රටක සෞඛ්‍යය සේවය ගුණාත්මකව පවත්වා ගෙන යෑමට නම් මීළඟට අත්‍යාවශ්‍ය පද්ධතියක් වන්නේ වෛද්‍ය පර්යේෂණ සහ සමීක්ෂණයි. රටේ පුරවැසියන්ගේ සෞඛ්‍යය තත්ත්වය නිරන්තරයෙන් වෙනස්වන්නක් වන අතර නව අභියෝග පැමිණෙන බැවින් ඒවා පිළිබඳව නිසි ලෙස පරීක්ෂණ පවත්වා නිවැරදි ප්‍රතිකාර ක්‍රම සොයා ගැනීමත්, අලුත් රෝග හඳුනාගෙන ඒවා සුවකළ හැකි ක්‍රම වේදයන් සංවර්ධනය කිරීමත් අත්‍යාවශ්‍ය වෙයි. වෛද්‍ය පර්යේෂණ වලින් ගොඩනගනු ලබන විද්‍යාත්මක සාධක මත නිර්මාණය වූ මාර්ගෝපදේශ සකස් කිරීමත් ඒවාට අනුගතව රෝගී ප්‍රතිකාර කරගෙන යාමත් රටකට අත්‍යාවශ්‍ය ය.

එනයින් අප දකින නූතන සෞඛ්‍යය ක්ෂේත්‍රයට පර්යේෂණ සහ අලුත් දැනුම සොයා යෑමට වැඩි අවකාශයක් තිබිය යුතුය. එනයින් වෛද්‍ය පීඨ සහ අනෙකුත් තාක්ෂණික විද්‍යාල තුළ වඩාත් හොඳින් මේ පර්යේෂණ පවත්වාගෙන යෑම සඳහා ප්‍රමාණවත් අරමුදලක් නිර්මාණය කරන අතර, එම ආයතනවලට වැඩි වශයෙන් පර්යේෂණ කිරීම සඳහා දිරි ගැන්වීම් සිදු කෙරේ.

දේශීය ආයුර්වේද ක්‍රම සහ රෝහල්

1. දේශීය ආයුර්වේද වෛද්‍ය පීඨ වෙතින් උපාධි ලබා පිටවී යන සියලුම ආයුර්වේද වෛද්‍යවරුන්ද බටහිර වෛද්‍යවරු මෙන් රැකියා සඳහා සෘජුවම බඳවා ගෙන සීමා වාසික පුහුණුව ලබා ගැනීමට යොමු කෙරේ.

2. රට පුරා ඇති ආයුර්වේද රෝහල් යාවත්කාලීන කර නව පහසුකම් සමගින් වඩාත් ජනතාවට ප්‍රියමනාප තැන් බවට පත් කෙරේ.

3. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව තෝරා ගන්නා රෝගී පුරවැසියන් හට එම රෝහල් තුළ පහසුකම් සකස් කෙරේ.

4. ඔසු උයන් ඇති කිරීමත්, ඔසු වගාව ව්‍යාප්ත කර, ඔසු ශාක සංරක්ෂණය කිරීමත් සැළසුම් කෙරේ.

5. දේශීය ඖෂධ නිෂ්පාදනය ප්‍රචලිත කර ඒවා මගින් විදේශ වෙළෙඳපොල සොයා ගැනීමේ උපක්‍රම සොයා බැලේ.

6. එලෙසම ලෝක Wellness වෙළෙඳපොළ ජය ගැනීමටත්, සංචාරකයන් හට ඒවා අලෙවි කිරීමටත් රාජ්‍ය අනුග්‍රහය සහිත වැඩපිළිවෙලක් සකස් කෙරේ.

අනෙකුත් සෞඛ්‍යය සේවා සහ ප්‍රතිකාර ක්‍රම.

1. හෝමියෝපති, යුනානි, කයිරොපැක්ටර් ආදී වෙනත් ප්‍රතිකාර ක්‍රමවලට පුරවැසියන් යොමුවීමට අවශ්‍ය නම් ඔවුනට ඒවා තෝරා ගැනීමේ නිදහස තිබේ. එහෙත් නීත්‍යානුකූල ලෙස රෝගී බවට සහතික කිරීම හෝ නීතිමය කටයුත්තක් වෙනුවෙන් භාවිතා කිරීමට රජයේ සාමාන්‍ය රෝහලකින් පිළිගත් සම්මතයන් අනුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වෙයි.

2. එම වෙනත් සායනික සේවා නියාමනය කිරීම, ගුණාත්මකභාවය පවත්වාගෙන යෑම රජයේ වගකීමක් වන බැවින් එම ආයතන විශේෂ විධිවිධාන මගින් පාලනය කිරීම අත්‍යාවශ්‍ය වෙයි.

3. ඒ පිළිබඳව පොදු වැඩපිළිවෙලක් සකස් කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වන්නෙමු.

කෘෂි කර්මාන්තය සහ වාරිමාර්ග

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් යැයි අපේ ජන සමාජය තුළ ප්‍රභල මතයක් ඇති බව අපි හැමෝම දන්නා කරුණකි. සාර්ථක අතීත ශිෂ්ඨාචාරයකින් හෙබි ඉතිහාසයකින් ද ඒ ඔස්සේ ගොඩනැගුණු වාරිමාර්ග පද්ධතියකින් ද සමන්විත, සංස්කෘතිය සමග බැඳුණු මේ රටේ පැවති ප්‍රධානම කර්මාන්තය වූයේ කෘෂි කර්මාන්තය බව අප අවිවාදයෙන් පිළිගත යුතුව තිබේ. මේ රටේ ජනයා ඉතිහාසය තුළ සාර්ථක වූ කර්මාන්තයක් වූයේද, ඒ ඉතිහාසයම බතින් බුලතින් සශ්‍රීක කිරීමට පදනම සැපයූයේද කෘෂි කර්මාන්තයමය. එනයින් කෘෂි කර්මාන්තය වනාහි ගහට පොත්ත මෙන් ශ්‍රී ලාංකීය ජන ජීවිතය හා බැඳී මෙතෙක් නොනැසී ඇති එකම කර්මාන්තය යි.

එම කර්මාන්තය අදටත් ග්‍රාමීයව ජීවත් වන ජනයාගෙන් 25% කට ආසන්න සංඛ්‍යාවක් රැකියාව සඳහා තෝරා ගෙන තිබේ. එම කර්මාන්තය මේ රටේ දැවැන්ත ම රැකියා සපයන්නා සේම භූමියෙන් වැඩි ම ඉඩක් යොදා ගන්නා ද වෙයි. මේ සියල්ල යෙදවුම් ලෙස යොදාගත්ත ද කෘෂි කර්මාන්තය මගින් රටේ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන්නේ 8% කටත් වඩා අඩු අගයකි. එහි සෘජු තේරුම නම් රට තුළ එම කර්මාන්තය වර්තමානය වන විට පවතින්නේ ඉතා අසාර්ථක හා අකාර්යක්ෂම තත්ත්වයක බවයි. එසේ නම් ඉන් කියැවෙන්නේ අපි ජාතියක් ලෙස සංස්කෘතිකමය වශයෙන් පාරම්පරිකව බැඳී තිබෙන කර්මාන්තය ද රටේ අනෙකුත් ක්ෂේත්‍ර මෙන්ම යාවත්කාලීන කොට දියුණුවකට ලක් කොට නොමැති බවයි. එම නිසා මේ රට සංවර්ධනය කරා රැගෙන යන පාලනයක ප්‍රමුඛ රාජකාරියක් ලෙස කෘෂි කර්මාන්තය ගොඩ නැංවීම හඳුන්වා දීමට හැකි ය. එම වගකීම නිවැරදිව හඳුනාගෙන සිටින අප මේ දිවයිනේ ජීවනාලිය වන් කෘෂි කර්මාන්තය වඩාත් විද්‍යාත්මක හා දියුණු කර්මාන්තයක් බවට පත් කිරීමට කටයුතු කරන්නෙමු.

සාරවත් පොළොවකින් ද වර්ෂය පුරා හිරු එළිය ලැබෙන සමකාසන්න ගෝලීය පිහිටීමකින් ද වසරේ දෙවාරයකට වැස්ස ලැබෙන මෝසම් වැහි රටාවකින් ද ඒ වැහි රට පුරා ගලා යන ගංගා හා ඔය 106 කින් ද ඒ ජලය රැස් කොට තබා ගෙන පාලනයකින් යුතුව නිකුත් කරනා මුතුන් මිත්තන් තැනූ වාරිමාර්ග හා වැව් අමුණු පද්ධතියකින් ද පොහොසත් වූ මේ පුංචි රට කෘෂි කාර්මිකව දියුණු කිරීම යනු එතරම් අපහසු කටයුත්තක් නොවේ. කාන්තාර වගා කොට ආහාර අපනයනය කිරීමට තරම් තාක්ෂණය දියුණු මේ යුගයේ අප සතු ස්වාභාවික සම්පත් කාර්යක්ෂමව යොදාගැනීමට අප අසමත් නම් එය මේ යුගයේ රටේ පාලනය භාරව ඉන්නා මිනිසුන්ගේ අසමත්කම මිසක පුරවැසියන්ගේ කරුමයක් නොවේ. එබැවින් අප

නොබියව වෙනස් විය යුතුය. මේ පාලන තන්ත්‍රය වෙනස් කරගෙන එය වෙනස් කළ හැකි ඉදිරි දැක්මක් සහිතව නව පාලනයක් ඇතිකර ගැනීමට පුරවැසියන් කටයුතු කළ යුතුය. එවන් වූ නව නායකයින්ගෙන් සැදුම්ලත් නව පාලනයක් මගින් මේ රට වෙනස් කිරීමට කටයුතු කරන මාර්ගය අපි ඔබට මෙසේ පැහැදිලි කරන්නෙමු.

කාලයක් තිස්සේ ජනතාවට බියක් ඇති කරමින් තිබූ බොරු මිත්‍යා විශ්වාසයක් නම්, රට සංවර්ධනය වන විට හා දියුණු වන විට රටේ පාරම්පරික කෘෂි කර්මාන්තය නැසී යා හැකි යැයි සිතන බියයි. එහෙත් ලොව සංවර්ධනය වූද කාර්මීකරණය වූද කිසිදු රටක් කෘෂි කර්මාන්තය අත හැර නොමැත. ඒ රටවල සිදුවූයේ ඔවුන් ලබාගත් දියුණුවේම අනුහසින් විද්‍යාවේ හා තාක්ෂණයේ භාවිතයෙන් කෘෂිකර්මාන්තය ද වඩාත් දියුණු නිෂ්පාදන කර්මාන්තයක් බවට පරිණාමය වීමයි. මිනිසුන් දියුණුයි යනු හොඳින් පෝෂණය ලබා ආහාර ප්‍රමාණවත්ව අනුභවකර ජීවිතයේ රසය විඳීමට යොමුවන තත්ත්වයකි. එසේ නම් එම ජනතාවට පරිභෝජනය සඳහා මෙන්ම ඉහළ යන ජනගහනයට ආහාර සැපයීමට කෘෂිකර්මාන්තය දියුණු කිරීම ඕනෑම රටක වගකීමකි. එමෙන්ම එම රටේ අනෙකුත් කර්මාන්තවලට අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරගැනීම පිණිස ද විවිධ වගාවන් පවත්වාගෙන යෑමට සිදුවේ. මේ සියල්ල හේතු කොට ගෙන රටක ප්‍රධානම නිෂ්පාදන කර්මාන්තයක් ලෙස කෘෂිකර්මාන්තය දියුණු කිරීම සිදු වෙයි. එනයින්, රට දියුණු වී සංවර්ධනය කිරීම තුළ මූලිකව කෘෂිකර්මාන්තය දියුණු කිරීම මිසක එය අත්හැර දැමීමක් සිදු නොවේ.

නූතන දියුණු රාජ්‍යයක් වන ඊශ්‍රායලය කාන්තාරයක් වෙද්දී එහි දියුණුවට සාපේක්ෂව කෘෂි කර්මාන්තය දියුණු වී තිබීම ම මෙයට උදාහරණයකි. එහි ජනාධිපතිව සිටි සිමෙන් පෙරෙස් වරක ප්‍රකාශ කර සිටියේ කෘෂිකර්මාන්තය යනු 95% ක් විද්‍යාව බවත්, ඉතිරිය ශ්‍රමය බවත් ය. එහි තේරුම නම් විද්‍යාව හා තාක්ෂණය යොදා නොගෙන රටක කෘෂි කර්මාන්තය ගොඩනැගීමක් සිදු නොවන බව ඔහු පෙන්වා දුන්නේ ය. ඒ වගේම ලෝක අධිරාජ්‍යයන් වන බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව හා චීනය දෙස බැලුව ද, ලෝකයේ අධික ආදායම් ලබන දියුණු රාජ්‍යයන් දෙස බැලුව ද ඒ සියලු ම රාජ්‍යයන් කෘෂි කර්මාන්තය දියුණු කොට සිය රටේ ජනතාවට ආහාර සැපයුම සුරක්ෂිත කොට දී තිබේ. එනයින්, අප සිටින මිත්‍යා විශ්වාසවලින් එළියට පැමිණීමට කාලය උදා වී තිබේ. අපි අපේ රට කෘෂිකාර්මිකව දියුණු රටක් බවට පත් කරමු.

රටේ කෘෂිකර්මාන්තයේ දියුණුව සෘජුව ම රටේ සංවර්ධනයට හේතු වන අතර, ආර්ථික වර්ධනයක් අත් කර ගැනීමට ද හේතු වෙයි. එමගින් දළ දේශීය නිෂ්පාදනය ඉහළ නංවා ගැනීම රටේ සමස්ත සංවර්ධනයට හේතු

වේ. රැකියා සපයන නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස ද, අපනයනය ඉලක්ක කරන රටේ නිෂ්පාදනයක් ලෙස ද, ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ පොදු පියවරක් ලෙස ද, අනෙකුත් කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය නිෂ්පාදනයක් ලෙස ද, ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩ නැංවීමේ පියවරක් ලෙස ද කෘෂිකර්මාන්තය යනු අපි පුළුල්ව ගොඩනැංවිය යුතු ක්ෂේත්‍රයකි.

කෘෂිකර්මාන්තය තිරසාර ලෙස දියුණු කිරීමේ ප්‍රයත්නයක දී එය පැහැදිළි ලෙස කොටස් කර වෙන්කර ගැනීම සාර්ථක ප්‍රතිපත්තියකට අඩිතාලම දමයි. ඒ අනුව ජාතික හරිත පෙරමුණේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මූලික කොටස් 5 ක් ඔස්සේ ඔබට ඉදිරිපත් කෙරේ.

1. ඉඩම් ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ

a) ශ්‍රී ලංකාව වෙනුවෙන් අප නිර්මාණය කරනු ලබන Blueprint සැලසුමට අනුව ශ්‍රී ලංකාවේ භූමියෙන් කෘෂිකාර්මික භූමි ප්‍රමාණය වෙන්කර ගැනේ. රටේ ආහාර අවශ්‍යතාවය මෙන් ම අපනයන ඉලක්ක සලකා බලා, ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියට අනුකූලව රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් මේ රටෙන් කොපමණ භූමියක් වගා කළ යුතු දැයි ගණනය කොට, ඒ භූමිය කෘෂිකර්මාන්තය වෙනුවෙන් උපරිමයෙන් කැප කිරීමට විධිවිධාන සකස් කෙරේ. මේ රටේ වගාකළ හැකි භූමිය සංගණනය කොට, එම ඉඩම් විද්‍යාත්මකව කෘෂිකර්මාන්තය වෙනුවෙන් යොදවා ගැනීමේ වැඩපිළිවෙලක් ඇරඹේ.

b) එම ඉඩම්වල දැනට පවතින අයිතීන් යාවත්කාලීන කොට, ඒවා ගොවීන් හට නීත්‍යානුකූලව ලබාදීම සිදුකළ යුතුය. සාර්ථක වෙළෙඳපොළ ආර්ථිකයක පැහැදිළිව දක්නට ලැබෙන ලක්ෂණයක් නම් දේපළ අයිතිය පැහැදිළිව නිර්ණය කර තිබීමයි. එහෙත් ලංකාවේ ඉඩම් යනු නිවැරදිව ජනතාව අතර බෙදී නොගිය සම්පතකි. රාජාණ්ඩු ක්‍රමය යටතේ රාජකීයන් හා ප්‍රභූන්ටද, යටත්විජිතකරණය යටතේ අධිරාජ්‍යවාදීන්ටද , අනතුරුව ගත වූ වසර 75 තුළ රජය සහ ව්‍යාපාරික වැවිලිකරුවන්ට ද ලෙස පැළැන්තියකට හිමිවූ ඉඩම් අයිතිය, දැන්වත් නිදහස් ශ්‍රී ලංකාවේ පුරවැසියන් අතරට සාධාරණව ලැබිය යුතුය. එනයින් වගා කරන කෘෂි

කාර්මික ඉඩම්වල අයිතිය එම ගොවියන් සතු වීම ඉතා අත්‍යාවශ්‍යය. වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ මිනිසුන් ධෛර්යමත් වන්නේ සිය පුද්ගලික ප්‍රතිලාභ වලින් බැවින්, ඉඩමේ අයිතිය ඔවුන්ට තිබේ නම්, ඔවුන් එම ඉඩම් වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීමට ස්වාභාවික උනන්දුවක් ඇතිවේ. එවිට සාර්ථක ලෙස ඉඩම වගා කිරීමට ඔවුන් උත්සාහ කරන අතර ඒ ඔස්සේ අස්වනු ඉහළ යෑම බලාපොරොත්තු විය හැකිය.

c) මෙහි ඊළඟ වැදගත් ම කරුණ නම් මේ ඉඩම් වගා කිරීම සඳහා දමා තියෙන කොන්දේසි ඉවත් කිරීමයි. නිදහස් වෙළෙඳපොළක් තුළ රාජ්‍ය නියාමනය අවමව යොදා ගැනීම බොහෝ ක්ෂේත්‍ර වල දියුණුවට හේතු වන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ද එය එසේමය. දැනට පවතින පැරණි නීති ඉවත් කොට, ගොඩ මඩ ඉඩම් ගොවියන්ගේ සිතැඟි පරිදි වගා කිරීමට ඉඩ ලබා දීම හෙවත් ඉඩම් අධිපාලනයෙන් රජය ඉවත් වීම අත්‍යාවශ්‍ය ය. නූතන වෙළෙඳපොළ තුළ ගොවීන් හට ද සිය ඉඩමේ ලාභ උපයා ගැනීම, වඩාත් ලාභදායීම කර්මාන්තය කර ගැනීම, වඩාත් ලාභදායීම බෝගය වගා කිරීම, හා තම ඉඩම වඩාත් ලාභදායීම කර්මාන්තය වෙනුවෙන් යෙදවීම කියන ආර්ථික නිදහස හිමි විය යුතුය. (Land Liberalization)

d) ඉඩම් කුඩා වීම අවම කරගැනීම සහ කැඩුණු ඉඩම් යළි එක් කිරීම.

ශ්‍රී ලංකාවේ වගා ඉඩම්වල ඇති විශාල අර්බුදයක් නම් පරම්පරාවෙන් ඉඩම් කුඩා වී යාමයි. ඉඩම් කුඩා වන විට ඒවා වගා කරමින් පවුලක් රැකීමට තරම් ප්‍රමාණවත් නොවන විට වෘත්තීය ගොවියන් ගොවිතැනින් ඈත් වන අතර, එවිට ගොවිතැනේ ඵලදායීතාවය අඩු වෙයි. බොහෝ විට ඉඩම් පුරන් වී යෑමත් මෙහි ප්‍රතිඵලයකි. වඩාත් වාසිදායක වන්නේ ඉඩම් විශාල වීමත්, ඒවා ශ්‍රමය අඩු කර ගෙන යන්ත්‍ර සූත්‍ර මගින් අස්වැද්දීමත් ය. එනයින් පරම්පරාවෙන් ඉඩම් කුඩා වීම අවම කර ගැනීමත්, දැනට එසේ කුඩා වී ඇති ඉඩම් හැකි පමණ යළිත් එක් කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම අත්‍යාවශ්‍ය ය. ඒ සඳහා විශේෂ කමිටුවක් පත් කර විශේෂ අවධානයක් යොමු කොට නව වැඩපිළිවෙලක් සකස් කෙරේ.

e) කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය සතු අත්‍යවශ්‍ය ඉඩම් හැරුණු කොට පවතින අතිරික්ත ඉඩම් පුද්ගලික ගොවියන් හෝ වගාකරුවන් වෙත නිකුත් කෙරේ. ඉඩම් කාර්යක්ෂමව භාවිතා කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත, රජයේ කටයුතුවලට අවශ්‍ය ඉඩම් සොයා බලා, විශේෂ කමිටුවක් මගින් නිර්ණය කොට, අනෙකුත් ඉඩම් නිර්දේශයන් මත වෙළෙඳපොල ඔස්සේ ප්‍රසිද්ධ වෙන්දේසි කිරීම් මගින් වගාකරුවන්ට සහ පුරවැසියන් හට නිකුත් කෙරේ.

2. පස

a) පසේ සජීවී ගුණය ආරක්ෂා කර ගැනීම.

ශ්‍රී ලංකාවේ පස වගාවට ඉතා සුදුසු සරු පසක් ලෙස අප අතර පිළිගත් මතයකි. එහෙත් දීර්ඝකාලීන අවිධිමත් වගාක්‍රම වලට හසු වීම නිසා පස මුඩු වීම, අධික පොහොර හා කෘෂි රසායන භාවිතය නිසා පසේ ඇති සජීවී කාබනික සංඝටක ක්ෂය වී යෑම, වැසිවලට සෘජුව ම නිරාවරණය වීම නිසා මතු පිට පස සෝදා යෑම ආදීය නිසා වගා බිම්වල පස නිරන්තරයෙන් නිසරු වීමකට ලක්වෙයි. කාලයත් සමග වඩාත් අක්‍රමවත් කෘෂිකාර්මික වගා ක්‍රම වලට හසු වීම නිසා මේ වන විට අපගේ බොහෝ වගා බිම්වල පොළොවේ පස දූෂිත තත්ත්වයට පත්ව තිබේ.

එම නිසා මේ පසේ ජීව ගුණය ආරක්ෂා කිරීම, එහි සංයුතිය තිරසාරව පවත්වා ගෙන යෑම කෘෂිකාර්මික සංවර්ධනයක් බලාපොරොත්තු වන රටක වගකීමකි. ඒ සඳහා විශේෂිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වෙයි. ගොවියන් දැනුවත් කිරීම, නිවැරැදි අවම කෘෂි රසායන භාවිතය හා නියාමනය මේවා අතර වැදගත් ප්‍රතිපත්ති වෙයි.

b) පාංශු සංරක්ෂණය

වගා බිම් නිරාවරණය වීමත් ඒවා සෝදා යෑමත් කඳු බහුල අප රටේ බහුල තත්ත්වයකි. කෘෂිකාර්මික ඉඩම්වල නියමිත බැමි බැඳීම, ඉඩම් සකස්කර ගැනීම, බාදනය අවම වන

ජීවවිද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම ආදිය ද අප ගොවියන් දැනුවත් කරමින් නියාමනය කිරීම සිදු කළ යුතුව ඇත. ඒ සඳහා සැලසුම් සකස්කර ක්‍රියාවට නැංවේ.

c) තිරසාර වගා ක්‍රම

තිරසාර සංවර්ධන ඉලක්ක අනුව යමින්, වගා බිම් සහ පස තිරසාරව පවත්වා ගෙන යෑමට අවශ්‍ය කටයුතු කෙරේ. මේ මහ පොළොව අපට පමණක් තිබූ අපෙන් පසුව වැනසෙන්නක් නොව, චිරාත් කාලයක් යනතුරු සෞඛ්‍යය සම්පන්නව සිය සාරය රඳවාගත් ජීව මාධ්‍යක් ලෙස අනාගතයට උරුම කර දෙන්නට වගවීමක් ඇති බව වටහා ගෙන ක්‍රියාකළ යුතුව ඇත.

3. **වාරිමාර්ග**

a) කෘෂිකර්ම අමාත්‍යාංශයත් වාරිමාර්ග අමාත්‍යාංශයත් එකම අමාත්‍යාංශයක් යටතට පත්කර ඒකාබද්ධ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක විය යුතුය.

b) රටේ මේ වන විටත් යහපත් වාරිමාර්ග පද්ධතියක් නිර්මාණය වී තිබීම පිළිබඳව අපි අපේ මුතුන් මිත්තන් හට ගෞරවය පුද කරන අතරම එම පද්ධතිය හොඳින් හඳුනාගෙන, එය ප්‍රතිසංස්කරණය සහ නඩත්තු කිරීම් කාර්යක්ෂම කරගැනීමට නිවැරදි තාක්ෂණය සහිත සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුවේ.

c) හම්බන්තොට සහ අම්පාර දිස්ත්‍රික්කයේ ජලසැපයුම නිර්මාණය කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ඒ සඳහා නව වැඩපිළිවෙලක් යටතේ අලුත් වාරිමාර්ග පද්ධතියක් නිර්මාණය කිරීම සිදු කෙරේ.

d) නූතන තාක්ෂණය භාවිතයෙන් ජලය අවම ලෙස යොදා ගනිමින් කරනු ලබන කෘෂිකාර්මික උපක්‍රම වෙත අවධානය යොමු කෙරේ. විසිරි බිඳිති ක්‍රම ආදියට පනවා ඇති බදු ඉවත් කොට ගොවියන් දැනුවත් කර ඒවා අඩු ම මිලට දැනුම සමග ලබා දීමේ වැඩපිළිවෙලක් ආරම්භ කෙරේ.

4. ගොවියා

a) ගොවියා නූතන දැනුමින් සන්නද්ධ කිරීමට විශේෂ ප්‍රාදේශීය වැඩසටහනක් ඇරඹේ. නූතන කෘෂි උපක්‍රම, කෘෂි රසායන භාවිතය, නව බීජ මාදිලි තෝරා ගැනීම, ජල කළමනාකරණය ආදී අලුත් දැනුම හා පුහුණුව ගොවියන් හට ලබාදීම එම නව වැඩසටහනේ අරමුණයි. මෙය යම් ආකාරයක ගොවි වෘත්තීය පුහුණුවක් වන අතර, ගොවි පවුල්වල ගොවි තැන තෝරා ගන්නා තරුණ පුරවැසියන් හට දීර්ඝව ගොවිතැන අධ්‍යනය කිරීමේ පාඨමාලා සකස් කෙරේ. ඒ මගින් අලුත් පරම්පරාව විද්‍යාත්මක නූතන දැනුමින් සන්නද්ධ වුණ දියුණු ගොවි පරම්පරාවක් බවට පත් කර ගැනීමට බලාපොරොත්තු වෙයි.

b) ගොවියන් වෙනුවෙන් විශේෂ ප්‍රාදේශීය බැංකු ක්‍රමයක් ආරම්භ කරන අතර, අඩු පොළී සහන යටතේ දීර්ඝකාලීන ගෙවීමේ පහසුකම් සමග කන්න සඳහා වගා ණය ලබා දීම සිදුකෙරේ. ඒ ඔස්සේ ගොවියන් ප්‍රාදේශීය අතරමැදියන්ගෙන් හදිසි ණය ලබාගැනීම් සීමා කෙරේ.

c) වගා හානිවීම් සඳහා සාධාරණ ඇස්තමේන්තු ක්‍රමයක්ද, වගාහානි රක්ෂණ ක්‍රමයක් ද හඳුන්වා දෙනු ලැබේ.

5. නව්‍යකරණය

කෘෂිකර්මාන්තය නව්‍යකරණය යනු සාපේක්ෂව අලුත් සංකල්පයක් නොවුනත්, තවමත් එය නිවැරදිව ශ්‍රී ලංකාව තුළ යොදා ගෙන නොමැත. එනයින් එම නූතන සංකල්ප ඉක්මනින් දේශීය ගොවිතැනට රැගෙන ඒමට කටයුතු කෙරේ. එම නව්‍යකරණය කොටස් 3 කින් සමන්විත වෙයි.

a) වැඩිදියුණු කළ බෝග.

විද්‍යාව හා තාක්ෂණික අනුහසින් ලෝකයේ වගා කරනු ලබන බෝග වර්ග සුවිශේෂී දියුණු කිරීම් රැසකට ලක් කර තිබේ. වැඩි අස්වැන්නක් ලැබීම, අඩු කාලයකින් අස්වැන්න නෙළීමට හැකි

වීම, රෝගාබාධ අඩු බව, පාරිසරික වෙනස්කම්වලට ඔරොත්තු දෙන බව, අඩු වියදම් වගා ක්‍රම යොදා ගත හැකි වීම ආදී ලක්ෂණ වලින් මේ නව බෝග වර්ග වැඩි දියුණු කර ගෙන තිබේ. එම දියුණු කරන ලද බෝග වර්ග වගාවන්ට යොදවා ගැනීමට ගොවියන් යොමු කෙරේ.

b) තාක්ෂණය සහ යාන්ත්‍රීකරණය.

අනෙක් නව්‍යකරණය නම් තාක්ෂණය සහ යන්ත්‍ර සූත්‍ර වගාවට හැකි තරම් යොදා ගැනීමයි. එහිදී විශාල යන්ත්‍ර යොදා ගැනීම මගින් වගාවට යන කාලය අඩු කර ගැනීමට හැකිවීම, මිනිස් ශ්‍රමය අඩු කර ගැනීම, ගුණාත්මකව වගාවක් කිරීමට හැකි වීම ආදිය දියුණු කෙරේ. මේ කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර ගොවියන් අතට පත් කිරීමට අඩු වියදම් ක්‍රමවේද, බදු සහන, ණය ක්‍රම ආදිය සකස් කෙරේ.

ඒ වගේම නූතන තාක්ෂණික උපක්‍රම වන ජලය සැපයීමේ උපක්‍රම, හරිතාගාර තාක්ෂණය, අස්වනු නෙළීමේ සහ සකස් කිරීමේ තාක්ෂණය ආදිය ද පහසුවෙන් ගොවීන් අතරට පත් කෙරේ.

c) පොහොර සහ කෘෂි රසායන භාවිතය.

ගුණාත්මක රසායනික පොහොර විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුව භාවිතා කිරීම දිරිමත් කෙරේ. ගොවි පුහුණුවේ දී එම දැනුම ඔවුන්ට ලබා දෙන අතර කෘෂි රසායන පිළිබඳව පුළුල් දැනුමක් ලබා දෙනු ලැබේ.

පොහොර නිෂ්පාදනය සහ බෙදාහරීම වෙළඳපොලට නිකුත් කරනු ලබන අතර, එම කෘෂි රසායන සහ පොහොරවල ගුණාත්මකභාවය නියාමනය කිරීම සඳහා කෘෂි රසායනික අධිකාරියක් ස්ථාපිත කෙරේ. එය සියළුම රසායනාගාර පහසුකම් සහිතව නිර්මාණය කරන අතර පුද්ගලික අංශය මගින් ගෙන එනු ලබන සියලු කෘෂි රසායන මේ අධිකාරිය මගින් පරීක්ෂාවට ලක් කළ යුතු වෙයි.

6. පශු සම්පත් කළමනාකරණය

a) පශු සම්පත් ක්ෂේත්‍රය නියාමනය කිරීමට නව පනතකින් අධිකාරියක් නිර්මාණය කෙරෙන අතර දැනට පවතින දෙපාර්තමේන්තුව අහෝසි කෙරේ.

b) එය කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර, දැනට පවතින බලතල යාවත්කාලීන කර, නූතන තාක්ෂණය යොදා ගත් පුළුල් නියාමනයකට කටයුතු සකස් කෙරේ.

c) එම අධිකාරිය මගින් ආහාර පිණිස ඇති කරනු ලබන පශු සම්පත් කර්මාන්තය දියුණු කිරීමේ සහ ඒවායේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමේ වගකීම දරනු ලැබේ.

d) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු ගොවිපළ වෙළඳපොලට නිකුත් කර එම මණ්ඩලය සියළු ව්‍යවසාය කටයුතුවලින් නිදහස් කෙරේ.

e) එම මණ්ඩලය සතු පරම වගකීම ලෙස ජාතික පශු සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත්, ජාතික නිෂ්පාදන ඉලක්ක වෙත රටේ පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවීමත් වෙයි.

f) රටේ පශු සම්පත් ක්ෂේත්‍රය නියාමනය කිරීමට ඉහතින් සඳහන් කළ අධිකාරියත්, ජාතික පශු සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය වෙනුවෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයත් කටයුතු කළ යුතු වෙයි.

g) මිල්කෝ සමාගම පුද්ගලීකරණය කොට, වෙළෙඳපොළට නිකුත් කෙරේ.

h) එමගින් රාජ්‍ය ව්‍යවසායකත්වයෙන් ඉවත්වීමේ ප්‍රතිපත්තියත්, රාජ්‍ය කුඩා කර ගැනීමේ ප්‍රතිපත්තියත්, රටේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමත්, පුද්ගලික අංශයේ කාර්යක්ෂමතාව යොදා ගැනීමෙන් එම ක්ෂේත්‍ර දියුණුවට පත්කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

i) එම පූර්ණ පුද්ගලික වෙළඳපොළ ක්‍රමයක් යටතේ රටේ කිරි නිෂ්පාදනය ඉහළ නංවා ගනිමින් රටේ කිරි අවශ්‍යතාවය රට තුළ නිෂ්පාදනය කර ගැනීමට ඉලක්ක කෙරේ.

j) කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනය වෙනුවෙන් සත්ත්ව ආහාර පිණිස බඩ ඉරිඟු වගාව ප්‍රචලිත කෙරේ. රටේ ඉඩම් ප්‍රතිපත්තිය අනුව තෝරාගත් ඉඩම් යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් අස්වැද්දීම මගින් සත්ත්ව ආහාර සියල්ල මේ රට තුළ නිෂ්පාදන කිරීමට ඇති හැකියාව දියුණු කෙරේ.

ගොවිජන සේවා

1) ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කොට ගොවිජන සේවා මණ්ඩලයක් නිර්මාණය කෙරේ.

2) එම මණ්ඩලය මගින් ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාල පවත්වා ගෙන යනු ලබන අතර ගොවිජන සේවා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම සිදු කෙරේ.

3) එම ප්‍රදේශයේ සියලු ම ගොවීන්ගේ තොරතුරු රැස් කිරීම, වගා කටයුතු නිරීක්ෂණය කිරීම, අස්වැන්න පිළිබඳව දත්ත රැස් කිරීම, ගොවි බිම් අධීක්ෂණය සහ නව්‍යකරණ වැඩපිළිවෙළ ක්ෂේත්‍රයට රැගෙන යෑම, ගොවියන්ගේ ගැටලු නිරාකරණය ආදිය කිරීම ඔවුන්ට පැවරේ. එම මධ්‍යස්ථාන ව්‍යවසාය කටයුතු වලින් නිදහස් කෙරේ.

4) එම මණ්ඩලයට නූතන පරිගණක ජාල ක්‍රමයක් සකස් කරනු ලැබේ. එහි ගොවියන්ගේ මෙන් ම වගා කර ඇති බෝගවල සජීවී දත්ත පුවරුවක් පවත්වා ගෙන යෑමට කටයුතු කෙරේ.

5) ඒ අනුව රටේ වගා කෙරෙන බෝග මොනවා ද, ඒවායේ අස්වැන්නේ ප්‍රමාණය කෙබඳු ද, එය ජාතික අවශ්‍යතාවයට ප්‍රමාණවත් ද, ආදිය මැන බලනු ලැබේ.

6) ගොවියන් කවර කන්නයේ කුමක් වගා කළ යුතුද යන්න පිළිබඳව ජාතික මට්ටමෙන් සම්බන්ධීකරණය කර තොරතුරු බෙදා හැරීමට එමගින් හැකියාව ලැබේ. ඒ අනුව රටේ වෙළෙඳපලට

ගැළපෙන ප්‍රමාණයට අස්වැන්න නෙළීම, සමතුලිත සැපයුමක් පවත්වා ගෙන යෑම කළමනාකරණය කෙරේ.

7) ජාතික ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගෙන යෑම, ජාතික ඉලක්කවලට කෘෂි නිෂ්පාදන පවත්වා ගෙන යෑම මෙම මණ්ඩලයේ වගකීම වන අතර, එම ඉලක්ක සපුරා ගැනීමේ දක්ෂතාවය මත වැටුප්, උසස් වීම් සහ ප්‍රතිලාභ ලැබෙන මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයන් මේ මණ්ඩලයේ පරිපාලනයට යොදා ගැනේ.

8) එමගින් ජාතික ආහාර අවශ්‍යතාවයන් දේශීයව කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් නිර්මාණය වන ජාතික යාන්ත්‍රණයක් සකස් කෙරෙන අතර පසු අස්වනු සුරක්ෂිතතාවය සහ ගබඩාකරණය පිළිබඳව එක් ජාතික ප්‍රතිපත්තියක සිට පහසුකම් පුළුල් කෙරේ.

අපනයන බෝග සහ වාණිජ වගා

1) සියලුම වාණිජ බෝග වගාවෙන් රජය ඉවත් වේ.

2) දැනට රජය යටතේ පවතින සියලුම ගොවිබිම් සහ වගාවන් පුද්ගලීකරණය කර වෙළෙඳපොළට නිකුත් කෙරේ.

3) ඒ සඳහා සුවිශේෂ කමිටුවක් පත්කර නියමිත විධිවිධාන සකස් කර, විනිවිදභාවය පවත්වා ගනිමින් කටයුතු කරනු ලැබෙන අතර දේශීය ආයෝජකයින් හට ප්‍රමුඛස්ථානය හිමිවේ.

4) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවට අපනයන බෝග සංවර්ධන මණ්ඩලයක් සකස් කෙරේ. රටේ අපනයන බෝග වගා සඳහා ගණනය කරන ලද වාර්ෂික ඉලක්ක ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කෙරේ. එම ජාතික ඉලක්ක සපුරා ගැනීමට පුද්ගලික ව්‍යවසායකයන් මගින් කටයුතු කිරීම අපනයන සංවර්ධන මණ්ඩලයේ මූලික කාර්යභාරයයි.

5) අපනයන වගා කරුවන් සමග එක්ව කටයුතු කිරීම, ඔවුන්ගේ ගැටලු නිරාකරණය දීම, අපනයන බෝග සංවර්ධන කටයුතු සිදු කිරීම, ඔවුන්ට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය සහ මැදිහත්වීම ලබා දීම,

අපනයන සංවර්ධනය කර ගැනීමට කටයුතු කිරීම මෙම මණ්ඩලයෙන් බලාපොරොත්තු වෙයි.

6) හිස් මුඩු ඉඩම් බහුල මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල රබර් වගාව ප්‍රචලිත කිරීමට පියවර ගැනෙන අතර, එම ප්‍රදේශවල මී මැසි පාලනය, හතු වගාව ආදිය දියුණු කෙරේ.

7) අපනයන කළහැකි විවිධ නව බිම්මල් ප්‍රභේද හඳුන්වා දෙනු ලැබේ.

8) විවිධ අපනයන බෝග වෙනුවෙන් ඇති සියලුම පර්යේෂණ ආයතන පොදු එක් ආයතනයක් බවට පත් කරන අතර, එය මෙම නව මණ්ඩලය යටතට ගෙන එනු ලැබේ. එම පර්යේෂණ ආයතනවලට නව තාක්ෂණය ලබා දෙන අතර, නව දැනුව සොයා ගැනීම පිණිස පර්යේෂණ සඳහා මුදල් වෙන් කෙරේ. විශේෂඥ දැනුම ලබා ගැනීමට ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කරන අතර ඒ ඔස්සේ මේ ආයතනවල පර්යේෂණ සහ සංවර්ධන අංශය පුළුල් කෙරේ.

9) බෝගවල ගුණාත්මකභාවය වැඩි කර ගැනීම, නෙළීම, ඇසිරීම, ප්‍රවාහනය දියුණු ක්‍රමවලින් සිදුකිරීම සහ වෙළඳපොල සොයා ගැනීම ආදී කරුණු වෙනුවෙන් මණ්ඩලය සහය ලබාදෙනු ඇත.

පර්යේෂණ සහ විෂය සංවර්ධනය

1) කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධනය පිණිස ඉහත ඇති කරගත් මණ්ඩල යටතේ මුදල් ප්‍රතිපාදන වෙන් කෙරේ. ඒ සඳහා නූතන තාක්ෂණය ලබා ගැනීම, දැනුම ගෙන්වා ගැනීම සහ උසස් පර්යේෂණ පවත්වා ගෙන යෑම වෙනුවෙන් නියාමන සකස් කෙරේ.

2) ඔවුන්ගේ උසස් වීම්, වැටුප් ලැබීම් ආදිය සේවයේ දක්ෂතා මත ලැබෙන දිරි දෙන මානව සම්පත් පරිපාලන ක්‍රමයක් ඇති කෙරේ.

3) විශ්වවිද්‍යාල පද්ධතිය සහ මෙම පර්යේෂණ ආයතන සෘජුව ම සම්බන්ධ කෙරෙන අතර, එම ආයතන අතර අන්තර්

සම්බන්ධතාවය දියුණු කෙරෙන ආයතනික ක්‍රමවේදයන් පහසු කෙරේ.

4) විශ්වවිද්‍යාලවල කෘෂිකාර්මික විෂයයන් වෙත සිසුන් බඳවා ගැනීමේ කාර්යය කෘෂිකාර්මික අමාත්‍යාංශය සමග සහයෝගයෙන් සිදු වන්නක් බවට පත් කෙරේ. විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය මෙන් ම ක්ෂේත්‍රයේ සේවයේ නියුතු විශේෂඥයන්ගෙන් සැදුම්ලත් කෘෂි අධ්‍යාපන නියාමන අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කෙරේ. ඒ අනුව විෂය පථයන් නිර්මාණය කිරීම, සහ පාඨමාලා පවත්වා ගෙන යෑම අධ්‍යයන සහ ක්ෂේත්‍ර අත්දැකීම් ඇති විශේෂඥයන් මගින් සිදු කෙරේ.

සමුපකාර කෘෂි සංවිධාන

1) ගොවීන් අතර සමූපකාර වගා ක්‍රමය ප්‍රචලිත කෙරේ.

2) ඒ සඳහා කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් සහ සම්බන්ධීකරණය ලබා දෙනු ලැබේ.

3) දැනට පවතින ගොවි සමිති ආශ්‍රිතව එම සමූපකාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් ප්‍රදේශයන්හි ගොවීන්ට සහය ලබා දෙනු ලැබේ.

වගා හානි රක්ෂණ ක්‍රමය

1) සියලුම ගොවිතැන් වෙනුවෙන් වගා හානි රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන අතර වගා හානිය නිර්ණය කිරීම, මැනීම සහ ඇස්තමේන්තු කිරීම වෙනුවෙන් විද්‍යාත්මක නිර්ණායක ඇතුළත් වැඩපිළිවෙලක් සකස් කොට ජනගත කෙරේ.

2) එම වගා හානි රක්ෂණ ක්‍රමය අඩු වියදමෙන් සපයා ගැනීමට රටේ පවතින රක්ෂණ සමාගම් සමග එක්ව සාකච්ඡා කොට විමධ්‍යගත ක්‍රමවේදයක් සකස් කෙරේ.

පසු අස්වනු තාක්ෂණය, ප්‍රවාහනය සහ ගබඩා කිරීම

1) පසු අස්වනු තාක්ෂණය, අස්වනු වෙළඳපොල වෙනුවෙන් සකස් කරගැනීම, ප්‍රවාහනය, ගබඩා කරගැනීම පිළිබඳව නව දැනුම ගොවියන් සහ අතරමැදියන් අතර බෙදාගනු ලබන අතර ඒවායේ සුරක්ෂිතතාවය සහ ගබඩාකරණය පුළුල් විධිමත් කිරීමට එක් ජාතික ප්‍රතිපත්තියක සිට පහසුකම් පුළුල් කිරීමට කටයුතු කෙරේ.

2) එම නව තාක්ෂණය ලබා ගැනීමට අඩු වියදම් ක්‍රමවේදයන් සකස් කෙරේ.

මේ ප්‍රතිපත්ති මාලාව අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ගණනාවක් කිරීමේ අවශ්‍යතාවය තිබේ. මේවා නූතන රාජ්‍ය පරිපාලන සංකල්ප අනුව යාවත්කාලීන නොවී වෙළෙඳපොළ අවශ්‍යතාවයන් මත පරිවර්තනය නොවී තිබීම නිසා රටේ කෘෂිකර්මාන්තය අද වනවිට අති අසාර්ථක තැනකට පත් වී තිබේ. එනයින් නූතන අදහස් යොදාගෙන සාර්ථක වෙළඳපොල ක්‍රමයකට අනුගත වෙමින් මේ ප්‍රතිසංස්කරණ ඉක්මනින් ගෙන ඒමට අප කටයුතු කළ යුතුය.

දැනට පවතින බදු මුදලින් නඩත්තු වන දැවැන්ත රාජ්‍ය වියදමක් යටකෙරෙන පරිපාලන ව්‍යුහයක් වෙනුවෙන්, අවම වියදමෙන් පාලනය වන තිරසාර කළමනාකරණයකට කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය පත්කළ යුතුය. රාජ්‍ය කුඩාවිය යුතු වීම, රාජ්‍ය සේවක බර ඉවත්කර ගැනීම, අය වැය පරතරය සීමා කරගෙන නාස්තිය අවම කරගෙන සකසුරුවම් අයුරින් කෘෂිකර්මාන්තය පවත්වා ගෙන යෑම අපේ ඉලක්කයයි. එනිසා විද්‍යාත්මකව ගණනය කර සනාථ කරන ලද ක්‍රමවේදයන් යොදා ගනිමින් කාර්යක්ෂම සහ ඵලදායි රාජ්‍ය සේවාවක් ලබා ගැනීමට අපි කටයුතු කරන්නෙමු.

පරිසර ප්‍රතිපත්තිය

අප නිර්මාණය කරනු ලබන රටේ සංවර්ධනය මනින නිර්ණායක අතර ප්‍රමුඛතාව හිමි වන්නේ දළ ජාතික සතුටටයි. එහි කොටස් හතරක් ඇති බව ඉහත සඳහන් කර ඇත. ආර්ථික සංවර්ධනය, යහපත් රාජ්‍ය පරිපාලනය, සංස්කෘතියේ යහපැවැත්ම සහ පරිසර සංරක්ෂණය ඒ කොටස් හතරයි.

එනම්, මින් පැහැදිලි වන කරුණ නම් පරිසරය සහ එහි යහපැවැත්ම රටක මිනිසුන්ගේ සතුට කෙරෙහි සෘජුව ම බලපාන බවයි. වේගයෙන් පරිසරයෙන් ඈත්ව තමාටම ආවේණික කෘතිම පරිසරයක් නිර්මාණය කර ගත්තා වුවද තවමත් ස්වාභාවික සත්ත්වයෙකුවන මිනිසාගේ පැවැත්ම පරිසරයේ යහපැවැත්ම මත රඳාපවතින්නකි. එහෙත් මිනිසා මෙතෙක් ලෝකය මත ආ ගමන දෙස ආපසු හැරී බැලූ විට ඔහුගේ දියුණුව සහ වර්ධනය යන්න ලෝකයේ පරිසරයට තිබූ ප්‍රභලම අභියෝගය යැයි අපට සැළකිය හැකිය. අප්‍රිකාවේ සැවනා බිම්වල පටන් වසර ලක්ෂ 2 ක් තිස්සේ සිය ගහණය වර්ධනය කරගනිමින්, බුද්ධිය දියුණු කර ගනිමින්, රාජ්‍යයන්වලට සංවිධානය වෙමින් පෘථිවි ජනගහණය බිලියන 8 ක් දක්වා මෙතෙක් අප ආ ගමන නිසා මේ පොළොව් තලය විශාල වන්දියක් ගෙවා තිබේ.

නූතන මිනිසා සිය ජනාවාස සහ වාසස්ථාන ස්වාභාවික පරිසරයෙන් වියුක්තව තනා ගනිද්දී ඔහු කේන්ද්‍ර වූ පරිසරය දැඩි බලපෑම් රාශියකට මුහුණ දී තිබේ. මිනිසාගේ බෝ වීමත්, පැතිරීමත් නිසා පරිසර පද්ධතීන් රාශියක් විනාශ වූ අතර, වන සතුන් දහස් ගණනාවක් වඳ වී ගියේ එහි වූ සුවිශේෂී තුලිත නොවූ, පරිසර තත්ත්වයන් නිසාම ය. මිනිසා යනු ස්වාභාවික පරිසරයේ තුලිතතාව බිඳින්නෙකු වූයේ ඔහු සතු බුද්ධි මහිමය නිසාම ය. එබැවින් නූතන ලෝකයේ මිනිසා විසින් පරිසරයට එල්ල කරන බැලපෑම අතිමහත් ය. එම පරිසරය නියාමනයට ලක් නොකළහොත් පාරිසරික බේදවාචකයන් ඇති වීම නොවැළක්විය හැකි ය.

පසුගිය ශතවර්ෂය සැලකීමේ දී නිදහස් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයත්, ගෝලීයකරණයත්, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයත් ලෝකය පාලනය කළ යුගයක් යැයි කිව හැකි ය. හිට්ලර්ගේ ෆැසිස්ට් වාදය දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව ඉතිහාසයට එක්වූ අතර, කොමියුනිස්ට් වාදය සොවියට් රුසියාවේ බිඳ වැටීමෙන් අවසන් ගමන් ගොස් තිබේ. අනතුරුව තනි ලෝක බලවතා ලෙස වැජඹුණ ඇමරිකාව සිය දේශපාලන මතවාදය වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයත්, සිය ආර්ථික ක්‍රමය වූ විවෘත වෙළඳපොල ආර්ථිකයත් ගෝලීයව ප්‍රචාරණය කිරීමට ඔවුන් සමත් වූයේ ය.

රාජාණ්ඩු ක්‍රමයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට පැමිණ කාර්මික විප්ලවය හරහා දියුණු වූ ලෝකයේ කාර්මීකරණයත් තරඟකාරී වෙළෙඳපොළත් ඇති කළ ගෝලීය අතුරු ඵලය වූයේ පාරිසරික අර්බුදයයි. එනම්, නූතන සමාජ ක්‍රමය තුළ දියුණු වීමේ දී ඇති වන වේගවත් ආර්ථික ක්‍රියාවලිය තුළ පාරිසරික ව්‍යසනයක් ඇති වීම පැහැදිළිව දක්නට ලැබේ. ඉඩම් හා අමුද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ද, ජනාවාස හා අනෙකුත් ඉදිකිරීම් වෙනුවෙන් ද, වේගයෙන් දියුණු වන ප්‍රවාහනය ආදී ක්ෂේත්‍ර නිසා ද සීමිත පාරිසරික සම්පත් තිරසාර නොවන ලෙස භාවිතා කිරීමත්, කාර්මික අපද්‍රව්‍ය පාලනයකින් තොරව පරිසරයට මුදා හැරීමත් හේතු කොට ගෙන වෙළඳපොල ආර්ථිකයක් තුළ පාරිසරික අර්බුදයන් ඇති වී තිබේ. මෙම පාරිසරික අර්බුද අපට විවිධ ස්වරූපවලින් පිළිඹිබු වූ අතර මිනිසාට ඒවා කළමනාකරණය කර ගැනීමට සිදු වූයේ ය.

ශතවර්ෂය ගණනාවක යටත් විජිත පාලනයකින් ද, දශක ගණනාවක දේශීය ස්වයං පාලිත සූරා කෑමකින් ද දුකට පත් වී ඇති ශ්‍රී ලංකාවේ මිනිසුන් හට දැනට පවතින ආර්ථික තත්වයෙන් ගොඩ ඒමට නම්, වේගවත් කාර්මීකරණයත්, කාර්යක්ෂම විවෘත වෙළඳපොල ආර්ථික ක්‍රමයත් අවශ්‍ය වෙයි. එවන් ක්‍රියාවලියක දී ඒත් සමඟම අතුරු ඵලයක් ලෙස පාරිසරික අර්බුද මතු වීම සිදුවීමට විශාල ඉඩක් තිබේ. එනයින් මේ තත්ත්වය කළින්ම අවබෝධ කරගෙන සිටින අප, ආර්ථික දියුණුවෙන් පරිසරය විනාශ වෙන තුරු බලා නොසිට ඊට පෙර පූර්ව ක්‍රියාකාරී වී එය වළක්වා ගැනීමට කටයුතු කළ යුතු බව විශ්වාස කරන්නෙමු. එනම්, පරිසරය රැක ගන්නා අතරම අපගේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑමට පවතින වෙළඳපොල ආර්ථික ක්‍රමය සමග පාරිසරික විඥානය මුහු කොට සංවර්ධනයට දැක්මක් සහ තිරසාර සැලසුම් ලබා දීමට බලාපොරොත්තු වෙමු. එනයින් අපි හරිත දේශපාලන මතවාදයක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටුවන්නෙමු. එබැවින් අපගේ පාරිසරික ප්‍රතිපත්තිය රටේ සිදු විය යුතු අත්‍යවශ්‍ය ආර්ථික සංවර්ධනයට පහසුකම් සලසන අතර, එම සංවර්ධන වැඩපිළිවෙල පාරිසරික අර්බුද නිර්මාණය නොවන අයුරින් ද පරිසරය සංරක්ෂණය වන අයුරින් සකස්කර ගැනීමට ද අප කටයුතු කරන්නෙමු.

නූතන පාරිසරික අර්බුදවල සුවිශේෂීත්වය නම් ඒවා බොහෝ විට ගෝලීය ගැටළු බවට පත් වී තිබීමයි. මීට පෙර ලෝකයේ නොතිබූ ආකාරයේ පාරිසරික අර්බුද රැසක් රටක දේශ සීමාවට සීමා නොවී ගෝලීයව බලපවත්වන ලෙස ඇති වී තිබේ. මෙය ලෝකයේ මුලින්ම අත් දකින්නට ලැබුණ අවස්ථාව ලෙස ඕසොන් වියනේ සිදුරු වීම දැක්විය හැකි වන නමුත්, ගෝලීය සහභාගීත්වයෙන් නිර්මාණය වුණ මොන්ට්‍රියල්

එකඟතාවයට අනුව එම හානිය වළක්වාගෙන ඕසොන් වියන සුවකර ගැනීමට ලෝකය සමත් වූයේ ය. එහෙත්, ලෝකය අලුත් පාරිසරික අර්බුද රාශියකට මේ වන විට මුහුණ දෙමින් සිටී. ඒවා අතරින් ගෝලීය උණුසුම ඉහළ යෑම, දේශගුණික විපර්යාස, සාගර දූෂණය, ස්වාභාවික සම්පත් අධිපරිභෝජනය, වනාන්තර හීන වී යෑම ආදිය දැක්විය හැකිය. මෙම ගැටලු සියල්ල මීට පෙර මෙන් රටකට ජාතියක් ලෙස තනිව සිට ගෙන විසඳා ගත හැකි ප්‍රශ්න නොවේ. ඒවා ගෝලීය කාර්මීකරණයේ, අධික ජනගහන වර්ධනයේ සහ ප්‍රවාහනයේ ප්‍රතිඵල වන අතර ඒවාට විසඳුම් සෙවීමටද ගෝලීයව සහයෝගයෙන් කටයුතු කිරීමට අපට සිදු වෙයි.

එහිදී පොදුවේ පිළිගත් අන්තර්ජාතික පාරිසරික සම්මතයන්ට අනුකූලව රටක් ලෙස කටයුතු කිරීමට අප බැඳී සිටින අතර, අලුතින් ඇති වන අන්තර්ජාතික ගිවිසුම් ගත වීම්, වෙළෙඳපොළ වෙනස් වීම්, තාක්ෂණික වෙනස් වීම් සහ ජීවන රටාවන්ගේ වෙනස් වීම් මෙරට තුළට ගෙන ඒමට අප වගකීම බාරගත යුතුයි. එනයින් පාරිසරික විඥානය පෙරදැරි කර ගත් ඒ ගැන අවබෝධයෙන් කටයුතු කළහැකි පිරිසක් පාර්ලිමේන්තුව සහ රාජ්‍ය පරිපාලනය තුළ සිටීම අත්‍යාවශ්‍ය වෙයි. එසේ සිටීමින් පොදු විද්‍යාත්මක ප්‍රතිපත්ති මාලාවක් ඔස්සේ කටයුතු කිරීමත්, නිවැරදි ජාතික ප්‍රතිපත්ති නිර්මාණය කිරීමත්, ගෝලීයව සිදුවන ක්‍රියාවලියට සක්‍රීයව දායක වීමත් අප සතු වගකීම් ලෙස අප හඳුනාගෙන තිබේ.

එලෙස ම තිරසාර සංවර්ධන ඉලක්ක අපගේ පදනම ලෙස ගෙන, හරිත දේශපාලනයත්, දළ දේශීය සතුටත් පාදක කරගෙන ශ්‍රී ලංකාවට ගැළපෙන පාරිසරික ප්‍රතිපත්ති මාලාවක් අප මෙසේ ඉදිරිපත් කරන්නෙමු.

වනාන්තර භූමිය

1) පෙර කී ලෙස අප නිර්මාණය කරනු ලබන මුළු රටේම භූමිය ඇතුළත් Blueprint සැළසුමට අනුව යමින් මේ රටට අවශ්‍ය වනාන්තර ප්‍රමාණය විද්‍යාත්මකව හඳුනා ගැනේ.

2) ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රමාණය දැනට පවතින භූමි ප්‍රමාණයෙන් 28% ක් යැයි කියවුනත්, ගවයින් ආහාර සඳහා වනාන්තර තුළට යැවීම, විශාල ගස් අනීතික ලෙස කඳන් ලෙස කපාගෙන යෑම, අනීතික හේන් ගොවිතැන, අනවසර ඉඩම් අල්ලා ගැනීම, ආක්‍රමණික ශාක බෝවීම ආදිය නිසා පවතින වනාන්තර වල ගුණාත්මකභාවය අඩාල වී තිබේ.

3) අප මේ භූමියෙන් කොටසක් ස්වාභාවික පරිසරය ලෙස වෙන් කොට තැබීමට බලාපොරොත්තු වන්නෙමු. භූතානයේ මෙන් එම අගයන් නිවැරැදිව ගණනය කොට ව්‍යවස්ථාවට එක් කරගත හැකි නම්, රටේ ස්වාභාවික පරිසරයේ පැවැත්ම තහවුරු කිරීමට අපට හැකියාව ලැබේ.

4) වර්තමාන මෙන් ම නුදුරු අනාගතයේ මුහුණ දීමට සිදු වන පාරිසරික අභියෝග වන දේශගුණික විපර්යාස සහ ජල ඌණතාවය සැළකිල්ලට ගෙන මේ රටට කොපමණ වනාන්තර අවශ්‍ය දැයි විද්‍යාත්මකව ගණනය කිරීමට අප බලාපොරොත්තු වෙමු.

5) ඒ වෙනුවෙන් සමීක්ෂණ සහ පර්යේෂණ කිරීමට විශ්වවිද්‍යාල සහ පරිසර අමාත්‍යාංශය මගින් කටයුතු කෙරේ.

6) එම ගණනය කිරීම්වලින් අනතුරුව රටේ භූමියෙන් කොපමණ ප්‍රමාණයක් එසේ වෙන් කළ යුතු දැයි තීරණය කරනු ලබන අතර, එම ගණනය කිරීම අවසන් වනතුරු, වැඩ කරගෙන යෑමේ උපකල්පිත අගයක් ලෙස ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රමාණය 40% විය යුතු බවට නිර්ණය කෙරේ.

ජාතික වනජීවී කොරිඩෝ ජාලය
Pan Island Wildlife Corridor Network

1) ශ්‍රී ලංකාවේ පවතින ජාතික වනෝද්‍යාන, රක්ෂිත, දැඩි රක්ෂිත සියල්ල වෙන් වී පැවතීම අවිද්‍යාත්මක පරිසර කළමනාකරණයකැයි අප විශ්වාස කරන්නෙමු. විශේෂයෙන් මේ භූමියේ නිදහසේ ඇවිද ගිය වන සතුන් කුඩා භූමිවල කොටු කර තැබීමට උත්සහ කිරීම දැක්මක් නොමැති පරිපාලනයක ප්‍රතිඵල වෙයි.

2) එනයින් මේ පුංචි දූපතේ, පානම් පත්තුවේ සිට වන්නි හත් පත්තුව දක්වා සියලු වනාන්තර එක ම ජාලයකින් සම්බන්ධ කළ යුතු බව අප විශ්වාස කරන්නෙමු.

3) දැනටමත් මේ පරිසර කළාප අතර අලි ඇතුන් ආදී සතුන් ගමන් කරන අතර එම සතුන්ගේ ස්වාභාවික මාර්ග සංචරණ රටා හඳුනාගෙන ඒවා පදනම් කරගෙන වන ජීවී කොරිඩෝ ජාලයක් නිර්මාණය කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.

4) ඉහතින් කී පරිදි භූමියේ වනාන්තර ප්‍රමාණය 28% සිට 40% දක්වා වැඩි කිරීමට අවශ්‍ය අමතර 12% ක භූමිය මේ කොරිඩෝ ඔස්සේ ගොඩනැගීමට කටයුතු කරනු ලැබේ.

5) එමගින් සතුන්ගේ ස්වාභාවික සංචරණය ආරක්ෂිත කරනු ලබන අතර, වඩා පුළුල් පරාසයක ජාන මිශ්‍ර වීම මගින් ශක්තිමත්, වඩාත් පරිසරයට ඔරොත්තු දෙන සත්ත්ව ගහණයන් නිර්මාණය කර ගැනීමට බලාපොරොත්තු වෙයි.

6) එසේම මෙම කොරිඩෝ දැනට පවතින වගාබිම් ඔස්සේ වැටී තිබේ නම්, එම ඉඩම් කෘෂිකාර්මික ඉඩම් වර්ගීකරණයෙන් ඉවත් කොට වෙනත් ඉඩම් ලබා දීම ක්‍රමිකව සිදු කළ හැකිය. අපගේ දැක්ම අනුව රටේ ආර්ථික සංවර්ධනය ඇති වීමත් සමග ග්‍රාමීය ශ්‍රමිකයන් රැකියා සොයා නගරවලට සේන්දු වීමත් සමගම මේ පරිවර්තනය කළමනාකරණය කර ගැනීමට අපට හැකි වෙයි.

7) එනයින් රට සංවර්ධනයේ ඉලක්ක සපුරා ගන්නා වසර 25 ක පමණ කාලයකට පසුව වඩාත් සංවිධානය වූ වනජීවී කොරිඩෝ ජාලයකින් සම්බන්ධ වූ වනාන්තර පද්ධතියක් අපට හිමි වේ.

අලි මිනිස් ගැටුම සහ ආරක්ෂාව

1) නිර්මාණය වන වන ජීවී කොරිඩෝ ජාල පද්ධතියට අනුකූලව, අලින් සිටින බිම් තෝරා ගැනෙන අතර, ඒවා විදුලි වැට, අගල්, ආදී බාධක ක්‍රම භාවිතය මගින් ජනාවාසවලින් වෙන් කෙරේ.

2) අලි ගහණය නිරන්තරයෙන් සංගණනය කොට එය සුදුසු විද්‍යාත්මක මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කෙරේ.

3) සංවේදී කැලෑ තුළට ගවයින් යැවීම වෙනුවට, අතහැර දැමූ ඉඩම්, පුරන් කුඹුරු ආදිය කළමනාකරණය කොට තෘණබිම් බවට පත් කිරීම මගින් කැලෑ තුළ වන සතුන් වෙනුවෙන් ඇති ආහාර ප්‍රමාණය සුරක්ෂිත කෙරේ.

4) කැලෑ තුළ ආක්‍රමණශීලී ශාක ගහණය විනාශ කිරීමටත් දේශීය වනවගා සහ තෘණබිම් ඇති කිරීමටත් කටයුතු කෙරේ.

5) සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා රක්ෂණ ක්‍රම, දේපළ සහ ජීවිත රක්ෂණ ක්‍රම ඇති කිරීම මගින් ග්‍රාමීය ගොවි ජනතාවගේ අලාභ දරා ගැනීමේ හැකියාව දියුණු කෙරේ.

වන රෝපණය සහ දැව සැපයුම

1) තෝරා ගන්නා ලද බිම්වල අලුතින් වන රෝපණය කිරීමට කටයුතු කෙරේ.

2) 40% ක වන වැස්ම ඉලක්ක කර මහජන ව්‍යාපෘති හා ව්‍යාපාර මගින් රුක් රෝපණය කරනු ලැබේ.

3) මේ වන විට කඳුකර ප්‍රදේශවල තිබෙන ෆයිනස් සහ ටර්පන්ටයින් වගා කළ භූමීන්වලින් එම වගා ඉවත් කොට, පරිභෝජන වනාන්තර ඇති කිරීමට කටයුතු කෙරේ.

4) එසේ ම දිවයිනේ දැව අවශ්‍යතාවය ගණනය කර එම දැව සැපයුම ලබා ගැනීම පිණිස වාණිජ වනාන්තර ඇති කිරීමට පුද්ගලික අංශය මගින් කටයුතු කරනු ලැබේ.

5) එසේ ඇති කරනු ලබන පුද්ගලික වාණිජ වනාන්තර මගින් වාර්ෂිකව රටේ දැව සැපයුම ස්ථාවරව ලබා ගැනීමට කටයුතු කරන අතර තිරසාර අයුරින් එම වගාවන් පවත්වාගෙන යෑම නියාමනය කෙරේ.

6) එම වාණිජ වනාන්තර ද ඒක ශාකීය නොවන බහු ශාකීය වගාවන් ලෙස පවත්වා ගෙන යෑමට ප්‍රතිපත්ති සකස් කෙරේ.

7) රාජ්‍ය දැව සංස්ථාව අහෝසි කරනු ලැබේ. එහි ඉඩම් රාජ්‍ය අංශයේ වෙනත් වුවමනාවන් සඳහා යොදා ගනු ඇත.

8) දැව සංස්ථාවේ කාර්යභාරය කොන්ත්‍රාත් පදනම මත පුද්ගලික අංශයට පැවරේ.

9) කාබන් වෙළෙඳපොළට ඇතුළු වීමට ශ්‍රී ලාංකීය වන වගාකරුවන්ට අවස්ථාව ලබා දේ. පුද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන අංශයේ මැදිහත් වීම මත, කාබන් අලෙවිකරණ ක්‍රමවේදයන්, නියාමනයන් සකස් කෙරේ. ඒ අනුව දේශීය වගාකරුවන් කාබන් වෙළඳපොලට ඇතුළු වීම දිරිමත් කෙරේ.

වනජීවී නියාමනය සහ රාජ්‍ය පරිපාලනය

1) වනජීවී, වන සංරක්ෂණ සහ සාගර පරිසර නියාමන ආයතන පරිසර අමාත්‍යාංශය යටතට ගැනේ. ඒවා එකම අමාත්‍යාංශයක් යටතේ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කෙරේ.

2) වන ජීවී නිලධාරීන් හට වඩාත් හොඳ වෘත්තීය පුහුණුවක් ලබා දෙනු ලබන අතර, හොඳ නිල ඇඳුමක් නිර්මාණය කෙරේ.

3) ඔවුන් හට ජීවිත රක්ෂණ ක්‍රමයක් ඇති කෙරේ.

4) සුදුසුකම් හා පුහුණුව මත ගිනි අවි ලබා දීමට කටයුතු සම්පාදනය කෙරේ.

5) වනාන්තරවල මෙන් ම වන ජීවීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට නිරන්තර සෝදිසිය, තාක්ෂණය යොදා ගැනීම දිරිමත් කරන අතර එම නිලධාරීන්ගේ වැටුප් තල උසස් කෙරේ.

6) පරිසර අමාත්‍යාංශ සතු නියාමන ආයතන අමාත්‍යවරයාගේ රාජකාරී සීමාවෙන් ඉවත් කොට ස්වාධීන තත්ත්වයට පත් කෙරේ. එම අධිකාරී සඳහා නිලධාරීන් පත් කිරීමට ව්‍යවස්ථා දායක සභාවට පැවරෙන අතර, දක්ෂතාවය, දැක්ම ඇති වෘත්තීය සුදුස්සන් මේ නියාමන ආයතනවලට පත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කෙරේ.

සාගර

1) සාගර අපවිත්‍ර වීම වැළක්වීම සඳහා ගංගා මෝය ආශ්‍රිතව දිය බාධක ක්‍රමයක් නිර්මාණය කෙරේ. එමගින් ගසා ගෙන එනු ලබන අපද්‍රව්‍ය සාගරයට එක් වීම අවම කර ගනී.

2) වෙරළ සංරක්ෂණ සහ සාගර ස්වාභාවික කළාප ආරක්ෂණය ශක්තිමත් කෙරේ.

3) සාගර ආරක්ෂක කලාප සංකල්පය පුළුල් කර අලුතින් මත්ස්‍යයින් බෝවන ස්ථාන හඳුනාගෙන ඒවා ධීවර කටයුතුවලින් හානි වීම අවම කර ගැනීමට නීති සකස් කෙරේ. එහෙත්, කාලයෙන් කාලයට තෝරා ගත් ධීවර උපක්‍රම මගින් එම ප්‍රදේශවල මසුන් ඇල්ලීමට විවෘත කෙරෙනු ඇත.

4) මත්ස්‍යයින් බෝවන වෙරළ ආශ්‍රිත කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කරගනු ලබන අතර ඒවා තවදුරටත් වර්ධනය කරනු පිණිස කඩොලාන වගා ව්‍යාපෘති දියත් කෙරේ.

කසළ කළමනාකරණය

කසළ කළමනාකරණය සහ නියාමනය පිළිබඳව වෙනම ප්‍රතිපත්තියක් මගින් ඉදිරිපත් කර තිබේ.

දේශගුණික විපර්යාස කාර්යය සභාව

1) දේශගුණික විපර්යාස කාර්යය සභාවක් පත් කෙරේ.

2) දේශගුණික විපර්යාස පිළිබඳව අධ්‍යයනය කිරීම, ඒ පිළිබඳව නව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ රටේ දේශගුණික ක්‍රියාකාරකම්වල ඉලක්ක අධීක්ෂණය හා ඒවා නියාමනය කිරීම එම ආයතනයට පැවරේ.

3) අන්තර්ජාතික සම්මුතීන්ට එළැඹීම, ඒවා අනුගමනය කිරීම සහ ජාතික වැඩපිළිවෙලක් මගින් එසේ ලබා දෙන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කිරීම මේ සභාවේ වගකීම් වෙයි.

4) රටේ ප්‍රවාහන ප්‍රතිපත්තියට අනුගත වෙමින් බලශක්ති පරිවර්තනය නිසිලෙස සිදුවෙනවා ද යන්න සොයා බැලීමටත්, පුනර්ජනනීය බලශක්ති ප්‍රභේද දිරිමත් කිරීමත්, ඒ අනුව යමින් විද්‍යුත් වාහන වෙළඳපොල වර්ධනය වෙනවා ද ඛනිජ තෙල් දහනය අවම උපක්‍රමවලින් සිදුවනවා ද යන්න අධීක්ෂණය කර ඒවාට විශ්ලේෂණ ඉදිරිපත් කිරීමත්, එම මැදිහත්වීම කිරීමට අදාළ බලය සහිත පාර්ශව වෙත යොමු කිරීමටත් සභාව බැඳී සිටී.

5) රටේ අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතන සමග එක්ව කටයුතු කරමින් දේශගුණික ක්‍රියාකාරකම් ඉලක්ක සපුරා ගැනීමට පොදු ජාතික වැඩපිළිවෙලක් නිර්මාණය කෙරේ.

පරිසර නීති

1) කර්මාන්ත සම්බන්ධ පාරිසරික නීති යාවත්කාලීන කෙරේ.

2) එම නීති කාර්යක්ෂමව ක්‍රියාත්මක වන අධිකරණ හා පරිපාලන යාන්ත්‍රණයක් සකස් කෙරේ.

3) කර්මාන්තවල පාරිසරික බාහිර සාධක ගණනය කොට ඒවා නිෂ්පාදන මිලට එක් කිරීමට කටයුතු කෙරේ.

4) කර්මාන්තවල ජල අපවහනය පරිසරයට නිකුත් කිරීමට පෙර පිරිපහදු කිරීමේ නීති සකස් කෙරේ.

5) කර්මාන්තවලින් සිදුවන වයු දූෂණය අවම කරගැනීමේ නීති සකස් කෙරේ. ඒ අනුව වඩාත් පිරිසිදු වාතාශ්‍රයක් පවත්වා ගෙන යෑමට පාරිසරික නීති යොදා ගැනේ.

වංචා දූෂණ වැළැක්වීම

ශ්‍රී ලංකාව ගොඩනගන ප්‍රතිපත්තියක ප්‍රධාන මාතෘකාවක් බවට වංචා සහ දූෂණ වැළැක්වීම යන්න දැක්විය හැකිය. රටේ ආර්ථිකය වෙලා ගත් දැවැන්ත, විනාශකාරී දේශපාලන ක්‍රමයේ පැවැත්ම වංචා දූෂණ ඔස්සේ වැටී තිබේ. වංචා දූෂණයට අනුබල සපයන විශාල රාජ්‍ය සේවයකින් සහ පරිපාලන අක්‍රමිකතා රැසකින් සමන්විත වර්තමාන දේශපාලන ක්‍රමය දූෂකයන් රැසකගෙන් පිරී තිබීම ද ඔවුන්ගේ බලයට නතුව තිබීම ද නිසා ඒවා පාලනය කිරීම එතරම් පහසු නොවේ.

මේ වත්මන් දූෂිත දේශපාලන ක්‍රමයට වගකිවයුත්තෝ හුදෙක් දේශපාලකයෝම පමණක් නොවේ ය. එහි වගකීම සමස්ත රට වැසියා ම බාර ගත යුතුය. දේශපාලකයා ද නිලධාරියා ද සහ පුරවැසියා ද යන තුන් පිරිසගෙන්ම අඩු වැඩි වශයෙන් මේ වංචා සහ දූෂණ සිදු වී තිබේ. එම නිසා චංචා දූෂණ වැළැක්වීමේ වැඩපිළිවෙලක දී මේ කොටස් තුන ම අපි සැලකිය යුතුය.

එසේම වත්මන් දේශපාලනයේ සිටින කිසිදු පක්ෂයක් හෝ කණ්ඩායමක් වංචා දූෂණ වැළැක්වීම පිළිබඳව පැහැදිළි ක්‍රමවේදයක් ඉදිරිපත් කර නොමැත. හුදෙක් නීතියේ පරමාධිපත්‍ය ඇති කිරීම මගින් පමණක් එය සිදු වේ යැයි ඔවුන් සිතති. එහෙත්, වංචා දූෂණ ප්‍රමාණාත්මකව ද ගුණාත්මකව ද සැලකිය යුතු මට්ටමෙන් අවම කරගත හැකි ප්‍රායෝගික ක්‍රමයක් ඔවුන් නොකියති. එනයින් එවන් වැඩපිළිවෙලක් මෙසේ ඉදිරිපත් කිරීමට අප සූදානම් වෙමු.

ඒ වෙනුවෙන් අපි දකින පුළුල් වැඩපිළිවෙල හමුවේ වංචා දූෂණ අවම කරන ක්‍රමවේදයන් 7 ක් අපි ඔබට දක්වන්නෙමු. ඒවා වංචා දූෂණ අවම කිරීම වෙනුවෙන් ම වෙන්වූ විශේෂ ක්‍රමවේදයන් නොව, රට හදන සැළැස්මක අන්තර්ගත කොටස් ය. එම දියුණු රට හදන මාර්ගයේම වංචා දූෂණ අවම කරන ක්‍රමය ද ගැබ් වී තිබීමෙන්, මේ දේශපාලන ක්‍රමය වෙනස් වූ විට වංචා දූෂණ ද අවම වන බවට අප සඳහන් කරනා ක්‍රමය යළි සනාථ වෙයි. එම කරුණු 07 මෙසේ ය.

1. කුඩා රාජ්‍ය සංකල්පය
2. කුඩා රාජ්‍ය සේවයක් හොඳ වැටුපක්
3. ආර්ථිකය නිදහස් කිරීම
4. නීතියේ පරමාධිපත්‍ය ඇති කිරීම
5. e Governance

6. මැතිවරණ වියදම් නියාමනය
7. නියාමන ආයතන ස්වාධීන කිරීම

කුඩා රාජ්‍ය සංකල්පය

රට හදන ප්‍රතිසංස්කරණවල අප ඉදිරිපත් කරන මූලික වැඩපිළිවෙලක් නම් කුඩා රාජ්‍ය සංකල්පයයි. එනම් අනවශ්‍ය ලෙස විශාලව වැඩී ඇති, අකාර්යක්ෂම රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගතකොට, කුඩා රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීමයි. එමගින් රජයේ වියදම් අවම කර ගැනීමට බලාපොරොත්තුවන අතර පාඩුව ආවරණය කර ගැනේ. දැනට තිබෙන ඇතැම් අතිරික්ත රාජ්‍ය ආයතන අහෝසිකර දැමීමත්, රජය කර්මාන්තවලින් නිදහස් වී වෙළඳපොලට නිකුත් කිරීම හෙවත් පුද්ගලීකරණය මගින් ආයතන අඩුකර ගැනීමත් දැක්විය හැකිය. එම ක්‍රමවේදයන් මෙම ප්‍රකාශනය තුළම වෙනත් තැන්වල විස්තර කරන බැවින් මෙහි දීර්ඝ ලෙස විස්තර නොකරයි.

මෙලෙස රාජ්‍ය කුඩා කිරීම තුළ ඒ ඒ ආයතන තුළ සිදුවන වංචා දූෂණ අහෝසි වී යෑම මත, වංචා දූෂණවල ප්‍රමාණය එමගින් අඩු වේ. එබැවින් කුඩා කාර්යක්ෂම රාජ්‍යයක් යනු වංචා දූෂණ අඩු රාජ්‍යයකි.

කුඩා රාජ්‍ය සේවයක් සහ හොඳ වැටුපක්

රාජ්‍ය කුඩා කිරීමේ සංකල්පයට සමගාමීව රාජ්‍ය සේවකයන් අවම කරගැනීමත් සිදු වේ. දැනට සිටින මිලියන 1.5 ඉක්මවූ රජයේ සේවකයන් ප්‍රමාණය ඉන් තුනෙන් එකක අගයට ගැනීමේදී, ඒ ඒ සේවකයන් අතින් සිදුවන වංචා දූෂණ ප්‍රමාණය අඩු වේ.

වංචාවක් හෝ දූෂණයක් සිදුවීමේදී රාජ්‍ය නිලධාරියෙකු සහ පුරවැසියෙකු අතර සේවය ඉටුකර ගැනීමක් ඉවහල් වෙයි. ඒ සේවය සැපයීම වෙනුවෙන් බොහෝවිට අල්ලස් දීම හා වංචා දූෂණවලට මාර්ගය විවර වීම සිදුවෙයි. අප රාජ්‍ය සේවය සකස් කළයුත්තේ ඒ හමුවීම් අවම වන පරිදි ය. රාජ්‍ය සේවකයන්ගෙන් ද බොහෝ දෙනෙක් මේ වංචා දූෂණවල කොටස්කරුවන් බැවින්, එම කොටස ප්‍රමාණාත්මකව අඩුවීම මත වංචා දූෂණ අඩු වීමක් සිදු වේ. රාජ්‍ය සේවය කප්පාදු කරගැනීම ගැන ප්‍රතිපත්තිය මෙම ප්‍රකාශනයේම වෙනත් තැනක දක්වා තිබේ. එනයින් දීර්ඝ විස්තරයක් මෙහි නොකෙරේ.

එසේම බොහෝ රාජ්‍ය නිලධාරීන්හට වංචා සහ දූෂණවලට යොමු වීමට පසුබිම නිර්මාණය වන්නේ ඔවුන්ගේ යාවත්කාලීන නොවූ ඉතා කුඩා වැටුප් තල නිසා ය. අපගේ ආර්ථික ක්‍රමවේද මගින් වේගයෙන් ධනය ජනිත කිරීමේ වැඩපිළිවෙලක් තුළ රජයේ ආදායම් ඉහළ යන අතර ඒ ඔස්සේ ජනතාවගේ ආදායම් ඉහළ දැමීමක් සිදු කිරීමට බලාපොරොත්තු වෙයි. ඒ අනුව සියලුම ශ්‍රමිකයන්හට උද්ධමනයට අනුපාතව වාර්ෂිකව ඉහළ යන නව වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. එමගින් උසස් ජීවන තත්ත්වයකට අවශ්‍ය ආදායමක් ලැබෙන වැටුප් ක්‍රමයක් නිර්මාණය කිරීම මගින් රජයේ සේවකයන් වංචා සහ දූෂණවලට යොමුවීම අවම කරගැනීමට බලාපොරොත්තු වේ.

ආර්ථිකය නිදහස් කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ දක්නට ලැබෙන බාධාකාරී ලක්ෂණයක් නම් මේ තුළ ඇති පර්මිට් සහ ලයිසන් ක්‍රමයි. එමගින් ඇති කරනු ලබන අධික වෙළඳපොල නියාමනය මගින් කර්මාන්ත සිර කරගෙන සිටීම නිසා වෙළඳපොල ක්‍රියාත්මක වීමට රජයේ නියාමන ආයතනවල සේවකයන්ට හා දේශපාලකයන්ට අල්ලස් දීම සිදුවෙයි. මෙලෙස පැරණි වාමාංශික වැසුණු ආර්ථිකය න්‍යායන්ට ගැළපෙන ලෙස සකස් වූ රටේ ආර්ථිකය විවෘත වෙළඳපොලට ගැළපෙන ලෙස ප්‍රමාණවත්ව නිදහස් කොට නොමැත. එලෙස නියමිත යාවත්කාලීන වීමකට ලක් වී නොමැති නිසා අනවශ්‍ය අධික නියාමනයකට රටේ වෙළඳපොල තවමත් ලක්වේ. එමගින් රටේ ආර්ථිකය සිරකොට තබනවා පමණක් නොව, ඒ නියාමනයන් ඔස්සේ දේශපාලන බලය ඇත්තන් වෙළඳපොළට බලපෑම් කර සෞඛ්‍යය සම්පන්න වෙළඳපොල තරඟය අභිබවා වෙළඳපොල වාසි අත්කර ගැනීම සිදු වේ. එසේ ම, නිලධාරීන් සහ සේවකයන් එම නියාමනය භාවිතා කොට ඒවා වංචා සහ දූෂණවලට ඇති අවස්ථා ලෙස යොදා ගනී.

අප නිර්මාණය කරනු ලබන නිදහස් විවෘත වෙළඳපොල ක්‍රමයක් තුළ අවම නියාමනයක් පවත්වාගෙන යෑම නිසා සෞඛ්‍යය සම්පන්න දක්ෂයාට ඉඩ ලැබෙන වෙළඳපොල තරඟයක් ඇතිවන අතර, රාජ්‍ය නිලධාරීන්හට නියාමනය භාවිතා කොට අල්ලස් ගැනීම සහ වංචා සිදුකිරීමට හැකියාවක් නොලැබේ. එමගින් ආර්ථිකයේ වේගවත් සංවර්ධනයක් ළඟා කර ගැනීමට අඩිතාලම දැමේ.

නීතියේ පරමාධිපත්‍ය ඇති කිරීම.

රටේ නීතියේ පරමාධිපත්‍ය ගිළිහී ඇති බව අපි දනිමු. එය ක්‍රියාත්මක වන්නේ පාලකයාගේ කැමැත්තට බවත්, නීතිය දුර්වල වී ඇති බවත්, සාධාරණය ඉටුකර ගැනීමට ඇති අවස්ථාවන් අකර්මණ්‍ය බවත් අපි දනිමු.

නීතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක නොවේ නම්, මිනිසුන් එය විශ්වාස නොකරන මට්ටමට පත් වෙයි නම්, නීතියට ඇති බිය පහව යෑම නිසා මිනිසුන් වැරදි කිරීමට නොපැකිළ වෙයි. එම නිසා ජනතාවට ඔවුන්ට සිදු වන වංචා දූෂණ වෙනුවෙන් පැමිණිළි කිරීමට පෙළඹවීම ඇති කිරීමත්, ඒවායේ කටයුතු විනිවිද භාවයෙන් සිදුවීමත්, අවම කාලයකින් නියමිත විමර්ශන සිදුකොට වගකිව යුත්තන් නීතිය හමුවන පැමිණීමට කටයුතු කිරීමත් සිදු විය යුතුය.

පොලිසිය, අල්ලස් සහ වංචා දූෂණ කොමිසම, රසපරීක්ෂණ ආයතන ආදිය වඩාත් සාධාරණ සහ කාර්යක්ෂම ආයතන බවට පත් කොට, ඒවාට ඇති දේශපාලන බලපෑම ඉවත් කොට ස්වාධීන ලෙස කටයුතු කිරීමට සකස් කිරීම මගින් නීතියේ පරමාධිපත්‍ය ඇති කිරීම රටේ වංචා දූෂණ වැළැක්වීමට ප්‍රධාන අවශ්‍යතාවයකි.

එනයින්, නීතියේ පරමාධිපත්‍ය පිහිටුවන තුරු වංචා දූෂණ වැළක්වීම කළ නොහැක. වැරදි කරන්නා නැවැත්වීමට නම් නීතිය ශක්තිමත් විය යුතුය. වැරදි කරන්නා නීතියට බිය විය යුතුය. එවිට වංචා දූෂණ අවම කිරීම සිදු කළ හැකිය.

e Governance **ක්‍රමවේදය.**

ශ්‍රී ලංකාවේ සිදු වන වංචා දූෂණවල ප්‍රධාන හේතුවක් නම් රාජ්‍ය පරිපාලනයේ ඇති අක්‍රමික භාවයයි. නූතන ලෝකයේ යහපාලයක් ඇති කිරීමට මෙන්ම විශාල මිනිසුන් ප්‍රමාණයක් පාලනය කිරීමට තවමත් කඩදාසිවල ඉරි අදිමින්, ලිපිගොනු ආධාරයෙන් කළ නොහැක්කකි. දූෂිත ආකාරයට වෙනස්කම් කිරීම, අස්ථාන ගත කිරීම, ව්‍යාජ තොරතුරු ඇතුළත් කිරීම ආදිය එම අක්‍රමිකතා අවභාවිතා කරමින් සිදු වන්නකි. එම නිසා එම පැරණි ක්‍රම වංචා දූෂණවලට ඉඩකඩ නිර්මාණය කර දෙයි. විනිවිද භාවය ඇති කිරීම සහ වගවීම ඇති කිරීම වෙනුවෙන් අත්‍යවශ්‍ය වැඩපිළිවෙලක් ලෙස නූතන තාක්ෂණය භාවිතයෙන් රාජ්‍ය පරිපාලනය සඳහා ජාලගත e Governance ක්‍රමවේදය හඳුන්වා දීම සිදු කළ යුතුය.

e Governance ක්‍රමවේදය ද රාජ්‍ය පරිපාලනය තුළ අපි ඇති කරනු ලබන්නේ එහි කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීම සඳහා ය. එයද දීර්ඝ

ලෙස රාජ්‍ය පරිපාලනය යටතේ විස්තර කෙරෙන අතර, ඒ ක්‍රමය මගින් විනිවිදභාවය, වගවීම හා ක්‍රමවත්භාවය ඇති කිරීම මත වංචා දූෂණ අවම කරගැනීමට ඉන් අවස්ථාව උදා වෙයි.

මැතිවරණ ව්‍යදම් නියාමන පනත

ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් නම් මැතිවරණයක් දිනීම සඳහා අපේක්ෂකයන් අධික මුදලක් ව්‍යදම් කිරීම ය. ඔවුන් තරඟ කරන නිලයෙන් වැටුප් හා දීමනා ලෙස ඉපයිය නොහැකි තරම් මුදලක් ව්‍යදම් කිරීම මගින් බලය ලබා ගන්නා ඔවුන්, ඒ ව්‍යදම් කළ මුදල යළිත් දේශපාලන තුළින් උපයා ගැනීමට උත්සාහ කිරීම තුළ වංචා දූෂණ කිරීමට ඔවුන් පෙළඹේ.

බොහෝ විට දේශපාලකයන් ගජමිතුරන් සමග එක්ව දේශපාලන බලය ලබා ගැනීම තුළ රාජ්‍ය බලය භාවිතා කොට සිය ව්‍යාපාරවලට වාසි ලබා ගැනීම, නෑයන් සහ හිතමිතුරන්හට දේශපාලන පත්වීම් ලබාදීම, සහ රාජ්‍ය සම්පත් අවභාවිතා කිරීම, වෙළඳපොල වාසි ලබා ගැනීම ආදිය සිදු වේ. එමගින් අප රටතුළ නිර්මාණය වී ඇති ගජමිතුරු ධනවාදය පවත්වා ගෙන යෑමට ද වංචා දූෂණ කර ගෙන යෑමට ද මාර්ගය විවෘත කර ගනී. එම නිසා මැතිවරණවලට ව්‍යදම් කළ හැකි මුදල සීමා කිරීමත්, මුදල් ලැබෙන ඒවා විනිවිදභාවයෙන් ප්‍රසිද්ධ කිරීමත්, ඒවා විගණනය කිරීමත් මේ තත්ත්වය පාලනය කර ගැනීමට අත්‍යාවශ්‍ය කරුණු වෙයි.

එවිට මුදල් බලය භාවිතා කොට දේශපාලන බලය ලබා ගැනීමට ඇති හැකියාව අවම කරගැනීමටත්, සාමාන්‍ය මිනිසුන්හට දේශපාලනයේ නියැළීමට සාධාරණ අවස්ථාවක් නිර්මාණය වීමත්, වංචා දූෂණ, ඥාති සංග්‍රහය, හා ගජ මිතුරු ධනවාදය වළක්වා ගැනීමටත් හැකියාව ලැබේ.

නියාමන ආයතන ස්වාධීන කිරීම.

වංචා දූෂණ සිදුවන තවත් එක හිඩැසක් වන්නේ යම් ක්ෂේත්‍රයක් නියාමනය කිරීමට ඇති රාජ්‍ය පරිපාලන ආයතනය ස්වාධීනව ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් ඇති නොකොට ඒවා එම අමාත්‍යාංශය භාර ඇමතිවරයා විසින් ම පාලනය වන තත්ත්වයට පත් කිරීමයි. එනම්, දේශපාලන බල අධිකාරියට සිතැඟි පරිදි රටේ විවිධ කර්මාන්ත හා ක්ෂේත්‍ර නියාමනයට අවස්ථාව ලබා දීමයි.

එහි දුර්වලතාවය නම්, දේශපාලන ක්‍රමය මගින් පත්වන බලය ලැබෙන පුද්ගලයන් විවිධ නියාමන උපයෝගී කරගනිමින්, අයථා ලෙස වෙළඳපොල පාලනය කිරීමත්, වෙළඳපොල තුළ ඇති සෞඛ්‍යය සම්පන්න වෙළඳ තරඟයට බලපෑම් කොට හිතවතුන් හට වාසි ලබා දීමත්, විවිධ කොමිස් සහ අල්ලස් ලබා ගැනීමට පෙළඹීමත් ය.

එනිසා, රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ යටතේ නිර්මාණය වන නියාමන අධිකාරීන්ගේ ස්වාධීන නියාමන හැකියාව දියුණු කිරීමත්, එය අවභාවිතා කොට අල්ලස් ගැනීම, කොමිස් ගැසීම හා වාසි ලබා ගැනීමට එම ආයතන පාලනය කරන්නන් හට අවස්ථාව නොලැබෙන අයුරින් නිර්මාණය කිරීමත් අත්‍යාවශ්‍ය වෙයි.

මේ ආකාරයට රටේ වංචා හා දූෂණ වැළක්වීම පිණිස අප ගතයුතු පැහැදිළි ක්‍රියාමාර්ග රාශියක් වෙයි. ඒවා මගින් ප්‍රමාණාත්මකව සහ ප්‍රායෝගිකව වංචා දූෂණ අවම කරගැනීමේ හැකියාව ලැබේ.

මේ ප්‍රතිසංස්කරණ යනු, පූර්ණ රාජ්‍ය දේශපාලන ක්‍රම වෙනසක් තුළ සිදුවන පුළුල් පරිවර්තනයක ප්‍රතිඵලයකි. ඒවා වෙන වෙ ම ඇති වන්නක් නොව ඒ සමස්ත පරිවර්තනය තුළ සිදුවන ක්‍රියාවලියකි. මේ පරිවර්තනය එක් දිනක, එක් මොහොතක ඇති වන්නක් නොව රාජ්‍ය පරිපාලනය තුළ කාලයක් වැය කොට ක්‍රමිකව ඇති වන වෙනස්කමකි.

එය වසර 5 ක් පමණ පුරාවට සිදුවිය හැකි වෙනස්කමකි. ඒ වෙනුවෙන් රාජ්‍ය පරිපාලනය යාවත්කාලීන කරගැනීම මගින් සොරෙකුට වුව ද සොරකම් කළ නොහැකි ක්‍රමවේදයක් සකස්කර ගැනීම කළ හැකිය. එබැවින් අපි අපේ අවධානය සමස්ත චිත්‍රය දෙස බැලීමටත්, පුළුල් පරිවර්තනය සිදුකර ගැනීම සඳහාත් යොමු කරන්නෙමු.

රාජ්‍ය සේවකයන් අඩු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව සංවර්ධිත රාජ්‍යයක් කරා රැගෙනයන ගමන නිර්මාණය කිරීමේදී අප විසින් අත්‍යාවශ්‍යයෙන්ම සිදුකළයුතු වෙනස්කමක් ලෙස රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ දැක්විය හැකිය.

නිදහසෙන් පසු අප විසින් ඈදාගත් බ්‍රිතාන්‍යයන් ගෙන් සෘජුවම දායාද වූ එවකට පැවති වෙබේරියන් ක්‍රමයට සකස් වූ රාජ්‍ය සේවය ශ්‍රී ලංකාවේ තවමත් පවතිනු දක්නට ලැබෙයි. ලෝකයේ රාජ්‍ය සේවය නූතන විද්‍යාත්මක දැනුම සමගින් යාවත්කාලීන වී පරිවර්තනය වී තිබුණ ද අපේ රටේ ඒ පරිවර්තනය සිදු වී නොමැත. එනයින්, රට හදන වැඩ පිළිවෙලකදී රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ වලට මූලික තැනක් හිමිවේ.

ශ්‍රී ලංකාවේ මහජනතාව රාජ්‍ය සේවයට දැඩි කැමැත්තක් දක්වති. රටේ ශ්‍රමිකයන් හට වඩාත් හොඳ රැකියා සුරක්ෂිතතාවයක් ලැබෙන්නේ ද, ඔවුන් බලාපොරොත්තුවන පහසු ජීවිතයක් ලැබෙන්නේ ද, සමාජ ගෞරවයට පාත්‍ර වන්නේ ද රජයේ සේවයෙන් යැයි සමාජ සම්මතයක් තිබේ. එසේම කුඩා වූවත් විශ්‍රාම වැටුප ද මිනිසුන් රජයේ රැකියාවන් වෙත ඇඳ බැඳ තබන තවත් එක් ප්‍රතිලාභයකි. මේ රජයේ රැකියාවන්ට ඇති කැමැත්ත නිසාම දේශපාලකයන් එය ඇමක් සේ යොදා ගෙන සිය මැතිවරණ කටයුතු වලට තරුණ තරුණියන් ආකර්ෂණය කරගැනීමට කටයුතු කොට තිබේ. රජයේ රැකියාවක් ලබා ගැනීමට ඡන්දයට වැඩ කළයුතු යැයි ද, අනතුරුව බලය ලබා ගන්නා දේශපාලකයාගේ මැදිහත්වීමෙන් රජයේ රැකියාවක් ලබාගත හැකි යැයි ද සමාජය පිළිගත් සම්මතය වී තිබේ. මේ සම්මතයේ අවසන් ප්‍රතිඵලය නම් රැකියා වලට නුසුදුස්සන් රාජ්‍ය සේවය තුළ පිරී යෑමත් එම රාජ්‍ය සේවය රජයට දැරිය නොහැකි තරම් විශාල වීමත් හා රාජ්‍ය අකාර්යක්ෂම වීමත් ය. වත්මන් ආර්ථික අර්බුදයේ ප්‍රධාන මූල බීජයක් ලෙස මේ තත්ත්වය දැක්විය හැකිය.

එනයින්, මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන මගක, මෙන්ම රට ආර්ථික සංවර්ධනය කරා ගෙනයන පාරක, රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂමකර ගැනීමත්, එහි සේවක බර අඩුකර ගැනීමත් දැක්විය හැකිය. වත්මන් රාජ්‍ය සේවක සංඛ්‍යාව වන මිලියන 1.5 ක පිරිස, මිලියන 0.7 කට වඩා අඩුකළ යුතුය. මේ සංකල්පය දුටුවනම අභියෝගයක් මෙන් පෙණුනද අප යෝජනා කරන නූතන සමස්ථ ප්‍රතිසංස්කරණ තුළ ආර්ථිකය වෙනස් කිරීම තුළ එය ඉටුකර ගැනීම අපහසු නොවේ.

රජය කුඩා කිරීම, රජය කර්මාන්ත වලින් ඈත් වීම, පුද්ගලීකරණය, වෙළෙඳපොළ නිදහස ඇති කිරීම ආදිය මත රජයේ සේවක බර අඩු කර

ගැනීමට පදනමත්, දියුණුවන ආර්ථිකයක් මගින් එම සේවකයන් වෙනත් රැකියා ලබා දීම සහ ආර්ථික අවස්ථා නිර්මාණයකර දීමත් සිදු කළ හැකිය. එනයින්, රජයේ සේවකයන් අඩු කිරීම යනු හුදෙකලා කටයුත්තක් නොව, රටේ සමස්ථ ආර්ථිකයේ සිදු වන වෙනස් කමක් සමග සමාන්තරව සිදු වන තවත් පරිවර්තනයකි. එබැවින් එය අපහසු නොවේ.

එම නිසා කරුණු 7 කින් රාජ්‍ය සේවක බර අඩු කර ගැනීමේ ක්‍රියාවලිය පැහැදිළි කරන්නෙමු.

1. කළින් විශ්‍රාම යෑමට අවසර දීම
2. නිශ්චිත කාලයක් යනතුරු වැටුපෙන් අඩක් ලැබෙන ලෙස රැකියාවෙන් ඉවත් වීමට අවසර දීම.
3. නව රැකියා සඳහා පුහුණු වීමට, වැඩිදුර අධ්‍යාපනයට අවස්ථා ලබා දීම.
4. ව්‍යාපාර කිරීමට ආයෝජන/ණය ලබා දීම.
5. වන්දි හෝ කොටස් ලබා දී ඉවත් කිරීම.
6. රට රැකියා සඳහා අවස්ථා ලබා දීම.
7. සැමට විශ්‍රාම වැටුපක් ලැබෙන ක්‍රමයක් සකස් කිරීම.

කළින් විශ්‍රාම යෑමට අවසර ලබා දීම

ඇතැම් රාජ්‍ය සේවකයන් කළින් විශ්‍රාම යෑමට කැමැති විය හැකිය. ඔවුන්ට වෘත්තීය ඉදිරි ගමනක් නොමැති නම්, විශ්‍රාම වයස පැමිණෙන තුරු නොසිට කළින් ඉවත් වී විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවසර ලබා දීමෙන් යම් පිරිසක් ඉවත් කර ගැනීමට හැකියාව ලැබේ.

නිශ්චිත කාලයක් යනතුරු වැටුපෙන් අඩක් ලැබෙන ලෙස රැකියාවෙන් ඉවත් වීමට අවසර දීම

ඇතැම් රජයේ සේවකයන් ඉතා දුර බැහැර සිට රජයේ රැකියා වලට ප්‍රවහන පහසුකම් සලසා ගනිති. නවාතැන් පොළවල නැවතී සිටිති. ඇඳුම් පැළඳුම් සපයා ගැනීම, සමාජ කටයුතු වලට සහභාගී වීම ආදිය නිසා වැටුපෙන් විශාල කොටසක් ඔවුන්ට අහිමි වෙයි. ඔවුන්ට ඒ වැටුපෙන් කොටසක් ලබා දී රාජ්‍ය සේවයෙන් ඉවත් වීමට අවස්ථාවක් ලබා දුනහොත් මේ පිරිසෙන් කොටසක් ඉවත් කරගැනීමට අවස්ථාව ලැබේ.

නව රැකියා සඳහා පුහුණුවීමට, වැඩිදුර අධ්‍යාපනයට අවස්ථාව ලබා දීම

රජයේ රැකියාවන් හි නියුතු පුරවැසියන් හට ඇති ලොකුම බාධාවක් නම් ඔවුන්ගේ රැකියා පුහුණුව විවෘත වෙළඳපොල තුළ රැකියාවක් සොයා ගැනීමට නුසුදුසු වීමයි. එසේම විවිධ දේශපාලන පත්වීම් නිසා රැකියා ලබාගත් මිනිසුන්හට හොඳ රැකියාවකට සුදුසුකම් නොමැති වීමයි. මේ අභියෝගයට මුහුණ දීමට කළ හැකි හොඳම කාර්යය නම් එම සේවකයන් විවිධ රැකියා පුහුණුවීම් සහ පාඨමාලා සඳහා යොමු කරවීමයි. එය වසරක්, දෙකක් හෝ තුනක කාලයක් ගතවන වැඩපිළිවෙලක් වූවත්, රජයේ වෘත්තීය පුහුණු ආයතන හා උසස් අධ්‍යාපන ආයතන එක්ව දියත් කරන සුවිශේෂී වැඩපිළිවෙලක් මගින් වසරක් පාසා සිදුකෙරෙන සැළසුම් සහගත ක්‍රියාවලියකින් සේවකයන් නිදහස් වෙළඳපොලක් තුළ රැකියාවක් ලබාගැනීමට සුදුස්සෙකු බවට පත්කෙරේ. ඒ අනුව ගොඩනැගෙන ආර්ථිකයක අලුත් රැකියා අවස්ථා ලබාගෙන ඔවුන්ට පිටවී යෑමට අවස්ථාවක් ලබා දිය හැකිය.

ව්‍යාපාර කිරීමට ආයෝජන හා ණය ලබා දීම

ඇතැම් රජයේ සේවකයන් විවිධ ව්‍යාපාර ආරම්භ කිරීමට කැමති විය හැකිය. ගොඩනැගෙන වර්ධනය වන ආර්ථිකයක ඒ සඳහා අවස්ථා උපරිමයෙන් තිබේ. එම ආර්ථික අවස්ථා හඳුනාගෙන අලුත් ව්‍යාපාර කිරීමට නැඹුරුවක් ඇති සේවකයන් හට රාජ්‍ය බැංකු මගින් ණය මුදලක් ලබා දීමට කටයුතු කළ හැකිය. එසේම එම ව්‍යාපාර සාර්ථක කරගැනීමට රජයේ පූරණ සහය ලබා දේ.

වන්දි හෝ සමාගම් කොටස් ලබා දී ඉවත් කිරීම

ඇතැම් සේවකයන් වන්දි ලබා දී ඉවත් කළ හැකිය. එය ද දීර්ඝකාලීනව වාසිදායක වන අතර ඇතැම් සමාගම් පුද්ගලීකරණය කොට වෙළඳපොලට නිකුත් කිරීමේදී සේවකයන් හට ඉන් කොටස් ප්‍රමාණයක් ලබා දීම ද සළකා බැලිය හැකිය. එවන් ඉවත්වීම් සඳහා ද කැමති පිරිසක් මෙහි සිටී.

සැමට විශ්‍රාම වැටුපක් ලැබෙන ක්‍රමයක් සකස් කිරීම

රජයේ රැකියාවකට මිනිසුන් මෙතරම් කැමති වන ප්‍රධාන සාධකයක් නම් විශ්‍රාම වැටුප යි. ශ්‍රී ලංකාවේ දුර්වල ආර්ථික සංකල්පයක්වන රජයේ

සේවකයන්ට පමණක් විශ්‍රාම වැටුප් ලැබෙන ක්‍රමය වෙනුවට රටේ රැකියාවේ නියුතු සියළුම පුරවැසියන්හට විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ අවස්ථාව හිමි විය යුතුය. ඒ සඳහා අලුත් කරන ලද සේවක අර්ථසාධක ක්‍රමයක් නිර්මාණය කළයුතුය. රජයේ හෝ පුද්ගලික අංශයේ වේවා සැමට සාධාරණ විශ්‍රාම වැටුපක් ලැබෙන ක්‍රමයක් නිර්මාණය කිරීමෙන් සේවකයන් රජයේ සේවයෙන් ඉවත් වීමට මැළි නොවනු ඇත.

රට රැකියා සඳහා අවස්ථාව සළසා දීම

රජයේ සේවකයන් ද බොහෝ දෙනෙකු රට රැකියා සඳහා යෑමට කැමැත්ත පළකර සිටියේ ය. ඒ අනුව විදෙස් රැකියා සඳහා යෑමට කැමති හා සුදුසු සේවකයන් හට විදෙස් රැකියා සොයා දීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

මෙම ක්‍රමවේදයන් මගින් යම් කාල පරාසයක් තුළ රජයේ සේවකයන් ගණනය කරන ලද ඉලක්කගත ක්‍රමයකට ඉවත් කරගැනීම සිදුකර ගත හැකිය. එය වසරකට කොපමණ දැයි ගණනය කර වසර 5 ක පමණ කාලයක් තුළ සැලසුම් කර සිදුකර ගත හැකිය. එනයින් රජයේ සේවකයන් ඉවත්කර ගැනීම අපහසු කටයුත්තක් නොවේ. වර්ධනය වන ආර්ථිකයක ගොඩනැගෙන ආර්ථික අවස්ථා උපයෝගී කරගනිමින්, වඩාත් හොඳ ආදායම් ඇති රැකියා හෝ වෙනත් ව්‍යාපාර අවස්ථා වලට යොමු කිරීම වඩා ප්‍රායෝගික විසඳුමක් යැයි අප විශ්වාස කරන්නෙමු.

රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ

ශ්‍රී ලංකාවේ අනාගතය වෙනස් කිරීමට නම් අප රටේ ප්‍රධාන මුල්ගල් තුනක් වෙනස් කළයුතු බව අපගේ මතයයි. රටේ දියුණුවද පැවැත්ම ද අනෙකුත් සියළුම ක්ෂේත්‍රයන්ගේ පරිවර්තනය ද මෙම ක්ෂේත්‍ර තුන මුල්කරගෙන, ඒවායේ ඇති වන නව්‍යකරණය වීම්, වෙනස්වීම් හා දියුණුවීම මත ඉදිරියට යනු ඇත. රටක පදනම දමන එම ක්ෂේත්‍ර තුන නම් යහපත් දේශපාලනය, කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනය සහ නීතියේ පරමාධිපත්‍ය වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ බහු පක්ෂ සහිත යහපත් දේශපාලනයක් නිර්මාණය කරගත යුතු අතර එය අප සමාජයේ සිදුවන කාලීන පරිවර්තනයක් වේ. එය ඉබේ පහලවීමක් සිදුනොවනු ඇත. එම දේශපාලන වෙනස රැගෙන ඒම සඳහා අප එකා මෙන් වෙහෙසවී සාමූහිකව කටයුතු කළ යුතුව ඇත. වත්මන් දේශපාලන ක්‍රමයේ මෙන්ම පුරවැසි චින්තනයේ ද ඇති වන සාමූහික වෙනස්වීමක් මේ රටට අත්‍යාවශ්‍යය. එම වෙනස ඇති කරගැනීමත්, එය පවත්වාගෙන යෑමත් අප පරම්පරාව ඉදිරියේ ඇති සාමූහික වගකීමක් ද වෙයි. ඒ සඳහා නව දේශපාලන දර්ශනයක්, නව ආරක දේශපාලන නායකත්වයක් අප නිර්මාණය කරගත යුතුව තිබේ. අප මේ නියැලී ඉන්නේ ඒ බාර ධූර කාර්යයේ බව ඔබට සතුටින් දන්වනු කැමැත්තෙමු. එම යහපත් දේශපාලනය නම් සරු කෙතේ පළමු මුරයේම අප වැපිරවිය යුතු බෝගය නම් කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනයයි. එනයින් අනෙකුත් සියළු ප්‍රතිසංස්කරණ වල මධ්‍යයේ තිබිය යුතු, ඒවායේ සාර්ථකත්වයට සෘජුවම බලපාන රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස අප සළකන්නෙමු.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය සකස් වී ඇත්තේ පැරණි ලෝකයේ ප්‍රචලිත වූ වෙබේරියන් ක්‍රමයට ය. යටත් විජිත පාලනයෙන් මෙරටට උරුම වූ රාජ්‍ය පරිපාලන ක්‍රමයක් වූ එය, රටේ අනෙකුත් ක්ෂේත්‍ර මෙන්ම කාලීනව වෙනස් නොවුණි. එම ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීම පිළිබඳව කථිකාවතක් තිබුනේ යැයි පෙනෙන්නට ද නොමැත. බටහිර අධිරාජ්‍යවාදයෙන් නිදහස ලබා ඔවුන්ගේ ක්‍රමයක සිටිමින්, ක්‍රමිකව සමාජවාදී රාජ්‍යයන් වෙත නැඹුරු වූ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන් දැමූ වෙළඳපොල පදනමත්, ලෝකයේ කොමියුනිස්ට් වාදයේ නැග්මෙන් ඇති වූ මතවාදී සට්ටනයත් අතර දෝලනය වෙමින්, ඒ සියල්ලට යටින් තිබූ ජාතිවාදී ගැටළුත්, බෙදුම්වාදයත් කරපින්නා ගෙන එකම තැන පල් වූවා යැයි සිතිය හැකිය. පැරණි ක්‍රමවේදයන් වල ගෝලීයව ඇති වූ යාවත්කාලීන වීම් ශ්‍රී ලංකාවට ගෙන

ඒමට තරම් දේශපාලන බල අධිකාරීන් සාර්ථක වූයේ නොමැත. ඒ වෙනුවට වසර 30 ක සිවිල් යුද්ධයකට කොටු වූ අප, එහි ප්‍රථිපලයක් ලෙස තත්ත්වය වඩාත් සංකීර්ණ කර ගනිමින් 13 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් සභා පිහිටුවා ගත්තේ ය.

13 වන සංශෝධනය ඔස්සේ පළාත් සභා පිහිටුවා ගැනීමෙන් රාජ්‍ය පරිපාලනය තව දුරටත් විශාල අකාර්යක්ෂම පද්ධතියක් බවටත්, රජය විශාල වීමත්, රාජ්‍ය වියදම් ඉහළ යෑමත් සිදු වූයේ ය. එසේම රාජ්‍ය සේවාවල තවත් එක් ප්‍රතිරෝදයක් එල්ල කරන ස්ථරයක් නිර්මාණය කිරීම තුළ වංචා දූෂණ කෙරෙහිද තවත් එක දොරටුවක් විවර කළේ ය. රාජ්‍ය පරිපාලනය තවත් කුඩා ඒකක වලට බෙදීම තුළ තීරණ ගැනීමේ බලය විශේෂ වාසියක් නොමැතිව විසිරී යෑමක් සිදු වූ අතර, ඇතැම් කටයුතු අඩාල කරවන්නක් වූයේ ය.

මේ ගැටළු හඳුනා ගනිමින්, රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ ඔබට මෙසේ ඉදිරිපත් කිරීමට අපට හැකිය.

1. නව ව්‍යවස්ථාවක් ඇති කර ගැනීම.

ශ්‍රී ලංකාවේ වත්මන් ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් ඇති කර ගත යුතු බව අප විශ්වාස කරන්නෙමු. දැනට සංශෝධන රැසකට භාජනය වී ඇති පවතින ව්‍යවස්ථාවේ ඇති අඩුපාඩු රාශියක් මේ වන විට ජනතාවට අවබෝධ වී තිබේ. එහි ඇති දුර්වලතාවය නම් මේ ව්‍යවස්ථාව ජනතාවගේ සැබෑ කැමැත්ත මත එක් වරක්වත් සංශෝධනය නොවීම ය. බලයේ සිටින පාලකයන්ගේ බලය දීර්ඝකාලීන ලෙස පවත්වා ගෙන යෑම, තිබෙන බලය ආරක්ෂා කර ගැනීම ආදි පුද්ගලික ඕනෑ එපාකම් වලට විටින් විට වෙනස් කරන ලද එය රටේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය නිවැරදිව විදහා දක්වන ලියවිල්ලක් නොවුණේ ය. ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ බලය තුලනය සහ නිෂේධනය කළ හැකි, බලය එක් පුද්ගලයෙකුගේ අතට අධික ලෙස කේන්ද්‍ර ගත නොවන නව ව්‍යවස්ථාවක ජාතික අවශ්‍යතාවය අපි පිළිගන්නා අතර ඒ සඳහා හැකි ඉක්මනින් කටයුතු කිරීමට බලාපොරොත්තු වන්නෙමු.

ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම යනු ඉතා පුළුල් මහජන සහභාගිත්වයෙන් සිදු විය යුතු, යම් කිසි කාලයක් ගතවන ව්‍යායාමයක් වන අතර, එය නිර්මාණය කරගත් පසු සම්මත කරගැනීමට පාර්ලිමේන්තුව තුල ⅔ ක බලයක් ද අවශ්‍ය වෙයි. එම නිසා අප එවන් බලයක් නිර්මාණය කර

ගැනීමට උත්සාහ කරනු ලබන අතර, අනෙකුත් දේශපාලන කඳවුරු සමග අවබෝධයන් ඇති කරගනිමින්, නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම හෝ එවන් ව්‍යායාමයකට සහය දැක්වීමට බලාපොරොත්තු වන්නෙමු.

2. රජය කුඩා කිරීම හා රාජ්‍ය බලවත් කිරීම.

ශ්‍රී ලංකාව සඳහා නව රාජ්‍ය පරිපාලනයක් නිර්මාණය කිරීමේදී අප සැළකිය යුතු ප්‍රධාන කරුණක් නම් රජය කුඩා කර ගැනීමයි. පැරණි සංකල්ප වලට අනුකූලව, රාජ්‍ය මූලික ආර්ථිකයක් නිර්මාණය කිරීමත්, එය අධිනියාමනයකට ලක් කිරීමත් කරුණු කොට ගෙන ශ්‍රී ලංකාවේ රජය විශාල ආයතනයක් ලෙස වැඩි ඇත්තේ ය. එම විශාල ආයතනය තුළ පරිපාලනය අක්‍රමවත් වී, සේවක පිරිස් ඉහළ ගොස්, කාර්යක්ෂමතාවය දැඩි ලෙස පහළ ගොස් තිබේ. ලෝකයේ රාජ්‍ය පරිපාලනය ක්‍රමවේදයන් යාවත්කාලීන වෙමින් නූතන දැනුම හා තාක්ෂණික දියුණුවන් නිසා ඉදිරියට ගිය ද ශ්‍රී ලංකාවට එසේ කරගැනීමට හැකියාවක් ලැබුණේ නැත. එනයින් මෙම කුඩා රටේ විශාල රජයක් නඩත්තු කිරීමේ බර ජනතාව මත පතිත වී තිබේ. ඒ ඔස්සේ විශාල රාජ්‍ය සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීමේ මූල්‍ය බර ද, විශ්‍රාම වැටුපේ මූල්‍ය බර ද, වංචා හා දූෂණ ඉහළ යෑමද අක්‍රමිකතා ඉහළ යෑම ද, රජයේ නඩත්තු වියදම් ඉහළ යෑමද සිදු වෙයි. එහි ප්‍රථිපලය වී තිබෙන්නේ රජයේ වැය පාර්ශවය ඉහළ යෑම නිසා අයවැය පරතරය දරා ගත නොහැකි සීමාවකට වාර්ෂිකව ඉහළ යෑමයි. වත්මන් ආර්ථික අර්බුදයට ප්‍රධාන හේතුවක් වූයේ එම අධික අය වැය පරතරයයි.

එනයින්, මෙම රජය කුඩා කිරීම මේ වනවිට පවතින අත්‍යාවශ්‍ය කරුණකි. එහි ඇති අධික රාජ්‍ය ආයතන ප්‍රමාණය අඩුකර, සේවක බර සැහැල්ලු කර, විශ්‍රාම වැටුප් ක්‍රම ප්‍රතිසංස්කරණය කොට, අධි නියාමනයෙන් අවම නියාමනයකට රාජ්‍ය පරිපාලනය වෙනස් කොට, රාජ්‍ය මූලික ආර්ථිකයක් වෙනුවට පුරවැසියා මූලික වෙළඳපොල ආර්ථිකයක් නිර්මාණය කර ගැනීමට අප කටයුතු කළ යුතුය. එබැවින්, අප දකින රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ යනු හුදෙක් රජය දෙස බලා සිදු කරන්නක් නොව රටේ සමස්ථ අර්බුදය දෙස බලා සිදුකරන පුළුල් පරිවර්තනයකි. එය අනෙකුත් අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණද සමග සමගාමීව සිදුවිය යුතු අතර, අපගේ දැක්ම අනුව රට දියුණු කරන වැඩපිළිවෙල තුළ අවශ්‍ය කරන කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනය ඇති කර ගැනීමට හැකි වෙනසක් විය යුතුය.

එසේම මෙම රාජ්‍ය කෙසේ කුඩා කළ ද, එහි අධිකාරි බලය හෙවත් ප්‍රභලත්වය හීනවීම වළක්වා ගත යුතුය. නිදහස් වෙළඳපොල ආර්ථිකයක්

තුළ ඇති විය හැකි වෙළඳපොල ඒකාධිකාරයන් සහ භූ දේශපාලනික බලපෑම හමුවේ ඒවාට ශක්තිමත්ව මුහුණ දිය හැකි, නිරන්තරයෙන් ජනතාවගේ පොදු යහපතට වගකිව හැකි සහ එය රැකිය හැකි අධිකාරී බලයකින් රජය ශක්තිමත් විය යුතුය. එනයින් කුඩා රජයක් නිර්මාණය කරන අතර තුර, එහි ප්‍රභලත්වය රැකෙන ආකාරයට නීති සකස් කිරීමත්, බලය නියාමනය කරගැනීමත් අත්‍යාවශ්‍ය කරුණු සේ අප දකින්නෙමු.

මෙසේ රාජ්‍ය කුඩා කර ගැනීමේදී අමාත්‍යාංශ ප්‍රමාණය විද්‍යාත්මක ක්‍රමවේදයකට සකස් කර ගැනීමත්, ක්‍රමවේදයක් නොමැතිව විසිරී ගිය ආයතන යළි එක්කොට අමාත්‍යාංශ 18 කට ඒවා ඇතුළත් කිරීමත් සිදු කෙරේ. රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි කරන අතර, එවන් ඇමති තනතුරුද අහෝසි කෙරේ. අනවශ්‍ය රාජ්‍ය ආයතන අහෝසි කරදමනු ලබන අතර, නව ප්‍රතිසංස්කරණ තුළින් ඒවායේ කටයුතු කාර්යක්ෂම ලෙස කර ගෙන යෑමට අනෙකුත් ආයතන ව්‍යුහයන් වෙනස් කොට, යළි සකස් කෙරේ. එසේම, පුද්ගලීකරණ වැඩපිළිවෙළ තුළින් රාජ්‍ය ව්‍යවසායකත්වය සීමා කරන අතර, ඒවා රජයක් විසින් පවත්වාගෙන යා යුතු අත්‍යාවශ්‍ය උපක්‍රමශ්‍රීලී කර්මාන්ත කීපයකට පමණක් සීමා කෙරේ. පුද්ගලික අංශයට ලබා දිය හැකි, වඩාත් ඵලදායී කර්මාන්ත එම අංශයට ලබාදෙන අතර, එහි වෙළඳපොල තරඟකාරීත්වය සනාථ කරේ. මෙම වෙනස් කම් පිළිබඳව ඒ ඒ ක්ෂේත්‍රය ගැන උපශීර්ෂ යටතේ සාකච්ඡා කර තිබේ. එනයින්, මෙහිදී සංකල්පය පැහැදිළි කිරීම පමණක් බලාපොරොත්තු වේ.

3. රාජ්‍ය පරිපාලන මොඩලය වෙනස් කිරීම සහ නව රාජ්‍ය කළමනාකරණය හඳුන්වා දීම.

අප රාජ්‍ය පරිපාලනය යැයි තවමත් හැඳින්වූවද ලෝකයේ අනෙක් රාජ්‍යයන් මේ වන විටත් සිය රාජ්‍ය අංශයේ පරිපාලන මූලධර්මයන් දැනට පවතින වඩාත් සාර්ථක ක්‍රමවේදයන්වලට වෙනස් කරගෙන තිබේ. මෙම පරිවර්තනය සිදු වීමට ආරම්භ වූයේ 1980 දශකයේ පමණ පටන් වූවත් ඒ සමය තුළ චර්ගවාදී සිවිල් යුද්ධයක පැටලී සිටි ශ්‍රී ලංකාවට සිය පරිපාලන ක්‍රමයන් වෙනස් කර ගැනීමට නිදහසක් නොලැබුණේය. බලහත්කාරයෙන් පැටවූ 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ආදී කරුණු නිසා රාජ්‍ය පරිපාලනය සංකීර්ණ වෙද්දී, වෙනස් වීමට බියක් හා අකමැත්තක් මෙරට මහජනතාව අතර විය. නිදහස් වෙළඳපොල ආර්ථිකයද එයට අවශ්‍ය රාජ්‍ය පසුබිම නිර්මාණය කරන රාජ්‍ය පරිපාලන ක්‍රමවේදයක් ද ශ්‍රී ලංකාවට නොලැබී ගියේ එම ගෝලීය පරිවර්තනයට අනුගතවීමට තරම් මෙරට පසුගාමී වී සිටීම නිසා ය. එනයින් කල් ගතවෙද්දී, ජනගහනය ද තාක්ෂණය ද ඉදිරියට යද්දී ශ්‍රී ලාංකීය සමාජය

ලෝකය හමුවේ පසු බැස්සේ ය. අපගේ පරිපාලන ක්‍රම ලෝකයේ වෙළඳපොල තුළ තරඟකාරී නොවීම හේතු කොට ගෙන ගෝලීයව තරඟකාරීව වෙළඳපොල දිනා ගැනීමත් ආයෝජන ගෙන්වා ගැනීමත් දුර්වල අඩියකට පතිත වූයේ ය. එහි ප්‍රථිපලය වූයේ ශ්‍රී ලංකාව විශාල ආර්ථික අර්බුදයකට ගමන් කිරීම ය.

එම අර්බුදයෙන් ගොඩ ඒමට අපට සමස්ථ ආර්ථික දේශපාලන හා සමාජීය පරිවර්තනයක් අවශ්‍යවන්නේ එහෙයිනි. එක් ක්ෂේත්‍රයක් නොව යාවත්කාලීන වීමට අතපසු වූ හා පසුගාමී වූ සියළු ක්ෂේත්‍ර සමාන්තරව දියුණු කිරීමට අපට සිදු වී තිබේ. එම නිසා අපි දැවැන්ත පරිවර්තන යුගයකට එළැඹ තිබේ.

රාජ්‍ය පරිපාලන මොඩලය වෙබේරියන් ක්‍රමයෙන් ඉවත් කොට වඩාත් කාර්යක්ෂම රාජ්‍ය කළමනාකරණ මොඩලයක් දක්වා වෙනස් කළ යුතුව තිබේ. පුරවැසියා ප්‍රජාව තුළ සිට සේවා ලබා ගන්නා පාරිභෝගිකයෙකු ලෙෂ සලකා එම රාජ්‍ය සේවා වඩාත් ආකර්ෂණීය ලෙස ලබා දීමට අප ක්‍රමය වෙනස් කළ යුතුය.

එසේම, ලෝකයේ මෙතෙක් වඩාත්ම කාර්යක්ෂම සහ ඵලදායී අංශය ලෙස හඳුනාගෙන තිබෙන්නේ පුද්ගලික අංශය වන බැවින්, පුද්ගලික අංශය සතු සංකල්ප සහ ක්‍රමෝපායන් මහජන සේවයට ආරෝපණය කරගැනීම කළ යුතුය. සිය රාජකාරිය වෙනුවෙන් වග නොකියන රජයේ නිලධාරීන් වෙනුවට, සිය ක්‍රියාවන්ගේ ප්‍රථිපල වලට වගකියන, නිරන්තරයෙන් දියුණුවට පත්වන, රාජ්‍ය අංශ කළමනාකරුවන් නිර්මාණය කළ යුතුව තිබේ.

අලුත් රාජ්‍ය සේවකයන් බඳවා ගැනීම සඳහා දැනට පවත්වන පරිපාලන සේවා විභාගය වඩාත් දියුණු හා දක්ෂ සුදුස්සන් රාජ්‍ය සේවයට බඳවා ගන්නා යාවත්කාලීන වූ පොදු විභාගයක් බවට පත්කළ යුතුය. එම විභාගයට පෙනී සිටීමට විශ්වවිද්‍යාල වලින් සමත් වන ඉහළම ලකුණු ලබා ගන්නා පිරිසට අවස්ථාව ලැබෙන අතර, ඒ ඒ ක්ෂේත්‍රයට විෂය දැනුම ඇති සුදුස්සන් තෝරා ගැනීම සඳහා පරිපාලන සේවා විභාගය නව්‍යකරණය කෙරේ.

රජයේ සේවකයන්ගේ වැටුප් තල දැනට පවතින ක්‍රමයෙන් වෙනස් කළ යුතුව තිබේ. විශේෂයෙන් දක්ෂයන් රාජ්‍ය සේවයට ගෙන්වා ගැනීමට නම්, පරිපාලන සේවයට පැමිණෙන්නන් හට විශේෂ වැටුප් තල නිර්මාණය කළයුතු අතර, එය පුද්ගලික අංශයේ විධායක ශ්‍රේණි හා තරඟකාරී විය යුතුය. එම නිසා රාජ්‍ය සේවක වැටුප් ප්‍රතිසංස්කරණයක් සිදුකිරීමට අපි

බලාපොරොත්තු වන්නෙමු. දක්ෂයන් සහ සුදුස්සන් රාජ්‍ය ආයතන සඳහා ගෙන්වා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, එම රැකියා සඳහා ලබා දෙන වැටුප් හා දීමනා ආකර්ෂණීය කළ යුතුය. ඒවායේ ව්‍යක්තීය ඉදිරි ගමන සුදුසුකම් හා දක්ෂතාවය මත ලැබෙන්නක් විය යුතු අතර හුදෙක් ජ්‍යෙෂ්ඨත්වය මත පහලවන්නක් නොවිය යුතුය. රාජ්‍ය සේවය තුළට දක්ෂතාවය සහ වැඩ කර ඉලක්ක සපුරා ගැනීමේ KPI වැනි ඇගයීම් ක්‍රමයක් ලබා දෙන අතර, වැටුප් වැඩිවීම්, බෝනස් සහ උසස් වීම් එම දර්ශකයන් මත තීරණය කළ යුතුය.

මෙලෙස නූතන ලෝකයේ අනෙකුත් රාජ්‍යයන් මෙන් නොබියව වෙනස් වී අලුත් රාජ්‍ය කළමනාකරණ සංකල්ප රාජ්‍ය අංශය වෙතට සාර්ථකව රැගෙන ඒමට වේගයෙන් කටයුතු කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.

එබැවින් රාජ්‍ය සේවය තුළ KPI වැනි ඇගයීම් ක්‍රම හඳුන්වා දීම සහ දක්ෂතාවය මත උසස් වීම් ලැබෙන ක්‍රමවේදයක් සකස් කිරීම අනිවාර්යය කරුණකි.

යාවත්කාලීන රාජ්‍ය නිළධාරීන්

දැනට පවතින පද්ධතිය තුළ ක්‍රියාකරන වසර ගණනාවක් රාජ්‍ය සේවය තුළ කටයුතු කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ ශක්‍යතාවන් හා යාවත්කාලීන බව යළි පරීක්ෂා කිරීම සිදු කෙරේ.

ඒ අනුව පසුගිය වසර 10 ක් තුළ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විසින් (ආයතන ප්‍රධානීන්, අධ්‍යක්ෂවරුන්, කළමනාකරුවන් ඇතුළු) සිදුකළ කාර්යයන් සලකා බලා ඔවුන්ගේ KPI ගණනය කොට රාජ්‍ය සේවයේ සීඝ්‍ර පරිවර්තනය සඳහා දායකත්වය ලබාදිය හැකි නිළධාරීන් රඳවා ගැනීමටත් තීරණය කරනු ලබන යම් පරිසාධන මට්ටමක් නොඉක්මවන නිළධාරීන් රජයේ සේවකයින් අඩු කිරීමේ ප්‍රතිපත්තිය යටතේ පිහිටුවා කටයුතු කිරීමටත් අපේක්ෂා කෙරේ.

මෙහි ප්‍රධානතම අරමුණ වන්නේ වේගයෙන් වෙනස් වෙන පරිසරයට අනුගත විය හැකි රාජ්‍ය නිළධාරීන් සේවයේ රඳවා ගනිමින් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීමයි.

ප්‍රාදේශීය රාජ්‍ය ජාලය ශක්තිමත් කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වඩා සවිබල ගන්වමින් සියළුම සේවාවන් එක් තොරතුරු පද්ධතියක් යටතට

අන්තර්ග්‍රහණය කෙරේ. එවිට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සිටින පුරවැසියකුට ඕනෑම සේවාවක් ලබාගැනීම සඳහා ප්‍රදේශයෙන් ප්‍රදේශයට නොගොස් භෞමික සීමාවන් නොමැති ගුණාත්මක හා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබා ගැනීමට හැකිවේ.
තවද දැනට තනි තනි හුදෙකලා ආයතන වශයෙන් සේවා සපයනු ලබන රාජ්‍ය ආයතනවල සේවාවන් ඒකාබද්ධ සේවාවක් ලෙස ප්‍රාදේශීය රාජ්‍ය ජාලය හරහා කඩිනමින් ලබා දීමේ අවස්ථාව මෙමගින් උදාවේ.

ළඟම සේවා ස්ථානය

මෙරට රාජ්‍ය සේවකයා මුහුණ දෙන ඉතාමත් බරපතල කාරණයක් ලෙස හඳුනාගත හැක්කේ නිවසේ සිට රැකියා ස්ථානය වෙත ඇති දුරයි. රාජකාරී සඳහා පැමිණෙන සහ නැවත නිවස බලා යන සේවකයින් ඔවුන් ගේ ජීවිතයෙන් වැඩි ප්‍රමාණයක් මහ මගට ගෙවා දැමීමෙන් ඵලදායී සේවාවක් පෙරලා මහජනතාවට බලාපොරොත්තු විය නොහැක.
එබැවින් සමස්ථ රාජ්‍ය සේවය තුළ සිටින සේවකයින්ගේ දක්ෂතාවය හා හැකියාව තක්සේරුකර හැකි උපරිම ප්‍රමාණයෙන් ආසන්නතම සේවා ස්ථානයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කෙරේ.
තවද සපයනු ලබන සේවාව අනුව නිවසේ සිට රාජකාරි සිදු කළ හැකි සේවකයින් හට මාර්ගගතව සේවය කිරීමේ අවස්ථාව ලබාදේ. මේ සඳහා විවිධ වැටුප් මට්ටම් හඳුවාදෙනු ඇත.

4. e Governance හෙවත් ඩිජිටල්කරණය

ශ්‍රී ලංකාවේ නොදියුණු රාජ්‍ය පරිපාලනය තුළ තවමත් ප්‍රමාණවත් ඩිජිටල්කරණයක් සිදු වී නොමැත. ලෝකයේ තාක්ෂණය වේගයෙන් දියුණු වී පරිඝණක යුගයෙන්, ජංගම දුරකථන යුගයද පසු කොට කෘතිම බුද්ධි යුගය දක්වා ගමන් කොට තිබේ. එහෙත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය තවමත් පරිඝණක යුගයට ද ප්‍රමාණවත්ව ඇතුළු වී නොමැත.
අප වේගයෙන් ශ්‍රී ලංකාව ඩිජිටල්කරණය කළ යුතුව ඇති අතර සම්පූර්ණ රාජ්‍ය අංශය පොදු රාජ්‍ය ජාල ගත පද්ධතියකට රැගෙන යා යුතුව තිබේ. තවදුරටත් කඩදාසි මත පැනෙන් ලියමින් කරන පරිපාලනයකට අනාගතය තුල මිලියන 22 ක් මිනිසුන් පාලනය කළ නොහැකිය. මේ සඳහා අප දැනටමත් ප්‍රමාද ය. එහෙත් එය කෙසේ හෝ ආරම්භ කළ යුතුව තිබේ.

■ ඒ සඳහා වෙනමම විශේෂිත වූ e Governance ඒකකයක් නිර්මාණය කෙරේ. මෙම ක්‍රියාවලියට ජාතික සැළසුම් නිර්මාණය කිරීම, එම

වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම, එය නිරීක්ෂණය කිරීම සහ අවශ්‍ය වෙනස් කම් සිදු කිරීමේ බලය එම ආයතනයට ලැබේ.

■ e Governance ජාතික වැඩපිළිවෙලට කාලනුරූපීව ඉලක්ක ලබා දෙන අතර, සම්පූර්ණ ක්‍රියාවලිය වසර 5 ක් ඇතුළත සම්පූර්ණ කර ගැනීමට අනුබල දෙනු ලැබේ.

■ සියළුම පුරවැසියන් හට ඩිජිටල් හැඳුනුමක් ලබා දීම ප්‍රථමයෙන් සිදුකරනු ලබන අතර, ජාතික හැඳුනුම්පත සහ අංකය ආශ්‍රයෙන් එය සිදු කරනු ලැබේ.

■ රාජ්‍ය සේවා සියල්ල ක්‍රමයෙන් පරිඝණක මෘදුකාංග, ජංගම යෙදවුම් ක්‍රම වලට රැගෙන එනු ලැබේ.

■ රාජ්‍ය සේවකයන්ගේ සහ විධායක නිලධාරීන් ගේ පරිඝණක සාක්ෂරතාවය ඉහළ නැංවීමට පුහුණු වැඩසටහන් ආරම්භ කෙරෙන අතර, එම පුහුණුව ලබා ගෙන සුදුසුකම් සම්පූර්ණ කිරීමට කාල පරාසයක් ලබා දෙනු ලැබේ. සියළුම සේවකයන් පරිඝණක සාක්ෂරතාවය ලබා ගැනීම අනිවාර්යය කෙරෙන අතර එසේ නොවන්නන් හට වෙනත් රැකියා අවස්ථා දෙනු ලැබේ.

■ වැඩපිළිවෙල අවසානයේ සියළුම පුරවැසියන් හට බොහෝමයක් රාජ්‍ය සේවා ජංගම දුරකථනය ඔස්සේ මාර්ගගත ක්‍රමයකට සිදු කර ගැනීමේ හැකියාව ඇති කෙරේ.

■ එසේම, මෙම රාජ්‍ය දත්ත පද්ධතියේ ආරක්ෂාව උදෙසා පරිඝණක ආරක්ෂණ ක්‍රම භාවිතා කිරීමට රජය බැඳී සිටී.
■ එම දත්ත අනුසාරයෙන් මහජනතාවගේ වෙළඳපොල අවශ්‍යතා විශ්ලේෂණය කිරීම, නිරීක්ෂණය කිරීම සහ ආර්ථිකය ඉදිරියට රැගෙන යෑමට අනාගත අවශ්‍යතා පුරෝකතනය කොට හඳුනාගැනීම ආදිය සිදු කෙරේ.

■ එමගින් ආර්ථිකය තුළ අනාගත අවශ්‍යතාවයන් නිවැරැදිව ඉටු වන යහපත් සම්පත් බෙදී යෑමේ ක්‍රමයක් ඇතිවීම වගකීමෙන් ඉටු කෙරේ.

ශ්‍රී ලංකාව තුළ block chain තාක්ෂණය ස්ථාපිතකර ඒ හරහා පූර්ණ විනිවිදභාවයක් සහ කාර්යක්ෂමතාවයක් ඇතිව රාජ්‍ය යාන්ත්‍රණය මෙහෙය වීමට අපේක්ෂා කෙරේ.

මේ යටතේ රජයේ ගෙවීම්, ලිපි ලේඛන කටයුතු, ටෙන්ඩර් කැඳවීම් යනාදිය ඇතුළු රාජ්‍ය කටයුතු විනිවිදභාවයකින් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ.

ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ යටිතල පහසුකම් සංවර්ධනය කොට විදේශීය දැනුම සහ තාක්ෂණයද ලබා ගනිමින් කටයුතු කෙරෙනු ඇත.

ඒකාබද්ධ තොරතුරු පද්ධතියක්

සමස්ථ රාජ්‍ය සේවය තුළ ඇති තොරතුරු එක් තොරතුරු පද්ධතියක් තුළට අන්තර්ග්‍රහණය කරමින් වඩා කාර්යක්ෂම සහ ඵලදායී රාජ්‍ය සේවයක් ලබාදීම මෙහි අරමුණයි. පුරවැසියකුගේ උපතේ සිට මරණය දක්වාම එකී පුරවැසියාගේ තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකිවන පරිදි, උපත්, මරණ, හැඳුනුම්පත්, බැංකු, ඡන්ද තොරතුරු, බලපත්‍ර, බදු, යනාදී සියළු තොරතුරු ඒකාබද්ධව මෙම යාන්ත්‍රණය සකස් කෙරේ.
මෙවැනි පද්ධතියක් නිර්මාණයේදී පුද්ගලික තොරතුරුවල ආරක්ෂාව පිළිබඳව ඉතා ගැඹුරින් සලකා බැලෙන අතර ඒ සඳහා දැනට පවතින උපරිම තාක්ෂණික භාවිතාවන් සලකාබලනු ලැබේ.

මෙවැනි ආයෝජන කොතරම් විශාල වුවද එහි ප්‍රතිඵල ඊටත් වඩා විශාල වනු ඇත. එබැවින් ඒ සඳහා ප්‍රමුඛතාවයදී කටයුතු කෙරෙනු ඇත.

5. විශ්‍රාම අරමුදල් ප්‍රතිසංස්කරණ.

ශ්‍රී ලංකාවේ වත්මන් අර්බුදයට තවත් එක ප්‍රධාන හේතුවක් නම් රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයයි. ඒ සඳහා සේවකයන්ගේ වැටුප් වලින් කොටසක් දායක නොකරන අතර හුදෙක් රාජ්‍ය ආදායමෙන් සෘජුවම ලබා දෙන වියදමක් ලෙස එය පවතී. එවන් විශ්‍රාම ක්‍රමයක් පවත්වා ගෙන යෑමට රටකට නොහැකිය. එය අසාර්ථක මූල්‍ය කළමනාකරණය යටතට වැටෙන අත් හැර දැමූ ක්‍රියාවලියකි.

එසේම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයට තිබෙන මෙය විශේෂ වරප්‍රසාදයක් සේ සැළකිය හැකිය. රාජ්‍ය ආදායමෙන් විශාල පංගුවක් නිර්මාණය කරන පුද්ගලික අංශයට එවන් වූ විශ්‍රාම ක්‍රමයක් නොමැත. එනයින් එහි විශාල සමාජ අසාධාරණයක් තිබේ. මේ රටේ කවුරුත් සමාන අයිතිවාසිකම් හිමි පුරවැසියන් වියයුතු අතර අප සියල්ලෝම අපගේ ශ්‍රමය මේ රටේ ආර්ථිකයට ලබා දෙති. එහෙත් පුද්ගලික අංශයට ඉන් හොඳ විශ්‍රාම දිවියක්

නොලැබෙන අතර රාජ්‍ය අංශයේ සේවකයන් පමණක් එම පහසුකම භුක්ති විඳිති. එසේ භුක්ති විඳින්නේද පුද්ගලික අංශය විසින් උත්පාදනය කරනු ලබන ලාබයෙන් එකතු වන බදු මුදලින් වීම විශාල ගැටළුවකි. එබැවින මෙම ක්‍රමය වෙනස් විය යුතුය.

පුරවැසියෙකු කුමන අංශයේ සේවය කළත් සාධාරණ විශ්‍රාම වැටුපක් ලැබීමේ සමාන අයිතියක් සියලුම දෙනාට තිබේ. එනයින් අප ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කළ යුතුය. එය පහත පරිදි වෙයි.

■ රජයේ සේවකයන් හට ලබා දෙන විශ්‍රාම වැටුප් ක්‍රමය පසුපසට වසර 15 කට බලපාන සේ අහෝසි කෙරේ. එනම්, අප මේ ක්‍රමය ආරම්භ කරනා වර්ෂයේ සිට වසර 15 ක් ආපස්සට බලා, එම වර්ෂයෙන් පසු රජයේ සේවයට සම්බන්ධ වූ අයට දැන් පවතින ක්‍රමයට විශ්‍රාම වැටුප් ලැබීම අහෝසි කෙරේ.

■ අලුත් විශ්‍රාම ක්‍රමයක් සියළුම වැඩ කරන ජනතාව වෙනුවෙන් ඇති කෙරේ.

■ එය මධ්‍යම අර්ථසාධක අරමුදල ලෙස හැඳින්වේ.

■ මධ්‍යම අර්ථසාධක අරමුදලට සේවකයාගේ වැටුපෙන් 10% මාස් පතා ලැබෙන ක්‍රමයක් සකස් කෙරේ. එය ආරම්භයේ දී කුඩා කොටසක් ලෙස ආරම්භ වී රටේ ආර්ථිකයේ ප්‍රගතිය අග කාලීනව ක්‍රමිකව ඉහළ දමා ගැනීම සිදු කෙරේ.

■ එම මධ්‍යම අර්ථසාධක අරමුදලට සේවය ලබා ගන්නා ද දායක විය යුතුය. එය වැටුප මෙන 10-15% ත් අතර අගයක් විය හැකිය. එහි ගණනය කිරීම් පසුවට සිදු කරනු ලැබේ.

■ සේවකයාගේද සේව්‍යයාගේද දායකත්වය ලබා ගෙන මාස් පතා ලැබෙන මුදලක් මධ්‍යම අර්ථසාධක අරමුදලේ එකතු කෙරේ.

■ නව ඩිජිටල්කරණ වැඩපිළිවෙළ යටතේ e Governance ක්‍රමවේදයන් මගින් සියළුම වැඩකරන පුරවැසියන් හට පුද්ගලික හා ස්වාධීන ගිණුමක් මධ්‍යම අර්ථසාධක අරමුදලේ විවෘත කෙරේ.

■ එම ගිණුමේ අයිතිය පුරවැසියා සතු වන අතර, එහි කටයුතු සොයා බැලීම, විනිවිදභාවයෙන් යුතුව පවත්වා ගෙන යෑම සඳහා පුරවැසියන් හට අවස්ථාව ලැබේ.

■ එම මධ්‍යම අර්ථසාධක අරමුදල භාවිතා කොට එයින් ගෙවී යන පරිදි සියළුම සේවකයන් හට පවුල් සෞඛ්‍යය ආවරණයක් ලබා ගැනීමට හැකියාව ඇති කෙරේ. එය සේවකයාට තීරණය කළ හැකි ස්වාධීන තීරණයක් වනු ඇත.

■ එසේම, නිවාස ණයක් ලබා ගන්නේ නම්, මධ්‍යම අර්ථසාධක අරමුදල භාවිතා කොට දීර්ඝකාලීන මූල්‍ය සැළසුමක් සඳහා පිවිසීමේ අවකාශය ලබා දෙයි.

■ ඉහත විශ්‍රාම සැලසුම ජාතික ප්‍රතිපත්තියක් ලෙස වැඩි දියුණු කර, මධ්‍යම අර්ථසාධක අරමුදල නව පනතකින් සම්මත කෙරේ. එය ස්වාධීන මූල්‍ය ආයතනයක් ලෙස වෙනම කළමනාකරණයක් යටතට පත්කරන අතර, මහබැංකුව සහ මහා භාණ්ඩාගාරයට ඇති බැඳීමෙන් නිදහස් කෙරේ. මධ්‍යම අර්ථසාධක අරමුදල වගකිව යුත්තේ මහජනතාවට වන අතර, නව පනත මගින් මෙම ස්වාධීනත්වය ආරක්ෂා කෙරේ.

6. වංචා දූෂණ වැළක්වීම.

මේ පිළිබඳව වෙනම උප ශීර්ෂයක් ඉදිරිපත් කර ඇත.

7. රජයේ සේවකයන් අඩු කිරීම.

මේ පිළිබඳව වෙනම උප ශීර්ෂයක් ඉදිරිපත් කර ඇත.

මෙම ප්‍රතිසංස්කරණ එකවර වේගයෙන් ඉටු කර ගැනීම සිදු කිරීම අපහසුය. එහෙත් අප නූතන පරිපාලන දැනුම් පද්ධතිය දෙස බැලීමේදී මෙවන් පරිවර්තනයන් ආයතනික මට්ටමෙන් සිදු කර ගැනීම ක්‍රමිකව සිදු කර ගත යුතු සංවිධානාත්මක වැඩපිළිවෙලක් ලෙස සකස් වී තිබේ. එය සියළුම සේවකයන්ගේ සහභාගිත්වය ඇතුව, කිසිවෙකු මග නොහැර යන, කිසිවෙකුට පාඩුවක් හෝ හානියක් වෙන අරමුණ ඇතුව සිදු කරගනු ලබන වගවෙන සංවිධානාත්මක ව්‍යායාමයක් වන අතර අයාලේ යන්නක් නොවිය යුතුය.

එනිසා, ඒ පිළිබඳව අවබෝධය ඇති වෘත්තීය දැනුම ඇති කණ්ඩායමක් විසින් එය මෙහෙය විය යුතුය. එබැවින් මේ ප්‍රතිසංස්කරණ මෙහෙයවා

ගැනීම වෙනුවෙන් විශේෂඥ දැනුම භාවිතා කර ඉලක්ක ගත දැක්මක් ඇති වැඩපිළිවෙලක් ලෙස සකස් කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.

විදේශ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව නම් රාජ්‍යය ලෝකයේ පවතින්නේ තවත් රාජ්‍යයන් 200 ක් සමග ය. මේ රාජ්‍යයන් කිසිවක් තනිව නොපවතින අතර අනෙකුත් රාජ්‍යයන් සමග අන්‍යොන්‍ය වශයෙන් සබඳතා පවත්වා ගෙන යමින් එකිනෙකාට සුදුසු වූ ක්‍රියාකාරකම් වල කටයුතු කරති. මානව ශිෂ්ඨාචාරය බිහිවූ දිනයේ පටන් ක්‍රමයෙන් එකිනෙකා සමග මුහුවීම ඇරඹූ ඔවුහු වර්තමානය වනවිට අත්කරගෙන තිබෙන තාක්ෂණික දියුණුව, සන්නිවේදනයේ දියුණුව සහ ප්‍රවාහනයේ දියුණුව හේතු කර ගෙන මුළු ලෝකයක් ලෙස පොදු ශිෂ්ඨාචාරයකට අනුගත වෙමින් පවතී. එම ක්‍රියාවලිය ගෝලීයකරණය ලෙස සරලව හැඳින්වූවත්, එහි සම්පූර්ණ අර්ථය සරලව වටහා ගැනීම පහසු නොවේ.

මුල් අවධියේදී පුංචි පුංචි රෑන් ලෙසත්, අනතුරුව ගෝත්‍ර ලෙසත්, පසු කලෙක රාජ්‍යයන් ලෙසත් සංවිධානය වූ මිනිසා වර්තමානය වන විට සිය රාජ්‍ය සීමාවෙන් ඔබ්බට යමින් ගෝලීය රාජ්‍යයක් ලෙස සංවිධානය වීම ඇරඹී තිබේ. මිනිසා යනු තව දුරටත් රාජ්‍යය නම් සීමාවෙන් වට වූන, රාජ්‍යයට සීමා වූ ජීවියෙකු නොව, දේශසීමා තුනී කරමින් ලෝකය පුරා සැරිසරන ගෝලීය පුරවැසියෙකු වීමට නියමිතය. ලෝකය එසේ ගමන් කිරීම පිළිබඳව සමාජයක සියලුම පාර්ශවයන් එකඟ නොවේ. ජාතිකවාදී සංකල්ප පෙරදැරි කරගත් රාජ්‍යයන් ලෝකය සමග මුහුවීමට එතරම් විවෘත නොවුණත්, ලෝකය පැමිණි ගමන දෙස බැලීමේදී ලෝකයා නිරන්තරයෙන් ගමන් කොට ඇත්තේ ගෝලීයකරණය දෙසට මිස රාජ්‍යයන් තුළ සිරවීමට නොවේ.

සිය සංස්කෘතික අනන්‍යතාවයන් අහිමි වේදැයි බියෙන් මිනිසුන් එසේ කටයුතු කරත්, රාජ්‍යයන් තුළ සිරවීම සාර්ථක විසඳුමක් වී නොමැත. එනයින්, නිරන්තරයෙන් වෙනස්වන ලෝක ස්වභාවය තේරුම් ගෙන අප හැකි ඉක්මනින් අනුගත විය යුත්තේ ලෝකයට විවෘත වීමටයි. එසේ කිරීමෙදී අප සතු අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමත්, ස්වෛරීත්වය හැකිතාක් දුරට රැකගැනීමත් වැදගත් වෙයි. අප කළ යුත්තේ ලෝකයෙන් සැඟවීම නොව වඩාත් විධිමත් සහ කාර්යක්ෂම ලෙස ලෝකය සමග බැඳීමය. එසේ කිරීමෙන් නූතන ලෝකයේ වැදගත් මරමස්ථානයක් බවට පත් වීමය. මෙහිදි සිදු වන ප්‍රමාදය අප ජාතිය අනාගතයේදී ලෝකය තුළ හුදෙකලා කරනු ඇත.

ලෝකය වේගයෙන් ඉදිරියට ගිය කල, අනෙකුත් ජාතීන් ඒ සඳහා අවශ්‍ය නූතන ක්‍රමවේදයන් අනුගමනය කරමින් එම නව ගෝලීය සමාජය තුළ සිය අනන්‍යතාවය නිර්මාණය කරගෙන ස්ථාවර වෙද්දී, අප එය සිදුකර

නොගන්නේ නම්, අප එම නව සමාජය තුළ කොන් වනු ඇත. එසේ වීම තුළ අනාගතයේ දවසක මේ රටේ පුරවැසියන් අසරණ වීම වැළක්විය නොහැකිය. එනයින්, අප දැන් සිටම මේ තත්ත්වයට මුහුණ දීමට සූදානම් විය යුතු බව අප විශ්වාස කරන්නෙමු.

ජාතික හරිත පෙරමුණේ විදෙස් ප්‍රතිපත්තිය සකස් වනුයේ ඒ පදනම මුල් කරගෙන ය. අනාගත ලෝකයක ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලංකාව ප්‍රමුඛ තැනකට ස්ථාන ගත කරවීම අපගේ අරමුණයි. එම නිසා අපගේ විදෙස් ප්‍රතිපත්තිය මෙසේ ඔබට ඉදිරිපත් කරන්නෙමු.

නූතන ගෝලීය දේශපාලනය අවබෝධ කර ගැනීම.

ලෝකයේ පොදුවේ බහුලව ක්‍රියාත්මකවන දේශපාලන මතවාදය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය යැයි සැළකිය හැකිය. දෙවන ලෝක යුද්ධයෙන් පසු අවසන් වූ ෆැසිස්ට් වාදයත්, සීතල යුද්ධය අවසානයේ අවසන් වූ කොමියුනිස්ට් වාදයත් ලෝක දේශපාලනය විවෘත කළේ බටහිර කඳවුර ප්‍රමුඛ කරගත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයටයි. ලෝක බලවතා ලෙස ඇමෙරිකාවේ නැග්මත්, එම බලවතා විසින් නිර්මාණය කරන ලද ගෝලීය සම්මත රාමුවත් ප්‍රජාතන්ත්‍රවාදයටත්, නිදහස මූලික කරගත් මානව හිමිකම් රැකෙන, පුද්ගලික නිදහසට රාජ්‍ය මැදිහත් නොවන, විවෘත හා නිදහස් වෙළඳපොල ආර්ථික ක්‍රමයත් පොදුවේ ලෝකය පිළිගත් දේශපාලන ධර්මතාවය බවට පත් වූයේ ය.

එනම්, ලෝකයේ බහුතරයක් රාජ්‍යයන් මේ වනවිට පාලනයවන පොදු දේශපාලන මතවාදය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය යැයි පිළිගත හැකිය. එහෙත් වර්තමානය වනවිට මේ තත්ත්වය තුළ යම් වෙනස් කමක් දක්නට ලැබේ. සීතල යුද්ධයෙන් පසුව තනි බලවන්තයෙකු ලෙස ඒක කේන්ද්‍රීයව ලෝකය තුළ සිය අණසක පැතිරවූ ඇමෙරිකාව දැන් දුර්වල වී තිබේ. මීට පෙර පැවති අධිරාජ්‍යයන් දුර්වල වී කලකදී අවසන් වූවා සේම ඇමෙරිකාව ද වේගයෙන් සිය දෛවයට සමීප වෙමින් තිබේ. ඔවුන් පරයා නැගී සිටින්නට සමත් වී ඇත්තේ ගෝලීය නැගෙනහිර කඳවුරයි. චීනය ප්‍රමුඛ කරගත් නව බල කඳවුරු ඇමෙරිකාව අභිබවා වර්ධනය වීම වගේම ලෝකයේ නැගී එමින් පවතින විශාල රාජ්‍යයන් එක්ව කටයුතු කරමින් ඇමෙරිකාවේ තනි බලයට අභියෝග කිරීම අපට මේ කාලයේ දක්නට ලැබේ.

එනම්, මින් ගම්‍ය වන්නේ අප සිටින්නේ ලෝක බලවතාගේ කිරුළ ඇමෙරිකාවෙන් ගැලවී මීළඟ බලවන්තයාට මාරුවන පරිවර්තන කාලයකටයි. ඇමෙරිකානු හෙජමොනියට විරුද්ධව නැගී සිටින ලෝකයේ

අනෙකුත් රාජ්‍යයන් අතර විවිධ මට්ටමේ ශක්තීන් ගැබ්ව ඇති බැවින් ලෝකය බහු කේන්ද්‍රීය අසමතුලිතතාවයකට පැමිණ ඇතැයි කිව හැකිය. එහි ප්‍රතිඵලය නම්, මේ ගෝලීය දේශපාලන බලයන් එකිනෙකා පරයා යෑමට දරණ වෑයම නිසා ලෝකයේ ක්‍රියාකාරීත්වය සුමට නොවීම ය. අස්ථාවර දේශපාලන තත්වයන් ඕනෑම මොහොතක වර්ධනය විය හැකි අතර, එසේ වන සෑම මොහොතකම ලෝකයේ ආර්ථික ස්ථාවරත්වය බිඳ වැටෙයි. මේ කාලය නිරන්තර ආර්ථික කම්පනයන් ඇතිවන, බහුවිධ ගෝලීය අර්බුධ මතු වන අභියෝගාත්මක කාලයකි. එනයින්, එම තත්ත්වය දැන් අවබෝධ කර ගෙන අප විදෙස් ප්‍රතිපත්තිය සකස් කර ගත යුත්තේ ය.

නූතන ගෝලීය ආර්ථිකය අවබෝධ කර ගැනීම.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය නම් දේශපාලන මතවාදයෙන් පසුබිම තැනුණු ලෝකයක එහි ආර්ථිකය නිර්මාණය කෙරුණේ වඩාත් විවෘත, තරගකාරී, හා නිදහස් වෙළෙඳපොළ ක්‍රමයක් මූලික කර ගෙනය. ධනය ජනිත කිරීමට වඩාත් සුදුසුම ක්‍රමය නම්, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රාමුවක් තුළ ලෝක සාමය පවත්වා ගනිමින්, වෙළඳපොල සඳහා උපරිම අවස්ථාව ලබා දීම යැයි ලෝකය පොදුවේ පිළිගෙන තිබේ. එම නිදහස් වෙළඳපොල මගින් ඇති කරනු ලබන ප්‍රතිලාභ මිනිස් සමාජයට අවශ්‍ය ගාමක බලය සපයන අතර, එම ප්‍රතිලාභ සිය උත්තේජනය කරගත් මිනිසුන් නව නිපැයුම් කිරීමටත්, නිර්මාණශීලී වීමටත්, එමගින් ලෝකයට අලුත් අලුත් දෑ තිළිණ කිරීමටත් පෙළඹවීම සිදු කෙරිණ.

ලෝකයේ රාජ්‍යයන් ස්වෛරීත්වය අනුව වෙන් වී සිටිය ද භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් වී එහි කොටස් ලෝකය පුරා විභජනයකට ලක් වී තිබේ. ලෝකයේ එක් රටක ප්‍රාග්ධනය තවත් ඕනෑම රටක් කරා ගලා යා හැකි වෙයි. එම භාණ්ඩ හා සේවා ද, ප්‍රාග්ධනය ද, ශ්‍රමය ද දේශසීමා විසින් නිර්මාණය කරන බාධාවන් බිඳ ගෙන, අවම බාධාවන් ඇති තැන් වලට ගලාගෙන ගොස් තිබේ. එනම්, දේශසීමා වලින් රාජ්‍යයන් වෙන් වුවද, වෙළඳපොල මගින් ඒවා එකිනෙකට යා කොට තිබේ.

එක් රටක නිෂ්පාදනය කරනු ලබන අමුද්‍රව්‍යයක්, නිමි භාණ්ඩයක් වී පාරිභෝගිකයා අතට පත් වීමට සාමාන්‍යයෙන් රටවල් පහක වත් දේශසීමා පසුකළ යුතු බව සොයා ගෙන තිබේ. එම අමුද්‍රව්‍ය ද භාණ්ඩ ද සේවා ද ප්‍රාග්ධනය ද ශ්‍රමය ද පහසුවෙන් ගලා යෑමට ඉඩ ලබා දීම සාර්ථක වෙළඳපොලක් ඇති කිරීමට ඇති මූලික පදනමයි. එනයින්, ලෝකයම එකක් ලෙස බැඳුන ආර්ථික ක්‍රියාවලියක අපි ද කොටස්

කරුවන් වෙමු. එසේ ලෝකය සමග සාර්ථකව මුහුවීමට නම්, අපි ආ එම වෙළඳපොල ක්‍රමයට හොඳින් අනුගතවීම අත්‍යාවශ්‍ය වෙයි. එහි ලා විදෙස් සේවා වලට විශාල වගකීමක් පැවරෙයි. එනයින් අපගේ විදෙස් සේවා ප්‍රතිපත්තිය තුළින් ඒ පිළිබඳව විශේෂයෙන් සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

තාක්ෂණයේ දියුණුව සහ ගෝලීයකරණය, ගෝලීය පුරවැසියන් බිහි වීම.

තාක්ෂණයේ දියුණුව ද සන්නිවේදනයේ දියුණුව ද ප්‍රවාහනයේ දියුණුව ද අද ලෝකයේ කුමන ස්ථානයේ සිටින මිනිසෙකු වුව ද එකිනෙකා සම්බන්ධ කරගැනීම ඉතා පහසු කටයුත්තක් බවට පත් කොට තිබේ. භාෂාවෙන්, සංස්කෘතීන්ගෙන්, භෞතික දුරින් හා දේශසීමාවලින් ඈත්ව හා වෙන්ව සිටි මිනිසුන් දැන් පහසුවෙන් එකිනෙකා සමග මුහු වෙති. අදහස් බෙදා ගනිති.

තරඟකාරී වාසි සහගත වෙළෙඳපොළක් නිර්මාණය කරගැනීම පිණිස වෙළඳ ගිවිසුම් අත්සන් කෙරෙති. රාජ්‍යයන් විසින් ස්වෛරීත්වය ආරක්ෂා කරනු වස් මෙතෙක් රැකි දේශසීමාවන් බොඳ කර හරිමින් මිනිස් අවශ්‍යතාවයන් හට ඇති බාධාවන් ඉවත් කර ගනිමින් සිටියි. ආර්ථික කළාප බිහිවෙති, එකිනෙකා විවෘත වෙති, නිදහස් වෙති, රාජ්‍යයන් එකි නෙක යා වෙති, සම්බන්ධකම් ඉහළ දා ගනිති, කළාපීය ආර්ථික සංවිධාන බිහිවෙති.

මේ සියල්ලේ සමස්ත ප්‍රතිඵලය නම්, රාජ්‍යයන් ලෙස සංවිධානය වූ ගෝලීය දේශපාලනය ක්‍රමිකව එහි අනාගතයට පරිවර්තනය වන බවයි. එනම්, රාජ්‍යයන් සියල්ලම පොදුවේ ආර්ථික කටයුතු වල නියැලෙන, පොදු දේශපාලන මතවාදයක් තුළ ගොඩනැගුණ, සෑමට පොදු හා සමාන අවස්ථා ලැබෙන ගෝලීය රාජ්‍යයක් බිහිවීම අපේ අනාගතයයි. අප විදෙස් ප්‍රතිපත්තිය තුලින් බලාපොරොත්තු වන්නේ මේ ගමන පහසු කරවගෙන අපි එම ලෝකයේ සැළකියයුතු කොටස් වරුවකු බවට පත් වීමයි.

නූතන ගෝලීය අර්බුද අවබෝධ කර ගැනීම.

ලෝකයේ වෙන් වෙන් රාජ්‍යයන් එකිනෙකාට ආවේණික වූ අර්බුද හා ගැටළු වලට මුහුණ දුන්නද අද ලෝකයක් ලෙස මුහුණ දෙන අර්බුදයන් හැමෝටම පොදු ඒවා වෙති. එම ගෝලීය බහු අර්බුදවල ස්වභාවය නම්, ඒවා එකිනෙකට වෙනස් කරුණු පදනම් කර ගනිමින් ඇති වී තිබීම ය. එසේම ඒවා තනි තනි රාජ්‍යයේ ක්‍රියාකාරිත්වයෙන් විසඳා ගැනීම කළ නොහැක්කකි. එම බහු අර්බුද ගෝලීය වන්නා සේම, ඒවායේ විසඳුම් ද

ගෝලීය ය. ඒවාට පුළුල් දායකත්වයක් ලබාදීම සහ සාකච්ඡාවක් ඇති කරගැනීම අත්‍යාවශ්‍ය ය. එම බහු අර්බුද කළමනාකරණය කරගැනීමට ලෝකය සමග එක්ව පොදු වැඩපිළිවෙලක කටයුතු කළයුතු අතර, ඒවාට අවශ්‍ය සහය ලබාදීම අප විදෙස් සේවා මගින් කළයුතු වැදගත් රාජකාරිය කි.

1. යුද්ධය

යුද්ධය යනු ලෝකයේ පවතින යථාර්ථයකි. මානව සමාජයන් සිය අභිමතාර්ථයන් ඉටු කර ගන්න එක ක්‍රමයක් ලෙස යුද්ධය හැඳින්විය හැකිය. ලෝකයට යුද්ධය යන්න කලින් කලට පහල වෙන වේදනාකාරී ක්‍රියාවක් බව ලෝක ඉතිහාසය දෙස බැලීමේදී අප හට පෙනී යයි. එම යුද්ධ ලෝකයේ දියුණුවත් සමග වඩාත් විනාශකාරී වූවා පමණක් නොව භූගෝලීයව වඩා විශාල ප්‍රදේශයක් කරා පැතිර ගියේ ය. කලෙක ප්‍රාදේශීයව ඇති වන යුද්ධ, මුළු ලෝකයම එක්ව බෙදී සටන් වදින ලෝක යුද්ධ බවට පරිවර්තනය වීම දැන් සාමාන්‍යකරණය වී ඇත.

ගතවූ පසු ගිය දශක තුනක කාලය සාපේක්ෂව ලෝක සාමය රැඳුන කාල පරාසයක් වූවත් ලෝක බල කේන්ද්‍රය ඒක පාර්ශවීය නොවූ බහු පාර්ශවීය වීම යනු ලෝකය තුළ දේශපාලනික බල අසමතුලිතතාවයන් හට ගැනීමට නුදුරු අනාගතයේදී හැකියාවක් ඇති බවයි. ලෝක බලවතුන් අතර බලය හුවමාරු බී තිබෙන්නේ යුද්ධයකට පසුව වූවත්, මීළඟ බල හුවමාරුවකට යෑමට යුද්ධයක් තුළින් යෑම න්‍යෂ්ටික බලයෙන් සන්නද්ධ නූතන ලෝකයට දරා ගත නොහැකි ය. එහෙත් අප මේ පසු කරමින් සිටින්නේ ලෝක බලවතුන් ගැටෙන පරිවර්තන යුගයකටයි.

යූක්‍රේනයේ රුසියානු ආක්‍රමණය සාපේක්ෂව ප්‍රාදේශීය ගැටුමක් වූවත්, ලෝකය පුරා එහි ප්‍රතිවිපාක විඳින්නට සිදු වූයේ ගෝලීයකරණයට ලක් වී ඇති වෙළඳපොල තුළ එම යුද්ධයෙන් ඇති කළ කම්පනය නිසා ය. ලෝකයේ වැදගත් ආර්ථික කළාප අතර බලශක්තිය, සැපයුම් ජාල මෙන්ම පරිභෝජනයේද ඇතිවන වෙනස් කම් අනෙක් කළාපවල ආර්ථිකයන් තුළ ට ගලා යෑම වත්මන් ආර්ථික රටාව තුළ නොවැළැක්විය හැකිය. එබැවින්, ලෝකයේ එක් තැනක සිදු වන ගැටුමක් තවත් තැනක ආර්ථික අර්බුද නිර්මාණය කළ හැකිය. නූතනයේ ලෝකය බැඳී ඇති ජාලය එයයි.

එනයින්, ලෝකයක් ලෙස එක්ව කිසිදු තැනක යුද්ධ ඇතිවීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. එය හුදෙක් තනිව කළ හැකි ක්‍රියාවක් නොව ලෝකයක් ලෙස එක්ව, සාමූහිකව දැරිය යුතු උත්සහයකි. එම නිසා ලෝක ප්‍රජාවේ කොටස් කරුවෙකු ලෙස ශ්‍රී ලංකාව ලෝක සාමය පවත්වා ගැනීම

මූලික කරගත්, යුද්ධ ඇති වීම වළක්වා ගැනීම ප්‍රමුඛ කර ගත් විදෙස් ප්‍රතිපත්තියකට යොමු වන්නෙමු.

2. වසංගත

ලෝකයේ මානව ජනගහනය මේ වන විට බිලියන 8 ඉක්මවා තිබේ. එසේ වර්ධනය වූ මිනිසුන් තාක්ෂණයේ දියුණුවත් සමග වඩාත් නාගරික වූ ජන ඝනත්වයෙන් ඉහළ ජනාවාස වල ජීවත් වීමට නැඹුරු වී තිබේ. ප්‍රවාහනයේ දියුණුව සමග ඔවුන් විශාල සංඛ්‍යාවලින් ප්‍රාදේශීයව ද ගෝලීයව ද සංචරණය කිරීම අරඹා තිබේ. මෙහි ප්‍රතිඵලය නම් ක්ෂුද්‍ර ජීවීන් මගින් ඇති කරනු ලබන ආසාදනයන් ඉක්මනින් වසංගත බවට පත් වීමට ඇති හැකියාවයි. පසුගිය දශක කීපය ගෙන බැලූවිට එවන් වූ වසංගත කීපයක් ඇති වූ අතර, ඇතැම් ඒවා ගෝලීය වසංගත වලට පරිවර්තනය වූයේ ය. ඉදිරියට මේ තත්ත්වය තව තවත් වර්ධනය විය හැකි අතර එය ගෝලීය අභියෝගයකි. මීළඟ වසංගතය මොන රටෙන්, මොන මොහොතේ ඇරඹේ දැයි අපි නොදනිමු. එහෙත්, එයට ප්‍රතිචාර දැක්වීමට සාමූහිකව ලෝකයක් ලෙස සූදානම් වී සිටිය යුතුය. එනයින්, ලෝකය සමග එක්ව අන්තර්ජාතික සම්මුතියන් නිර්මාණය කර ගෙන ඒවා පවත්වා ගෙන යෑම අත්‍යාවශ්‍ය ය. අපේ විදේශ ප්‍රතිපත්තිය නිර්මාණය වන්නේ මෙවන් තත්ත්වවලට ශ්‍රී ලංකාව සූදානම් කර තබා ගැනීමේ අභිප්‍රාය ද ඇතුළුව ය.

3. දේශගුණික විපර්යාස

පසුගිය දශකය ගත් කළ ලෝකයේ පාරිසරික අර්බුද වේගයෙන් ඉහළ ගිය කාලයක් වූයේ ය. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක ඍණාත්මක ප්‍රතිඵලයක් වන පාරිසරික අර්බුද සියල්ල එක්ව ගත් කළ එහි අග්‍ර ඵලය බඳු ගෝලීය උණුසුම ඉහළ යෑමත්, අනතුරුව ලෝකය දේශගුණික විපර්යාස වලට ලක් වීමටත් ආරම්භ වී තිබේ.

ගෝලීය උණුසුම ඉහළ යැමත්, දේශගුණික විපර්යාස වලට ලක් වීමෙන් ස්වාභාවික විපත් ඇති වීමත් දේශසීමා වලට කොටු වී නොමැත. එහි බලපෑම ගෝලීය ය. එසේම, දේශගුණික විපර්යාස මැඩපැවැත්වීම වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග ද දේශසීමාවකට ලඝු නොවේ. එම විසඳුම් ලෝකයක් ලෙස සාමූහිකව එක්ව විසඳා ගත යුතු ගැටළු වෙයි. එබැවින්, ලෝකය සමග සාමූහිකව කටයුතු කරමින්, විසඳුම් සම්මතයන් බවට පත්කර ගනිමින්, අන්තර්ජාතිකව ඇතිකර ගනු ලබන ගිවිසුම්වලට

එළඹීමත්, ඒවා රටේ අවශ්‍යතාවය පරිදි සකස් කර ගෙන, සම්මුතීන්ට එකඟව කටයුතු කිරීමත් අපට පැවරෙන වගකීමකි.

මේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට අපගේ විදෙස් සේවා වලට විශාල වගකීමක් තිබේ. ගෝලීයව සිදුවන බලශක්ති පරිවර්තනය, දේශපාලන පරිවර්තනය ආදියට නිවැරදිව රාජ්‍ය මෙහෙයවා ගැනීමට විදෙස් සේවා බැඳී සිටිය යුතුය.

4. සංක්‍රමණය

ලෝකය පසු කරන බහු අර්බුද සමයේ අප දකින තවත් එක ලෝක අර්බුදයක් නම් මිනිසුන්ගේ සංක්‍රමණයයි. ලෝකයේ ඇති වන ආර්ථික, දේශපාලන හෝ සමාජීය කුමන හෝ අර්බුදයකට විසඳුම් ලෙස මිනිසුන් වෙනත් රටකට සංක්‍රමණය වීම සුලභ සිදු වීමකි. ජීවත් වීමට අභියෝගාත්මක ස්ථානයක සිට වඩාත් ආරක්ෂිත සහ ගුණාත්මක ජීවිතයක් සොයා ගෙන මිනිසුන් ගමන් කිරීම ස්වාභාවික තත්වයකි.

එහෙත්, මිනිසුන් විශාල වශයෙන් එසේ ගමන් කරයි නම්, එසේ ගමන් කරන රටවල සම්පත් බෙදී යෑමේ අසමතුලිතතාවයන් හට ගන්නේ ය. එම අසමතුලිතතාවයන් ආර්ථික කම්පන මෙන්ම සමාජ සංස්කෘතික ගැටලු ලෙස ප්‍රකාශයට පත්වන අතර ඒවා නිසා සමාජයක පැවැත්මට බලපෑම් ඇති වේ. එබැවින්, මිනිස් සංක්‍රමණය යනු වර්තමාන ලෝකයේ ගෝලීය අර්බුදයක් බවට පත්ව තිබේ. විශේෂයෙන් ලෝකය දේශසීමා තුනී කොට ගෝලීයකරණය සමග විවෘතව බැඳීම පදනම කර ගත් කාලයක, මිනිස් සංක්‍රමණය යනු එහි ඇති අභියෝගයකි. මේ මගින් ඇති කරන අසමතුලිතතාවයන් කලක් යනවිට තනුක වී යා හැකි නමුත් වර්තමාන වන විට ලෝකයට එය අර්බුදයක් නිර්මාණය කර දී තිබේ.

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තුළ මේ නව ගෝලීය අර්බුදයට පැහැදිළි දර්ශනයක් තිබිය යුතුය. අප බලාපොරොත්තු වන පරිදි සංවර්ධනය කරා ළඟා වන්නේ නම්, සංක්‍රමණිකයන් මෙහි ඇදී ඒම ද සමාන්‍යයෙන් සිදු වන්නකි. එසේ ම, අපගේ සංස්කෘතිය ද එමගින් අභියෝගයට ලක් වීමට ඉඩ තිබේ. මෙය නව ගෝලීය නැඹුරුවයි. එය අපට වළක්වාලිය හැකි නොවේ. අපට කළ හැක්කේ වඩාත් හොඳින් එයට අනුගත වීම පමණකි. එනයින්, අපගේ විදේශ ප්‍රතිපත්තිය තුළ මිනිස් සංක්‍රමණය පිළිබඳව පැහැදිළි නීති රාමු නිර්මාණය කිරීමටත්, ඒවා ගෝලීය සම්මතයන්ට අනුකූලව පවත්වා ගැනීමටත්, ඒ පිළිබඳව ලෝකය සමග එක්ව කටයුතු කිරීමටත් අප බලාපොරොත්තු වන්නෙමු.

5. ත්‍රස්තවාදය

ත්‍රස්තවාදය ද තව දුරටත් එක් රටක දේශසීමාවට සීමා නොවන අභියෝගයක් බව තව දුරටත් කිව යුතු නොවේ. විශේෂිත වූ දේශීය හෝ ප්‍රාදේශීය කරුණු හැරුණු කොට පසුගිය දශක කීපය සැලකීමේ දී ලෝකය පුරා අන්තවාදී ත්‍රස්තවාදී කණ්ඩායම් ව්‍යාප්ත වී තිබෙනු අපට දකිනට ලැබෙයි.

එසේ ම ප්‍රාදේශීය හෝ දේශීය ත්‍රස්තවාදීන් වුව ද සිය අරමුදල් සපයා ගැනීමත් අවි ආයුධ සපයා ගැනීමත් වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය හා සැපයුම් ජාල භාවිතා කරනු ලැබුවේ ය. එසේම තාක්ෂණයේ, අන්තර්ජාලයේ සහ සමාජ මාධ්‍ය ජාලා වල භාවිතයෙන් ලෝකයේ ඕනෑම තැනක සිටින ත්‍රස්තවාදී සංවිධානයකට තවත් ඕනෑම තැනක ක්‍රියාත්මක වීමට හැකියාව ලැබී තිබේ. අලුත් පිරිස් බඳවා ගැනීම, සැපයුම් ජාල පවත්වා ගැනීම, අරමුදල් රැස්කිරීම හා ක්‍රියාත්මක වීම ලෝකයේ ඕනෑ ම ස්ථානයක සිට දැන් කර ගත හැකිය. එනම්, කුමන අරමුණකින් ඇති වූවත්, ත්‍රස්තවාදය යනු තව දුරටත් එක රටක පමණක් ප්‍රශ්නයක් නොවේ. එය කළාපයක හෝ ගෝලීයව වැදගත් ප්‍රශ්නයක් බවට පත් වී හමාර ය. තව දුරටත් තනි රටකට ත්‍රස්තවාදය පාලනය කර ගැනීම තනිව කළ නොහැක්කකි. එනිසා, ඒ වෙනුවෙන් ගෝලීය වැඩපිළිවෙලක් අවශ්‍ය බවත්, ජාත්‍යන්තර සම්බන්ධීකරණය ඇතුව, පොදු එකඟතාවයන් සහ සම්මුතීන් අවශ්‍ය බවත් අපි පිළිගනිමු.

විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි ත්‍රස්තවාදයෙන් දිගින් දිගටම බැට කෑ රාජ්‍යයකට තව දුරටත් එවන් අවාසනාවන්ත තත්ත්වයන්ට ගොදුරු වීම විනාශකාරී ය. එනයින්, අප සිදුකළ යුත්තේ එවන් ගෝලීය එකඟතාවක් වෙනුවෙන් කටයුතු කිරීම ය. අපගේ විදෙස් සේවා ප්‍රතිපත්තිය ත්‍රස්තවාදය ඇති වීම වැළක්වීම සඳහා ක්‍රියාත්මක වනු ඇත.

6. ජනගහන වර්ධනය

එක රාජ්‍යයකට සුවිශේෂී නොවුණත් ජනගහන වර්ධනය යනු ලෝකයේ පවතින පොදු අභියෝගයකි. සීමිත සම්පත්වලින් යැපෙන ලෝක ජනගහනය තවදුරටත් වර්ධනය වීම යනු ලෝකය සතු එම සීමිත සම්පත් මත ඇති වන පීඩනය තවත් ඉහළ යන බවයි. ගෝලීය ආර්ථිකය විසින් නිෂ්පාදන ක්‍රියාවලිය පුළුල් කර, වැඩි වන සියලු ජනගහනයට අවශ්‍ය සම්පත් නිෂ්පාදනය කළත්, එමගින් ඇති කර තියෙන තිරසාර නොවන

ආර්ථික රටාව ලෝකයේ පැවැත්මට අභියෝගය කි. වසර 2100 පමණ වන විට ලෝක ජනගහනය බිලියන 10 අභිබවා යෑමට නියමිතය. එනම්, ලෝකයට දැරිය හැකි උපරිම මිනිස් ගහනය එය බැවින් ඒ වන විට ලෝකය ජනගහනයෙන් පිරුණු ස්ථානයක් බවට පත්වෙනු ඇත. එසේ වැඩි වුණ ජනගහනයත්, තිරසාර නොවන සම්පත් පරිභෝජනයත්, මේ ලෝකය තුළ විවිධ ඌණතා නිර්මාණය කරයි නම්, එම සීමිත සම්පත් බෙදා ගැනීම සඳහා ගැටුම් ඇතිවීම සිදු විය හැකිය. එබැවින් විදෙස් සේවා ප්‍රතිපත්තිය නිර්මාණය කිරීමේදී මේ අනාගත අභියෝගවලට මුහුණ දීමට රට සූදානම් කරගත යුතු බවත්, ලෝකය සමග ඒ පිළිබඳව අවබෝධය ගොඩනගා ගැනීමත් වැදගත් වෙයි.

7. අනෙකුත් පාරිසරික අර්බුද

සාගර දූෂණය

පාරිසරික අර්බුද අතර තවත් සුවිශේෂී අර්බුදයක් නම් සාගර දූෂණය යි. අධි ධීවර කර්මාන්තය සහ කැළි කසළ සාගර වලට මුදා හැරීම යන කරුණු ඔස්සේ සාගර දූෂණය විශාල වශයෙන් සිදු වෙමින් පවතී. සාගර උණුසුම් වීම සහ දේශගුණික විපර්යාසවලට ලක්වීමත් තව ගැටලුවක් වූවත්, එය අප ඉහතදී සළකා බැලීය.

සාගරවල පවතින මත්ස්‍යය සහ සාගර ආහාර වර්ග අධික ලෙස පරිභෝජනය කිරීම පිණිස අල්ලා ගැනීම නිසා සාගර තුළ ජීව විද්‍යාත්මක අර්බුද රැසක් මතුවී තිබේ. එසේම නිසි ලෙස කළමනාකරණය නොකළ කැළි කසළ අවසානයේ සාගරයට පැමිණීම මත සාගරය තුළ විශාල නොදිරන කැළි කසළ ප්‍රමාණයක් දැනටමත් එක් රැස් වී තිබේ. ඉන්දියන් සාගරයේ පිහිටි කුඩා දූපතක් වන බැවින් සාගරයේ සෞඛ්‍යය සම්පන්න පැවැත්ම ශ්‍රී ලංකාවට සෘජුව ම බලපානු ලැබේ.

එසේම සාගරවල මේ අර්බුදය දේශීයව පමණක් කළමනාකරණය කළ හැක්කක් නොවේ. ඒ සඳහා අපට ගෝලීය එකඟතාවයන් නිර්මාණය කර ගැනීමට සිදු වන අතර, සාමූහිකව කටයුතු කර ගැනීමට සිදු වෙයි. එනයින්, සාගර වල ගැටලු විසඳා ගැනීමටත් අපට සුවිශේෂී විදෙස් සේවාවක් අවශ්‍ය වෙයි. අපගේ විදෙස් කටයුතු ප්‍රතිපත්තියක් තුළ ඒ සඳහා ද ඉඩක් නිර්මාණය වනු ඇත.

උක්ත ගෝලීය අර්බුද තේරුම් ගෙන, ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සැළැස්ම ඉදිරියට ගෙන යාමටත් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය රැකගෙන,

අප රට ලෝකය තුළ අභිමානයෙන් හිස ඔසවා තබා ගැනීමට යහපත් ප්‍රතිරූපයක් නිර්මාණය කරගැනීමත් අරමුණු කර ගෙන අප අපගේ විදේශ ප්‍රතිපත්තිය මෙසේ ඉදිරිපත් කරන්නෙමු.

ලෝක සාමය පවත්වා ගැනීම.

ලෝකය බහු කේන්ද්‍රීය බල තුලනයක් වෙත ගමන් කරද්දී, කුඩා රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව විශේෂයෙන් පාර්ශවීය නොවී සිටීම වඩාත් උචිත ස්ථාවරයයි.

එහෙත්, නූතන ගෝලීය භූ දේශපාලනික අරගලයේ තීරණාත්මක රාජ්‍යයක් බවට පත්ව සිටින ශ්‍රී ලංකාවට ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව නොමැත. එයට හේතුව නම් අප රාජ්‍යයක් ලෙස ආර්ථික අතින් කඩා වැටුණු, අසරණ තත්ත්වයකට පත්ව තිබීම ය. අප මේ භූ දේශපාලනික බල කඳවුරුවලින් ස්වාධීනව හෝ වක්‍රාකාරයෙන් යැපෙන අතර, අර්බුදයෙන් ගොඩ ඒම සඳහා එම කඳවුරුවල සහයෝගය බලාපොරොත්තු වෙති. එහි තේරුම නම්, අපට මීට පෙර තිබූ තරම් ස්වාධීනත්වයක් ලෝක දේශපාලනය හා ආර්ථිකය තුළ නොමැති වීම ය.

කෙසේ වෙතත්, අනාගත ගෝලීය බල පොරයක දී යම් ආකාරයක යුධමය තත්ත්වයක් ඇති වුවහොත් හෝ ආර්ථික පරිහානියක් ඇති වුවහොත්, අපගේ පැවැත්ම අනෙකෙකු අතේ රඳවා තැබීම නුසුදුසු ය.

එනයින්, අප ලෝක සාමය ඇති කිරීම පිණිස කටයුතු කළ යුතුය. එය අපේ වගකීමක් ලෙස සළකනු ලබන අතර මධ්‍යස්ථව කටයුතු කරමින් පාර්ශවීය නොවී සිටීමට අප කටයුතු කරන්නෙමු.

රටේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීම.

අනාගත ලෝකයක ස්වෛරීත්වය යනු සාපේක්ෂ සංකල්පයක් වීමේ ඉඩකඩ බොහෝ වැඩි ය. අන්තර්ජාතික ගිවිසුම් ගතවීම්, ලෝක සම්මුතීන්, වෙළඳපොල ගිවිසුම් සහ ගෝලීයව එකඟ වන නියාමනයන් ආදිය නිසා ලෝකයේ කිසිදු රටකට සිතැඟි පරිදි කටයුතු කිරීමේ නිදහස තව දුරටත් නොමැත. එනයින්, ස්වාධීනව හා ස්වායක්තව කටයුතු කිරීමට බොහෝ

අවස්ථාවන්වල නොලැබුණත්, රැකී ඇති ප්‍රමාණයෙන් රටේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීමට අප බැඳී සිටින්නෙමු.

ආර්ථික අර්බුදය හමුවේ යම් ආකාරයකට දුර්වල වූවත්, ශ්‍රී ලංකාව ජාතියක් ලෙස නැගී සිටිය යුතුය. හැමදාම දියුණු වෙමින් පවතින රාජ්‍යයක තත්වයේ සිටිමින් අප වැනි කුඩා රාජ්‍යයක් හට ලෝක තලයේ එතරම් වැදගත්කමක් හිමි නොවේ. ඒ තත්ත්වය හා ගෞරවය අපි දිනා ගතයුත්තකි. එය දිනාගත හැක්කේ අන් කිසිවකින් නොව වෙළඳපොල ජයගෙන සාර්ථක ආර්ථිකයක් නිර්මාණය කර ගැනීමෙන් පමණ ය. ලෝකය ම එකම වෙළඳපොලක් ලෙස යා වෙද්දී, අප ද ලෝකය සමග මුහු වෙමින්, එහෙත් අප සතු අනන්‍යතාවය රැක ගනිමින්, ව්‍යාපාර හා කර්මාන්ත කොට ධනය උත්පාදනය කොට ණය අර්බුදයෙන් මිදී, කිසි රටකට ගැති නොවන දියුණු ආර්ථිකයක් නිර්මාණය කර ගත යුතුය.

රටේ ස්වෛරීත්වය ආරක්ෂා කරගෙන ලෝකයට මුහු වීම පිණිස අපට සූක්ෂම විදෙස් සේවාවක් අවශ්‍ය වන අතර, මේ හරහා එයට පදනම දැමීමට අප බලාපොරොත්තු වන්නෙමු.

ලෝක බලවතුන් සමග සුහදව කටයුතු කිරීම සහ රාජ්‍ය තාන්ත්‍රික සමබරතාව පවත්වා ගැනීම.

ඉහත පැහැදිළි කළ අයුරින් ම අප කළ යුත්තේ ලෝක බලවතුන් සමග සුහදව කටයුතු කිරීමයි. ඉතා කුඩා රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවට නූතන ලෝක බලවතුන් සමග ගැටීමේ වාසියක් නොමැත. එසේම, ලෝක බලවතුන් හට බියෙන් කටයුතු කරමින්, අධිරාජ්‍ය විරෝධයක් ගෙන එමින් කටයුතු කිරීමත් ප්‍රඥාගෝචර නොවේ. ලෝකයේ ධර්මතාවයන් අපට වෙනස් කළ නොහැකි ය. අපට කළ හැක්කේ ඒ ධර්මතාවයන්ට අනුගත වෙමින් අප ගමන් කළ මාර්ගය සොයා ගැනීම පමණකි.

එනයින් අධිරාජ්‍යන් සහ බලවතුන් සමඟ සාමයෙන් හා විවෘතව සිටීමත්, සුහදව සම්බන්ධීකරණය කර ගැනිමත්, එම ආර්ථිකයන් හා අපේ ආර්ථිකය මුහු කර ගැනීමත්, බලවතුන් අතර රාජ්‍යය තාන්ත්‍රික සමබරතාව පවත්වාගෙන යෑමත් අපේ වගකීම් වෙයි.

අනාගත ලෝක බල කේන්ද්‍ර වෙනස් වීමකට පෙරතියා සූදානම් වීම.

නුදුරු අනාගතයේ දී ලෝකයේ සිදුවන දේශපාලන පරිවර්තනයන් ප්‍රමාණය බොහෝ විය හැකි ය. ඒ අතර ලෝක බල කේන්ද්‍ර මාරු වීමත් දැන් යථාර්ථයක් බවට පත් වී තිබේ. මෙවන් බල භූවමාරුවක් සිදුවන කාල පරිච්ඡේද වේදනාකාරී විය හැකිය. ලෝකය සුමට ලෙස මෙකල ගලා නොයයි. එනයින්, මේ නව තත්ත්වයන් විශ්ලේෂණය කොට, ඒවා පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීමටත්, අනාගතයට සූදානම් වීමත් විදෙස් සේවා ප්‍රතිපත්ති යටතේ අපි බලාපොරොත්තු වන්නෙමු.

රටේ සම්පත් ආරක්ෂා කර ගැනීම.

ගෝලීය දේශපාලනය තුළ ආර්ථික අර්බුදයකට හසු වීම යනු, යම් රටක් සතු සම්පත් අහිමි වන හේතුවකි. එසේ ම ක්‍රීඩා රාජ්‍යයක් ලෙස ලෝක බලවතුන්ගේ ග්‍රහණයට ලක් වීම යනු එම ලෝක බලවතාගේ අවශ්‍යතාවය මත රටේ සම්පත් යොදා ගැනීමය. මීට පෙර පැවති අධිරාජ්‍ය වාදී කොලණි ක්‍රමය මෙන් නොව නූතනයේ එම සම්පත් උකහා ගැනීම සිවු වන්නේ වක්‍රාකාරයෙනි.

එසේ නම්, ලෝකය සමග ගනුදෙනු කිරීමේ දී අප රට සතු සම්පත් වෙනත් ජාතීන් හෝ සංවිධාන විසින් උරුම කර ගැනීමට එරෙහිව අප කටයුතු කළ යුතුය. රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා මගින් අවබෝධයෙන් සබඳතා ගොඩනගා ගැනීම තුළ, අප සතු සම්පත් වෙනකෙකු විසින් අත්කර ගැනීමට එරෙහිව කටයුතු කිරීමේ හැකියාව ලැබේ. එනයින්, විදෙස් සේවා ප්‍රතිපත්තියක දී අප සතු සම්පත් රැක ගැනීමට අන්තර්ජාතික සබඳතා යොදා ගැනීමටත්, ඒවා පිළිබඳව පූරව අවධානයෙන් සිටීමින් කටයුතු කිරීමටත් අපි බලාපොරොත්තු වන්නෙමු.

අන්තර්ජාතික සම්මුතියන් ගරු කිරීම සහ පවත්වා ගැනීම.

ශ්‍රී ලංකාව ගෝලීය දේශපාලනය තුළ වගකියන රාජ්‍යයක් ලෙස පිළිගැනීමට නම්, මෙතෙක් අත්සන් කරන අද අන්තර්ජාතික සම්මුතීන් සහ ගිවිසුම් නොපිරිහෙළා ගරු කළ යුතුය. ණය ගෙවීමේ පටන් දේශගුණික විපර්යාස ක්‍රියාකාරිත්වය දක්වා පරාසයක මේ ගිවිසුම් විහිදී යන අතර, එම ගිවිසුම් කඩ නොකර පවත්වාගෙන යමින් විදෙස් සබඳතාවයන් හොඳින් නඩත්තු කර ගැනීමට අප බලාපොරොත්තු වන්නෙමු.

ගෝලීය ආර්ථිකය සමග මුහු වීමට වෙළඳපොල බාධා අවම කරගැනීම.

අප ආර්ථික ප්‍රතිපත්තිය තුළින් පැහැදිළි කරන ආකාරයට බලාපොරොත්තු වන්නේ අනාගත ගෝලීයකරණය වූ ලෝකයක අන්තර්ජාතික වෙළඳපොල කොටසක් උරුම කරගැනීම මත ධනය උත්පාදනය කර ගැනීමයි. ඒ සඳහා වන වෙළඳපොල බාධා අඩු, දේශසීමා ඔස්සේ පහසුවෙන් භාණ්ඩ හා ප්‍රාග්ධනය ගලා යන ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා අනෙකුත් පාර්ශ්වයන් සමග මනා විදේශ සබඳතා පවත්වා ගෙන යා යුතුය. එම සබඳතා අනුසාරයෙන්, ඒවායේ විශ්වාසය දිනා ගැනීමෙන් වෙළඳපොල බාධා අවම කර ගැනීමත්, ආයෝජන ගෙන්වා ගැනීමට අඩිතාලම දමා ගැනීමත්, වෙළඳපොල ගිවිසුම්වලට පෙළඹීමත් සිදුකර ගැනීම විදෙස් සේවාවල වගකීමකි. අප ශ්‍රී ලංකාවේ විදෙස් සේවය මේ රටේ වෙළඳපොලට තානාපතිවරයෙකු සේ සළකා කටයුතු කරන අතර අන්තර්ජාතික වෙළඳපොලට හොඳින් අනුගතවීමට එම සේවය භාවිතා කිරීමට බලාපොරොත්තු වෙමු.

වෙළඳපොල ගිවිසුම් ඇති කරගැනීම මඟින් විදේශීය වෙළඳපොල පුළුල් කිරීම සහ ආයෝජකයන් සඳහා සම්බන්ධීකරණ මාර්ගයක් සේ කටයුතු කිරීම.

අප රටට අන්තර්ජාතික වෙළඳපොල තුළ කොටසක් උරුම කරගැනීමත්, දේශීය නිෂ්පාදන වෙත අපනයන වෙළඳපොලක් සකස් කිරීමත් වෙනුවෙන් අපට වෙළඳපොල ගිවිසුම්වලට ඇතුලත් වීමට සිදු වේ. ඒ වෙනුවෙන් කටයුතු කිරීමට විදෙස් සේවා යොදවනු ලැබේ.

ගෝලීය ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත කාර්යක්ෂම විදේශ සේවයක් ලබා දීම.

මේ වන විට ලෝකය පුරා ශ්‍රී ලාංකිකයන් මිලියන 30ක් පමණ ජීවත් වෙයි. ඉන් බොහෝ පිරිසක් ස්ථිර පදනම මත රට හැර ගිය ඇයෝ වූව ද අනෙක් පිරිස අපේ ම විදෙස් ගත ශ්‍රමිකයන් ය. මේ දෙපිරිස ම සිය පරිපාලන සහ සංචරණ අවශ්‍යතාවයක් උදෙසා විදෙස් සේවා මත රඳා පවතින්නේ ය.

එම නිසා ඔවුන්ගේ පහසුව පිණිස රටේ අභ්‍යන්තර රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණවලට සාපේක්ෂව විදෙස් සේවාවල ද ගුණාත්මක දියුණුවක් සමාන්තරව ඇති වනු ඇත. විශේෂයෙන් ඩිජිටල්කරණය සහ e Governance ක්‍රමවේදයන් හරහා බොහෝ රාජ්‍ය සේවා විදේශයක සිට

වුව ද ඉටු කර ගැනීමේ හැකියාව ලබෙන අතර, තවත් බොහෝ සේවා තානාපති කාර්යාල ඔස්සේ පමාවකින් තොරව කර ගැනීමේ හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතිකය තුළ ඉහළ නැංවීමට කටයුතු කිරීම.

දැනට දුර්වල වී ඇති ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතිකය හමුවේ දියුණු කළ යුතුව තිබේ. දීර්ඝකාලීන වර්ගවාදී සටන්, ත්‍රස්තවාදය , දූෂිත දේශපාලනය සහ ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාව පිළිබඳව අන්තර්ජාතිකය තුළ දීර්ඝකාලීනව ඇති වූ අඳුරු මතකයන් රාශියකි. මේ නිසා අපට වෙළඳපොල විශ්වාසය දිනා ගැනීම අපහසු ය. ඒ විශ්වාසනීයත්වය නොමැතිව ලෝක වෙළඳපොල තුළ පැවැත්ම තහවුරු කර ගැනීම අපහසු ය. එනයින් රට සංවර්ධනයේ මාර්ගයට යොමු කළ සැණින්ම මෙරට පිළිබඳව ඇති අඳුරු මතකයන් වෙනුවට ලෝකයට අප ගැන හොඳ ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය පැන නගී. එම ක්‍රියාවලිය විදෙස් සේවා ඔස්සේ ඉටු කර ගත යුතු අතර, ඒ වෙනුවෙන් විශේෂ අවදානය යොමු කෙරේ.

විදේශ සේවා සඳහා නව රාජ්‍යතාන්ත්‍රික අධ්‍යාපන ක්‍රමයක් ආරම්භ කිරීම සහ විශේෂ විභාග ක්‍රමයක් ඇති කිරීම.

රාජ්‍ය පරිපාලන සේවා අධ්‍යාපනය මෙන් විදෙස් සේවා සඳහා ද නව තෝරා ගැනීමේ විභාගයක්, වෙනම පාඨමාලා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. එම පාඨමාලාවෙන් අනතුරුව විශේෂ විභාගයෙන් සමත් පිරිස විදෙස් සේවා සඳහා තෝරා ගන්නා අතර, ඔවුන් අනිවාර්යය පුහුණු වැඩසටහනකට යොමු කෙරේ. රටේ බිහිවන සුදුදුකම් ලත් හොඳම දක්ෂයන් ලෝකය සමග ගණුදෙනු කිරීමට ඉදිරියට යොමු කිරීම මෙහි අරමුණ වන අතර, විදේශ සේවා සුදුසුකම්ලත් දක්ෂයින් අතින් ක්‍රියාත්මක වනු දැකීම මෙහි අරමුණයි.

විදේශ සේවා පත් කිරීම් දේශපාලන මැදිහත්වීමෙන් හැකිතාක් ස්වාධීන කිරීම.

විදේශ සේවා සඳහා පත් කිරීම් සිදුකිරීමේ දී දේශපාලන බලය අවභාවිතා කරමින් පවුල් වාදය සහ අනුග්‍රහකවාදය ක්‍රියාත්මක කිරීම නැවැත්වේ. ඒ සඳහා නව නීති නිර්මාණය කිරීමට අනාගතයේ දී කටයුතු කරනු ලැබේ.

විදේශ සේවා සඳහා නිලධාරීන් පත් කිරීම දේශපාලන වුවමනාව මත සිදු වීම නැවැත්වේ. විදේශ සේවා පුහුණුව ලැබූ, විභාගයෙන් සමත් පුද්ගලයන් හට පමණක් එම අවස්ථාව සීමා වෙයි.

බලශක්ති ප්‍රතිපත්තිය

බලශක්තිය යනු ඕනෑ ම රටක මූලික අවශ්‍යතාවයක්වන අතර ඒ රටේ ආර්ථිකයට පදනම සකස් කරන ප්‍රධානම සාධකයකි. එම බලශක්තිය විවිධ ස්වරූපවලින් පවතින අතර මිනිස් සමාජයක පැවැත්මට ඒ සියළු ස්වරූපවල සමස්තය යොදා ගැනීම සහ සංකලනය වැදගත් වෙයි.

බලශක්තිය විසින් ආර්ථිකයක ගාමක බලය සපයන අතර, එහි විශ්වාසනීයත්වය මත ආර්ථිකයේ පැවැත්ම රඳා පවතී. එනයින්, මිනිස් සමාජයක් නිරන්තරයෙන් බලශක්තිය කෙරෙහි ප්‍රමුඛ අවධානයක් ලබාදුන් අතර, එම අවධානය යුගයෙන් යුගයට ඉහළ ගොස් තිබේ. තාක්ෂණයේ දියුණුවත්, නූතන ජීවන රටාවත් මිනිසාගේ බලශක්ති පරිභෝජනය සීඝ්‍රයෙන් ඉහළ දමා තිබේ. එනයින්, බලශක්තිය යනු නූතන මිනිස් සමාජයක පැවැත්ම තහවුරු කරන සාධකයක්වන අතර ගුණාත්මක, විශ්වාසනීය, අඛණ්ඩ හා ලාභදායි බලශක්ති සැපයුමක් සකස්කර ගන්නාතුරු මිනිස් සමාජයකට සාර්ථක විය නොහැකිය.

ගින්දර සොයා ගත් දින සිට මිනිසා සිය බලශක්ති අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස විවිධ ආකාරයෙන් උපක්‍රම සකස්කර ගත්තේ ය. ක්‍රමයෙන් විවිධ දේ අත්හදා බැලූ ඔවුහු සිය ඉහළ යන අවශ්‍යතාවයන් දරවලින් පමණක් සංතෘප්ත නොවන විට අලුත් ඉන්ධන ප්‍රභේද සොයා ගියේ ය. විටෙක දර ද, කලෙක තල්මසුන්ගේ තෙල් ද, අනතුරුව ගල් අඟුරු ද, පසුව බනිජ තෙල් ද මිනිසා විසින් භාවිතා කළේ ය. පසුගිය සියවස ගත්කළ බලශක්තියේ විශාල පරිවර්තන රාශියක් ඇති වී තිබේ. නාෂ්ටික බලය, ස්වභාවික බලශක්ති ප්‍රභේද වේගයෙන් දියුණු වූයේ ය.

සම්පත් යනු ලෝකය තුළ සීමාකාරී දෙයක් වුණත්, බලශක්තිය අවශ්‍ය සෑම මොහොතකදී ම මිනිසා විසින් එයට ප්‍රමාණවත් පිළිතුරක් සොයා ගත්තේ ය. එම නිසා මේ ලෝකය තුළ බලශක්තිය යනු කිසි විටෙක හිඟයකට ලක් වූ සම්පතක් නොවූයේ ය. බල ශක්තිය සීමාකාරී සාධකයක් වූවත්, අවශ්‍යතාවය පරිදි බලශක්තිය නිශ්පාදනය කර ගැනීමට මිනිසා සමත් වී තිබේ. ලෝකය නව සොයා ගැනීම් ඔස්සේ විවිධ බලශක්ති ප්‍රභේද භාවිතයට ගනිමින් නොනැවතී පරිවර්තනයට ලක් වූයේ ය. බලශක්ති ක්ෂේත්‍රය තුළ සිදුවන වෙනස්කම් පසුකාලීනව ගෝලීය දේශපාලනයේ බල පෙරළියන් සමග සමගාමීව සිදු වූයේය. බලශක්තියේ නව සොයා ගැනීම් සමග කාර්මීකරණයේ ද වෙළඳපොල තුළ ද තාක්ෂණයේ දියුණුවේ ද විශාල ධනාත්මක වෙනස්කම් ඇතිවූයේ ය. ඒවායේ ප්‍රතිඵලය වූයේ සාර්ථක මිනිස් සමාජයක් නිර්මාණය කිරීමට නම්

සාර්ථක බලශක්ති සැපයුමක් නිර්මාණය කර ගැනීම අත්‍යාවශ්‍ය පදනමක් බව ලෝකයට සනාථ වීම ය.

ඒත් සමග ම බලශක්තිය යනු නිරන්තරයෙන් වෙනස්වන, යාවත්කාලීනවන, නව සොයා ගැනීම්වලින් පරිවර්තනයන්ට ලක්වන වඩාත් තරගකාරී ක්ෂේත්‍රයක් බව මේ වනවිට පොදුවේ පිළිගැනේ. වර්තමානය වනවිට ද බලශක්ති ක්ෂේත්‍රය තුළ එවන් වූ ඓතිහාසික පරිවර්තනයක් සිදුවෙමින් පවතින යුගයකට අප එළැඹ සිටින්නෙමු. එනම්, පොසිල ඉන්ධනවලින් සියවසකට අධික කාලයක් සිය මූලික බලශක්ති අවශ්‍යතාවය සපුරා ගත් මිනිස් සමාජය ඉන් ඇති කරන ලද පාරිසරික අර්බුදයට පිළියමක් ලෙස විකල්ප බලශක්ති ප්‍රභේද වෙත හුවමාරු වීමයි. සුළං බලය, සූර්ය බලය මෙන්ම න්‍යෂ්ටික බලය ද වේගයෙන් නව දහරාවේ විකල්ප බලශක්ති උපක්‍රම ලෙස ඉදිරියට එද්දී, ලෝකය පොසිල ඉන්ධනවලින් ඈත් වීම අරම්භ කර තිබේ. දේශගුණික විපර්යාස වැළැක්වීම පිළිබඳව ඇති කරගත් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුව ලෝකය වර්තමානය වන විට බලශක්ති පරිණාමයකට ලක් වෙමින් පවතියි. එබැවින් රටක් ලෙස ද අප සිටින්නේ එම පරිවර්තනයට මුහුණ දෙමිනි. බලශක්ති ක්ෂේත්‍රයේ සිදුවන පරිවර්තනය පාරිසරික විඥානය අනුව අප ද සාදරයෙන් පිළිගනු ලබන අතර ඒ පිළිබඳව අවබෝධයෙන් බලශක්ති ප්‍රතිපත්තිය සකස් කළ යුතුව තිබේ.

රටක දළ දේශීය නිෂ්පාදනයත් ඒ සඳහා යෙදවෙන බලශක්තියේ ප්‍රමාණයත් අතර සහසම්බන්ධයක් තිබේ. තවමත් සාපේක්ෂව කාර්මීකරණය නොවූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියනයක් නිර්මාණය කිරීමට යෙදවෙන බලශක්ති ප්‍රමාණය ටෙරාජූල් 0.47 ක් යැයි ගණන් බලා තිබේ. එය ගෝලීය අගයන්ට සාපේක්ෂව අඩු අගයක් යැයි සලකනු ලැබේ. රටක් ආර්ථික සංවර්ධනයට ලක් වන්නේ නම් එම රට කාර්මීකරණයට ලක්වීමත්, එහි නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය වීමත් අපේක්ෂා කළ යුතු වෙයි. එසේම ජනතාවගේ ආදායම් ඉහළ යෑම මත ඔවුන්ගේ ද බලශක්ති පරිභෝජනය ඉහළ යෑම සිදු වෙයි. එනම්, අප රට සංවර්ධන මාවතකට යොමු කරන්නේ නම් එහි දී බලාපොරොත්තුවන දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට සාපේක්ෂව බලශක්ති සැපයුමේ ද වර්ධනයක් ඇති කිරීමට අප සැලසුම් කළයුතු වෙයි. එසේම බලශක්ති සැපයුමේ වර්ධනයක් ඇති කිරීම වේගයෙන් කෙටි කාලයකින් කළ නොහැක්කක් බැවින්, දීර්ඝකාලීන සැලසුම් මතින්, වඩාත් විශ්වාසනීය, සුරක්ෂිත, තිරසාර සහ ලාභදායි බලශක්ති සැපයුමක් නිර්මාණය කර ගැනීම රජයක වගකීම වෙයි.

රටක විශ්වාසනීය, සුරක්ෂිත, තිරසාර සහ ලාභදායි බලශක්ති සැපයුමක් නිර්මාණය කිරීම රටේ ආර්ථිකයේ ප්‍රගතියට සෘජුව ම බලපවත්වන අතර, ලෝකයේ ආයෝජකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට ද එය ඉවහල් වෙයි. එබැවින්, එවන් බලශක්ති සැපයුමක් යනු වෙළඳපොල තුළ අප රට ගැන ඇති විශ්වාසය තහවුරු කරවන්නක් සේ ම, ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට ඉන් සෘජු දායකත්වය ලැබෙයි. මේ එකිනෙක සම්බන්ධතාවය අවබෝධ කර ගෙන, ශ්‍රී ලංකාවට අවශ්‍ය බලශක්ති සැපයුමක් නිර්මාණය කර ගැනීමත් ඒ සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කර ගැනීමත් අපගේ පරම වගකීමකි.

ලෝකයේ සිදුවන බලශක්තියේ පරිවර්තනයට සමාන්තරව සිදුවන අනෙක් විශාල ම පරිවර්තනය නම් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කමයි. පොසිල ඉන්ධන දහනයෙන් සියවසකට අධිකව ඉදිරියට ආ ප්‍රවාහන ක්ෂේත්‍රය විද්‍යුත් බලයට හුවමාරු වීම ඔස්සේ බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනයකට ලක්වනවා පමණක් නොව, ලෝකයේ ම යටිතල පහසුකම්වල, නිෂ්පාදන සැපයුම් ජාලවල මෙන්ම කැණීම් ක්ෂේත්‍රවල ද පුළුල් වෙනසක් ඇති කොට තිබේ. එමගින් ඇති කළ දැඩි ඉල්ලුම මගින් නව රැකියා බිහි වීම වගේ ම වෙළඳපොල හැසිරීමේ වෙනස්කම් පවා ඇතිවී තිබේ. අප ද හරිත ආර්ථිකයක් නිර්මාණය කිරීමට සැළසුම් සකස් කරන මේ කාලය තුළ ලෝකයේ මේ වෙනස්කම් සැලකිල්ලට ගැනීම අනිවාර්යයෙන් කළ යුත්තකි. ඉතා කුඩා වෙළඳපොලක් වන අප ඉක්මනින් ලෝකයේ රිද්මයට අනුගත වීම වඩාත්ම ලාභදායි උපක්‍රමය වන බව අපේ ආර්ථික ප්‍රතිපත්තිය තුළින් ඔබට පැහැදිළි කළෙමු. එනයින් අන්තර්ජාතික සම්මුතීන්ට අනුකූලව බලශක්ති පරිවර්තනයට අප ද යොමු වීම අපගේ ආර්ථිකය තුළ ද ගෝලීය රිද්මය පවත්වා ගැනීමට හැකියාව ලැබේ. එම නිසා බලශක්ති ක්ෂේත්‍රය වගේම ඊට අනුරූපීව ප්‍රවාහන, නිෂ්පාදන, තාක්ෂණික හා අධ්‍යාපන ක්ෂේත්‍රවල ද වෙනස්කම් සිදුකර ගැනීමට අප විවෘතව කටයුතු කළ යුතුය.

තිරසාර සංවර්ධන ඉලක්ක වැඩපිළිවෙළ අනුව එහි 07 වන කරුණට අනුගත වී, එහි ඉලක්ක සපුරා ගනිමින් වසර 2050 වන විට කාබන් විමෝචනය උදාසීන කරගැනීමට එහි ජාතික වැඩපිළිවෙළට එකඟව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය නිර්මාණය කරගත යුතුය. එම ඉලක්කවලින් නික්මීමේ නිදහසක් අපට නොමැති අතර, එයට අනුගත වී වේගයෙන් ඉලක්ක සපුරා ගැනීම අපගේ අරමුණයි.

විශේෂයෙන් සමකයට ආසන්න කුඩා දූපතක් වීමෙන් අපට ලැබී ඇති ස්වාභාවික වාසි සහගත තත්ත්වය බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ද වඩා වාසි සහගත වෙයි. දැඩි හිරු කිරණ සෘජුව ම වසරේ සෑම දිනක ම

පතිත වන, රට වටේ පවතින මුහුදු සීමාවෙන් වේගවත් සුළං නිතර හමා යන, මධ්‍යම කඳුකරයකින් ද ඉන් ගලා බසිනා ගංගා 106 කින් ඉහළ සිට ගලා යන ජල සම්පතකින් යුක්ත වීම ද ශ්‍රී ලංකාව රටක් විදියට ලබා ඇති දායාදයයි. සූර්ය බලය ද සුළං බලය ද උකහා ගැනීමේ තාක්ෂණය වඩාත් දියුණුවන හා ලාභදායි ක්‍රම නිර්මාණයවන ගෝලීය බලශක්ති පරිවර්තනය ශ්‍රී ලංකාවට තරගකාරී වාසිදායක තත්ත්වයක් අත්කර දී තිබේ. මේ හැකියාව නම් ශ්‍රී ලංකාවට බොරතෙල් නිධි පහළ වූවා මෙන් සිතා නිවැරැදිව කළමනාකරණය කර ගැනීම තුළ රටට බලශක්ති ක්ෂේත්‍රය තුළ දැවැන්ත වර්ධනයක් අත්කර ගැනීමට අවකාශය නිර්මාණය කර දෙයි.

මේ වන විටත් ජල විදුලිය නිෂ්පාදනය කිරීම අතින් අප ඉදිරියෙන් සිටින අතර, පවතින සම්පත් උපරිමයෙන් යොදා ගැනීම කරගෙන තිබේ. එසේ ම, මෑතක දී සිදුවන කුඩා ජල විදුලි බලාගාරවල වැඩිවීම මගින් ජාතික අවශ්‍යතාවයෙන් කොටසක් ආවරණය වී තිබේ. ජල විදුලි ක්ෂේත්‍රය තව දුරටත් ප්‍රසාරණය කිරීම පාරිසරිකව අවාසි සහගත විය හැකි බැවින්, ජල විදුලිය ක්ෂේත්‍රය තවදුරටත් වර්ධනය කිරීම සීමාකාරී වෙයි. එනයින්, අප අනාගත සැළසුමක දී අනෙකුත් විකල්ප බලශක්ති ප්‍රභේද පිළිබඳව වැඩි අවධානය යොමු කිරීම කළ යුතුය.

ගැඹුරු මුහුදේ සුළං බලය මගින් විදුලිය උත්පාදනය කරන (Offshore) තාක්ෂණික ලොව පුරා වේගයෙන් ප්‍රචලිත වෙමින් පවතී. මුහුදෙන් වටවූ දිවයිනක් වන ශ්‍රී ලංකාවට මෙම බලශක්ති ප්‍රභේදය උකහා ගනිමින් පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කර ගැනීමේ විශාල ඉඩකඩක් නිර්මාණය වී තිබේ.

විශේෂයෙන් මන්නාරම් ප්‍රදේශයේ මේ වන විටත් සුළං බලාගාර නිර්මාණය සඳහා ඉතාමත් සුදුසු තත්ත්වයක් පවතී. රටේ අනෙකුත් මුහුදු සීමාවල ද ශක්‍යතා අධ්‍යනයක් සිදු කර මුහුදු සුළං බලය උකහා ගැනීමට වඩාත් සුදුසු ස්ථාන හඳුනාගත යුතුය.

අනතුරුව පුද්ගලික ආයෝජකයන් සඳහා විදුලි බල උත්පාදනයට ආයෝජන කැඳවන අතර ජාතික විදුලිබල සැළැස්මට අනුකූලව බලශක්ති ඉලක්ක සපුරා ගැනීමට මෙම ප්‍රභේදය යොදා ගනේ.

එම නිසා ඉතා පැහැදිලි කරුණ නම් අපට ඉදිරියට යෑමට ස්වයං ජනනීන බලශක්ති ප්‍රභේදවලට වැඩි ඉඩක් ලබා දිය යුතු අතර, ඒ අතරින් සූර්ය බලය සහ සුළං බලයට ප්‍රමුඛතාව ලැබේ. එසේ ම, ඉදිරි අවශ්‍යතාවයන් වෙනුවෙන් න්‍යෂ්ටික බලාගාර නිර්මාණය කිරීම ද අප විසින් කළයුතු

වෙයි. නූතන තාක්ෂණයේ දියුණුවෙන් වේගයෙන් ඉදිරියට එන කුඩා ප්‍රමාණයේ න්‍යෂ්ටික බලාගාර නිර්මාණය කිරීමත් ඒවා ජාතික බලශක්ති පද්ධතියට එක්කර ගැනීමත් අපට කරගැනීමට සිදු වෙයි. මේ සියල්ලෙහි පසුබිම අවබෝධ කර ගෙන අපේ ප්‍රතිපත්ති දෙස අප අවධානය යොමු කරමු.

නව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ලෙස සැලකෙන්නේ වසර 2019 අගෝස්තු 08 වන දින අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් නිකුත්කළ ප්‍රතිපත්ති මාලාවයි. අනාගතයට ගැළපෙන ලෙස යාවත්කාලීන කොට නිකුත් කරනු ලැබූ මෙම ප්‍රතිපත්ති මාලාව වඩාත් හොඳ දැක්මක් සහිත දීර්ඝකාලීන ප්‍රතිපත්තියක් ලෙස පිළිගැණුනත් පසුකාලීනව පැන නැගුණු බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධ ආර්ථික පරිපාලනයන් නිසා ඒ තුළ දුර්වලතා ඇති බව පෙනෙන්නට තිබුණේ ය. කෙසේ වෙතත් ගෝලීය ආර්ථිකයේ ඇතිවන වෙනස්කම් සහ කම්පන, බලශක්ති ක්ෂේත්‍රය තුළ ඇතිවන ඉහත කී ගෝලීය පරිවර්තන, විද්‍යාවේ, තාක්ෂණයේ සහ වෙළඳපොලේ දියුණුව ආදී කරුණු හේතු කොටගෙන යම් ජාතික ප්‍රතිපත්තියක් කලින් කලට යාවත්කාලීන කිරීම අත්‍යාවශ්‍ය වෙයි. එනයින්, වරක් නිර්මාණය කළ ජාතික ප්‍රතිපත්තියක් සදාකාලික නොවන අතර, එම ප්‍රතිපත්තීන් තුළ ක්ෂේත්‍රයට පරිණාමය වීමට අවකාශ සලසා තිබිය යුතුය. ජාතික ප්‍රතිපත්තියක් යනු සෘජු ගලේ කෙටූ ලියවිල්ලක් බඳු සදාතනික දෙයක් නොවන්නා සේ ම, හිතූ හිතූ හැටියේ වෙනස් කිරීමට ද නොහැකි, විද්‍යාත්මක ලියවිල්ලක් විය යුතුය.

2019 ජනාධිපතිවරණයේ දී අපේක්ෂකයන් ඉදිරිපත් කළ බලශක්ති විසඳුම් සලකා බලා ජනතාව විසින් ඡන්දය ලබා දුන්නත්, ජනතාවගේ ඡන්දයෙන් තීරණය කළ හැකි කරුණක් ලෙස බලශක්තිය සැළකීම කළ නොහැකි ය. ජනතාව පොදුවේ අපේක්ෂකයෙකු අනුමත කළත්, එම අපේක්ෂකයාගේ බලශක්ති ප්‍රතිපත්තිය රටේ බලශක්ති ප්‍රතිපත්තිය ලෙස පිළිගැනීමක් ඉන් නොකියැවේ. එසේම, මැතිවරණ ප්‍රකාශන සකස් කෙරෙනුයේ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනවා මෙන් බහුවිධ විශේෂඥ කණ්ඩායම් මගින් නොව ඉතා සීමිත අධ්‍යයනයකින් පසුව බැවින්, ජාතික ප්‍රතිපත්තියක් හා මැතිවරණ ප්‍රකාශනයක් පටලවා ගැනීම සිදු නොකළ යුතුය.

විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ එක් දුර්වලතාවයක් යම්, කෙටි කලෙකින් ඡන්දයෙන් පාලන බලයේ සිටිනා ආණ්ඩුව වෙනස් වන විට බලයට පත්වන පිරිසට අවශ්‍ය පරිදි රටේ ජාතික ප්‍රතිපත්තිය ද වෙනස් කිරීමට

යෑමයි. එහෙත්, යම් ජාතික ප්‍රතිපත්තියකින් බලාපොරොත්තුවන කාර්යභාරය ඉටු වන්නේ එය ආණ්ඩුවක් මාරුවන ගාණේ වෙනස් කිරීමට නොහැකි පොදු ක්‍රමවේදයක් තුළ ක්‍රියාවට නැංවීම තුළිනි. එසේම, බලශක්තිය වැනි විශේෂඥ දැනුම සහිත ක්ෂේත්‍රයක් වැදගත් තීරණ සාමාන්‍ය පුරවැසියන් හට ගැනීමට නොහැකිය. ඔවුන් මැතිවරණ ප්‍රකාශයකට ඡන්දය දුන් පළියට, එය බහුතර කැමැත්තෙන් රටේ බලශක්ති ප්‍රතිපත්තිය බවට පත් නොවන අතර මැතිවරණ ප්‍රකාශයක් තුළින් ජනතාව අපේක්ෂකයාගේ දැක්මත්, අනාගතයේ දී බලශක්ති ක්ෂේත්‍රයේ උන්නතියට ඔහුට ඇති කළ හැකි සාධනීය බලපෑමත් පිළිබඳව සෑහීමකට පත් වීමක් පමණක් අදහස් කෙරේ. එනයින්, මැතිවරණ ප්‍රකාශන හෙවත් දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශනයක ජාතික ප්‍රතිපත්තියක් අඩංගු නොවන අතර, පවතින ජාතික ප්‍රතිපත්තිය අධ්‍යයනය කොට එය තවත් දියුණු කිරීමට සිදුකළ යුතු වෙනස්කම් හා යෝජනා පිළිබඳව සාකච්ඡාවක් ඇතිකර ඒ සඳහා මතවාදී වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරීම කළ හැකිය.

ජාතික හරිත පෙරමුණ ලෙස අප මේ උත්සාහ කරන්නේ එම ජාතික ප්‍රතිපත්තිය අමුතුවෙන් ලිවීමට නොව, එය ක්‍රියාත්මක කරන ගමන්, එය නූතන ලෝකයට හා රටේ සුරක්ෂිත අනාගතයට, අවශ්‍යතාවයට ගැළපෙන පරිදි දියුණුකර ගැනීමට අපගේ දැක්ම පරිදි යාවත්කාලීන කර ගැනීමට පදනම දමා ගැනීමයි. එනයින්, රටේ පවතින ජාතික බලශක්ති ප්‍රතිපත්තිය කාලීනව වෙනස් වියයුතු බව අපි විශ්වාස කරන්නෙමු. එසේ ම, අප විසින් ආර්ථිකයේ ඇති කරන වෙනස්කම් මෙන් ම සංවර්ධන ඉලක්ක වෙත යෑමට බලශක්ති ක්ෂේත්‍රය සමාන්තරව ගොඩනගා ගැනීමට අපගේ දැක්ම මෙම මැතිවරණ ප්‍රකාශනය තුළින් ඉදිරිපත් කරන්නෙමු. ඒ දැක්ම අනුව සුදුසු මොහොතේ දී, රටේ පවතින බලශක්ති සැපයුමට කිසිදු බලපෑමක් නොවී, දැනට පවතින වෙළඳපොල ගිවිසුම් හා සංවර්ධන කටයුතු හානි නොවී, බලශක්ති සේවා ප්‍රතිසංස්කරණ කටයුතු කර ගැනීමට අප බලාපොරොත්තු වන්නෙමු.

බලශක්ති ක්ෂේත්‍රය

බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්ෂේත්‍ර තුනකට වෙන් කර දැක්විය හැකිය.

1. ප්‍රවාහනයට අවශ්‍ය ඉන්ධන
2. ගෘහස්ථ සහ කර්මාන්ත සඳහා දහනයට අවශ්‍ය ඉන්ධන
3. විදුලි බල සැපයුම.

ප්‍රවාහනයට බලශක්තිය

ගෝලීය බලශක්ති පෙරළියත් සමග වේගයෙන් වෙනස් වන ප්‍රධාන ම ක්ෂේත්‍රය ප්‍රවාහනය බව අමුතුවෙන් කිවයුතු නොවේ. ගොඩබිම් ප්‍රවාහනයේ දැනටමත් විද්‍යුත්කරණය විශාල දුරක් ගෙවා ගොස් තිබෙන අතර, ජල ප්‍රවාහනය මෙන්ම ගුවන් ප්‍රවාහනයේ ද පර්යේෂණ මේ වන විට සාර්ථක වෙමින් පවතී.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව මෙම පරිවර්තනය සිය අභ්‍යන්තරය තුළ සිදුකර ගැනීමට ප්‍රමාණවත්ව උත්සුක නොවුණේ ය. එහි ප්‍රතිඵලය නම් ශ්‍රී ලංකාවේ ගොඩබිම් ප්‍රවාහනය තවමත් පොසිල ඉන්ධන මත ම රඳා පැවතීම ය.

ප්‍රවාහනයට අවශ්‍ය බලශක්ති ප්‍රතිපත්තියක් සැකසීමේ දී අපට අවධානය යොමු කිරීමට කරුණු දෙකක් තිබේ. එකක් නම් ප්‍රවාහනයට අවශ්‍ය පොසිල ඉන්ධන වඩාත් කාර්යක්ෂම වෙළඳපොල ක්‍රමයක් තුළ ගුණාත්මකභාවයෙන් අඩුපාඩුවක් නොමැතිව සැපයිය හැකි ක්‍රමවේදයන් සැකසීමයි. අනෙක නම්, ක්‍රමයෙන් සිදුවන ප්‍රවාහනයේ විද්‍යුත් පරිවර්තනය ක්‍රමිකව දේශීය වෙළඳපොලට එක්කරගෙන එයට අනුවර්තනය වෙමින් අවශ්‍ය කරන නීති රෙගුලාසි සම්පාදනය සහ යටිතල පහසුකම් නිර්මාණය යි.

ප්‍රවාහනයට අවශ්‍ය පොසිල ඉන්ධන සැපයුම.

ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය මෙතෙක් පැවතියේ රාජ්‍ය විසින් පාලනය කරන ඒකාධිකාරයක් යටතේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව භාරයේය. එයට අමතරව ඉන්දියානු තෙල් සමාගම විසින් වෙළඳපොල භාගයෙන් 20% ක් උරුම කරගෙන සිටියේ ය. ඉන්ධනවල මිල තීරණය කෙරුණේ දේශපාලන බල අධිකාරියේ වුවමනාවට මිසක වෙළඳපොල සාධක මත නොවේ. ඉන්ධන ඔස්සේ විශාල සහනාධාරයක් ජනතාවට ලබාදුන් අතර

රාජ්‍ය අංශයේ අනෙකුත් සේවා සපයන්නන් විසින් මුදල් නොගෙවා ඉන්ධන ලබා ගැනීමත් කරුණුකොට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අධික පාඩු ලබන තත්ත්වයට පත්කර තිබිණ. මෙහි තත්ත්වය බොහෝ විට දැන් ජනතාවට පැහැදිළි වී ඇති බැවින් ප්‍රශ්නය විශ්ලේෂණය කිරීමට වැඩිපුර කාලයක් මිඩංගු නොකොට අප විසඳුම් සාකච්ඡා කරමු.

- රජය විසින් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන නිෂ්පාදන මිල ආවරණය වන මිල ක්‍රමයක් අප ක්‍රියාත්මක කරන්නෙමු.

- ඉන්ධන මගින් ජනතාවට සහනාධාර ලබා දීම නතර කෙරේ.

- ඛනිජ තෙල් වෙළඳපොල නව ආයෝජකයන් හට විවෘත කෙරේ. එනම් නව සමාගම්හට ශ්‍රී ලංකාව තුළ තෙල් ආනයනය කිරීම, ගබඩා කිරීම සහ අලෙවි කිරීමට අවස්ථාව ඇති කෙරේ.

- වර්තමාන රජය විසින් නව සමාගම් 3 ක් හට වෙළඳපොල විවෘත කිරීමට අප එකඟවන අතර, එමගින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වෙළඳපොල ඒකාධිකාරය අහෝසිකර ගැනීමට බලාපොරොත්තු වේ.

- ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, සංස්ථා මොඩලයෙන් ඉවත් කොට පොදු සමාගම් මොඩලයකට පරිවර්තනය කෙරේ.

- එම සමාගම රජය සතුව පවත්වා ගන්නා අතර, එය රාජ්‍ය භාණ්ඩාගාර මව් සමාගම යටතට පත් කෙරේ.

- එම පොදු සමාගම සතු ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් වෙළඳපොල භාගය 40% ක පවත්වා ගැනීමට කටයුතු කෙරේ.

- එම පොදු සමාගමේ සුදුසු කොටස් ප්‍රමාණයක් දේශීය ආයෝජකයන් වෙනුවෙන් කොටස් වෙළඳපොලට නිකුත් කෙරේ. එමගින් ජනතාවට වඩාත් හොඳ ආයෝජන අවස්ථා ඇති කිරීමට කටයුතු කෙරේ.

- ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් හට අලුතින් බිහිවන ඛනිජ තෙල් සමාගම් සහ පිරිපහදුවල රැකියා අවස්ථා ඇති කරන අතර, ඒවා තෝරා ගැනීමේ නිදහස ඔවුන්ට ලබා දෙනු ලැබේ.

- මෙලෙස සමාගම් 5 ක් මගින් ඛනිජ තෙල් සැපයුම පවත්වා ගන්නා අතර, එමගින් වෙළඳපොල තරඟකාරීත්වය ඇති කිරීමට බලාපොරොත්තු වේ.

- අනතුරුව අනාගතයේ දී ආර්ථිකය සාමාන්‍ය අතට පත්වී ආදායම් දියුණු වූ පසුව මිල නියාමනය වෙළඳපොලට ලබා දෙයි. රජය වෙළඳපොල තුළ තරඟකාරීව රැඳී සිටීම මත එහි අධික මිල වැඩිවීම ඇති නොවීමට තරඟකාරීව කටයුතු කෙරේ.

- මෙම නව තෙල් සමාගම්වල වෙළඳපොල විශ්ලේෂණය ආර්ථික ප්‍රතිපත්තියේ දී විස්තර කළ වෙළඳපොල නියාමන අධිකාරියට පැවරේ. එසේ ම භූ දේශපාලනික ප්‍රතිවිරුද්ධ සැපයුම්කරුවන් පවත්වා ගෙන යෑම උපක්‍රමශීලීව සිදුකරන අතර මේ සමාගම් එකිනෙක එක්කොට විශාලකර වෙළඳපොල ලොකු භාගයක් උරුම කර ගැනීම ආදිය නිරීක්ෂණය කරනු ලබන අතර ප්‍රතිඒකාධිකාරී පනත ක්‍රියාත්මක කිරීම තුළින් නව ඒකාධිකාරයන් බිහිවීම වළක්වා ගැනේ.

- මෙලෙස නව ආයෝජන බලශක්ති වෙළඳපොලට ගෙන්වා ගැනීම තුළින්, එම ක්ෂේත්‍රය තුළ වෙළඳපොල අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීමේ ඇති හැකියාව දියුණු කෙරේ.

- ගෝලීයව පිළිගත් තෙල් සමාගම් විසින් දේශීය ඉන්ධන සැපයුම පවත්වාගෙන යෑම තුළින් වෙළඳපොල තුළ සමස්ත විශ්වාසනීයත්වය ඉහළ දමා ගැනෙන අතර, එමගින් රටේ අනෙකුත් කර්මාන්ත සඳහා ආයෝජකයන් දිරිමත් කෙරේ.

- නුදුරු අනාගතයේ දී පරිවර්තනයවන බලශක්ති වෙළඳපොල පුද්ගලික අංශය මගින් පවත්වා ගැනීම මත එම නූතන පරිවර්තනයන් සිදු කර ගැනීම, නව තාක්ෂණය ගෙන්වා ගැනීම, එවාට අවශ්‍ය ආයෝජන ලබා ගැනීම සහ ඒවායේ අවධානම දරා ගැනීම එම පුද්ගලික සමාගම් වෙත ම පැවරෙන අතර, එය රජය විසින් දැරිය යුතු නොවේ.

- රජය සතු ඛනිජ තෙල් සමාගම් ද මේ නව පුද්ගලික සමාගම් සමග කරට කර තරඟකොට වෙළඳපොල තුළ රැඳී සිටිය යුතු අතර ඒ සඳහා ස්වාධීනත්වය ඇති කළමනාකරණයක් පත් කිරීම දේශපාලන පාක්ෂිකත්වයෙන් බැහැරව සිදු කෙරේ. මෙම නව

සමාගමේ වගකීම පැවරෙනුයේ රාජ්‍ය භාණ්ඩාගාර මඩි සමාගමට වන අතර එම සමාගම දේශපාලන බලපෑම්වලින් නිදහස් ආයතනයක් බැවින්, දේශපාලන පත්වීම් සහ ඇමතිවරයාගේ මැදිහත්වීමෙන් නිදහස් වෙයි.

- බනිජ තෙල් හා ඉන්ධන සඳහා නියාමන අධිකාරියක් පිහිටුවීමට කටයුතු කෙරේ. බනිජ තෙල් වෙළඳපොල නියාමනය කිරීමත්, අධීක්ෂණය කිරීමත්, තත්ත්ව පරීක්ෂාවත්, ගුණාත්මකභාවය පවත්වා ගැනීමත්, මෙම නව බලශක්ති අධිකාරියට පැවරේ.

- නැව් සහ ගුවන් යානා සඳහා ද අවශ්‍ය අනෙකුත් ඉන්ධන වර්ග සැපයීම මේ ආකාරයට ම ක්‍රියාත්මක වන අතර, මේ නව සමාගම් සඳහා එම වෙළඳපොල ද විවෘත වේ.

ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ විද්‍යුත් වාහන පරිවර්තනයට සූදානම් වීම.

- ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් වාහන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉක්මනින් ඇති කිරීමට වහා ම පියවර ගැනේ.

- රජයේ ප්‍රවාහන ප්‍රතිපත්තිය සහ දේශගුණික විපර්යාස සම්මුතීන්ට අනුකූලව තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට වාර්ෂිකව වෙනස් කළ යුතු වාහන ප්‍රමාණය ගණනය කොට නිවැරැදි ඉලක්ක හඳුනා ගන්නා අතර, එම ඉලක්ක කාලානුරූපීව සපුරා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කෙරේ.

- එම යටිතල පහසුකම් නිර්මාණය කිරීම පිණිස පුද්ගලික අංශයෙන් ආයෝජන කැඳවෙන අතර, එහිදී ද තරඟකාරීවයක් පවත්වා ගැනීම සඳහා සමාගම් කීපයකට අවස්ථාව විවෘත කෙරේ.

- එසේ ම, ගෘහස්ථ සූර්ය පැනල භාවිතයෙන් වාහන ආරෝපණය කරගැනීමට තාක්ෂණික මෙවලම් සවිකර ගැනීම දිරිමත් කෙරෙන අතර ඒවා සඳහා බදු සහන ලබා දීම සහ රාජ්‍ය පහසුකම් සකස් කර දීමට විශේෂ වැඩපිළිවෙලක් සකස් කෙරේ.
- සූර්ය බලය උකහා ගැනීම සම්බන්ධයෙන් එම කර්මාන්තයේ නියුතු දේශීය සමාගම් ප්‍රවර්ධනය කරනු ලබන අතර, ඒවාට ප්‍රමුඛතාව ලැබෙන ප්‍රතිපත්තියක් මෙහි දී ක්‍රියාත්මක කරනු ලැබේ.

- එසේම එම වාහනවල බැටරි ආදිය භාවිතයෙන් අනතුරුව නියමිත ආකාරයට බැහැර කරනවාදැයි සොයා බැලෙන අතර, ඒවා නියාමනය කිරීමට නව නීතිරීති මේ යුගය තුළ නිර්මාණය කළ යුතු ය.

ගෘහස්ථ සහ කර්මාන්ත සඳහා දහන අවශ්‍යතාවයක් සඳහා බලශක්තිය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කොටන දහන අවශ්‍යතාවයන් සඳහා යොදා ගන්නා බලශක්ති ප්‍රභේදය නම් දරයි. මීට අමතරව යම් ප්‍රමාණයක් LP ගෑස් යොදාගනු ලැබේ. එහෙත්, ශ්‍රී ලංකාව අප බලාපොරොත්තුවන වේගවත් සංවර්ධනය වෙත රැගෙන යෑමේදී මීට වඩා බොහෝ වෙනස් ආකාරයෙන් ගෘහස්ථ දහනය සහ කර්මාන්ත දහනය සඳහා ඉන්ධන සැපයීම සිදු කළ යුතු වෙයි. එම සංවර්ධනයත් සමගම මිනිසුන් නාගරික ජීවන රටාවකට හුරු වීමත්, තට්ටු නිවාස සංකීර්ණවලින් සමන්විත ජනාවාස ප්‍රදේශවල ජීවත් වීමටත් යොමු වෙයි. හරිත නගර සංකල්ප අනුව හැඩ ගැන්වෙන නගර තුළ හරිතකරණ සංකල්ප හමුවේ ක්‍රියාත්මකවන රාජ්‍ය පරිපාලනයකදී ගෘහස්ථ අවශ්‍යතාවය සඳහා බලශක්තිය සැපයීමද ජාතික වැඩපිළිවෙළක් අනුව නිර්මාණය විය යුතුය. එම වැඩපිළිවෙළ මෙසේ ඔබට ගෙන හැර දැක්විය හැකිය.

- දැනට ගෑස් සපයන ලිට්රෝ සමාගම පුද්ගලික අංශයට නිකුත් කෙරේ.

- පුද්ගලික අංශයට තවත් ගෑස් සැපයීම සඳහා සමාගම් ගෙන්වා ගැනීමට ආයෝජන කැඳවනු ලැබේ.

- එම සමාගම් ද ඉහත ඛනිජ තෙල් සමාගම් නියාමනය කරන අයුරින් ම වෙළඳපොල නියාමන අධිකාරිය මගින් නිරීක්ෂණය සහ විශ්ලේෂණය කෙරේ. එසේ ම, එම අධිකාරිය මගින් ම ප්‍රතිඒකාධිකාරී පනත තුළින් මේ ක්ෂේත්‍රය තුළ ඒකාධිකාරයන් ඇති වීම වළක්වා ගැනේ.

- එසේම, ඉහත පරිදිම ඛනිජ තෙල් හා පොසිල ඉන්ධන නියාමන අධිකාරිය මගින් මෙම ගෑස් සමාගම්වල නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමත්, නියාමනයට ලක් කිරීමත් කෙරේ.

- රට තුළ LNG සැපයුමක් නිර්මාණය කිරීම සඳහා PPP යටතේ ආයෝජන කැඳවනු ලැබේ. එම LNG සඳහා වෙනම පර්යන්තයක්, ගබඩා පහසුකම් සහ නාල පද්ධතියක් අන්තර්ගත වේ.

- එම ප්‍රධාන පර්යන්තයේ සිට කොළඹ නගරය ආවරණය වන පරිදි නල මඟින් LNG සැපයිය හැකි ජාල පද්ධතියක් නිර්මාණය කෙරේ.

- අනතුරුව නව ගොඩනැගිලි, තට්ටු නිවාස සංකීර්ණ ආදී සියල්ලට ම නල මඟින් LNG සැපයුමක් ලබා ගැනීමේ යාන්ත්‍රණය සකස් කෙරේ.

- හරිත නගර සංකල්ප යටතේ, නව ජනාවාස ප්‍රදේශවල නිර්මාණය වන සියලුම නිවාස සංකීර්ණවලට නල පද්ධතියක් අඩංගු කරන අතර, LNG සැපයුම ඒ ඔස්සේ නිවෙස්වලට ලබා දෙනු ලැබේ.

- ආර්ථික ප්‍රතිපත්තිය තුළින් විස්තර කරන ලද නිදහස් වෙළෙඳ කළාප මෙන්ම, කාර්මික නගරවල LNG ගබඩා පහසුකම් නිර්මාණය කරන අතර, ඒවා ඒම වරායන්වල සිට නල පද්ධතියක් මඟින් එකිනෙකට සම්බන්ධ කෙරේ. එමඟින් කර්මාන්ත සඳහා දහනයට අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමට විශ්වාසනීය සැපයුමක් ලබා දෙනු ලැබේ.

විදුලි බල සැපයුම

ශ්‍රී ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රය යනු සුවිශේෂී ලක්ෂණ රැසකින් සමන්විත බලශක්ති ක්ෂේත්‍රයකි. එම ලක්ෂණ අපට පහත පරිදි පැහැදිළි කරගත හැකිය.

- රටේ අනෙකුත් වැදගත් ක්ෂේත්‍රයන් රැසක් වාගේ ම විදුලි බල ක්ෂේත්‍රය ද රාජ්‍ය මූලික වෙයි. පැරණි ලෝකයේ සමාජවාදී ආකල්පවලින් හැඩ ගැන්වුණු රාජ්‍ය පරිපාලන මූලධර්ම මත පිහිටුවමින් නිර්මාණය වුණ ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ වැදගත්

ම කාර්යභාරයක් ඉටු කරන බලශක්ති ක්ෂේත්‍රය ද එම රාජ්‍ය මූලික මූලධර්ම පෙරදැරි කරගෙන නිර්මාණය වී තිබේ.

- ශ්‍රී ලංකාව මේ වනවිට සම්පූර්ණයෙන් ම විදුලි බල පද්ධතිය මගින් ආවරණය වෙයි. එනම්, සියලුම පුරවැසියන් හට බලශක්තිය යනු මූලික අයිතිවාසිකම් සේ සලකා රාජ්‍යයේ වියදමෙන් නිර්මාණය කළ විදුලි පද්ධතිය රටේ සෑම අස්සක් මුල්ලක් නෑරම විහිදී ගොස් තිබේ. එය ලාභ ලැබීමේ අරමුණ මූලික කර ගෙන නොව මහජන පොදු සේවාවක් සැපයීමේ අරමුණ මුල්කොට ගෙන, රජයේ වියදමෙන් ජනතාවට ලබා දී ඇති සේවාවකි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන සංකල්පය තුළ විදුලි බලය යනු වෙළඳ භාණ්ඩයකට වඩා, ජනතා සේවයක් සේ සලකා කටයුතු කර තිබේ.

- එසේම, වඩාත් අඩු ආදායම්ලාභී පවුල් වෙත අඩු සහන මිලකට විදුලිය සැපයීම අරමුණු කරගෙන, පොදු සහනාධාර ක්‍රමයකට විදුලි බිල තීරණය කොට තිබේ. අඩු ආදායම්ලාභීන් අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන්නේ යැයි සලකා, අඩු විදුලි පරිභෝජනය කරන පාරිභෝගිකයන් හට ඉතා අඩු මිලකට විදුලිය ලැබෙන සේ විදුලි මිලකට, සහනාධාර මිල ක්‍රමයක් පවත්වා ගෙන ගොස් තිබේ. මේ ක්‍රමය මගින් සහනාධාර අත්‍යාවශ්‍ය පුරවැසියන් හඳුනා ගැනීමක් හෝ ඉලක්කගත කිරීමක් සිදුනොවන අතර, සියලුම පුරවැසියන් හට සිය පරිභෝජනයේ ප්‍රමාණය මත සහනාධාර ලැබී තිබේ.

- ශ්‍රී ලංකාව සතු ස්වාභාවික සම්පත්වන මධ්‍යම කඳුකරයත් ගලා යන ගංගා ජාලයත් උපයෝගීකර ගනිමින් ජල විදුලි බලාගාර රාශියක් නිර්මාණය වී තිබේ. ඒවා වර්තමානය වනවිට සිදුවන බලශක්ති පරිවර්තනයේ දී අප සතු ප්‍රධාන ස්වාභාවික බලශක්තියක්වන අතර, අනාගතයට ද නොනැසී පැවතීමේ තිරසාර හැකියාව මේවා සතුව තිබේ. කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ද රාශියක් මගින් සැලකිය යුතු ප්‍රමාණයක් බල ශක්තිය ජාතික අවශ්‍යතාවයට එක් කරනු ලැබේ. අපේ රටේ ජල විදුලිය උකහා ගැනීමේ ධාරිතාව සංතෘප්ත වී ඇතැයි සැලකිය හැකිය. තව දුරටත් ජල විදුලි ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් බලාපොරොත්තු විය නොහැකි අතර, එසේ කිරීමෙන් විශාල පාරිසරික අර්බුද පවා ඇතිවීමේ අවදානමක් පවතී. එනයින්, ජල විදුලි ක්ෂේත්‍රය යනු තව දුරටත් විදුලි නිෂ්පාදන වැඩි කිරීමට පුළුල් කළයුතු ක්ෂේත්‍රයක් ලෙස අපි නොසැලකිය යුතුය.

- සාපේක්ෂව කාර්මීකරණය නොවූ රටක් ලෙස ශ්‍රී ලංකාවේ දෛනික විදුලි අවශ්‍යතාවයේ උපරිමය ඇති වන්නේ හවස 6 ත් රාත්‍රී 10 ත් අතර ය. එනම්, විදුලි පරිභෝජනය උපරිමය ඇති වන්නේ ගෘහස්ථ පරිභෝජනය මගින්වන අතර, දිවා කාලයේ කර්මාන්ත මගින් එතරම් විදුලි පරිභෝජනයක් සිදු නොකරනු ලබයි. මේ ආර්ථිකයේ වත්මන් රටාව වන අතර, අප බලාපොරොත්තු වන ආර්ථික පරිවර්තනය ඇති කර ගැනීම තුළ මේ උපරිම අවශ්‍යතාවය පැමිණෙන රටාවන් වෙනස් වී යා හැකිය. විශේෂයෙන් සූර්ය පැනල දැනටමත් භාවිතාවන බැවින් මෙම උපරිම ඉල්ලුම දිවා කාලයට ගමන් කළත් නොපෙනී යා හැකි බැවින් එම රටාද අනාගතයේදී සැළකිල්ලට බඳුන් කළ යුතු වෙයි.

- ශ්‍රී ලංකාව සතුව ඇති අනෙකුත් ප්‍රධාන ම බලශක්තිය ජනනය කළ හැකි ස්වාභාවික සම්පත් නම් සුළං බලය සහ සූර්ය බලයයි. තවමත් ප්‍රමාණවත් ලෙස උකහා ගැනීමට අපොහොසත් බලශක්ති සම්පතක් ලෙස යහමින් ඇති මෙම සම්පත් දැක්විය හැකි ය. විශේෂයෙන් නූතන බලශක්ති පරිවර්තනයට අනුගත වීමටත් තිරසාර බලශක්ති ප්‍රභේද වෙත මාරු වීමේ ගෝලීය අවශ්‍යතාවය සැලකීමේදීත් අප සතුව තවමත් උකහා නොගත් මේ සම්පත පැවැතීම වාසනාවකි. අපට ඇත්තේ අවශ්‍ය බලාගාර ඉදිකර ගනිමින්, එම ශක්තීන් විද්‍යුත් ශක්තීන් බවට පරිවර්තනය කරගැනීම පමණකි. ඒවා පුනර්ජනනීය වන අතර බලශක්ති ක්ෂේත්‍රයේ වත්මන් පුනරුදය පුනර්ජනනීය බලශක්ති ප්‍රභේද ඔස්සේ වැටී තිබේ.

- රාජ්‍ය මූල්‍ය ආර්ථිකයක් තුල එහි සිරවීම නම් රාජ්‍ය අංශය සතු අකාර්යක්ෂමතාවය සහ වංචා දූෂණ සඳහා වන නැඹුරුව මෙන්ම දේශපාලන අතපෙවීම් තුළින් පැන නගින අක්‍රමිකතා සියල්ලෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය ද වෙලා ගෙන ඇති බවයි. රාජ්‍ය අංශය සතු පොදු උපන්ගෙයි දෝශවන මේවා විදුලි බල ක්ෂේත්‍රය තුළ ද එකසේ ප්‍රචලිත ය. නිසි කළමනාකරණයක් නොමැතිකම, වෘත්තීය සමිතිවල අනිසි ක්‍රියාකාරිත්වය හා බලපෑම, සුදුස්සන් හට ඉහළට යෑමට නොහැකි දෘඩ පරිපාලන ව්‍යුහය, දේශපාලන ව්‍යාපාර මගින් නුසුදුස්සන් රැකියාවේ යෙදවීම, අධික සේවක බර, තොග මිලදී ගැනීම් හා ටෙන්ඩර් ක්‍රියාවලිවලදී සිදුවන දූෂණ හා දූර්වල පාරිභෝගික සේවා ආදිය මේ ක්ෂේත්‍රය තුළ ඇති දරුණු

සුව නොවන තුවාලයි. මේවා සමාජයට සිදු කරන අලාභය සහ හානිය සුළුපටු නොවේ. රටේ ආර්ථිකයේ මූලිකව සැපයුමක් වන බලශක්ති ක්ෂේත්‍රය අකාර්යක්ෂම රාජ්‍ය අංශය සතුව සිරකර ගනිමින් දේශපාලකයන්, නිලධාරීන් සහ සේවකයන් ඒවායින් අනිසි ප්‍රතිලාභ ලබමින් කරගෙන යනු ලබන අවිධිමත් සේවයට වන්දිය ගෙවීමට සිදුව ඇත්තේ මහා භාණ්ඩාගාරයට එකතු වන බදු මුදලින් වීම ශෝක ජනක ය.

- ලෝකයේ ප්‍රධාන බලශක්ති සැපයුමක් වන න්‍යෂ්ටික බලය වෙත තවමත් ශ්‍රී ලංකාවේ අවධානය යොමු වී නොමැත. තවමත් පැරණි අණුපනත් මගින් නියාමනය වන පරමාණුක බලශක්ති ක්ෂේත්‍රය නූතන ලෝකයේ තාක්ෂණික දියුණුව සමග යාවත්කාලීන වී නොමැත. කෙතරම් කුඩා රාජ්‍යයක් වූවත් අපට න්‍යෂ්ටික බලය පිළිබඳව අමතක කොට බලශක්ති ක්ෂේත්‍රය ගැන සැලසුම් සකස් කළ නොහැකිය. විශේෂයෙන් අපිට නුදුරේ ඉන්දියාවේ ද විශාල න්‍යෂ්ටික බලාගාරයක් මේ වන විටත් ක්‍රියාත්මක වේ. එනයින්, අප රට ද න්‍යෂ්ටික බලාගාර නිර්මාණය පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය බව අප විශ්වාස කරන්නෙමු.

- ශ්‍රී ලංකාව සමීපයේ කාර්මීකරණය වූ ලෝක බලවතෙකු සිටී. අප අයත් වන කළාපයේ අනෙකුත් සහෝදර රාජ්‍යයන් සමග ද බැඳි පවතින එම බලවතාගේ බලශක්ති අවශ්‍යතාවය ඉතා අධික ය. ගෝලීයකරණයේ මූලික ලක්ෂණයක් නම් රාජ්‍යයන් මුලින් ප්‍රාදේශීයකරණයකට ලක් වීමය. එනම්, ගෝලීය ආර්ථික කළාප ලෙස සාමූහික වීම ය. එනයින්, සන්නිවේදනයෙන්, ප්‍රවාහනයෙන්, හා තාක්ෂණයෙන් පමණක් නොව බලශක්තියෙන් ද සම්බන්ධ වීම කළාපය තුළ ආර්ථිකයක එකිනෙකට ශක්තිමත් කිරීමට හේතු වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. එසේ නම්, අප ඉදිරියට වඩාත් විවෘතව මේ සඳහා සූදානම් විය යුතු අතර, ඒ ගැන සාකච්ඡාවක් විශේෂඥ මට්ටමෙන් ඇති කරගැනීම සිදු විය යුතු ය.

විදුලි බල ක්ෂේත්‍රයේ ගොඩනැගීම.

මූලධර්මවල වෙනස් කමක්

- අපගේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ පැහැදිළි කරන්නේ ශ්‍රී ලංකාව රාජ්‍ය මූලික ආර්ථිකයක සිට පුරවැසියා මූලික වෙළඳපොල

ආර්ථිකයක් දක්වා වෙනස් කරන බවයි. එනම්, සමාජවාදී ආර්ථික සංකල්ප වලින් මිදී රජය විසින් කර්මාන්තවල නියැළීම සිදු කරනුයේ අත්‍යාවශ්‍ය විටක දි පමණක් බවත්, කර්මාන්ත කිරීම පුද්ගලික අංශයට ලබා දී රජය විසින් අවශ්‍ය නියාමනය සිදු කරන බවත් ඔබට පැහැදිළි කළෙමු.

ලෝකය මේ වන විට බලශක්තිය සේවාව සම්පූර්ණයෙන් ම පාහේ වෙළඳපොලට බාර දී තිබේ. බලශක්තිය යනු තව දුරටත් රටක ආරක්ෂාවට අභියෝගයක් එල්ල කළ හැකි ක්ෂේත්‍රයක් නොවේ. එයට හේතුව නම් සෑම රටකම පාහේ සිය බලශක්ති සැපයුම ප්‍රභේද ගණනාවකින් සකස් වී තිබීමත්, ඒවායින් විශාල ප්‍රමාණයක් දේශීයව සපයා ගැනීමත්, සැපයුම්කරුවන් විශාල ගණනකින් සමන්විත පද්ධතියක් සකස්කර ගැනීම තුළ එක් සැපයුම්කරුවෙකුට පාලනය කළ නොහැකි විවිධත්වයෙන් හා තරඟකාරීත්වයෙන් යුතු වෙළඳපොලක් නිර්මාණය කර ගැනීමට හැකි වීමත් නිසා ය. ගෝලීය බලශක්ති වෙළඳපොල ද විශාල වශයෙන් පුද්ගලික අංශය ඔස්සේ ක්‍රියාත්මක වන අතර, ඒවායේ සැපයුම්කරුවන් බහුල ය. මේ හේතුව නිසා යම් රටකට ස්වෛරීත්වයට හානි කිරීමට තරම් බලශක්ති ක්ෂේත්‍රයේ කොටසක් තනි බලයක් යටතට පත් කර ගැනීම උගහට ය.

එසේම, ප්‍රතිඒකාධිකාරී පනත් සහ වෙළඳපොල නියාමන අධිකාරියක් මගින්, නිරන්තරයෙන් අධීක්ෂණයට ලක්කර එවන් බාහිර බල අධිකාරීන් නිර්මාණය වීම වළක්වා ගැනීමට පියවර ගත හැකිය. රාජ්‍ය පරිපාලනය කාර්යක්ෂම නම්, නීතියේ පරමාධිපත්‍ය ශක්තිමත් නම්, රාජ්‍ය ප්‍රභල වීම මත වෙළඳපොල පාලනය කර ගැනීමේ හැකියාව රජයට ලැබේ. එනම්, නූතන ලෝකය තුළ ශක්තිමත් රාජ්‍යයක් බලශක්ති ක්ෂේත්‍රය උපයෝගී කරගනිමින් ස්වෛරීත්වයට බලපෑම් කිරීමට හැකියාවක් නොමැත.

මේ හැකියාව නිසා ම නූතන ලෝකය තුළ පසුගිය දශකය තුළ බලශක්ති ක්ෂේත්‍රය වෙළඳපොල ආර්ථික ක්‍රමයකට ක්‍රමයෙන් පරිවර්තනය වූයේ ය. මෙම ගෝලීය තත්ත්වය නිවැරැදිව කළමනාකරණය කරගත් කාර්යක්ෂම රාජ්‍යයන් බලශක්ති වෙළඳපොල නිදහස් කර පුද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ නංවා ගත් අතර ඒමගින් වඩාත් විශ්වාසනීය බලශක්ති ක්ෂේත්‍රයක් එම රටවල නිර්මාණය කර ගත්තේ ය.

ශ්‍රී ලංකාව ද මේ වන විට එවන් වූ ආර්ථික පරිවර්තනයකට ලක් වෙමින් තිබේ. රාජ්‍ය ක්‍රීඩා කරමින්, වඩාත් කාර්යක්ෂම සහ ප්‍රභල රාජ්‍යයක් අපි නිර්මාණය කරන්නෙමු. එසේ ම මේ වන විට ශ්‍රී ලංකාවේ බලශක්ති සැපයුම විවිධ ආකාරයෙන් ප්‍රභේදවලින් සිදුවන අතර, ඒවායේ සැපයුම්කරුවන් ලොව පුර විහිදී සිටී. එසේම එම සැපයුම් භූ දේශපාලනිකව එකිනෙකට ප්‍රතිවිරුද්ධ බලවේග වෙත පිරිනමා බලය තුලනය කිරීම අපේ උපක්‍රමය විය යුතු ය. එසේනම්, බලශක්ති ක්ෂේත්‍රයද රාජ්‍ය අංශය සතුව හිර කර නොගෙන පුද්ගලික අංශයට නිකුත් කිරීම සිදුකර ගැනීමට දැන් හැකියාව තිබේ. එය සිදු කරගත යුතු ක්‍රමෝපායන් අපි ඔබට ඉදිරිපත් කරන්නෙමු.

- විදුලි බලය ඔස්සේ සහනාධාර සැපයීමට යෑම ශ්‍රී ලංකාව වත්මන් ආර්ථික අර්බුදය දක්වා රැගෙන ආ විශාල හේතුවක් වූයේ ය. විදුලි බලය තවදුරටත් එවන් වූ සේවාවක් ලෙස පවත්වා ගෙන යෑමට රජයට හැකියාවක් නොමැත. එබැවින් විදුලි බලය මින් මතුවට සැපයෙන්නේ එහි වියදම ආවරණය වන ක්‍රමයකට ය. එනම්, විදුලි බලය ඔස්සේ සහනාධාර සැපයීම අහෝසි කෙරේ.

- විදුලි බල මණ්ඩලය අහෝසි කෙරේ. එහි කාර්යයන් සඳහා එකිනෙකට වෙන්වූ සමාගම් ජාලයක් ඇති කෙරේ. අපගේ රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ තුළදී පැහැදිළිව සාකච්ඡා කළ පරිදි මෙම කර්මාන්ත සඳහා සමාගම් මොඩල ආදේශ කරනු ලැබේ.

- විදුලි ජනනය සඳහා වෙන්වූ සියලුම බලාගාර අයත් සමාගම් ජාලයක් ඇති කරනු ලබන අතර, විදුලි නිෂ්පාදන සඳහා තරඟකාරීත්වය ඇති කෙරේ. මෙහිදී මෙම සමාගම් පුද්ගලික අංශයට නිකුත් කරනු ලබන අතර එම සමාගම් බාර දීම සඳහා සමාගම් තෝරා ගැනීමේදී, එකිනෙකාට වෙනස් භූ දේශපාලනික කඳවුරු මත වීම, එක ම පොදු මව් සමාගම්වලට අයත් නොවීම, ප්‍රතිඒකාධිකාරී නීතිවලට යටත් වීම, වෙළෙඳපොළ නියාමනයට යටත් වීම, ආදිය සනාථ කෙරේ.

- විදුලිය බෙදා හැරීම සඳහා පුද්ගලික අංශයේ සමාගම්වලට බෙදා හැරීමේ කොටස සම්පූර්ණයෙන් පැවරේ. ඒ සඳහා තරඟකාරී සමාගම් 4 ක් වත් ඇති කළ යුතු අතර, තමාට අවශ්‍ය සමාගම තෝරා ගැනීමේ නිදහස පාරිභෝගිකයාට ලැබේ. ඳ

- විදුලි බලාගාරයේ විදුලිය සම්ප්‍රේෂණය (Transmission) වන ජාලය රජය සතුව තබා ගැනේ. එම කොටස රජය සතු සමාගමක් බවට පත් කරනු ලබන අතර, එහි අයිතිය රාජ්‍ය භාණ්ඩාගාර මඩි සමාගමට පැවරේ. එම සමාගමේ කළමනාකරණය ස්වාධීන කරන අතර, එය පවත්වාගෙන යෑමේ වගකීම මඩි සමාගම සතු වෙයි. එනයින්, දේශපාලන පත්වීම්, ඇඟිලි ගැසීම් සහ වංචා දූෂණවලින් එම ක්ෂේත්‍රය මුදවා ගැනේ.

- විදුලි ජනන සමාගම් රැසක් මේ ආකාරයට රට තුළ පවත්වාගත හැකි අතර, විදුලිය බෙදා හැරීමේ සමාගම් ද කීපයක් පැවතිය හැකිය. විදුලි ජනන සමාගම් හා බෙදා හරින සමාගම් අතර ඉල්ලුම සහ සැපයුම අතර තරගකාරී වෙළඳපොල සාධක මත අනාගතයේ දී විදුලි මිල තීරණය වීමට ඉඩ හැරිය හැකි ය. එහෙත්, එම තත්ත්වයන් ඇතිවන තුරු විදුලි මිල වෙළඳපොළල නියාමන අධිකාරිය මගින් විශ්ලේෂණය කර නිරීක්ෂණය කෙරේ. එම මිල අසාමාන්‍ය සහ පාරිභෝගිකයාට අසාධාරණ ලෙස ඉහළ දැමීමට නොහැකි අයුරින් නියාමනය කෙරේ.

- මේ අනුව විදුලි ජනනය පුද්ගලික අංශයට පැවරෙන අතර, විදුලිය බෙදා හැරීම ද පුද්ගලික අංශයට පැවරේ. මේ ඔස්සේ බලශක්ති යෙදවුම් ඔස්සේ වංචා දූෂණ සිදු කිරීමට ඇති හැකියාව ඉවත් කෙරෙන අතර, දේශපාලන අතපෙවීම්, බලපෑම්, සේවා සැපයීමේ ප්‍රමාද දෝෂ මග හරවා ගැනේ. එනයින් පුද්ගලික අංශයේ කාර්යක්ෂමතාවයට විදුලි අංශයට ආකර්ෂණය කර ගැනේ. ජනතාවට වඩාත් විශ්වාසනීය, මිල පහසු, ආරක්ෂිත හා අඛණ්ඩ විදුලි බල සැපයුමක් ලබා දීම මේ මගින් තහවුරු කෙරේ.

- විදුලි ජනනය වන බලාගාර තීරණය කිරීම හා පාලනය කිරීම වෙන ම ස්වාධීන පද්ධති මෙහෙයුම් කරන (Independent System Operator - ISO) ස්වාධීන ආයතනයක් මගින් කෙරේ. විදුලි සම්ප්‍රේෂණ කරන ආයතනය මගින් විදුලි ජනනය සහ බලාගාර පාලනය කිරීම මගින් සිදුවන අකටයුතු සහ දූෂණ මෙම ක්‍රියාවලි දෙක සම්පූර්ණයෙන් ම එකිනෙකින් වෙන් කිරීම මගින් කරන්නෙමු. විදුලි සම්ප්‍රේෂණය කරනු ලබන රාජ්‍ය සමාගමට ගෙවීම, බෙදා හරින සමාගම් මගින් සිදු කරනු ලබන අතර ඒවා විදුලි බිලට අඩංගු කෙරේ.

- මහජන උපයෝගිතා කොමිසම අවලංගු කෙරේ. ඒ වෙනුවට 'විදුලි වෙළඳපොල නියාමන අධිකාරියක් ස්ථාපිත කෙරේ. මෙමගින් විදුලි ජනන සමාගම් සහ විදුලිය බෙදා හරින සමාගම් අතර සිදු වන විවෘත විදුලි වෙන්දේසි වෙළඳපොල අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා බලතල පැවරේ. එම නියාමනය මගින් අසාමාන්‍ය ලෙස මිල ඉහළ යෑම සහ අසාධාරණ වෙළඳපොල බලවේග පාලනය කර ගැනේ.

- විදුලි බල සැපයුම රටේ අවශ්‍යතාවයට අනුව දියුණු කරගැනීම, වෙළඳපොල ආයෝජකයන් මගින් ජාතික ඉලක්ක සපුරා ගැනීමට විදුලි සංවර්ධන උපාය මාර්ග නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම, නව විදුලි ජනන බලපත්‍ර නිකුත් කිරීම ආදිය වෙනුවෙන් විදුලි බල සංවර්ධනය අධිකාරියක් පිහිටුවා ගැනේ. එම අධිකාරිය නව විදුලි බල පනතකින් සම්මත කර ගන්න අතර, විදුලි බල ක්ෂේත්‍රයේ නූතන ප්‍රතිසංස්කරණ සියල්ල එම පනත මගින් ක්‍රියාත්මක කෙරේ.

- නව ''විදුලි බල සංවර්ධන අධිකාරිය'' අප නූතන රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ වල දී විස්තර කළ ආකාරයට ක්ෂේත්‍රයේ සංවර්ධකයා බවට එය පත් වන අතර නියාමකයා බවට විදුලි වෙළඳපොල නියාමන අධිකාරිය පත්වෙයි.

- පුනර්ජනනීය බලශක්ති අධිකාරිය ද පරමාණුක බලශක්ති අධිකාරිය ද ප්‍රතිසංස්කරණවලට යොමු කෙරේ. මෙම අධිකාරීන් ද එම ක්ෂේත්‍රවල නියාමකයන් බවට පත්කරන අතර, සමස්ත සංවර්ධකයා බවට පත් වන්නේ විදුලි බල සංවර්ධන අධිකාරියයි. මෙම නව විදුලි බල සංවර්ධන අධිකාරිය විසින් රටේ සමස්ත විදුලි බල සැපයුමට අවශ්‍ය ජාතික සැලසුම ක්‍රියාත්මක කරනු ලබන අතර, එනයින්, පුනර්ජනනීය බලශක්ති අධිකාරිය ද පරමාණුක බලශක්ති අධිකාරිය ද ඔවුන්ගේ දායකත්වය විදුලි බල සංවර්ධන අධිකාරිය වෙත ලබා දිය යුතු ය.

- පරමාණුක බලශක්ති පනත යාවත්කාලීන කර, න්‍යෂ්ටික ඉන්ධන ශ්‍රී ලංකාවට ගෙන ඒමේ හා ශ්‍රී ලංකාව ඔස්සේ ප්‍රවාහනය කිරීමට නීති සකස් කෙරේ. නූතන තාක්ෂණික උපක්‍රම සමගින් එන කුඩා මාදිලියේ න්‍යෂ්ටික බලාගාර ඉදිකර ගැනීමට අවශ්‍ය වැඩකටයුතු සකස් කිරීමට මෙම අධිකාරියට වගකීම පැවරේ.

- ශ්‍රී ලංකාවේ ජාතික විදුලි බල සැළැස්ම යළි යාවත්කාලීන කෙරේ. නූතනයේ සිදු වන ප්‍රවාහනයේ සහ ජනාවාස වල ඇතිවන වෙනස්කම් අනුව ඉහළ යන බලශක්ති අවශ්‍යතාවය යළි ගණනය කර, ජාතික විදුලි බල සැපයුම නව වෙළඳපොල චින්තනය සමගින් යාවත්කාලීන කෙරේ. එසේ ම, ගෝලීය සම්මතයන්ට හා ගිවිසුම් වලට අනුරූපීව, ජාතික ඉලක්ක සපුරා ගත හැකි බලශක්ති සැලසුමක් යළි නිර්මාණය කෙරේ. දේශගුණික විපර්යාස කළමනාකරණය කර ගනු පිණිස කාබන් විමෝචනය තුලිත කර ගැනීමේ අරමුණ ඇතිව පොසිල ඉන්ධන මත රඳා නොපවතින බලශක්ති ක්ෂේත්‍රයක් නිර්මාණය කර ගැනීමට සැලසුම් සකස් කෙරේ. එම සැළසුමට අනුව මේ රටේ සෑම පුරවැසියෙකුට ම ආරක්ෂිතව, සාධාරණ මිලකට, විශ්වාසනීයත්වයෙන්, තිරසාර ලෙස බලශක්තිය සැපයීම රජයේ වගකීමක් කොට, ඉටු කෙරේ.

- තව ද ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙන වෙනම සාදන දිගුකාලීන විදුලි ජනන සැළසුම හා විදුලි සම්ප්‍රේෂණය සැළසුම් වෙනුවට ලෝකයේ තිබෙන නවීනත ම ක්‍රමවේදය අනුව Integrated Resource Plan එකක් වෙත යොමු වී වඩා කාර්යක්ෂම ලෙස රටේ ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධති සැලසුම් කරන්නෙමු.

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ විද්‍යුත් වාහනවල ඇතිවන වෙනස්කම් සමග ම නුදුරු අනාගතයේ ම ඛනිජ තෙල් ක්ෂේත්‍රය බර විදුලි බල ක්ෂේත්‍රයට මාරු වන බැවින්, හැකි ඉක්මනින් සුළං බලාගාර සහ සූර්ය බලාගාර නිර්මාණය කරගැනීමේ උපක්‍රම ක්‍රියාත්මක කෙරේ. ඒවා පොදු-පුද්ගලික හවුල් ව්‍යාපාර ලෙස හෝ පුද්ගලික අංශයේ පූර්ණ ආයෝජන ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. එමගින් දහවල් කාලය තුළ විදුලි ජනනය ඉහළ යා හැකි බැවින්, එම විදුලි බලය වාහන ආරෝපණය කිරීම් මෙන් ම, වේගයෙන් කාර්මීකරණය සිදුවන ආර්ථික ක්ෂේත්‍රයට යොමු කිරීමේ හැකියාව ඇතිවනු ඇත. එම නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභේද වලට ගැළපෙන ලෙස සම්ප්‍රේෂණ පද්ධතිය අලුත්වැඩියා කොට නව තාක්ෂණය භාවිතා කොට දියුණු කර ගැනීමට කටයුතු කෙරේ.

- පුනර්ජනනීය බලශක්තිය සඳහා යොමුවන විට විදුලිය ගබඩා කිරීමේ පද්ධති (බැටරි සහ ජලය පොම්ප කිරීම මගින් ශක්තිය

ගබඩා කිරීමේ තාක්ෂණය ප්‍රධාන වශයෙන්) අවශ්‍ය අධ්‍යයනය කොට යොදා ගනී.

- නිවාසවල වහලය මත සූර්ය පැනල සවි කර ගනිමින් විදුලි බලය සපයා ගැනීමට කැමති හා ආයෝජනය කළ හැකි මිනිසුන් සඳහා බදු සහන සහිත පහසුකම් ඇති කෙරේ. එම ක්‍රමය ප්‍රචලිත කරමින් විදුලි බල නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට කටයුතු කෙරේ.

- ඉන්දියාව සමග විදුලි බලය හුවමාරු කර ගැනීමේ සම්ප්‍රේෂණ සම්බන්ධතාවයක් නිර්මාණය කිරීම පිළිබඳව සොයා බැලේ. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර බල ශක්තිය හුවමාරුව ඔස්සේ මේ රට තුළ බලශක්ති ක්ෂේත්‍රයේ විශ්වාසනීයත්වය ඉක්මනින් ඉහළ දමා ගැනීමට බලාපොරොත්තු වන අතර, එමගින් වෙළඳපොල විශ්වාසය ඉහළ නංවා ගැනීමත් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමත් සිදුකර ගත හැකිය.

- මෙතෙක් නිර්මාණය කර ගැනීමට නොහැකි වූ LNG බලාගාර හැකි ඉක්මනින් නිර්මාණය කර ගැනීමට බලාපොරොත්තුවන අතර වැඩ නැවතී ඇති අනෙකුත් බලාගාරවල වැඩ හැකි ඉක්මනින් අවසන් කර ගැනීමට කටයුතු කෙරේ.

- ඉහතින් සඳහන් කළ විදුලි බල සංවර්ධන අධිකාරිය, විදුලි වෙළඳපොල නියාමන අධිකාරිය, පුනර්ජනනීය බලශක්ති අධිකාරිය සහ පරමාණුක බලශක්ති අධිකාරිය බලශක්ති අමාත්‍යාංශයට පවරනු ලබන අතර, එම අධිකාරීන්වල සමාන්තර සහ පොදු ක්‍රියාකාරීත්වය අමාත්‍යාංශය මගින් පරිපාලනය කෙරේ. එමගින් ජාතික සැලැස්ම අනුව ඉලක්ක සපුරා ගැනීමට සාමූහිකව ක්‍රියාත්මක වීම එම අධිකාරීන්වල වගකීම වෙයි. එම කටයුතු කළමනාකරණය කර ගැනීමත්, ජාතික බලශක්ති අවශ්‍යතාවය නොපිරිහෙළා ඉටු කිරීමත් බලශක්ති අමාත්‍යාංශයට පැවරෙයි.

  මෙම අධිකාරයන්ගේ කටයුතු දේශපාලන බලපෑම් සහ අතපෙවීම් වලින් නිදහස් කෙරේ. නූතන රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ මගින් මෙම ආයතනවල ස්වාධීනත්වය රැකගෙන ඒවායේ දියුණුව ඇති කිරීමට කටයුතු කෙරේ.

මේ ආකාරයට රටේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව අපගේ වැඩපිළිවෙල ඔබට ඉදිරිපත් කරන්නෙමු. එය නූතන වෙළඳපොල න්‍යායන් අනුව සකස්කර ඇති, නූතන තාක්ෂණය සහ ලෝක දේශපාලනය ආදිය සලකා බලා අනාගතය වෙනුවෙන් නිර්මාණය කරන ලද්දකි. අපගේ දේශපාලන මතවාදය මත පිහිටා, රට ගැන ඇති ඉදිරි දැක්ම අනුව වඩාත් හොඳ බලශක්ති වැඩපිළිවෙලක් ලෙස මෙය ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු.

මෙය හුදෙක් ප්‍රතිපත්ති ප්‍රකාශයක් පමණක් නොව මෙම ක්ෂේත්‍රය උඩුයටිකුරු කරන දැවැන්ත ප්‍රතිසංස්කරණ වෙයි. ඒවා කරගැනීම අපහසු නැත. අප ක්‍රියාත්මක කළ යුත්තේ අනාගතය වඩාත් උචිත බල ශක්තිය සැලසුමක් බැවින්, එය නිර්මාණය කිරීමට අවශ්‍ය දේශපාලන මග පෙන්වීම මේ ලියවිල්ලෙන් අප ලබා දෙන්නෙමු.

ආර්ථික ප්‍රතිපත්තිය

රටක ආර්ථිකය යනු, යම් රටක තිබෙන හා අලුතෙන් ගොඩනගා ගනු ලබන සම්පත් ඒ රටේ පුරවැසියන් අතර බෙදී යන ආකාරය තීරණය කෙරෙන යාන්ත්‍රණයයි. රටක දේශපාලනය විසින් එම සම්පත් බෙදී යෑම නියාමනය කරනු ලබන අතර, එනයින් දේශපාලන මතවාදයන් ආර්ථික ක්‍රියාවලිය හා සෘජුව ම සම්බන්ධ වේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක දී රටේ බහුතර දේශපාලන මතය මත එහි ආර්ථිකයේ පාදක ප්‍රතිපත්ති තීරණය වන අතර ඒ ඔස්සේ සම්පත් ජනනය කිරීම හා බෙදීයෑම පිළිබඳව පොදු එකඟතාවයන් ඇති වේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ හඳුනාගත හැකි එක් ප්‍රායෝගික ගැටලුවක් වන්නේ බහුතර දේශපාලන මතය වරින් වර වෙනස් වෙද්දී , රටේ දිගුකාලීන ආර්ථික වර්ධනයට හානිකර අයුරින් ආර්ථිකය හා අදාළ මූලික ප්‍රතිපත්ති රාමුව ද වෙනස් වීමට ඇති හැකියාවයි.

දේශපාලනයත් ආර්ථිකයත් අතර ඇති අන්තර් සම්බන්ධය අප රට හඳන ප්‍රතිපත්තියක් සාකච්ඡා කරන අවස්ථාවක දී පැහැදිළි කරගැනීම අත්‍යාවශ්‍යය. මානව හිමිකම් සුරැකුණ, සෑමට සමාන අවස්ථා ලැබෙන සමාජයක් තුළ සාධාරණ ලෙස සම්පත් බෙදී යන ආර්ථික ක්‍රමයක් බිහි වේ. එලෙස සාධාරණ ලෙස සම්පත් බෙදී යෑම පිණිස යහපත් දේශපාලනයක් තිබිය යුත්තේ ය. යහපත් දේශපාලනයක් නොමැති අවස්ථාවකදි සම්පත් බෙදී යෑම සාධාරණ නොවන බැවින්, දේශපාලන බලය අවභාවිතා කර ඇතැම් අයට සම්පත් අසාධාරණ ලෙස ගොඩ ගසා ගැනීමට හැකියාව ලැබීම සමාජයක් පිරිහීම කරා රැගෙන යයි. සම්පත් නිර්මාණය කරන්නන්ට එහි නියම අයිතිය නොලැබෙන, සීමිත පිරිසක් විසින් එම සම්පත්වල ප්‍රතිලාභ භුක්ති විඳින දේශපාලන ක්‍රමයක් නිර්මාණය වන්නේ එවන් අසාධාරණ සම්පත් බෙදී යෑමකට සමාජය ඉඩ කඩ ලබා දෙන අවස්ථාවන්වල දීය.

එබැවින් රට හදන අපේ ආර්ථික ප්‍රතිපත්තිය, යහපත් රාජ්‍ය පරිපාලනය හා යහපත් දේශපාලනය නම් පදනම මත ගොඩනැගෙන ක්‍රියාවලියකි. මේ රට තුල ප්‍රමාණවත් තරම් සම්පත් ජනනය වීමට ඉඩ සැලසීම ද එම සම්පත් ජනතාව අතර සාධාරණ ලෙස බෙදී යෑම ද පිළිබඳව වගකියන දේශපාලන ක්‍රමයක් අපි ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන්නෙමු.

ආර්ථික සැලසුම් ගැන කතා කිරීමට පෙර, අපි අපේ ශක්තීන් හා දුර්වලතාවයන් හඳුනා ගමු.

ශ්‍රී ලංකාවට ගැලපෙන ආර්ථික සැලසුමක මූලික ආකෘතිය තෝරා ගැනීමට පෙර අප විසින් මුලින්ම කළ යුත්තේ, ලෝකයට සාපේක්ෂව අපි සිටිනා තැන අවබෝධ කර ගැනීම ය. අපේ ශක්තීන් හා දුර්වලතාවලට සාපේක්ෂව හැකියාවන් හඳුනා ගැනීම ය. නූතන ගෝලීය ආර්ථිකය තුළ අපට සාර්ථක විය හැකි උපාය මාර්ග තෝරාගත හැක්කේ ඉන් අනතුරුවය. ඒ අනුව, යමින් අපි සුවිශේෂී කාරණා කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමු.

ශ්‍රී ලංකාව යනු කුඩා රාජ්‍යයකි.

බිලියන 8 ක් වන ගෝලීය ජනගහනයට සාපේක්ෂව මිලියන 22 ක කුඩා ජනගහනයකින් සමන්විත ශ්‍රී ලංකාව කුඩා රාජ්‍යයක් ලෙස හැඳින්විය හැකි ය. එහි අනෙක් අර්ථය නම් දැවැන්ත ගෝලීය වෙළඳපොලට සාපේක්ෂව අපේ දේශීය වෙළඳපොල ඉතා කුඩා එකක් බවයි. ඩොලර් ට්‍රිලියන සියය ඉක්මවන ලෝක ආර්ථිකය තුළ අපේ පංගුව 0.1% කටත් වඩා අඩු ය. ගෝලීය ජනගහනයෙන් 0.3% කටත් වඩා අඩු පංගුවක් හා ලෝක ආර්ථිකය තුළ එයින්ද හතරෙන් එකක් පමණ වන ඉතා කුඩා පංගුවක් නියෝජනය කරන ශ්‍රී ලාංකික අප, අපේ දියුණුව ඉලක්ක කිරීමේ දී ලෝකය සමග සෘජුව ම මුහුවී කටයුතු කිරීම අත්‍යාවශ්‍ය ය. අන්තර්ජාතික ප්‍රජාව හා වෙළඳපොල අපේ ගමන් සඟයා විය යුතුය. ශ්‍රී ලංකාවෙන් බාහිර ලෝකය තුළ සිදු වන සම්පත් ජනනය වීමේ ක්‍රියාවලියට අප විසින් සෘජුව සම්බන්ධ විය යුතු අතර එම සම්පත්වලින් හැකි තරම් විශාල පංගුවක් අප විසින් දිනා ගැනීම පිණිස නොබියව ලෝකය සමග තරඟ කිරීමට සූදානම් විය යුතුය.

ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින, අඩු ආදායම්ලාභී රාජ්‍යයකි.

ශ්‍රී ලංකාව යුරෝපීය අධිරාජ්‍යවාදීන් විසින් වසර 447 ක් යටත් කර ගෙන සිටි අභ්‍යන්තරයෙන් විනාශ වූ සූරා කෑමට ලක් වූ රාජ්‍යයකි. එම අධිරාජ්‍යවාදීන් විසින් වැවිලි ආර්ථිකයකට තල්ලු කර හරින ලද, දියුණු නොකළ මානව සම්පතකින් සමන්විත මේ රටේ නිදහසෙන් පසු දේශපාලනය තුළ රට ඉදිරියට ගෙන යෑමට කිසිවෙකු සමත් වී නොමැත. නිදහසෙන් පසුව ඇතිවූ දේශපාලන ක්‍රමය තුළ රට ඉදිරියට ගෙන යන පැහැදිළි දැක්මක්, සැළසුමක් දකින්නට නොමැති වීම තුළ, එවන් දැක්මක් ඇති නායකයින් පාලනයට නොපැමිණීම තුළ, රට දශක ගණනාවක් නුසුදුස්සන් අතින් පාලනය වූයේ යැයි කිව හැකිය. එහි අවසන් ප්‍රතිඵලය නම් අප තවමත් ආර්ථික සංවර්ධන ළඟා කර ගැනීමට නොහැකි වූ දුප්පත් ජාතියක් ලෙස ලෝකය තුළ ඉතිරි වීමය. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ඡන්ද බලයෙන් ආණ්ඩු වෙනස් වුව ද පරිපාලන ක්‍රමයේ වෙනසක් ඇති නොවීම

මත මේ රටේ ආර්ථිකය ලෝකයේ දුර්වල ම තැනකට රැගෙනවිත් තිබේ. අපිට අලුතින් නිර්මාණය කිරීමට ඇත්තේ මේ ආර්ථිකයයි. එනයින්, අප සිටින තැන අවබෝධ කර ගෙන, එතනින් නැගී සිටීමට සුදුසු දැක්මක් ඇති සැළැස්මකට රට මෙහෙය වීම අපගේ ආර්ථික ප්‍රතිපත්තිය තුළින් ඔබට ගෙන ඒමට අප බලාපොරොත්තු වන්නෙමු.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි දූපතකි.

ශ්‍රී ලංකාව යනු ඉන්දියාවට සමීපයේ පිහිටි වර්ග කිලෝමීටර් 65610 කින් යුක්ත වූ කුඩා දූපතකි. ඉන්දියාව නම් වූ බිලියන 1.4 ක ජනගහනයක් සිටින, මිල දී ගැනීමේ පදනම අනුව ලෝකයේ තුන් වන ලොකුම ආර්ථිකය අපට කිලෝමීටර කිහිපයක් දුරින් පිහිටා තිබේ. ඉන්දියාව ද අයත් දකුණු ආසියාව නම් ආර්ථික කලාපයද ඇතුළුව ලෝකයේ වැදගත්ම ආර්ථික කලාප 7 කට මැදිව ශ්‍රී ලංකාව පිහිටා තිබේ. දකුණු ආසියාව, මැදපෙරදිග, යුරෝපය, අප්‍රිකාව, අග්නිදිග ආසියාව, චීනය සහ පැසිෆික් යන ආර්ථික කලාපවල මධ්‍යයේ පිහිටා තිබීම ශ්‍රී ලංකාව සතු සුවිශේෂී පිහිටීමේ වැදගත් කමයි. එනම්, එම ආර්ථික කලාප පිහිටි මහද්වීප 4 වන ආසියා, යුරෝපා, අප්‍රිකා සහ ඕස්ට්‍රේලියා යන මහද්වීප 4 ට මැදිව තිබෙන මේ පුංචි දූපත එහි පිහිටීම හේතුවෙන් උපාය මාර්ගික ලෙස ඉතාමත් වැදගත් රටකි. ලෝකයේ ප්‍රධාන මුහුදු මාර්ගයක පිහිටීමත්, වරායන් තැනීමට සුදුසු ගැඹුරු මුහුදු සීමා වලින් යුක්ත වීමත්, මහද්වීප යා කරන ගුවන් මාර්ගවලට නුදුරේ පිහිටා තිබීමත්, ලෝක බලවතෙකු ලෙස නැගී එන ඉන්දියාවට සමීප වීමත් යන කරුණු ශ්‍රී ලංකාව මේ යුගයේ ලෝක සිතියමේ තිබෙන වැදගත්ම රාජ්‍යයක් බවට පත්කර තිබීම පුදුමයට කරුණක් නොවේ. ඒ නිසාමදෝ භූ දේශපාලනිකව ශ්‍රී ලංකාවට මේ යුගයේදී අත්වන වැදගත්කම ඉතිහාසයේ පෙර නොතිබූ තරම් යැයි කිව හැකිය. මෙම භූ දේශපාලනික වැදගත්කම ඇතැම් විට අප අගතියට පත් කරවන සුළු වූවත්, නිසි අයුරින් එය කළමනාකරණය කර ගැනීම මත එය රටේ වැදගත්ම සම්පත බවට පත් කර ගත හැකිය. එනම්, අප සතු ප්‍රභල ම සම්පත නම් ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමයි.

ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත් වලින් අනූන රාජ්‍යයක් නොවේ.

ලෝකයේ ඇතැම් රාජ්‍යයන් සැලකීමේ දී ඒ රාජ්‍යයන් දියුණු කර වීමට භූමියේ තිබූ ස්වාභාවික සම්පත් ප්‍රමාණය හේතු වී තිබේ. එහෙත්, තෙල්, ගෑස් හා ගල් අඟුරු වැනි ෆොසිල ඉන්ධන, යකඩ, ඇලුමිනියම්, තඹ, සින්ක් ආදී සුලබ ලෝහ වර්ග, නැතිනම් නූතන තාක්ෂණික උපකරණවලට අවශ්‍ය වන දුලබ ලෝහ වර්ග ආදියේ විශාල නිධි ශ්‍රී ලංකා භූමියේ පිහිටා නොමැත. ග්‍රැෆයිට්, ඉල්මනයිට්, සහ පොස්පේට් අඩංගු

සාපේක්ෂව කුඩා නිධි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පිහිටා ඇතත් ඒවා රටේ සමස්ත ආර්ථිකය පවත්වා ගෙන යා හැකි මට්ටමේ සම්පත් නොවේ.

අපට තිබෙන කුඩා ස්වාභාවික සම්පත් ප්‍රමාණය කළමනාකරණය කරගැනීම හා ඒවාට අගය එකතු කිරීම කළයුතු වූවත්, රටේ ආර්ථිකයේ බර එම සීමිත ස්වාභාවික සම්පත් කොටසට දැරිය නොහැකි ය.

එහෙත් විශාල ඉන්දියන් සාගරයේ වැදගත් තැනක පිහිටීමත්, රට දූපතක් වීමත්, වනාන්තර සහ ස්වභාවධර්මය හේතු කොට ගෙන වෙරළ, සයුර, වනය, සතා සිවුපාවන් අපට ආර්ථික සම්පත් තනා දී තිබේ.

එසේම, වසරක 2500 ක ඉතිහාසයක් පුරා ගොඩ නැගුණු වාරිකර්මාන්ත මෙන්ම, වගා කළ සරු සාර භූමියත්, අතීත ශිෂ්ඨාචාරවලින් ඉතුරු වී ඇති නෂ්ඨාවශේෂත් නූතන ආර්ථිකයේ වැදගත් සම්පත් ලෙස අපිට හැඳින්විය හැකිය.

මානව සම්පත

ශ්‍රී ලංකාවේ ජනගහනය මේ වන විට මිලියන 22 ක් බව ද එබැවින් ජන ඝනත්වය වර්ග කිලෝමීටර් එකකට මිනිසුන් 342 ක් බව ද අපි දනිමු. එය සාපේක්ෂව අධික ජන ඝනත්වයක් යැයි අපිට කිව හැකි ය.

ඒත් මේ මානව සම්පතෙහි ගුණාත්මකභාවය කොපමණ දැයි අපෙන් ප්‍රශ්න කළහොත් එයට ලබා දීමට ඇති පිළිතුර එතරම් සුබදායක නොවේ. රටක ආර්ථිකය සතු වටිනා ම සම්පත එරට මානව සම්පත බැව් අවිවාදයෙන් පිළිගත හැකිය. එහෙත් ඒ මානව සම්පත දියුණු නොකළ සම්පතක් නම්, ඉන් ආර්ථිකයට සිදු වන වාසිය එතරම් විශාල නොවේ. රටක මානව සම්පත දියුණු කිරීමේ ලා රජයකට විශාල කාර්යභාරයක් තිබේ. දියුණු කළ අධ්‍යාපනයක්, සෞඛ්‍යයක්, සංස්කෘතියක්, පරිසරයක් ආදී සියල්ලෙන් ඒ රටේ මානව සම්පත ගොඩනැගෙන අතර, ශ්‍රී ලංකාවේ එම සම්පත ඇත්තේ ලෝක සම්මතයෙන් දුර්වල වූ තැනක ය. අපි සතුව ඇත්තේ බහුතරයක් වූ නුපුහුණු ශ්‍රම සම්පතකි. නුපුහුණු ශ්‍රමිකයන්, කම්කරුවන්ගෙන් ගහන වූ අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව ව්‍යාත්තීය පුහුණුවක් නොළඳ පිරිස බොහෝ ය. ඒ නිසා අප අද වනවිට විදේශීය ශ්‍රම වෙළඳපොල තුළ පවා ශ්‍රී ලාංකිකයන් යොමු වී ඇත්තේ ගෘහ පාලනය වැනි සේවාවන් සඳහා ය. වතු කම්කරුවන්, ඇඟලුම් කම්හල් සේවකයන් ආදී අඩු වැටුප් ක්ෂේත්‍රවලට යොමු වීමට පුරවැසියන් විශාල ප්‍රමාණයකට සිදුවී තිබේ. එසේම ජනගහනයෙන් 25% කට ආසන්න පිරිසක් කෘෂි

කර්මාන්තයේ ම නියැළෙන අතර, කාන්තාවන් අතරින් ආර්ථික ක්‍රියාවලියකට සෘජුව දායක වන්නේ තුනෙන් එකකි. මේ ආකාරයට අප සතු මානව සම්පත හඳුනා ගැනීම රට හදන ආර්ථික වැඩපිළිවෙලක අත්‍යාවශ්‍ය පදනමකි.

ආර්ථික මතවාදය සහ දේශපාලන සාක්ෂරතාවය

ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සාක්ෂරතාවය ඉහළ අගයක් ගත්ත ද ඉන් කියැවෙන්නේ ඔවුන්ගේ කියවීමට සහ ලිවීමට ඇති හැකියාව යි. ඒ අනුව අප මානව සංවර්ධන දර්ශකයේ ඉහළින් සිටියද රට තවමත් ආර්ථික අතින් සංවර්ධනය ළඟා කරගෙන නොමැත. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුරවැසියෙකුගේ මූල්‍ය සාක්ෂරතාවය 30% කට වඩා අඩු යැයි කියවෙති. එසේම දේශපාලනය දෙස බැලීමේදී ද එය ඉහළ අගයක් ගනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකි ය.

යටත් විජිතකරණයෙන් පසු ස්වයං පාලන ක්‍රමයක් අපිට ළැබුන ද සර්වජන ඡන්දය භාවිතා කිරීමට තරම් දේශපාලනිකව මේරූ පුරවැසියන් අපිට නොසිටියේ ය. ශතවර්ෂ කීපයක් තිස්සේ අධිරාජ්‍යවාදීන් විසින් පාගා ගෙන මොට කරන ලද ජාතියක් තමන්ට සුදුසු ආණ්ඩුවක් පත් කර ගැනීමට තරම් දැනුවත්භාවයකින් සිටියා යැයි සිතිය නොහැකි ය. අපේ පුරවැසියන් හට රජයක් පිළිබඳව ඇත්තේ වෙනයම් වූ අදහසකි. අධිරාජ්‍ය සමග සටන් කොට නිදහස දිනා ගැනීමට නොහැකි වූ අප, ස්වයං පාලනයෙන් අනතුරුව ද රාජ්‍යය පිළිබඳව දැරුවේ අධිරාජ්‍ය කෙරෙහි දැක්වූ යටහත් පහත්භාවයම දැයි සිතිය හැකි ය. සිය අනන්‍යතාවය හඳුනාගත්, අභිමානය ඇති ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහස පූර්ණව භුක්ති විඳිය හැකි පුරවැසියන් අපිට නොසිටියේ ය. එහි ප්‍රතිඵලය වූයේ සිය හාම්පුතුන් පාලකයන් බවට පත් කරගෙන ඔවුන් නිර්මාණය කරන ආණ්ඩුවකින් සියල්ල කර දෙනු ඇතැයි සිතන ජනතාවක් බිහි වීමය.

අධිරාජ්‍යවාදයෙන් බැටකෑ ඔවුන් බටහිරින් නික්ම සෝවියට් රුසියාවේ කොමියුනිස්ට් ක්‍රම දිහා වැඩිපුර විශ්වාස කරන්නෝ බවට පත් වූයේ ය. ශ්‍රී ලාංකිකයෝ ඉන්දියාව දෙසත්, ඉන්දියාව සෝවියට් රුසියාව දෙසත් බැලූහ. එහි ප්‍රතිඵලය වූයේ කොමියුනිස්ට් වාදයේ මුල් ශ්‍රී ලංකාව තුළත් ව්‍යාප්ත වීමය. පසුකාලීනව වාමාංශික දේශපාලන මතවාදය බලසම්පන්න වෙද්දී, රාජ්‍ය පරිපාලනයට රාජ්‍ය මූලික ආර්ථිකයක සංකල්ප ගැඹුරින් අන්තර්ගත කර ගැනීමට සාපේක්ෂව සමාජවාදී දේශපාලන ව්‍යාපාර කටයුතු කළේ ය. යටත් විජිතකරණයෙන් රජය පිළිබඳව ඇති කර ගත් යටහත් පහත් අදහස ද වාමාංශික දේශපාලන මතවාදයෙන් ලැබුණ රාජ්‍ය මූලික ආර්ථිකය ද ශ්‍රී ලාංකීය පුරවැසියා කෙරේ ඇතිකළ බලපෑම සුළුපටු

නොවේ. ඔවුහු සියල්ල රාජ්‍ය විසින් කරනු ඇතැයි විශ්වාස කරන්නෝ වූ අතර එම සර්ව බලගතු රජයේ රැකියාවක් කිරීම ජීවිතයේ ලැබිය හැකි ඉහළම ගෞරවයක් සේ සැලකූහ. පුද්ගලික ව්‍යාපාර, වෙළඳපොල, සියල්ල දෙස වාමාංශික ඇසකින් බැලූ ඔවුහු දශක ගණනාවක් ගත වුව ද සිය ආර්ථිකයේ සැකැස්ම වෙනස් කර ගැනීමට කටයුතු නොකළේ ය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ, ලෝකය වේගයෙන් වෙනස් වෙමින් ඉදිරියට ගිය ද ශ්‍රී ලංකාව තවමත් යාවත්කාලීන නොවූ දේශපාලන මතවාදයන්ගේ පැටලුණු රාජ්‍ය මූලික ආර්ථිකයක් සහිත අසාර්ථක රාජ්‍යයක් බවට පත් වීම ය.

ශ්‍රී ලංකාවේ නිදහසෙන් පසු බහුතර මහජන මතය විමසා බැලීමේ දී ගම්‍යවන සුවිශේෂී ලක්ෂණය නම්, තවමත් ඔවුන් මේ දේශපාලන මතවාදයෙන් නික්මී නොමැති බවයි. එම දේශපාලන මතය සමග රටකට ඉදිරියට යෑම අපහසු ය. රටේ ආර්ථිකයේ හැඩතල වෙනස් කිරීම අපහසු ය. එනයින්, රට ගොඩ නගන සැලැස්මක මේ මතවාදය වෙනස් කර ගැනීමේ අවශ්‍යතාවය දැඩිව පවතියි.

ජාතික සමගිය

ශ්‍රී ලංකාව ජාතික සමගිය අතින් සිටින්නේ දුර්වල තැනක ය. බහුතරයක් වූ සිංහලයන් වෙසෙන මේ දිවයිනේ තවත් බොහෝ ජාතීන් වාසය කරති. ඒ ඒ ජාතීන් අදහන ආගම් විවිධ වෙති. කතා කරන භාෂාවන් විවිධ වෙති. එසේම ඒ ඒ ආගමේද ඒ ඒ ජාතියේද කුලයන් අනුව මිනිසුන් බෙදී ගොස් තිබේ.

යම් අතීත කාරණාවකට සම්බන්ධ සාම්ප්‍රදායික පදනමකින් ගලා එන අනන්‍යතාවයන් බීජ කර ගෙන බෙදී ගිය මිනිසුන් පොදු එක් ජාතියක් ලෙස එක් වීමට මැළිකමක් දක්වති. එක ම භූමියක එකම හුස්ම පොද බෙදා ගත්ත ද එක කෑම වේල බෙදා ගැනීම ප්‍රතික්ෂේප කරන සමාජයන් තිබේ. එසේ එක ම ජාතියක් ලෙස එක් වීමට මැළි වූ නිසා ම පසු ගිය දශකය පුරා ජාතිවාදී කෝළාහල තුනක් ඇති වූයේ ය. සිවිල් යුද්ධයක් හට ගත්තේ ය. බෝම්බ පුපුරමින් ත්‍රස්තවාදී ක්‍රියා සිදු වූයේ ය. මේ සියල්ල විසින් අපේ රටේ පුරවැසියන්ගේ මතකයන් තුළ ඇති කරන ලද කැළැල් ප්‍රමාණය ගැඹුරු ය. එවන් අඳුරු මතකයන් අතරින් එකිනෙකා විශ්වාස කරමින් එක ම ජාතියක් ලෙස හදවතින් හැඟීමෙන් එක්සේසත් වීම උගහට ය. අවිශ්වාසය රජ කරවන, සැකය මේරූ, එකිනෙකා තේරුම් නොගත් පුරවැසියන් සිටින රටකට එකාවන්න කටයුතු කිරීම දුෂ්කර ය. මේ බෙදීම ද සැකය ද රටේ ආර්ථිකයට සෘජුවම බලපවත්වයි. විටින් විට ගොඩ

නැගෙන ආර්ථිකය යළි යලිත් කඩා බිඳ දමන්නට ඉතිහාසය පුරාවට සිදු වූ වර්ගවාදී ගැටුම් හේතු වූයේ ය.

එනයින්, අපි රටක් විදියට ගෝලීය සමාජය සමග එක්වීමටත්, අනතුරුව එකිනෙකා ඉවසන සහ ගරු කරන, විවෘත බහු සංස්කෘතික සමාජයක් නිර්මාණය කිරීමටත්, අපි එකිනෙකා සතු ශක්තිය එකට මුහු කොට රට වෙනුවෙන් යොදා ගැනීමටත් මේ දුර්වලතාවය මගහරවාගැනීම අත්‍යාවශ්‍ය ය. ජාතික සමගිය අපේ ආර්ථික සැළැස්මකදී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු අංශයක් සේ අප සලකමු.

ඉන්දියාව

ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර ඇති සමීප සම්බන්ධය ඉන්දියාවේ සිට බලංගොඩ මානවයාගේ මුතුන්මිත්තන් මෙහි ඇවිද ආ දිනයේ සිට අද දක්වා ම නොනැසී පවතින්නකි. එකිනෙකට සමීපයේ පවතින ගොඩබිම් දෙකක් රාජ්‍යකොට පවතින අසල්වැසියන් වන අප ඉතිහාසය මුළුල්ලේ ම එකිනෙකා සමග අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කළේ ය. විටෙක ආක්‍රමණිකයෙකු ද විටෙක සංක්‍රමණිකයෙකු ද ලෙස මේ භූමියට නැකම් කියූ ඉන්දියාව මේ වන විට ලෝකයේ ආර්ථික බලවතෙකු ලෙස වේගයෙන් ඉදිරියට එමින් තිබේ. මේ දැවැන්ත රාජ්‍යයට ළඟම නෑයන් වන අප කළාපීය වශයෙන් ඉන්දියාවේ ප්‍රභලත්වය තේරුම් ගත යුතුය. නූතන ලෝකය තුළ යම් වෙළඳපොලක් වේගයෙන් ආර්ථික දියුණුව දක්වා ගමන් කරයි නම්, එම ආර්ථිකය විසින් ආර්ථික අවස්ථා රැසක් ඇති කරනු ලබන්නේ ය. ''උෆරන් කැකුණ තලන විට හබන් කුකුළන්ට රජ මගුල්'' වැනි යැයි කියන්නක් මෙන් යම් ආර්ථික බලවතෙකු වේගවත් සංවර්ධනයක් කරා යයි නම්, ඉන් ගොඩ නැගෙන ආර්ථික අවස්ථා අල්ලා ගැනීමට කුඩා රාජ්‍යයන් හට අවස්ථාව ලැබේ. ශ්‍රී ලංකාවට ලැබී තිබෙන හොඳ ම අවස්ථාව ද මෙයයි. මේ වන විට ලෝකයේ රාජ්‍යයන් රැසක් සංවර්ධනය කරා ගමන් කොට ඇති බැවින්, මෙවන් දැවැන්තයෙකු එසේ කරනු ලබන අවසන් අවස්ථාව මෙය විය හැකිය. එනම්, ඉන්දියාව විසින් අප වෙත හිමිකර දෙනු ලබන මේ අවස්ථාව අප විසින් අල්ලා නොගන්නේ නම්, අපිට එවන් අවස්ථාවක් යළි නොලැබී යෑමේ ඉඩකඩ වැඩිය. එම නිසා ඉන්දියාව සමග අවබෝධයෙන් කටයුතු කිරීම ද ඉන්දීය ආර්ථිකය සමග සමීප සබඳතාවයන් ගොඩ නගා ගැනීම ද අපේ උපක්‍රමය විය යුතු බවට අප අවධාරණය කර සිටින්නෙමු.

ගෝලීයකරණය හා අනාගතය

තාක්ෂණයේද, සන්නිවේදනයේද, ප්‍රවාහනයේද දියුණුව නිසා වේගයෙන් සිදුවන ගෝලීයකරණය මේ මහපොළොව මත ක්‍රියාත්මක වන යතාර්ථයකි. මීට වසර 5000 කට පෙර සිට රාජ්‍යයන් ලෙස සංවිධානය වූ මානව ශිෂ්ඨාචාරය මේ වන විට එක ම ගෝලීය රාජ්‍යයක් ලෙස යළිත් ප්‍රතිසංවිධානය වීම සිදුවෙමින් පවතින්නේ ය.

දැනට පවතින එකිනෙකට වෙනස් රාජ්‍යයන් 195 ක් පෘථිවිය මත විවිධ ආර්ථික කළාප ලෙස කළාපීයව සංවිධානය වීම දැනට සිදුව තිබේ. යුරෝපා සංගමය එයට ලොකුම උදාහරණය සපයද්දී ආරාබි ලීගය, අප්‍රිකානු සංගමය ආදිය කරළියට එන කළාපීය සංවිධාන ලෙස හැඳින්විය හැකිය. ආරක්ෂාව මූලික කරගෙන හෝ වෙළඳපොල විශාල කර ගැනීම ඉලක්ක කරගෙන විවිධ ගිවිසුම්වලින් එකිනෙකට බැඳී මෙම සංවිධාන බිහිවීම මේ යුගයේ සුවිශේෂී ලක්ෂණයකි. කළාපීයකරණයෙන් ඔබ්බට ගොස් රාජ්‍යයන් ගෝලීය අභියෝග ජය ගනු වස් එක්ව කටයුතු කිරීම ද දැන් ඇරඹී තිබේ. ත්‍රස්තවාදය, දේශගුණික විපර්යාස හා පාරිසරික අර්බුද, ජන සංක්‍රමණය ආදී ගැටලු හුදෙක් ස්වෛරීය රාජ්‍යයන් ලෙස තනිව විසඳා ගැනීම කළ නොහැක්කකි. එනයින් පුළුල් ගෝලීය සම්මුතියන් නිර්මාණය කිරීමත්, ගෝලීයව බලපවත්නා ගැටලු වෙනුවෙන් පොදු ගෝලීය එකඟතාවයන් මත කටයුතු කිරීමත් සිදු වෙයි. මේ සියල්ල දේශපාලනිකව සිදු වූවත්, මේවාට බොහෝ පෙර ගෝලීය ආර්ථිකය ලෝකය වෙලා ගත්තේ ය. එය වෙළඳපොල නිෂ්පාදන විභාජනය වීමෙන් මෙන්ම ප්‍රාග්ධනය ගලා යෑමෙන්ද, භාණ්ඩ සහ සේවා හුවමාරු වීමෙන් ද ඇති වී ඇති සංකීර්ණ ජාලයක් ලෙස හැඳින්විය හැකිය. මෙම ගෝලීය වෙළඳපොල යනු, ලෝකයේ සම්පත් රට රටවල් අතර බෙදා ගන්නා අවකාශයයි. එමගින් ගෝලීයව පිළිගත් පොදු සම්මතයන්, ගිවිසුම් සහ එකඟතාවයන් නිර්මාණය වීම මත පොදු ගෝලීය රීති සහ හර පද්ධතියක් නිර්මාණය වී තිබේ. රාජ්‍යයන් සිය දේශසීමාවට කොටු වෙද්දී, ගෝලීය වෙළඳපොල සමග කටයුතු කිරීමට පුරවැසියන් හට සිදු වෙයි.

එහි ප්‍රතිඵලය වී ඇත්තේ පුරවැසියන් ද ක්‍රමිකව ගෝලීය චින්තනයකට හුරුවීමත්, රටක සීමාවකට කොටු නොවූ ගෝලීය පුරවැසියන් බවට පත්වීමත් ය. එනම්, තවදුරටත් රටක ආර්ථිකය සැලසුම් කිරීමේ දී දේශීය සීමාවට කොටු වීම ප්‍රායෝගික නොවේ. යම් රටක පුරවැසියන් තවදුරටත් එම රටේ සීමාවට සීමා නොවී පොදුවේ ලෝකය සමග ගනුදෙනු කරන්නන් බවට පත් වෙයි. තාක්ෂණය, සන්නිවේදනය සහ ප්‍රවාහනය විසින් එම පුරවැසියන්ගේ දේශසීමා පුළුල් කර තිබේ. යම් පුරවැසියෙකුට මෙමගින් සිය දේශීයත්වය තනුක වී යෑමක් දැනෙන්නට හැකියාවක් තිබුණත්, සංස්කෘතික වශයෙන් කෙතරම් අභියෝගාත්මක වුණත්, අපට එය මග හැර යා නොහැක. ලෝකයේ ස්වභාවය එයයි.

ගෝලීයකරණය යනු අපි වැළඳගත යුතු අනාගතයයි. එය මග හැර, ඉන් ඈත් වී දියුණු වන රටක ආර්ථිකය සකස් කළ නොහැකි ය. අපේ රටේ ආර්ථික ප්‍රතිපත්තිය මේ නූතන ගෝලීය දියුණුව අනුව සකස් විය යුතු එකකි. ලෝකය එක්ක යන, ලෝකයේ එන අලුත් රටාවන් හඳුනා ගෙන, එයට අනුගත වෙමින් එහි පෙරගමන්කරු වීමට අපි උත්සාහ කළ යුතුය. අපිට ලෝකය ජය ගත හැකි වන්නේ එවිට පමණ ය.

ණය බර සහ බංකොලොත්භාවය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය සමග සමාන්තරව එන අනෙක් ප්‍රධාන සංකල්පය නම් රාජ්‍ය ණය ප්‍රමාණය සහ වත්මන් බංකොලොත්භාවය යි. දීර්ඝකාලීනව ගොඩනැගි ඇති ණය මත රඳා පැවතුණ, මූල්‍ය විනය නොරැකි රාජ්‍ය ප්‍රතිපත්තියක අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ රට ගැඹුරු තිරසාර නොවන ණය අර්බුදයක පැටලීම ය. ඒ ණය අර්බුදයේ දිග පළල පිළිබඳව මේ වන විට රටේ විශාල පිරිසකගේ දැනුම පුළුල් වී තිබේ.

රටේ දැනට පවතින ආදායමෙන් ගෙවා ගැනීමට නොහැකි තරම් ප්‍රමාණයක් ණය ලබා ගෙන රාජ්‍ය වියදම් පියවීමට යෑමෙන් වර්ධනය වී ඇති මේ ණය තොගය, ගෙවා ගෙන යාමට හැකි මට්ටමට පත් කර ගැනීමේ අවශ්‍යතාවය ප්‍රමුඛ කාර්යයක් වන්නේ ය. බංකොලොත්භාවය නිසා ම අවපාතනයකට ගොස් හැකිලීමකට ලක්ව ඇති රටේ ආර්ථිකය තුළින් ප්‍රමාණවත් රාජ්‍ය ආදායමක් උපයා යළිත් ණය ගෙවාගෙන යෑමට ඇති හැකියාව වර්ධනය කර ගැනීම ඉක්මනින් කර ගත යුතුව තිබේ. ඒත් සමග ම රටේ තිබෙන ණය ප්‍රමාණය ඉක්මවා යන ආදායමක් ජනිත කිරීමට තරම් ධනය නිර්මාණය වන ආර්ථික ක්‍රමවේදයකට පරිවර්තනය වීමේ අභියෝගය අප හමුවේ තිබේ.

ආර්ථිකය තුළ ඇති මොඩලය වෙනස් කොට මේ රට තුළින්ම ණය ගෙවාගෙන යෑමට තරම් ධනය රැස් වන ආර්ථික ක්‍රමයක් නිර්මාණය කිරීම අපගේ වගකීම යි.

දුර්වල නීතිය සහ වංචා දූෂණ ඉහළ වීම.

ආර්ථිකය පණ ගැහෙන ජීවියෙක් නම්, වංචා සහ දූෂණ යනු ඒ ජීවියා තුළ වැඩෙන පිළිකාවක් වැනි ය. පිළිකාවක් එක වරක් වැළඳුණ විට එය සුව කිරීම අපහසු ය. බොහෝ විට රෝගියා මිය යන තෙක් ම පිළිකාව වැඩී විශාල වෙයි. ශරීරයේ සෑම තැනකටම එය පැතිරෙයි. රටකට හෝ ආයතනයකට වංචාව හා දූෂණය බෝ වූ විට ද කටයුතු සිදු වන්නේ

එසේම ය. එය පැතිරෙයි, ශරීරය රෝගාතුර වී මිය යන තුරු ම පැතිරෙයි, විශාල වෙයි. ශ්‍රී ලංකාවේ වංචා දූෂණ ප්‍රමාණයත් එම පිළිකාව සේ ම මේ රටේ රාජ්‍ය සේවයේ, දේශපාලනයේ මෙන් ම පුරවැසි ජන ජීවිතයේ ද අස්සක් මුල්ලක් නැර පැතිර ගොස් තිබේ.

අපි ලෝකය අතින් ද වංචා දූෂණ අතින් ඉහළ අගයක් ගන්නා දූෂිත රාජ්‍යයකි. මේ තත්ත්වය කළමනාකරණය කරගැනීම ගැන අපි පුළුල්ව කතා කළ යුතු අතර, ආර්ථික උපක්‍රම තෝරා ගැනීමේ දී එම තත්ත්වය සැලකිල්ලට ගෙන, වංචා දූෂණ සිදු නොවීමට වගවීමෙන් බැඳීමට අපට සිදුවනු ඇත.

අකාර්යක්ෂම රාජ්‍ය පරිපාලනය

රටක් කාර්යක්ෂමව පාලනය කිරීමට නම් ඒ රජය සතුව හොඳ ආයතන ව්‍යුහයක් තිබිය යුතුය. ඒ ආයතන වල උනන්දුවෙන් රැකියාව කරන දක්ෂ සුදුසු සේවක මණ්ඩලයක් සිටිය යුතුය. ඒ නිලධාරීන් හා සේවකයන් රටේ බිහිවන හොඳම මානව සම්පතෙන් තෝරාගත් සුදුස්සන් විය යුතුය.

අප රටේ ගැටලුව නම් රාජ්‍ය පරිපාලනය ඉතා දුර්වල තත්ත්වයක පැවතීම ය. එය එක පැත්තකින් යාවත්කාලීන නොවූ පැරණි සිද්ධාන්තවලට අනුව ක්‍රියාත්මක වන්නෙකි. අනෙක් පැත්තෙන් නූතන තාක්ෂණය සහ ශිල්පක්‍රම අවමව භාවිතා කරන්නකි. මෙවන් දුර්වල රාජ්‍ය පරිපාලන ක්‍රමයක් තියා ගෙන රටක් සාර්ථකව පාලනය කිරීම උගහට ය. රජයක් විසින් ගනු ලබන තීන්දු තීරණ ක්‍රියාත්මක කරවීමට තිබෙන්නේ දුර්වල යාන්ත්‍රණයක් නම්, එය මගින් ආර්ථිකයට අවශ්‍ය ශක්තිය නොලැබේ. ඒ නිසාම මේ රටේ ව්‍යාපාර හා කර්මාන්ත කිරීමට අපහසු රාජ්‍යයක් ලෙස ප්‍රසිද්ධ වී තිබේ. Ease of Doing Business Index එකට අනුව අපි සිටින්නේ 100 ආසන්නයේ ය. එය අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පහත් අගයක් වන අතර ඉන් මේ රටතුළ ව්‍යාපාර හා කර්මාන්ත කිරීමට ඇති අපහසුවත්, ආයෝජන ගෙන්වා ගැනීමට ඇති බාධාවත් පෙන්නුම් කරයි. එනයින් රටේ ඕනෑම ප්‍රගතියක් අත්කර ගැනීමට නම්, අපගේ රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණය යාවත්කාලීන කොට සම්පූර්ණ වෙනස් කළ යුතු යැයි අප විශ්වාස කරන්නෙමු.

අපි ආර්ථිකය ගොඩ නගන බිම් පදනම

රටේ ආර්ථිකය නම් යාන්ත්‍රණය හොඳින් ක්‍රියාත්මක වීමට නම්, රට තුළ ශක්තිමත් අඩිතාලම් තුනක් සකස් කර ගත යුතුය. ඒවා රටේ ආර්ථිකය ගොඩනැගෙන පාදම් වෙයි. එම මූලික අඩිතාලම් ශක්තිමත් නොවී

සංවර්ධිත රාජ්‍යයක් කරා යෑමට දැවැන්ත ආර්ථිකයක් සඳහා වූ මග විවර කර ගත නොහැකිය. මක්නිසාද යත්, මේ මූලික පදනම් තුන මත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය සෘජුවම රඳා පවතින බැවිනි. එම මූලික පදනම් තුන මෙසේ ය.

1. යහපත් දේශපාලනය
2. කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනය
3. නීතියේ පරමාධිපත්‍යය

යහපත් දේශපාලනය

රටක ආර්ථිකය පැන නගින්නේ දේශපාලනයෙන් බැව් අප ඔබට පැහැදිළි කළෙමු. දේශපාලනය යනු වත්මන් පාලන තන්ත්‍රයට අනුව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයයි. එය මානව නිදහස හා සමානාත්මතාවය පිරි, මූලික මිනිස් අයිතිවාසිකම් රැකි, බහුතර කැමැත්ත මත රටේ පරිපාලනයට සම්බන්ධ තීන්දු තීරණ ගන්නා ක්‍රමයකි. ජනතාවට සිය නියෝජිතයන් මගින් දේශපාලන තීන්දු තීරණවලට සහභාගී විය හැකි අතර, එම නියෝජිතයන් ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් පෙනී සිටී.

මේ දේශපාලන මොඩලය ලොව පිළිගත් බහුතර රටවල් රැසක ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී පාලන මොඩලයයි. මේ නියෝජිතයන් යහපත් දේශපාලනයක් සිදු කරයි නම් ඔවුන් යහපත් සාධාරණ තරඟකාරී ආර්ථිකයක් නිර්මාණය කිරීමට දායක වෙති. එහෙත්, එම නියෝජිතයන් ඔවුන් උසුලන දේශපාලන බලය අවභාවිතා කොට, නිදහස් වෙළඳපොල තරගයට බාධා කරයි නම්, දේශපාලන හා ආර්ථික වාසි ලබයි නම් එවන් අවස්ථාවකදී ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක නොවේ. දේශපාලන බලය ඇත්තෝ ආර්ථික වාසි සූරා ගනිමින් ජනතාවගෙන් ඈත් කරයි නම් අපි බලාපොරොත්තු වන යහපත් ආර්ථිකයක් නිර්මාණය නොවේ.

දේශපාලනය අධිකාරිය යහපත් වූ කළ එය විසින් රටේ ආර්ථිකය දියුණු කිරීමට කටයුතු කරති. වංචා දූෂණ සීමා කරති, වෙළඳපොල නිදහස ඇති කොට, අවශ්‍ය අවම නියාමනය ලබා දෙති. රාජ්‍ය සාර්ව ආර්ථිකය ස්ථාවරව තබා ගනිමින්, වෙළඳපොලට දියුණු වීමට අවකාශ සලසා දෙති. එමගින් ධනය ගොඩනැගීමට අවස්ථා නිර්මාණය කරති. ඒවා සාධාරණව බෙදී යන යාන්ත්‍රණ නිර්මාණය කරති. එසේ කළ හැක්කේ දේශපාලකයා වගවීමෙන් බැඳුණු කලක දී පමණකි. ඒ අනුව යහපත් දේශපාලනයක් නිර්මාණය කරගත හැකි අතර, එමගින් සාර්ථක ආර්ථිකයක් නිර්මාණය කිරීමට පදනම දමයි.

කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනය

යහපත් දේශපාලනය මගින් සපයනු ලබන අවම නියාමනයන් සහ සේවා කාර්යක්ෂම ආර්ථිකය තුළට රැගෙන ඒම රාජ්‍ය පරිපාලනයේ කාර්යභාරයයි. වෙළඳපොලට අවශ්‍ය වන පරිපාලනය පහසුකම්, ලියාපදිංචි කිරීම්, යටිතල පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ආදිය සැපයීමත්, ගුණාත්මක ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමත් රාජ්‍ය සේවා මගින් සැපයිය යුතුය. රාජ්‍ය සේවාවන් යාවත්කාලීන හා කාර්යක්ෂම නොවන විටෙක ඇති වන ප්‍රමාදවීම් සහ අක්‍රමිකතා මෙන්ම විවිධ පරිපාලන ස්ථරවල ඇතිවන වංචා දූෂණ ආදිය නිසා එවන් රටවල ව්‍යාපාර කිරීමට අපහසු තත්ත්වයන් පැන නගී. එවන් රටවල ආර්ථිකය දියුණු කිරීම අපහසු ය. එනයින් කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනයක් නොමැති රටක ආර්ථිකයක් සාර්ථක නොවේ. ඒ අනුව අපගේ රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්තිය මත ආර්ථිකයට හිතකර කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනයක් ඇති කෙරේ.

නීතියේ පරමාධිපත්‍යය

රටක නීතිය එහි ආර්ථිකය හා සෘජුව ම බැඳී පවතී. ආර්ථිකයක් තුළ නිරන්තරයෙන් ඇති වන වෙළෙඳපොළ අවබෝධතාවයන් සහ ගිවිසුම් විවිධ කරුණු නිසා උල්ලංඝනය වීම් නිරන්තරයෙන් ස්වාභාවිකව සිදු වේ. එවිට ඇතිවන වෙළඳපොල ගැටුම් නිරාකරණය කර ගැනීමත්, එම ගිවිසුම් නීත්‍යානුකූලව ක්‍රියාවේ නැංවීමත් විශ්වාසයෙන් යුතුව කර ගැනීමට හැකියාව වෙළඳපොලක් තුළ තිබිය යුතුය. එසේ ම මහජන විනය පවත්වා ගෙන යෑමත්, ඒ සමාජයේ සාමය පවත්වා ගෙන යෑමත් ආර්ථිකයකට සෘජුවම බලපානු ලබයි. රටක සමාජය මෙන් ම ශ්‍රම බලකාය නීතිගරුක පුද්ගලයන්ගෙන් සමන්විත වීමත්, ස්වයං විනයක් පවත්වා ගැනීමත් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට සෘජුව ම සම්බන්ධ ය. නීතියේ පරමාධිපත්‍ය ඇතිකිරීම මත පුරවැසියන් වඩාත් නීතිගරුක පුරවැසියන් බවට පත් වන අතර, එම ශක්තිමත් නීති පද්ධතිය මගින් ඇති කරනු ලබන සමාජ ස්ථාවරත්වය හා විශ්වාසය ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට සෘජුව ම සම්බන්ධ ය. එනයින් රටේ සමස්ත ආර්ථිකයේ වේගවත් දියුණුවට රටේ නීතියේ පරමාධිපත්‍යය පිහිටුවීම අත්‍යාවශ්‍ය ය.

රටට ගැළපෙන ආර්ථික මොඩලය

විවෘත ආර්ථිකය

ශ්‍රී ලංකාවට වඩාත් ගැළපෙන ආර්ථික මොඩලය විවෘත ආර්ථිකය බව අප විශ්වාස කරන්නෙමු. ලෝකයේ කුඩා ජනගහනයක් වෙසෙන පුංචි

රාජ්‍යයක් ලෙස අප රටට ලෝක වෙළඳපොල සමග තරඟකර ධනය උත්පාදනය කර ගැනීමට නම්, වෙළඳපොල බාධා සියල්ල ඉවත් කළ, අන්තර්ජාතිකය සමග ඉතා පහසුවෙන් ගනුදෙනු කළ හැකි, සන්නිවේදනයෙන්, තාක්ෂණයෙන් හා ප්‍රවාහනයෙන් බැඳුණ, භාණ්ඩ හා ප්‍රාග්ධනය අවම පිරිවැයක් යටතේ ගලා යා හැකි රාජ්‍යයක් අපි නිර්මාණය කළ යුතුය.

1978 දී සාපේක්ෂව වැසුණු ආර්ථිකයක සිට විවෘත වෙළඳපොලට පිවිසිය ද එම තත්ත්වයට ගැළපෙන්නට දේශීය ආර්ථිකය සහ සීමා වෙනස් කර ගෙන නොමැත. එනයින් සාපේක්ෂව විවෘත තත්ත්වයක් ඇති වුව ද තවමත් සමස්ත ආර්ථිකය තුළ ඇත්තේ වෙළඳපොල බාධා වලින් අනූන, රාජ්‍ය අධිනියාමනයකට ලක් වූ දේශීය වෙළඳපොලක් මෙන්ම අන්තර්ජාතිකයට බියෙන් සකස් කරගත් යාවත්කාලීන නොවූ ආරක්ෂණවාදී ආර්ථික ක්‍රමවේදයකි. රටතුළ බැසගත් වාමාංශික ව්‍යාපාර සහ ජාතිකවාදී දේශපාලන මතවාදයන් මුල් කරගත් දේශපාලන පක්ෂ බලයට පත් වීමත්, ඔවුන් විසින් පෙර පැවති ක්‍රමය දිගට ම පවත්වා ගෙන යෑමත්, ලෝකය සමග ඉදිරියට යෑමට තරම් දේශපාලන දැක්මක් සහිත නව අදහස් දේශපාලනය තුළට නොපැමිණීමත්, යුද්ධය හා ත්‍රස්තවාදය නිසා ආර්ථිකයට ලැබුණ අවධානය අඩු වීමත් නිසා මේ ක්‍රමික පරිවර්තනය රටතුළ සිදු වූයේ නොමැත. එහි ප්‍රතිඵලය නම්, ආර්ථිකයට නියමිත පදනමක් නොමැතිව ලෝක වෙළඳපොල තුළ අතරමං වීමය.

එමනිසා අප අරගෙන එන පළමු වෙනස නම් මේ විවෘත ආර්ථිකය සංකල්පය යාවත්කාලීන කර, එයට ගැළපෙන අයුරින් දේශීය වෙළඳපොල ද රාජ්‍ය පරිපාලනය ද ජනතාව දැනුවත් කර ඔවුන්ගේ මතවාදය ද වෙනස් කර නිවැරදි පදනමක් දැමීම ය. වෙළඳපොලට ඇති බාධා ඉවත් කොට, අන්තර්ජාතිකයට බිය නැති, ලෝකය සමග පහසුවෙන් ගනුදෙනු කළ හැකි, පුළුල් හා විවෘත වෙළඳපොල ක්‍රමයක් ඇති කිරීම ය.

එවිට අප මෙන් ම අනෙකුත් කුඩා රාජ්‍යයන් සිදුකළා මෙන් ම, ලෝකය සමග තරඟ කොට, ලෝක වෙළඳපොලෙන් කොටසක් උරුම කර ගැනීමට අපට ඉඩ විවර වේ.

නිදහස් වෙළඳපොල

වෙළඳපොලක් ක්‍රියාත්මකවන සාර්ථක ම ක්‍රමය නම් නිදහස් වෙළඳපොල බව දැන් ලෝකය ඉගෙන ගෙන තිබේ. සාපේක්ෂව වැසුණු ආර්ථික ක්‍රම, ආරක්ෂණවාදී ආර්ථික, සමාජවාදී ආර්ථික ක්‍රම ක්‍රියාත්මක කළ රාජ්‍යයන් බොහෝමයක් ඒවායින් මිදී නිදහස් වෙළෙඳපොළ තෝරාගෙන ඇති අතර,

අතළොස්සක් හැරුණු කොට එසේ වෙනස් වූ රාජ්‍යයන් සියල්ලක්ම පාහේ ඉන් සාර්ථක ප්‍රතිඵල නෙලාගෙන තිබේ. එනම්, රටක් ආර්ථික අතින් සංවර්ධනය කරා ගෙනයෑමට නම්, ලෝකයේ අත්හදා බලා සාර්ථක වූ එකම ක්‍රමය ලෙස නිදහස් වෙළඳපොල ආර්ථිකය අවිවාදයෙන් පිළිගෙන තිබේ. එනයින් අප ද තෝරා ගත යුත්තේ නිදහස් වෙළඳපොල ආර්ථික ක්‍රමයක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

එම නිදහස් වෙළඳපොල ක්‍රමයක් තුළ ගොඩනැගෙන ප්‍රතිලාභ දිනා ගැනීමට පුරවැසියන් තුළ ඇති වන කැමැත්ත හා තරඟය උත්තේජනය කොට සමාජයක් නව නිර්මාණ කිරීමටත්, ඒවා නිෂ්පාදනය කොට වෙළඳපොලට ගෙන ඒමත්, එමගින් සමාජයට අභිවෘද්ධිය ඇති වීමත් මෙය සිදුවන සරළ ක්‍රියාවලියයි. එමගින් පුරවැසියාට වෙළඳපොල තුළින් ප්‍රතිලාභ දිනා ගැනීමට බාහිර බලපෑමෙන් තොර නිදහසක් තිබිය යුතු ය. පැරණි ලෝකයේ ආරක්ෂණවාදී ආර්ථිකයන්හි රාජ්‍ය මැදිහත්වීම අධික වූ අතර, රාජ්‍ය සෘජුව ම වෙළඳපොල නියාමනය කිරීම කළේ ය. එසේ කරනුයේ විවිධ ලයිසන් ක්‍රම සහ පර්මිට් ක්‍රම ආධාරයෙනි. ඒ හරහා තවත් රාජ්‍ය සේවා නියාමනයක් ද ඒ ඔස්සේ වංචා දූෂණවලට තවත් එක අවස්ථාවක් ද නිර්මාණය කරයි. රටේ ආර්ථිකය තුළ සිදුවන සමස්ත ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නියාමනය කිරීමට කිසිදු රජයක් සර්ව බලධාරී නොවන බැවින්, එම මැදිහත්වීම තුළ අක්‍රමිකතා රාශියක් හට ගෙන එහි බලපෑම මත වෙළඳපොල අධෛර්යමත් වීමත්, අකාර්යක්ෂම වීමත් සිදුවේ. එවන් ආර්ථිකයක පුරවැසියාට ප්‍රතිලාභ ප්‍රමාණවත්ව නොලැබෙන බැවින් නව නිර්මාණ කිරීමටත්, අලුත් ව්‍යාපාර කිරීමටත් ඇති උනන්දුව බොහෝ අඩුය. එවන් ආර්ථිකයක් සාමාන්‍යයෙන් දියුණු නොවෙයි. එනිසා මේ ආර්ථික යන්ත්‍රය පණ ගැන්වීමට නම්, වෙළඳපොලට සහභාගී වීමට පුරවැසියන් හට ඇති අවස්ථාව පහසු විය යුතු අතර, බාධා අවම විය යුතුය. එම නිදහස් වෙළඳපොල තුළ සම්පත් බෙදී යෑම සාධාරණ විය යුතු අතර, කිසිවෙකු මග නොහැර යන ක්‍රමවේදයන් සකස් කර ගත යුතුය. එහි වගකීම පාලකයා සතුවන අතර එයට අදාළ අවශ්‍ය නියාමනයක් සකස් කිරීමට අප කටයුතු කරන්නෙමු.

එමෙන්ම නිදහස් වෙළඳපොලක් ස්වයං පාලනයට ලක් වූවත්, පූර්ණ නිදහස් වෙළඳපොලක් තුළ එම ස්වයං නියාමනය දුර්වල වී සමාජ සාධාරණත්වය නොලැබී යන මට්ටමට පත් විය හැකිය. ඒ නිසා ම ලෝකයේ කිසිදු රටක පූර්ණ නිදහස් වෙළඳපොලක් ක්‍රියාත්මක නොවේ. වෙළඳපොල අසාර්ථක වන තැන් හඳුනා ගෙන එවාට පිළියම් යෙදීමත්, අසාර්ථක නොවීමට අවශ්‍ය අවම නියාමනය ලබා දීමත් රජයෙන් බලාපොරොත්තුවන පරිපාලන වගකීමයි. ඒ සඳහා ආයතන සකස් කිරීමත්, අණපනත් නිර්මාණය කිරීමත් අපගේ වගකීමයි. එසේම රාජ්‍ය

කුඩා වූවත් එය වෙළඳපොලට වඩා ප්‍රභල වීමත් මෙවන් ක්‍රමයක අවශ්‍යතාවයකි. වෙළඳපොල තුළ කිසිඳු ආකාරයකින් රජයේ රාජ්‍ය බලයෙන් ඔබ්බට ඉක්මවා යන වෙළඳපොල බලයක් ගොඩ නගා ගැනීමට අවස්ථාවක් නොවිය යුතුය. එනයින්, නිදහස් වෙළඳපොලක් ඇති කිරීමටත්, ඒ සඳහා අවම නියාමන යාන්ත්‍රණයක් ඇති කිරීමටත්, කුඩා නමුත් ප්‍රභල රජයක් නිර්මාණය කිරීමටත් අප කටයුතු කරන්නෙමු.

ගෝලීයකරණය

ලෝකයේ අනාගත යතාර්ථය නම්, මිනිස් සමාජය ක්‍රමක්‍රමයෙන් පොදු ගෝලීය සමාජයක් බවට පත් වීමය. එම පරිවර්තනය ක්‍රමිකව සිදුවන පරිණාමයක් වන අතර එය ඉතිහාසය පුරාවට නොකඩවා සිදු වී තිබේ. එසේම වර්තමානයෙත්, මේ මොහොතේත් සිදු වෙමින් පවතියි. තාක්ෂණයේ, සන්නිවේදනයේ, සහ ප්‍රවාහනයේ වේගවත් දියුණුව සමග වෙළඳපොල, මූල්‍ය ක්‍රම හා ප්‍රාග්ධනය දේශසීමා නොසලකා, බාධාවන් මැඩ ගෙන මුහු වීමත්, දේශගුණික විපර්යාස, ත්‍රස්තවාදය, සංක්‍රමණය, යුද්ධය ආදී ලෝකයේ බහු අර්බුද දේශසීමාවලට කොටු නොවීමත් ආදිය කරුණු කොට ගෙන නිරන්තරයෙන් සිදුවන දියුණුව හා අනුවර්තනය වීම් සියල්ලේ අවසානය වන්නේ මුළු මහත් මිනිස් සමාජය ම ගෝලීය පුරවැසියන් වෙසෙන පොදු ගෝලීය රාජ්‍යයක් බවට පත් වීමය.
එම පරිවර්තනය ලෝකයේ රාජ්‍යයන් කළාප සංවිධානවලට එකතු කිරීම මේ වන විටත් සිදු වී ඇති අතර, ඉන් අනතුරුව ක්‍රමයෙන් ගෝලීයකරණය යතාර්ථයක් වීම සිදුවනු ඇත. අප රටක් ලෙස, ලෝකයේ මෙම පරිවර්තනයට මුහුණ දීමට සූදානම් විය යුතුය. අපගේ පුරවැසියන් නියමිත අධ්‍යාපනයකින්, ආර්ථික ක්‍රමයකින්, ගෝලීය චින්තනයකින් සන්නද්ධ කරගැනීමට අප පමා වුවහොත් ලෝකයේ දියුණු රාජ්‍යවල පුරවැසියන් හමුවේ අප කොන් වී යෑම නැවැත්විය නොහැකිය. මේ ගෝලීයකරණය යන ප්‍රභල සමාජ සාධකය හමුවේ අප කළ යුත්තේ දොරටු අවුරා ගෙන ලෝකයට බියෙන් සැඟවීම නොව ජනතාව සූදානම් කර ගෙන ඉදිරියට ගොස් අපේ කොටස අත් කර ගැනීම ය. එබැවින් අප ලෝකය සමග ඉදිරියට යන, අනාගතයට ගැළපෙන ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු අතර විවෘත, නිදහස්, ලෝකයට නොබියව මුහුණ දෙන ලෝකය සමග මුහුවන, ලෝකය සමග තරඟ කරන, ආර්ථිකයක් නිර්මාණය කිරීමට කටයුතු කරන්නෙමු.

අපනයන මූලික ආර්ථිකය

ඉහත කී සංකල්ප පෙරදැරි කරගෙන ආර්ථිකය නිර්මාණය කිරීමේ දී විවෘත, නිදහස්, හා ලෝකය සමඟ මුහුවන වෙළඳපොල ක්‍රමයකදී

පැහැදිළිවම අප ඉලක්ක කරගත යුත්තේ මිනිසුන් බිලියන 8 ක් වෙසෙන ගෝලීය වෙළඳපොලට භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි. එසේ නොකොට ආරක්ෂණවාදී ක්‍රමවල මෙන් රටට ගෙන්වන භාණ්ඩ සීමා කොට ඒවා දේශීයව නිෂ්පාදනය කරන ආනයන ආදේශක නිෂ්පාදන ආර්ථිකයක් සාර්ථක නොවේ. මෙරට ඇති මිලියන 22 ක් මිනිසුන් තනන කුඩා වෙළඳපොල ඉලක්ක කර මහා කර්මාන්ත මෙ රටේ ගොඩ නැගිය නොහැකි ය. එවන් ආදේශක කර්මාන්ත වෙත විදෙස් ආයෝජන පැමිණෙන්න ද නොමැත. එනයින් ආයෝජන ඉලක්ක කර, ප්‍රාග්ධනය හා තාක්ෂණය ගෙන්වා ගෙන, ගෝලීය වෙළඳපොල ඉලක්ක කර කෙරෙන නිෂ්පාදන ආර්ථිකයකට අපි ආවඩන්නෙමු. එනයින් අපනයන මූලික ආර්ථිකයක් ඇති කිරීමට අප කටයුතු කරන්නෙමු.

පුරවැසියා මූලික ආර්ථිකය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ මෙතෙක් පැවැති සුවිශේෂී දුර්වලකමක් නම් එය රාජ්‍ය මූලික ආර්ථිකයක් වීම ය. ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් ලෙස පැවැති ශ්‍රී ලංකාව සමාජවාදී ප්‍රතිපත්ති වෙනස් නොකොට ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලය වී ඇත්තේ රජය විසින් අධික නියාමනයක් කරනු ලබන, රජය විසින් විශාල කර්මාන්ත ප්‍රමාණයක් තමන් සතුව පවත්වාගෙන යන, ආර්ථිකයෙන් ලොකු පංගුවක් රාජ්‍ය යාන්ත්‍රණය තුළ සිර කරගෙන සිටින රාජ්‍ය මූලික ආර්ථිකයක් නිර්මාණය වීම ය.

රටේ ආර්ථිකයෙන් විශාල පංගුවක් අකාර්යක්ෂම රාජ්‍ය අංශය සතුව තබා ගැනීමත්, ඒ ඔස්සේ රාජ්‍ය බලය භාවිතාකර වෙළඳපොල ඒකාධිකාරයන් පවත්වාගෙන යාමත්, වෙළඳපොල තරඟකාරීත්වයට බධා කිරීමත්, ලයිසන් සහ පර්මිට් ක්‍රම මගින් පුද්ගලික අංශයට වැට කඩොලු බැඳීමත් නිසා මෙරටේ පවතිනුයේ ආර්ථිකය රාජ්‍ය විසින් මූලික කරගෙන පාලනය කරනු ලබන ක්‍රමයකි. ඒ තුළම දේශපාලන බලය ලබා ගනිමින් වංචා සහ දූෂණ බහුලව සිදුවන, වෙළඳපොල වාසි අසාධාරණ ලෙස ලබා ගන්නා තත්ත්වයක් ඇති වී තිබේ. මේ රාජ්‍ය මූලික ආර්ථිකය සමාජවාදී ක්‍රමයක පැන නගින අසාර්ථක ආර්ථික ක්‍රමයකි. අප එය රාජ්‍ය මූලික නොව පුරවැසියා මූලික ආර්ථික ක්‍රමයක් බවට පත් කළ යුතුව තිබේ.

රටේ ආර්ථිකයේ වගකීම පුද්ගලික අංශයට ලබා දී, පුරවැසියන් මගින් එය වර්ධනය වීමට අවශ්‍ය පසුබිම සකස් කොට, යටිතල පහසුකම් නිර්මාණය කොට, අවම නියාමනය ලබා දීම රජයෙන් කළ යුතු අවම කාර්යය යි. එවිට වඩාත් කාර්යක්ෂම පුද්ගලික අංශය විසින් රටට අවශ්‍ය ධනය උත්පාදනය කිරීම සිදුකරන අතර, ඒ ධනය ලාභාංශ ලෙස හා වැටුප් ලෙස වැඩ කරන ජනතාව අතර බෙදී යෑමත්, බදු ලෙස රජයට ලැබී එමගින්

සුබසාධනයට යොදා ගැනීමෙන් අනෙකුත් සේවා පවත්වාගෙන යෑමටත් හැකිවේ. එනයින් අපි වඩාත් ඵලදායී පුරවැසියා මූලික ආර්ථිකයක් නිර්මාණය කිරීමට කටයුතු කරන්නෙමු.

Invest Sri Lanka

- ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය අහෝසි කෙරේ.
- ඒ වෙනුවට ආයෝජන ප්‍රවර්ධනය, කළමනාකරණය, සහ ඒවාට පහසුකම් සැපයීම වෙනුවෙන් ''Invest Sri Lanka" නම් රාජ්‍ය ආයතනයක් පිහිටුවනු ලැබේ.
- ඒ සඳහා මේ රටේ සිටින පුද්ගලික අංශයේ දක්ෂතම ව්‍යාපාරවල සේවයේ නියුතු පුද්ගලයන් සේවයට බඳවා ගැනේ.
- මේ ආයතනය විදෙස් ආයෝජකයන්ට අවශ්‍ය සියලුම සේවා එක ම වහලක් යටින් සපයන ආයතනයයි.
- ආයෝජකයන් අමාත්‍යාංශ වෙතට යෑම, ඇමතිවරුන් හා අනෙකුත් රාජ්‍ය සේවකයන් සමග ගනුදෙනු කිරීම මින් මගහරවා ගැනේ.
- රටේ ආර්ථික ප්‍රතිපත්තියට අනුව නිර්මාණය කෙරෙන ජාතික සැළැස්ම අනුව ආයෝජන ගෙන්වා ගැනීමටත් ඒවා කළමනාකරණය කිරීමටත් මේ ආයතනයට බලය පැවරේ. අමාත්‍යාංශ වෙතට ගොස් බලපත්‍ර ලබා ගැනීම, අවසර ලබා ගැනීම ආදිය මෙම ආයතනය විසින් කර දෙනු ලබන අතර, කිසිදු ප්‍රමාදයකින් තොරව ඒවා සිදුකර ගෙන විනිවිදභාවයෙන් යුතු වංචා දූෂණ නොමැති ක්‍රමවේදයන් ඇති කෙරේ.
- එසේම ආයෝජකයන්ට අවශ්‍ය තොරතුරු නිවැරදිව හා ලෝකයේ ඕනෑම තැනක සිට විශ්ලේෂණය කළ හැකි ඩිජිටල්කරණ තාක්ෂණයෙන් රාජ්‍ය ශක්තිමත් කෙරේ.
- Ease of Doing Business Index හි ශ්‍රී ලංකාවේ අගය ඉහළ නැංවීම සඳහා මේ ආයතනය යටතේ වෙනම ක්‍රියාකාරී කමිටුවක් පත්කෙරේ. එම දර්ශකයේ නිර්ණායකයන් ඉලක්ක ගත

ආකාරයට දියුණු කිරීමට සැලසුම් සකස් කිරීම, ඒවා ඉටුකර ගැනීමට ඉලක්ක නිර්මාණය කිරීම සහ වාර්ෂිකව ඒවා අධීක්ෂණය කර දියුණු කරවීමට එම ක්‍රියාකාරී කමිටුවට බලය පැවරේ. එහි විධායක නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වලට අදාල KPI එම දර්ශකයේ ඉහළ යාම මත සකස් කෙරේ.

- මෙම Invest Sri Lanka ආයතනය අලුත් පනතකින් බලාත්මක කරන අතර, එහි ප්‍රධානියා සුදුසුකම් මත පත්කර ගත යුතු මූල්‍ය හා ආයෝජන ක්ෂේත්‍රයේ අන්තර්ජාතික අත්දැකීම් ඇති ප්‍රවීණයෙකු වියයුතු අතර, ඔහු හෝ ඇය සෘජුවම ජනාධිපතිවරයාට වාර්තා කරන ලෙස සැළසුම් සකස් කෙරේ.

- මෙම ආයතනයේ වැටුප් ආයෝජන ඉලක්ක සපුරා ගැනීම මත වැඩිවන ආකාරයට සකස් කෙරේ. දිරිදීමනා සහ බෝනස් ආදී උපක්‍රම මගින් කාර්යය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වැඩිවන උපක්‍රම යොදා ගැනේ.

- අලුත් නිදහස් වෙළෙඳ කළාප ඇති කිරීම සඳහා ඉඩම් වෙන් කරන අතර, ඒවා අපගේ පොදු Blueprint එකට අනුව, අනාගත කාර්මික නගර ආශ්‍රිතව තෝරා ගැනේ. විශේෂයෙන් අනාගත වෙළෙඳ වරාය නගර වන ත්‍රිකුණාමලය සහ හම්බන්තොටට වැඩි අවධානය යොමු කෙරේ.

- එම තෝරා ගත් කාර්මික නගර, වරාය නගර සහ වෙළෙඳ කලාප ආශ්‍රය කර ගෙන Public Private Partnerships යොදා ගනිමින් යටිතල පහසුකම් නිර්මාණය කිරීමට කටයුතු කෙරේ. එම කටයුතු අධීක්ෂණය කිරීම සහ ඉලක්ක ගත සැළසුමකට යොමු කිරීමට Invest Sri Lanka වෙත බලය ලැබේ.

- එම නිදහස් වෙළෙඳ කළාප මෙන් ම පවතින වෙළඳ කළාපවලට දැනට ලබා දී ඇති ඉඩම් උපරිමයෙන් භාවිතා කිරීමට අවශ්‍යකරන මෙහෙයවීම රජයෙන් ලබා දේ.

Spring Sri Lanka

- ''Spring Sri Lanka'' යනු විශේෂ ව්‍යාපෘතියක් ලෙස දියත් කරන ශ්‍රී ලංකාව තුළ නව ව්‍යාපාර/ Startups අලුතින් ආරම්භ කිරීමට අවශ්‍ය සහය ලබා දෙන රජයේ ආයතනයයි.

- එය ද නව පනතක් මගින් ඇති කරනු ලබන අතර, ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳව දැනුමක් ඇති අලුත් කාර්යය මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක කෙරේ.

- ඔවුන්ගේ කාර්යය නම් ශ්‍රී ලංකාව තුළ අලුතින් කර්මාන්ත ආරම්භ කරම ඕනෑම කෙනෙකුට අවශ්‍ය සහයෝගය ලබා දීමයි.

- ව්‍යාපාර ලියාපදිංචියේ සිට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීම, පුහුණුව ලබා ගැනීම, නියාමන ආයතනවලින් අවසර ලබා ගැනීම, වෙළඳපොල සොයා ගැනීම ආදී සියලුම අංශවලින් අලුත් ව්‍යවසායකයන් හට එකම වහලක් යටින් මග පෙන්වීම ලබා දෙයි.

- ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වා ගෙන යාමට රටතුළ ඇති බාධා හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට කටයුතු කිරීම මෙහි තවත් වගකීමකි.

- අලුත් ව්‍යාපාර ආරම්භ කිරීමටත් ඒවා සාර්ථක වනතුරු සහයෝගය ලබා දෙමින්, දැනුම හා තොරතුරු ලබා දෙමින්, මූල්‍ය සාක්ෂරතාවය දියුණු කරමින් අලුත් ව්‍යවසායකයන් සමග එක්ව ක්ෂේත්‍රයේම සිටිමින් උදව් කිරීම මෙම ව්‍යාපෘතියේ වගකීමයි.

- ඔවුන් හට ද වැටුප් හා දීමනා ලැබෙනුයේ KPI ක්‍රමයක ය. ඒ අනුව වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම මත වෘත්තිය ඉදිරි ගමන සකස් කෙරේ.

ආර්ථික පරිවර්තන කවුන්සිලය

රටක ආර්ථික ක්‍රමයක් පවතින අසාර්ථක ක්‍රමයක සිට අලුත් සාර්ථක ක්‍රමයකට ගෙන යෑමේදී සමාජයම පුළුල් පරිවර්තනයකට ලක් වෙයි. ඒ මක් නිසාද යත් පවතින ක්‍රමයෙන් ජීවනෝපාය සකස් කර ගත් පිරිසක් අලුත් ක්‍රමය තුළ අසාර්ථක වීමට ඇති ඉඩකඩ නිසා ය. එමගින් ඇති වන

බිය නිසා ම පවතින ආර්ථික ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන්නෝ වෙනස් වීමට නොකැමැත්තෝ වෙති.

ඉන් පැන නගින අසහනකාරී තත්ත්වය පුරවැසියන් තුළ වෙනස් වීමට ප්‍රතිරෝධයක් ඇති කරයි. එනයින් එම තත්ත්වය පූර්ව සූදානමකින් කළමනාකරණය කර ගැනීම වටී.

එසේම මෙහි දී සිදු වන ප්‍රතිසංස්කරණ පිළිබඳව ජනතාව තුළ අවිශ්වාසය හා සැකය ඇති විය හැක්කේ ය. විශේෂයෙන් රාජ්‍ය කර්මාන්ත නිදහස් කොට පුද්ගලික අංශයට ලබා දීම ජනතාව අතර ප්‍රසිද්ධ කරුණක් නොවේ. සිය රාජ්‍යයේ සම්පත්වලට කුමක් සිදුවන්නේ දැයි ජනතාව විමසිලිමත් වන අතර, එම ගනුදෙනුවලදී වංචා දූෂණ සිදුවන්නේ දැයි ඔවුන් අවධානයෙන් බලා සිටිති.

එසේ ම එම සම්පත් පුද්ගලික අංශයට පැවරීමෙන් ජනතාවට වඩාත් හොඳ ප්‍රතිලාභ ලැබෙන ක්‍රමයක් නිර්මාණය කිරීම කළ යුතු ය. එම සම්පත් වල වටිනාකම් නිවැරැදිව තක්සේරු කළ යුතුය.

එනයින් එම ප්‍රතිසංස්කරණ සඳහා විශේෂිත වැඩපිළිවෙලක් අවශ්‍ය වෙයි. එම වැඩපිළිවෙළ මගින් මේ පුළුල් ආර්ථික පරිවර්තනය ජනතාවගේ දිවි පැවැත්මට අභියෝගයක් නොවෙමින්, සමාජ ආර්ථික රටාවන් හට අවම කම්පනයක් ඇති කරමින් සිදු කර ගත යුතුය. එක හුදෙක් එක වර සිදුවන ක්ෂණික වෙනස් වීමක් නොව කාලයක් තුළ සෙමින් සිදුවන්නක් විය යුතුය. ඒ සඳහා පහත පියවර අනුගමනය කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.

- ආර්ථික පරිවර්තන කවුන්සිලයක් පිහිටුවීම සිදු කෙරේ.
- එමගින් යම් කිසි කාල පරාසයක් තුළ රටේ සැලසුම් කරන පරිවර්තනය ඉටුකර ගැනීමට කටයුතු සම්පාදනය කෙරේ.
- පුළුල් ජනතා දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- ජනතාවගේ, සේවකයන්ගේ දුක්ගැනිවිලි බාර ගැනීමට එහි කොටසක් වෙන් කෙරේ. එම දුක්ගැනවිලි විමර්ශනය කිරීම සහ ඒවාට පිළිතුරු සැපයීමට කවුන්සලය බැඳී සිටී.

- කිසිවෙකුටත් අසාධාරණයක් නොවන අයුරින් මෙන් ම කිසිවෙකුත් මග හැර නොයන අයුරින් නව ආර්ථික පරිවර්තනය සකස් කෙරේ.

- මෙහි සියලු කටයුතු විනිවිද භාවයෙන් ඉටු කරන අතර, එම කවුන්සිය විසින් වගවීම දරනු ලැබේ.

- පුද්ගලික අංශයට නිකුත් කරන රාජ්‍ය කර්මාන්තවල වෙළඳපොල වටිනාකම් ඇස්තමේන්තු කිරීම සඳහා ඒ සඳහා විශේෂඥ දැනුම සහිත සමාගම් වෙත ටෙන්ඩර් පටිපාටියට අනුගතව කොන්ත්‍රාත් ලබා දේ.

- එම වටිනාකම් සළකා බලා, මෙම කවුන්සිලයේ නිගමන අනුව රාජ්‍ය පරිපාලන නීති රාමුවට යටත්ව රාජ්‍ය කර්මාන්ත වෙළඳපොලට නිකුත් කිරීම සිදු කෙරේ.

- එම ගණුදෙනු විනිවිදභාවයෙන් ඉටුකළ යුතු අතර, තොරතුරු ජනතාවට හෙළි කළ යුතුය.

- නව ආර්ථිකයට ජනතාව හුරුකර ගැනීමත්, ජනතාවගේ වෙළඳපොල සාක්ෂරතාවය දියුණු කිරීමටත් මෙම කවුන්සිලය මගින් කටයුතු කෙරේ.

රාජ්‍ය භාණ්ඩාගාර මවු සමාගමක් පිහිටුවීම
State Treasury Holding Company

- රජය සතු පුද්ගලික අංශයට නිකුත් කළ නොහැකි කර්මාන්ත හා රාජ්‍ය ව්‍යවසායකත්වයේ යෙදෙන ආයතන මණ්ඩල, සංස්ථා, දෙපාර්තමේන්තු ආදී පරිපාලන මොඩල්වලින් වෙනස් කොට හැකි සෑම විටෙක ම සමාගම් මොඩලයකට ගෙන එනු ලැබේ. එම සමාගම්වල පරිපාලනය පිණිස ස්වාධීනත්වය ලැබෙන අතර සමාගම්වල කළමණාකාරීත්වය පුද්ගලික අංශයේ මෙන් සුදුසුකම් මත පත් කර ගත යුතුය.

- එම සමාගම් සියල්ලෙහි පාලනය පොදු එක් සමාගමකට ගනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයට අනුබද්ධ නව මවු

සමාගමක් නිර්මාණය කෙරේ. එය සියලුම රාජ්‍ය සතු සමාගම් සහ සමාගම් කොටස් කළමනාකරණය කරනු ලබන මවු සමාගම බවට පත් කෙරේ.

- එම මවු සමාගම විශේෂ විධිවිධාන සහිත පනතකින් නිර්මාණය කෙරේ.

- එම මවු සමාගම කළමනාකරණය කිරීමට රටේ බිහිවන දක්ෂ ම ආර්ථික කළමණාකරුවන් තරඟකාරීව සුදුසුකම් මත තෝරා පත් කර ගැනේ.

- එම ආයතන මගින් ලබන සාර්ථකත්වය මත, ලාභය මත එහි කාර්යය මණ්ඩලයේ KPI මැන බැලෙන අතර, ඒ අනුව ඔවුන්ගේ උසස් වීම් සහ ප්‍රසාද දීමනා තීරණය කෙරේ.

- මේ මවු සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය තෝරා පත්කර ගැනීමට කැබිනෙට්ටුවට සහ ජනාධිපතිවරයාට බලය ලැබේ.

- මවු සමාගමට අයත් අනෙකුත් සමාගම් වලට අධ්‍යක්ෂකවරුන් පත්කිරීම මවු සමාගමේ කළමනාකරණය මගින් ගනු ලබන තීරණ මත සිදු වෙයි.

- මෙම සමාගම් දේශපාලකයන්ගේ මැදිහත් වීමෙන් තොරව, ශිල්පිය දක්ෂතාවය සහ හැකියාවන් ඇති සුදුස්සන් විසින් පාලනය කරගෙන යන ක්‍රමවේදයන් ඇති කෙරේ.

- මහා භාණ්ඩාගාරයට අතිරික්ත ධනයක් රැස් වන විට එම ධනය වෙළඳපොල තුළ ඇති සමාගම්වල කොටස් වල ආයෝජනය කිරීමට මෙම මවු සමාගම් ඔස්සේ අවස්ථාව ලැබේ. ඒ අනුව රටේ අනාගතයට තැන්පත් ධනයක් ආයෝජන ලෙස රැස්කර තබා ගැනීමට මෙමගින් බලාපොරොත්තු වෙයි.

ප්‍රති ඒකාධිකාරී අධිකාරිය සහ ප්‍රති ඒකාධිකාරී පනත

නිදහස් වෙළඳපොලක් යනු සෑම විටම සර්ව සාධාරණ තත්ත්වයක්ද නොවේ. වෙළඳපොල ක්‍රමයක් තුළ ඇති විය හැකි දුර්වලතා රාශියක් තිබේ. ඒවා වෙළඳපොල ක්‍රමය අසාර්ථක කරනු ලබන අතර, එම දුර්වලතා

හඳුනා ගෙන ඒවා පාලනය කර ගැනීම රජයට හිමි අවම නියාමනයට අයත් වගකීමකි.

ඉන් ප්‍රධාන කොට සැළකිය හැකි දුර්වලතාවයක් ලෙස වෙළඳපොල ඒකාධිකාරයන් ඇති වීම හැඳින්විය හැකිය. ඇතැම් ඒකාධිකාරයන් රජය මගින් ඇතිකරනු ලබන ඒවා වන අතර තවත් ඒවා දූෂිත දේශපාලනයේ ආධාරයෙන් ඇතිවන ඒවා වෙයි. තවත් ඒවා වෙළඳපොල ක්‍රියාකාරිත්වය මතම ඇති වන ඒවා වෙයි. සියලු ඒකාධිකාරයන් නරක නොවන්නා සේ ම, හොඳ ද නොවේ. සමාජ ප්‍රතිලාභ අවම කරන වෙළඳපොල අසාර්ථක කරන ඒකාධිකාරයන් ඇති වන්නේ නම් ඒවාට මැදිහත්වී නිශේධනය කිරීම රජයක වගකීමයි. එබැවින් වෙළඳපොල තුළ පහත වෙනස් කම් කිරීමට කටයුතු කෙරේ.

1. වෙළෙඳපොළ නියාමන අධිකාරියක් පවත්වා ගැනීම. මේ අධිකාරිය මගින් ව්‍යාපාර හා වෙළඳපොල පොදුවේ විශ්ලේෂණය කළ යුතු අතර නිරන්තරයෙන් එහි තත්ත්වයන් ගැන නිරීක්ෂණය කරනු ලැබේ. එම අධිකාරිය වෙළඳපොල තරඟය නිවැරදිව පවත්වාගෙන යෑම කළ යුතුයි. සාධාරණ තරඟයක් නොපැත්තෙන, දුර්වල වෙළඳපොලවල් හඳුනා ගැනීමත් ඒවාට නිවැරදි විසඳුම් නිර්මාණය කිරීමත් එම අධිකාරිය සතු වගකීමකි.

2. ප්‍රති-ඒකාධිකාරී පනතක් සම්මත කර ගත යුතුයි. ඉහත කී අධිකාරියට ක්‍රියාත්මක වීමට වෙළඳ අධිකරණය තුළ බලාත්මක කළ හැකි ප්‍රති ඒකාධිකාරී පනතක් සම්මත කෙරේ. එම පනත මගින් අහිතකර ඒකාධිකාරයන් නිර්මාණයවීම වළක්වා ගනිමින් නියාමනය කෙරේ.

3. රජය මගින් වෙළඳපොල ඒකාධිකාරයන් නිර්මාණය කිරීමත්, පවතින ඒවාට අනුග්‍රහය ලබාදීමත් නොකෙරේ. රාජ්‍ය ඒකාධිකාරයන් පවතින කර්මාන්ත සඳහා අලුත් ආයෝජන ගෙන්වා ගෙන වෙළඳපොල කොටස අවම කර ගෙන, තරඟකාරීතවය ඇති කිරීමට කටයුතු කෙරේ.

කර්මාන්ත සහ ක්ෂේත්‍ර තෝරා ගැනීම.

කැණීම්

ශ්‍රී ලංකාවේ කැණීම් කිරීම සඳහා නිධි පිහිටා ඇත්තේ මිනිරන්, පොස්පේට් සහ ඉල්මනයිට් සඳහා පමණි. ගෝලීය සැපයුම්වලට සාපේක්ෂව මේවා

ඉතා කුඩා අගයන් වන අතර, ඒවායේ වාර්ෂික නිෂ්පාදනයන් සැලකිය යුතු තරම් ප්‍රමාණයක් නොමැත. එනිසා කැණීම් කර්මාන්තය යනු ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුල විශාල කාර්යයභාරයක් ඉටු කළ හැකි ක්ෂේත්‍රයක් නොවේ. එනයින් කැණීම් ක්ෂේත්‍රය මූලික කර ගෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කිරීම සිදු කළ නොහැක. අපට කළ හැක්කේ එම ක්ෂේත්‍ර තවත් ඉදිරියට ගෙන එමින් ඒවායේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීමට කළ හැකි දේ සිදු කිරීම පමණ ය. එසේ ම එම කැණීම්වලින් ලබා ගන්නා සැපයුම් සඳහා අගය එකතු කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීමත් පමණ ය.

මිනිරන් කර්මාන්තය සැලකීමේදී අප සතුව ඇත්තේ මිනිරන් ටොන් මිලියන 5 ක් පමණක් වන අතර මේ වනවිට වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන මිනිරන් ප්‍රමාණය ටොන් 10000 ක් පමණ ය. එය ලෝක වෙළඳපොල තුළ අපිට ලබා දී ඇත්තේ 0.3% ක තරම් වෙළඳපොල භාගයකි. බෝගල පතල ආශ්‍රිත කර්මාන්තය මේ වන විටත් ජර්මානු සමාගමක් යටතේ පවතින අතර, කහටගහ පතල සම්පූර්ණයෙන් රජය යටතේ පවතියි.
ඉල්මනයිට් සැලකීමේදී ද ශ්‍රී ලංකාව ඉතා කුඩා සැපයුම්කරුවෙකි. ලෝක වෙළඳපොල ඩොලර් මිලියන 900 ක් වෙද්දී අප ඉන් සපයන්නේ ඩොලර් මිලියන 50 ක පමණ ඉල්මනයිට් වෙති. පුල්මුඩේ කර්මාන්ත ශාලාවෙන් වාර්ෂිකව ඉල්මනයිට් ටොන් 40000 ක් ද, රූටයිල් ටොන් 25000 ක් ද සර්කොන් ටොන් 1200 ක් ද නිෂ්පාදනය කරන අතර ඒවා ටොන් එකක් ඩොලර් 240$, 1700$, 1900$ බැගින් මිලකට අලෙවි වෙයි. මේ වන විට දකුණේ ද ඇතැම් ප්‍රදේශවල ඉල්මනයිට් අඩංගු වැලි සහිත ප්‍රදේශ හඳුනාගෙන ඇතත්, තවමත් කැණීම් සඳහා යොදා ගෙන නොමැත. පුල්මුඩේ පිහිටා ඇති ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම ද සම්පූර්ණයෙන් රජය සතු සමාගමකි. මෙම ස්වාභාවික ඉල්මනයිට් ප්‍රමාණය ඉතා විශාල ප්‍රමාණයක් නොවන බැවින්, මේ වෙනුවෙන් අගය එකතු කරන පිරිපහදු ශ්‍රී ලංකාවේ නිර්මාණය කිරීමට ආයෝජන කැඳවීමට ඇති හැකියාව සාපේක්ෂව කුඩා ය. එහෙත් එම තත්ත්වය තවත් ඉදිරියට සලකා බලා ඒ සඳහා අවස්ථා ඇති නම්, ඉල්මනයිට් කැණීම් ව්‍යාප්ත කිරීමට කටයුතු කෙරේ.

එප්පාවල පොස්පේට් නිධියේ ශ්‍රී ලංකාව සතු මුළු පොස්පේට් ප්‍රමාණය ටොන් මිලියන 60 කට කිට්ටුය. මූලිකව පොස්පේට් ලොව පුරා යොදා ගනු ලබන්නේ රසායනික පොහොර නිෂ්පාදනයට වන අතර, එහි අනෙකුත් භාවිතාවන් සාපේක්ෂව කුඩා ය. ලෝකය සතුව පොස්පේට් මේ වන විට ටොන් බිලියන 72 ක් පවතින අතර, ඉන් අප සතුව ඇත්තේ 0.8% ක පමණ ප්‍රමාණයකි. එනම්, අප ලෝකය හමුවේ එතරම් විශාල පොස්පේට් නිධියකට හිමිකම් නොකියයි. එවැනි තත්ත්වයක් හමුවේ

ලෝක වෙළඳපොල තුළ සිටින කැණීම් ක්ෂේත්‍රයේ දවැන්තයින් සමග තරඟකොට වෙළඳපොල අල්ලා ගැනීමක් කිරීම දුෂ්කර ය. එනයින් දේශීය පොස්පේට් නිධියෙන් රටේ අවශ්‍යතාවයට සරිලන රසායනික පොහොර නිෂ්පාදනය කර ගැනීමට ප්‍රමුඛතාව ලබාදිය යුතුය. එමනිසා දේශීය රසායනික පොහොර නිෂ්පාදනය කිරීමට පුද්ගලික අංශයේ ආයෝජන කැඳවීම සිදුකළ යුතු අතර, දැනට සම්පූර්ණයෙන් රජය සතුව පවතින එප්පාවල පොස්පේට් සමාගම මගින් සැපයුම් ලබා ගෙන පුද්ගලික අංශය මගින් අගය එකතු කර පොහොර නිෂ්පාදනය සඳහා කටයුතු සකස් කෙරේ. එම පොහොර නිමි භාණ්ඩයක් ලෙස දේශීය කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්න අතර ම අන්තර්ජාතික වෙළඳපොලට සැපයීම සඳහා පහසුකම් සලසා දෙනු ලැබේ.

භූ විද්‍යා සහ පතල් කාර්යාංශය යාවත්කාලීන කොට මෙම ක්ෂේත්‍රයේ නියාමකයා බවට පත්කෙරේ. විද්‍යාත්මක පර්යේෂණ පැවත්වීම, පතල් කටයුතු අධීක්ෂණය, නව සම්පත් සොයා ගැනීම, පාරිසරික තත්ත්ව පවත්වාගෙන යෑම ආදී වගකීම් එයට පැවරේ. මෙම කාර්යාංශය රටේ කැණීම් නියාමකයා බවට පත් කෙරේ.

- රජය සතු කැණීම් කර්මාන්තයේ නියුතු සමාගම්වල අයිතිය මවු සමාගමක් නිර්මාණය කොට එයට පැවරේ. එම මවු සමාගම විසින් මෙම ක්ෂේත්‍ර වලට ඉලක්ක ලබා දීම, කළමනාකරණය, සංවර්ධනය කිරීම සිදුකෙරේ. එය මෙම ක්ෂේත්‍රයේ සංවර්ධකයාගේ කාර්යයභාරය ඉටු කෙරේ. එම මවු සමාගම ඉහතින් සඳහන් කළ රාජ්‍ය මවු සමාගම යටතට පත්කරන අතර, එම සමාගමේ ව්‍යාපාරික දැනුම සහ මෙහෙය වීම මත සියලුම ගෝලීය ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සහ ලාභ ඉපැයීම සිදු කෙරේ. එනයින් මේ පතල් සහ සමාගම් දේශපාලන බල අධිකාරියේ ඇඟිලි ගැසීම්වලින් තොරව සෘජු වෙළඳපොල ආර්ථික මොඩලය තුළ රාජ්‍ය සතු සමාගම් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

- මෙම සියලුම රාජ්‍ය සමාගම්, කාර්යක්ෂම සමාගම් මොඩලය තුළ, සුදුස්සන් නිලතලවලට පත්කිරීම, ඔවුන්ගේ දක්ෂතා ඇගයීම තුළින් උසස් වීම්, දීමනා සහ ප්‍රසාද දීමනා ලබා දීම් ආදී නූතන සංකල්ප මත ක්‍රියාත්මක කිරීමට අවකාශය සකස් කෙරේ.

ඉදිකිරීම්

ශ්‍රී ලංකාව අප වසර 25 ක් තුළ සංවර්ධිත රාජ්‍යයක් කරා ගෙන යන්නේ නම්, රටේ කාර්ය බහුලම ක්ෂේත්‍රය බවට ඉදිකිරීම් ක්ෂේත්‍රය පත්වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. එනම්, මෙතෙක් ආර්ථික සංවර්ධනය කරා ළඟා වූ අනෙකුත් සෑම රටක මෙන්ම ශ්‍රී ලංකාවේ ද ඉදිකිරීම් ක්ෂේත්‍රය වේගයෙන් ඔසවා තැබීම කළ යුතු ය. ඒ සඳහා ජාතික මට්ටමේ සැලසුම් නිර්මාණය කළ යුතු අතර, දැක්මත් සහිත රාජ්‍ය පරිපාලනයක් ඇති කිරීම තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉලක්ක නිර්මාණය කළ හැකිය. එනයින්, එයට අදාළ පොදු වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම රජයක කාර්යභාරය බැව් අපි විශ්වාස කරන්නෙමු. එම වැඩපිළිවෙල පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

Blueprint - ජාතික සැළැස්ම

අප මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ආරම්භයේ දී සඳහන් කළ අයුරින් මුළු රටට පොදු සැළසුමක් හෙවත් Blueprint එකක් නිර්මාණය කිරීම තුළ රටට පොදු දැක්මක්, ඉලක්කයක් ජාතික මට්ටමේ සැළැස්මක් නිර්මාණය වේ. එම සැළැස්මට අනුව වාසස්ථාන ප්‍රදේශ, කාර්මික ප්‍රදේශ හඳුනාගත හැකිවන අතර හරිත සංකල්ප මත නූතන ඉදිකිරීම, හරිත නගර නිර්මාණ, යටිතල පහසුකම් සකස් කිරීම සිදුකළ හැකිය. එනම්, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍යවන දීර්ඝකාලීන දැක්ම මින් ලැබෙන අතර, ඒ දැක්ම අනුව ඉදිරි අනාගතය සඳහා ආයෝජනය කිරීම, තාක්ෂණය ගෙන්වා ගැනීම, ප්‍රාග්ධනය යෙදවීම, ශ්‍රමිකයන් පුහුණු කරවා ගැනීම, මූල්‍ය පහසුකම් ලබා ගැනීම ආදිය වඩාත් වගවීමෙන් සිදු කළ හැකිය. රට ඒ ඉලක්කවලට යන්නේ නම්, සමාගම් විශාල කර ගනිමින් වර්ධනය කරගෙන වඩාත් දැවැන්ත ඉදිකිරීම් කිරීම වෙනුවෙන් අවශ්‍ය දැනුම හා තාක්ෂණය රැස් කර ගැනීමට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සමාගම්වලට හැකියාව ලැබේ.

නිවාස සැළැස්ම

රජයේ නිවාස ප්‍රතිපත්තිය අනුව, වාසස්ථාන සැලසුම් කිරීම් හා ඉදිකිරීම් පිළිබඳව වැඩපිළිවෙලක් සකස්කර ඇති බැවින් එම වැඩපිළිවෙලට අනුගතව ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා විශාල ඉල්ලුමක් ඇති වේ. එම ඉදිකිරීම් කළින් නිවාස සැළසුමේ ඉදිරිපත් කළ පරිදි සිදුකෙරෙන අතර, ඒ සඳහා පුද්ගලික අංශය කොන්ත්‍රාත් පදනම මත යොදා ගනේ. මෙම වේගවත් ඉල්ලුමට සැපයුම ලබා දීමට ඉදිකිරීම් කර්මාන්තය තුළ විශාල චින්තනයේ වෙනසක්, උත්තේජනයක් ඇති කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා රටතුළ පුළුල් අවකාශයක් නිර්මාණය කෙරේ.

ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම

ශ්‍රී ලංකාවට අවශ්‍ය වේගවත් සංවර්ධනය කරා යෑමේදී, ජාතික සැළසුමට අනුව ඉදිරි වසර 25 සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම පිළිබඳව සැළසුමක් නිර්මාණය කෙරේ.

රටතුළ ඇති වැලි නිධි, ඉදිකිරීම් සඳහා යොදා ගත හැකි කළුගල් ප්‍රමාණය, ටයිල් සහ අනෙකුත් මැටි, පෝසිලෙන් ආශ්‍රිත නිෂ්පාදන කිරීමට ඇති ධාරිතාවය ගණනය කෙරේ. ඒවා භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය වෙනුවෙන් ඇති කරන වෙනම අංශයක් මගින් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. එම ගණනය කිරීම් වලින් අනතුරුව වාර්ෂික

අවශ්‍යතාවය සළකා බලා ජාතික සැළැස්මට යටත්ව කළුගල් කැඩීම් සහ වැලි හෑරීම් සිදු කිරීමට බලපත්‍ර නිකුත් කෙරේ. එම බලපත්‍ර නිකුත් කිරීම ප්‍රසිද්ධ වෙන්දේසියක දී විනිවිදභාවයෙන් සිදුකරනු ලබන අතර, ජාතික අවශ්‍යතාවය සපිරෙන ආකාරයට එම කටයුතු නියාමනය කෙරේ.

එසේ ම ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ විවිධ සැපයුම් නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වෙළඳපොල තුළ ඇති අවස්ථා පුළුල් කෙරේ. විශේෂයෙන් ටයිල් වර්ග, නාන කාමර කට්ටල, සහ පොළොව සකස් කරන ග්‍රැනයිට් නිෂ්පාදන රට තුළින් නිෂ්පාදනය කරගැනීමට රාජ්‍ය දායකත්වය ලබා දෙනු ලැබේ. ඒ අනුව වේගයෙන් දියුණු වන ඉදිකිරීම් ක්ෂේත්‍රයට අඛණ්ඩ ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුමක් ලබාගැනීම ස්ථාවර කෙරේ.

පුහුණු ශ්‍රමිකයන් ඇති කිරීම.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේම සඳහන් නූතන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව අවශ්‍යවන ඉංජිනේරුවන් ප්‍රමාණය සහ තාක්ෂණික ශිල්පීන් ප්‍රමාණය ගණනය කෙරේ. අනතුරුව එම ප්‍රමාණය සපිරෙන ඉංජිනේරුවන් ප්‍රමාණයක් නිර්මාණය කෙරෙන ඉංජිනේරු පීඨ සහ පුද්ගලික විශ්වවිද්‍යාල ප්‍රමාණය ඇති කෙරේ. අනෙකුත් ක්ෂේත්‍රවල තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීමට වෘත්තීය පුහුණු අධිකාරියට ඉලක්ක ලබා දෙන අතර, අවශ්‍යවන නව තාක්ෂණය සහ දැනුම ගෙන්වා ගැනීමට රජය ආධාර අනුබල ලබා දෙයි. ඒ අතර දැනට විවිධ ආකාරයෙන් ශිල්පීය නිපුණතා ඇති කර ගත් පිරිස් හට ඔවුන්ගේ ශිල්පීය දක්ෂතා දියුණු කර ගෙන පිළිගත් සහතියක් ලබා ගැනීමේ වැඩපිළිවෙළ පුළුල් කෙරේ. ඒ අනුව සියලුම තාක්ෂණික ශිල්පීන් හට නිසි පුහුණුව ලබා වෘත්තීය බලපත්‍රයක් නිකුත් කරන වැඩ පිළිවෙලක් සකස් කෙරේ.

ඒ අනුව වාර්ෂිකව රටට අවශ්‍යවන ඉංජිනේරුවන් සහ අදාළ තාක්ෂණික ශිල්පීන් නිර්මාණය කරගනිමින් දියුණුවන ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය දියුණුකළ මානව සම්පත ලබා දීම ප්‍රත්‍යක්ෂ කෙරේ.

ප්‍රාග්ධනය

ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා දීර්ඝකාලීන ණය පහසුකම් ලබා දීමට සංවර්ධන බැංකු ක්‍රමයක් ඇති කෙරේ. එම සංවර්ධන බැංකුව මගින් රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අදාළවන ප්‍රාග්ධනය සපයා ගැනීමට කටයුතු කෙරේ. එසේ ම දේශීය ව්‍යාපෘති සඳහා විදෙස් ආයෝජන ගෙන්වා ගැනීම දිරිමත් කෙරෙන අතර Invest Sri Lanka සමග එක්ව එම ආයෝජන මගින් ඉදිකිරීම් සිදුකර ගෙන යෑමට කටයුතු කෙරේ.

රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව සහ නීතියේ පරමාධිපත්‍ය.

ඉදිකිරීම් ක්ෂේත්‍රයට දැනට තිබෙන ප්‍රභල බාධාවක් නම් රාජ්‍ය සේවයේ ඇති අකාර්යක්ෂමතාවය සහ නීතියේ දුර්වලකමයි.

ඉදිකිරීම් සඳහා ඉඩම් ලබාගැනීම, ඒවා නීත්‍යානුකූලව කරගැනීම, අවශ්‍ය කරන ඉදිකිරීම් පර්මිට් ලබා ගැනීම, රාජ්‍ය අනුමැතිය ලබාගැනීම, විදුලිය හා ජලය ලබා ගැනීම ආදී බොහෝ කරුණු කර ගැනීමට සිදුව ඇත්තේ දූෂිත දේශපාලන ක්‍රමවේදයන්ට අනුව අල්ලස් සහ වංචා සහගත ක්‍රම වලිනි. එම නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දියුණුවට ඇති බාධාව විශාලවන අතර ඒ නිසා ම අහිමි වන කාලය සහ වැය වන මිලක් තිබේ.

එසේම නීතිය ක්‍රියාත්මක වීමේ ඇති දුර්වලතා නිසා ඉදිකිරීම් කටයුතුවල ඇති වන නීතිමය ගැටලු නිරාකරණය කර ගැනීම් පමා වීමත්, එමනිසා විශාල කාලයක් හා මුදලක් නාස්ති වීමත් සිදු වේ. ඉදිකිරීම් ක්ෂේත්‍රය ඉදිරියට යෑමට නම් නීතිමය ගිවිසුම් පිළිබඳව එම සමාජයේ ඇති වගවීමත්, එම ගිවිසුම් සුරැකීම පිළිබඳව සමාජයක් ලෙස තැබිය හැකි විශ්වාසනීයත්වයත් වැදගත් වෙයි. දැවැන්ත ප්‍රාග්ධනයක් යට කිරීමට පෙර, ආයෝජන ගෙන්වා ගැනීමට පෙර මෙන්ම මූල්‍ය පහසුකම් ලබා ගැනීමට පෙර රටක මෙම ගිවිසුමක් රැකීමට ඇති විශ්වාසනීයත්වය ඇති කිරීම අත්‍යාවශ්‍යය.

එනයින්, අපි දිගින් දිගටම කියන මේ දේශපාලන ක්‍රමය වෙනස් කොට රටතුළ ඇති වන පුළුල් පරිවර්තනය නිසා රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ හා වෙළඳපොල ප්‍රතිසංස්කරණ මගින් වඩාත් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීමත්, නීතියේ පරමාධිපත්‍ය ඇතිකිරීමත් රටේ දියුණුවට අත්‍යාවශ්‍ය මූලික වෙනස්කම් වෙයි. එම මූලික පදනම දැමීම අපසතු ලොකු ම වගකීම බව අවධාරණය කරන්නෙමු.

දේශීය සමාගම් සඳහා ප්‍රමුඛතාව

රටේ ඉදිකිරීම් කර්මාන්තය ඉදිරියට දියුණු වන ප්‍රමාණය විශ්ලේෂණය කර, එම වෙළඳපොල පිළිබඳව පූර්ව අවබෝධයක් ලබා ගනිමින්, එම මුළු වෙළඳපොලෙන් වැඩි පංගුවක් හිමිකර ගැනීමට දේශීය ඉදිකිරීම් සමාගම් හට රාජ්‍ය දායකත්වය අවස්ථාව ලබා දේ. ඒ අනුව යමින් තරඟකාරීව දැනුමින්, තාක්ෂණයෙන්, ප්‍රාග්ධනයෙන් උසස් තරඟකාරී දේශීය ඉදිකිරීම් සමාගම් නිර්මාණය කරගැනීමට කටයුතු කෙරේ. එම සමාගම් හට දේශීයව නිර්මාණය වන නව ඉදිකිරීම් සඳහා තරඟකාරීව ප්‍රමුඛතාව ලබාදෙන අතර, ඒවායේ ගුණාත්මකභාවය දියුණු කර ගැනීමට අන්තර්ජාතිකව පිළිගත් සම්මතයන් හට අනුකූලවම නියාමනය කෙරේ.

නිෂ්පාදන

ශ්‍රී ලංකාවට නිෂ්පාදන ආර්ථිකයක් අවශ්‍ය බව බොහෝ දෙනාගේ පිළිගැනීම වී ඇති බව කරුණු අධ්‍යයනය කිරීමෙන් පැහැදිළි වෙයි. එනම්, භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෙවත් Manufacturing කෙරෙන, එය කේන්ද්‍ර කර ගත් ආර්ථිකයක් නිර්මාණය කිරීම මෙහි අදහසයි.

භාණ්ඩ නිෂ්පාදනය කොට ලෝක වෙළඳපොලට අලෙවි කිරීම හෙවත් අපනයන සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම මෙහි ප්‍රධාන ම අංගයයි. මෙම අපනයන ඉලක්ක කළ නිෂ්පාදන ආර්ථිකය නිර්මාණය කිරීමට අවශ්‍ය පදනම අපි දැනටමත් ඉහත දී ඔබට පැහැදිළි කර තිබේ.

ශ්‍රී ලංකාව තුළ ගෝලීයව විවෘත වුණ නිදහස් වෙළඳපොල ආර්ථිකයක් නිර්මාණය කළ යුතු බව අප කියා සිටියෙමු. එමගින් ප්‍රාග්ධනයට මෙන් ම අමුද්‍රව්‍ය හා භාණ්ඩවලට පහසුවෙන් ගලා යා හැකි දේශසීමා බාධක අවම වෙළඳපොල නියාමනය අවම, පිරිවැය අවම ක්‍රමයක් අප රට තුළ ඇති කළ යුතු වෙයි. එම ප්‍රාග්ධනය සහ භාණ්ඩ ගලා යෑමට විශ්වාසනීය මෙන්ම වගවන යටිතල පහසුකම් වලින් සපිරුණ කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනයක් සහ සේවා ක්ෂේත්‍රයක් නිර්මාණය කළ යුතුය.

එම මූලික සැකැස්ම නිවැරදිව පිහිටුවා ගත් පසුව රටතුළ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ආයෝජන කැඳවා ගත හැකිය. Invest Sri Lanka මගින් එම ආයෝජන ගෙන්වාගෙන පෙර කී කාර්මික වරාය නගර ආශ්‍රිතව රටේ නිර්මාණය වන විවිධ නිදහස් වෙළඳ කළාපවලට අනුයුක්ත කෙරේ. රටේ මේවන විට සිටින නුපුහුණු ශ්‍රම බලකායට, ශ්‍රමය මූලික කර්මාන්ත මුල් අවධියේ දී ගෙනඑනු ලබන අතර, ක්‍රමක්‍රමයෙන් ශ්‍රම

බලකාය නියමිත අධ්‍යාපන ක්‍රමයකින් දියුණු කිරීමේදී අනාගතයේදී තාක්ෂණය මූලික කරගත් කර්මාන්තවලට වෙනස් වීමේ හැකියාව ලැබේ.

එසේම Ease of Doing Business Index දර්ශකය දියුණු කිරීම මගින් මෙරට ව්‍යාපාර කිරීමට සුදුසු වටපිටාවක් නිර්මාණය කරන අතර, එනයින් නිෂ්පාදන ආර්ථිකයකට රුකුලක් ලැබේ.

මෙලෙස විදෙස් ආයෝජන ගෙන්වා ගැනීමත්, ඒවා මගින් ගෝලීය වෙළඳපොලට අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් මේ රට සංවර්ධනය දක්වා රැගෙන යන එන්ජිමයි. විදෙස් සංචිත ගොඩනගා ගැනීමත්, තාක්ෂණය ගෙන්වා ගැනීමත්, ප්‍රාග්ධනය ගෙන්වා ගැනීමටත් කළ හැකි මාර්ගය එයයි. එසේ ම විශාල පරිමාණයේ කර්මාන්ත ඇති කොට රැකියා විශාල සංඛ්‍යාවක් නිර්මාණය කළ හැක්කේ ද මෙමගිනි.

ඒ සමග ම කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යාපාරිකයින් සහ ව්‍යවසායකයින් මගින් රට තුළ අනෙකුත් නිෂ්පාදන කර ගෙන යෑම සඳහා වැඩපිළිවෙලක් සකස් කෙරේ. ඉහතින් කී Spring Sri Lanka යටතේ අලුතින් ව්‍යාපාරවලට එළඹෙන්නන් සාර්ථක කරවීම සඳහා සැලසුම් නිර්මාණය වන අතර, දැනට පවතින ව්‍යවසායන් හට ඊළඟ අදියරට යෑමට සහ ස්ථාවරවීමට සහය ලැබේ. රටේ ආර්ථිකයේ සමස්තය තුළ ඇති වන පුබුදුව ඔස්සේ රට තුළ ගොඩනැගෙන සාමූහික වෙළඳපොල ඉල්ලුම මගින් මේ ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ ප්‍රතිලාභ වැඩි කෙරේ. ඒත් සමගම මේ දේශීය ව්‍යාපාරිකයන් විසින් කරනු ලබන අලුත් ආයෝජන හා කර්මාන්ත, භාණ්ඩ නිෂ්පාදනය ලෝක වෙළඳපොල තුළට රැගෙන යාමට අවශ්‍ය තරඟකාරී ගුණාත්මකභාවය ඇතිකර ගැනීමට රජය මගින් මෙහෙයවීමක් ලබා දෙනු ලැබේ.

මෙලෙස නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම සමග, එයට සමගාමීව රට තුළ අනෙකුත් සේවා වර්ධනය විය යුතු අතර ඒවා පිළිබඳව පහත සාකච්ඡා කෙරේ.

කෘෂි කාර්මික

කෘෂිකර්මාන්තය යනු රටේ ප්‍රභල ම ආර්ථික ක්ෂේත්‍රයක් වන අතර, ඒ සඳහා වන වැඩපිළිවෙල අප කෘෂිකර්මාන්තය සඳහා වූ වෙන ම ප්‍රතිපත්ති ඇතුළත් උපශීර්ෂය යටතේ ඉදිරිපත් කර ඇත. එනයින්, ඒ පිළිබඳව මෙහිදී සඳහන් නොකරන්නෙමු.

සේවා

ගුවන් සේවා

ඔබට ඉහතදී පැහැදිළි කළ අයුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම අනුව එය ලොව වැදගත් ම පිහිටීමකට උරුමකම් කියයි. මහද්වීප 4 කින් ද ආර්ථික කලාප 7 කින් ද වටවූ මේ දිවයින ලෝක බලවතෙකු ලෙස වැඩෙන දැවැන්ත ඉන්දියාවේ අසල්වැසියා යි. මෙම වේගයෙන් වර්ධනය වන මිනිසුන් බිලියන 1.4 කින් සමන්විත ඉන්දීය වෙළඳපොල යනු ඉදිරි දශක කීපය තුළ ගුවන් ගමන් කර්මාන්තය වේගයෙන් ම වර්ධනය වන කළාපයයි. ලෝකයේ අනෙක් සියලුම රාජ්‍යයන් ඉන්දියාව සමග ගනුදෙනු කිරීම ඉහළ යන අතර, එහි සෘජු ප්‍රතිඵලයක් වන්නේ ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රසාරණය වීමයි.

එසේ ම, ඉන්දියාව යනු දැවැන්ත ප්‍රාන්ත රාජ්‍යයයන් සහිත විශාල ගුවන් කළාපයක් වීම නිසා, ඉන්දියාව තුළ හෝ එය ආසන්නයේ ඉන්දීය ප්‍රාදේශීය ගුවන් පථ යා කරමින් ගුවන් සේවා මධ්‍යාස්ථානයක් බිහි වීමේ විශාල ඉඩක් පවතී. මැදපෙරදිග සහ පැසිෆික් කළාපීය ගුවන් සමාගම් ඉන්දීය කළාපය තුළ ස්ථාවර වීමට උචිත ස්ථානයක් සෙවීමේ දී ශ්‍රී ලංකාවට ඉන් වැදගත් ම තැනක් හිමි වන අනිවාර්යයෙන් කිව හැකිය. එනම්, ශ්‍රී ලංකාවේ ගුවන්ගමන් කර්මාන්තය රටේ නුදුරු අනාගතයේ දී ඉක්මනින් වර්ධනය කළ යුතු කර්මාන්තයකි.

ඒ සඳහා පහත ක්‍රියාදාමයන් ගනු ලැබේ.

1. ශ්‍රී ලංකන් ගුවන් සේවය පුද්ගලීකරණය කෙරේ. එහි අලාභය මහා භාණ්ඩාගාරයට දරා ගැනීමට සිදුවන නමුත් තවදුරටත් පාඩු ලබමින් එක ක්‍රියාත්මක කිරීමේ වුවමනාවක් රජයට නොමැත.

2. ශ්‍රී ලංකන් කේටරින් සමාගම පුද්ගලීකරණය කෙරේ.

3. කටුනායක ගුවන් තොටුපොළ පොදු සමාගමක් බවට පත් කෙරේ. එය සමාගම නූතන සමාගම් ව්‍යුහයකින් ක්‍රියාත්මක කරනු ලැබේ. එහි අයිතිය ඉහතින් කී රාජ්‍ය භාණ්ඩාගාර මවු සමාගම වෙත පැවරෙන අතර මෙම නව සමාගම දේශපාලන අත පෙවීම් සහ මැදිහත් වීම්වලින් වළක්වා ගැනේ.

4. කටුනායක ගුවන් තොටුපොළ අනෙකුත් ජාත්‍යන්තර ගුවන් මෙහෙයුම් සඳහා මධ්‍යස්ථානයක් ලෙස දියුණු කෙරේ.

5. එම ඉලක්ක ඉටුකර ගැනීමට සුදුසු පහසුකම් සහ යටිතල පහසුකම්වලින් සමන්විත ගුවන් සේවා කළාපයක් කටුනායක අවට නිර්මාණය කෙරේ.

6. රටේ අනෙකුත් ගුවන් තොටුපොළ ද ස්වාධීන රාජ්‍ය සමාගම් බවට පත් කෙරේ. ඒවායේ සෘජු අයිතිය ද රාජ්‍ය භාණ්ඩාගාර මවු සමාගම වෙත පැවරේ. එම ගුවන් තොටුපොළ සියල්ල ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, එහෙත් ස්වාධීනව සංවර්ධනය කර දියුණු කිරීමේ නිදහස එම සමාගම් වල පරිපාලනයට ලබා දෙයි.

7. ඒවායේ තනතුරුවලට සේවකයන් පත් කිරීම, උසස් වීම් හා දීමනා ලබා දීම, ඔවුන්ගේ සුදුසුකම් සහ KPI මත තීරණය වනු ලබන අතර, ඒවා දේශපාලන මැදිහත් වීම්වලින් නිදහස් වේ.

වරාය සේවා

ඉහත කී පරිදි ම ලෝකයේ ප්‍රධාන මුහුදු මාර්ගයකට මුහුණ ලා පිහිටි හෙයින් ද ඉන්දියාවට සමීපයේ ඇති වසරේ සෑම කාලයක ම භාවිතා කළ හැකි ගැඹුරු වරායන්ගෙන් යුක්ත වීම ද හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ වරාය සහ නැව් සේවාව යනු විශාල විභවයක් ඇති කර්මාන්තයකි. ඒ නිසා ම දැනටමත් අන්තර්ජාතික වෙළඳපොල තුළ බහාලුම් හුවමාරු කරනා වරායක් ලෙස නම් දරා ඇති කොළඹ වරාය තුළ ඉදිරියට නව ජැටි ඇති වනු දකින්නට ලැබේවි. විශේෂයෙන් බටහිර ජැටිය නිර්මාණය වීමත්, ඉන්දියාවේ වෙළඳපොල වර්ධනය වීමත් සමග ම තව දුරටත් විශාල නැව් යන එන නාවික මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් වනු අනිවාර්යය වෙයි. අප කළ යුත්තේ එම අවස්ථාවන් නිවැරදිව

ප්‍රයෝජනයට ගෙන රටට වඩාත් වාසිදායක ලෙස ආර්ථික ප්‍රතිලාභ ලැබෙන අයුරින් ඒවා භාවිතා කිරීම පමණය.

- නාවික සේවයට එක් වීමට අලුත් සීමන්වරුන් හා නැව් සේවා ආශ්‍රිත තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීම සඳහා අවස්ථා පුළුල් කළයුතු අතර, ඒ වෙනුවෙන් වෙන මම සියලු පහසුකම් සහිත ඇකඩමියක් නිර්මාණය කළ යුතු බව අපි විශ්වාස කරන්නෙමු. ඒ සමග ම වේගයෙන් දියුණු වන මේ ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත රට තුළින් සපයා ගැනීමට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදෙන අතර, දේශීය රැකියා වෙළඳපොලට එමගින් හොඳ අවස්ථාවක් ලැබේ.

- බලශක්ති වෙළඳපොල නිදහස් කොට මේ දියුණුවන වරාය සේවා වෙනුවෙන් වඩා විශ්වාසනීය සහ තරඟකාරී බලශක්ති සැපයුමක් ස්ථාවර කිරීමට කටයුතු කෙරේ.

- කොළඹ වරාය සහ දැනට තිබෙන හා අලුතින් ඇති කරන නිදහස් වෙළඳ කළාප යා කරමින් පුළුල් මහාමාර්ග ජාලයක් සැලසුම් කරන අතර, බහාලුම් ප්‍රවාහනය ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම කර ගැනීමට කටයුතු සම්පාදනය කෙරේ.

- කොළඹ, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට යන වරායන් දුම්රිය මාර්ග මගින් යා කෙරේ. එම වරාය නගර ආශ්‍රිතව කාර්මික ජනපද බිහි කරන අතර, ඒවාතුළ නිදහස් වෙළෙඳ කළාප බිහි කෙරේ.

- ප්‍රවාහන ප්‍රතිපත්තියේ විස්තර කෙරෙන ආකාරයට කුරුණෑගල සහ කළුතර වියළි වරාය භූමි නිර්මාණය කෙරෙන අතර, බහාලුම් බාර ගැනීම, බෙදා හැරීම හා ඒවා දිය වරායට දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමට යාන්ත්‍රණයක් සකස් කෙරේ.

- කොළඹ වරාය තුළ තෝරා ගත් බහාලුම් හුවමාරු පර්යන්ත ආශ්‍රිතව නිදහස් වෙළඳ කළාප ඇතිකෙරේ. ඒවායෙන් ලබාදෙන බදු සහන මගින් නාවික සැපයුම් ජාල උත්තේජනය කොට වඩා වැඩි බහාලුම් හුවමාරු ක්‍රමයක් ඇතිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වෙළඳපොල කටයුතු ඉවත් කොට ඒ වෙනුවෙන් නව රාජ්‍ය සමාගමක් නිර්මාණය කෙරේ. එම නව සමාගම රාජ්‍ය භාණ්ඩාගාර මවු සමාගමට පැවරේ.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය වරාය හා නාවික සේවාවල සංවර්ධකයා ලෙස ද නියාමකයා ලෙස ද කටයුතු කිරීමට නව පනතක් සකස් කෙරේ. ඒ අනුව නාවික ක්ෂේත්‍රය තුළ අවශ්‍ය සංවර්ධනය සැලසුම් කිරීම, ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, අපේක්ෂිත සේවා නියාමනය කිරීම හා ඒවා අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පවත්වා ගෙන යෑම එම අධිකාරියට පැවරෙන වගකීම් වෙයි.

රක්ෂණ

- රක්ෂණ ක්ෂේත්‍රයට රජය හවුල් නොවේ. එම වෙළඳපොල නිදහස් කරනු ලබන අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කෙරේ.

- කෘෂි රක්ෂණ මණ්ඩලය අහෝසි කෙරේ. ඒ වෙනුවෙන් ගොවීන් සඳහා රක්ෂණ වෙළඳපොල තුළ, පුද්ගලික අංශය මගින් නව කෘෂි රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කෙරේ. (මේ පිළිබඳව වැඩි දුර තොරතුරු කෘෂිකර්මාන්තය පිළිබඳව ප්‍රතිපත්ති තුළ ඇතුළත් වෙයි.)

- ජනතාවට වඩාත් යහපත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් පිළිබඳව ජාතික වැඩපිළිවෙලක් ඇති කෙරේ. ඒ සඳහා පුද්ගලික අංශය මූලික කර ගත් වෙළඳපොල ක්‍රමයක් නිර්මාණය කෙරේ. එම රක්ෂණාවරණය සඳහා පුරවැසියාට සිය සේවක අර්ථසාධක අරමුදලෙන් ගෙවිය හැකි ක්‍රමයක් ඇති කෙරේ. එම රක්ෂණාවරණය සිය පවුල වෙනුවෙන්ම ලබා ගැනීමේ හැකියාව ඇති කෙරේ. එය භාවිත කොට පුද්ගලික අංශයෙන් සෞඛ්‍යසේවා ලබාගැනීමට පුරවැසියන් හට අවස්ථාව ලබා දෙනු ලැබේ.

- රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන් හට කොමිස් මුදල පමණක් ලැබෙන ක්‍රමය වෙනුවට යම් මූලික වැටුපක් ලැබෙන ක්‍රමයක් සකස් කිරීමට කටයුතු කෙරේ. ඔවුන්ගේ රැකියාවල අභිවෘද්ධියට,

රැකියා සුරක්ෂිතතාවය ආරක්ෂාවෙන වැඩපිළිවෙලක් සකස් කෙරේ.

මූල්‍ය

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ සිදු කළයුතු මූලිකම ප්‍රතිසංස්කරණ නම් මහ බැංකුව ස්වාධීනත්වයට පත් කිරීමයි. එමගින් රජයේ අයවැය හිඟය අත්තනෝමතික ලෙස මහ බැංකුව මගින් සපයා ගැනීම වැළැක්වීම සිදු කෙරේ. මහ බැංකුව ස්වාධීන ආයතනයක් ලෙස දේශපාලන බලපෑමෙන් තොරව මහජනතාව වෙනුවෙන් සේවය කරන මහජන ආයතනයක් බවට පත් කෙරෙන අතර එමගින් මුදලේ අගය ආරක්ෂා කර ගැනීමත්, රටතුළ ප්‍රමාණවත් විදෙස් සංචිත පවත්වාගෙන යෑමත්, විදෙස් මුදල් හුවමාරු අගයන් දීර්ඝකාලීනව ස්ථාවර කර ගැනීමත් සිදු කෙරේ.

- මූල්‍ය ක්ෂේත්‍රය තුළ රාජ්‍ය අංශයේ සහභාගීත්වය පවත්වා ගැනේ. රජය සතු බැංකු රාජ්‍ය අංශය තුළ පවත්වා ගෙන යනු ලබන අතර, ඒවායේ කළමණාකාරීත්වය දේශපාලන බලපෑමෙන් තොර ස්වාධීනත්වයට පත් කෙරේ. එම රාජ්‍ය බැංකු පුද්ගලික අංශය සමග තරඟකාරීව මූල්‍ය සේවා සපයන වාණිජ බැංකු ලෙස දියුණු කෙරේ.

- මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ හවුල් ව්‍යාපාරයක් ලෙස අලුත් රාජ්‍ය සංවර්ධන බැංකුවක් ස්ථාපිත කෙරේ. එම නව සංවර්ධන බැංකුවේ අරමුණ වන්නේ රටේ සංවර්ධනය පිණිස ප්‍රාග්ධනය සැපයීමයි. යටිතල පහසුකම් නිර්මාණය කිරීම, නව ව්‍යවසායකයන් හට අලුත් ව්‍යාපාර ආරම්භ කිරීමට ණය ලබා වීම, අලුත් ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධනය සැපයීම ආදිය මෙම නව බැංකුවේ ප්‍රමුඛ කාර්යභාරයයි. ඒ අනුව එම නව බැංකුවට වාර්ෂික ඉලක්ක සැපයෙන අතර, එම බැංකුවේ සාර්ථකත්වය සහ එහි කාර්යමණ්ඩලයේ සාර්ථකත්වය එම සපුරා ගන්නා ඉලක්ක මත තීරණය කෙරේ.

- ප්‍රධාන වාණිජ බැංකු ක්ෂුද්‍ර මූල්‍ය වෙළඳපොලෙන් ඉවත් කෙරේ. ඒ වෙනුවෙන් වෙන්වූ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වන සණසස, සමෘද්ධි බැංකු ආදියට එහි වගකීම පැවරෙන අතර, ඒවා පුළුල් කිරීමට කටයුතු කෙරේ. ක්ෂුද්‍ර මූල්‍ය වෙළඳපොල තුළ තොරතුරු හා දත්ත පරිඝණකගත කරනු ලබන අතර, ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගන්නා

ණය හිමියන්ගේ නාමාවලියක් සහ දත්ත එම ක්ෂේත්‍රයේ සියලු පාර්ශව සමග හුවමාරු කර ගැනේ. ඒ අනුව එම ක්ෂුද්‍ර මූල්‍ය ණය හිමියන් සිය ගෙවීමේ හැකියාවෙන් ඔබ්බට ණය ලබා ගැනීම වළක්වා ගැනේ. ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය නම්, පුද්ගලික අංශයට එය විවෘත කෙරේ. ක්ෂුද්‍ර මූල්‍ය ණය නියාමනය කිරීමට මහ බැංකුවට ඒ සඳහා ම වෙන්වූ නව ඒකකයක් නිර්මාණය කෙරේ. එමගින් ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම, විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය තැන්වල දී මැදිහත්වීම් කිරීමට එම ඒකකයට බලය පැවරේ.

- රටේ සෑම පුරවැසියෙකුගේ ම සහ ආයතන/සංවිධානවල මූල්‍ය ගණුදෙනු අධීක්ෂණය කළ හැකි පොදු ක්‍රමයක් සකස් කෙරේ. එමගින් රට තුළ කුමන බැංකුවක් සමග ගණුදෙනු කළ ද මුදල් ලැබීම් සහ ගෙවීම් අධීක්ෂණය කළ හැකි නීති සම්පාදනය කෙරේ. නියමිත බදු අය කර ගැනීම්, නිවැරදි ආදායම් හෙළි කර ගැනීම්, මුළු මූල්‍ය ණයගැතිභාවය ගණනය කරගැනීම් ආදියට එම තොරතුරු අත්‍යාවශ්‍ය බැවින්, රටේ මූල්‍ය වෙළඳපොල වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණෙන් මේ දත්ත සොයා ගැනීම පහසු කෙරේ. ඒ අනුව යමින් රටතුළ වඩාත් හොඳ මූල්‍ය විනිවිදභාවයක් ඇති කරනු ලබන අතර, ඒ ඔස්සේ රටේ බදු ප්‍රතිපත්තිය නිවැරදි දිශාවකට යොමු කර ගැනීමට කටයුතු කෙරේ.

- මූල්‍ය වෙළඳපොල ද්‍රවශීලතාවය ඉහළ දැමීමට කටයුතු කෙරේ. කොටස් වෙළඳපොල තුළ දේශීය මෙන් ම විදේශීය ගනුදෙනුකරුවන් සඳහා අවස්ථා වැඩි කර සහභාගීත්වය ඉහළ නංවා ගැනේ. දැනට පවතින වෙළඳපොල බාධා ඉවත් කොට කොටස් වෙළඳපොල වඩාත් නිදහස් වෙළඳපොල අවකාශයක් බවට පත් කෙරේ.

- කොටස් වෙළඳපොල තුළ ඇති සමාගම් ප්‍රමාණය ඉහළ දැමීමට පසුබිම සකස් කෙරේ. එමගින් ජනතාවට වඩාත් හොඳ ආයෝජන අවස්ථා විවෘත කෙරේ.

- රාජ්‍ය භාණ්ඩාගාර මවු සමාගම්වලට අයත් උපක්‍රමශීලීව තෝරා ගත් සුදුසු සමාගම්වල කොටස්, රජය සතුව වැඩි කොටස් ප්‍රමාණයක් රැඳෙන සේ වෙළඳපොලට නිකුත් කෙරේ. එමගින්

කොටස් වෙළඳපොල තුළ ක්‍රියාකාරිත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කරන අතර වක්‍ර ආයෝජන දිරිමත් කෙරේ.

- මහජනතාව සඳහා විවෘත වූ නව ඒකක භාරයන් ඇති කිරීමට කටයුතු කෙරේ. එමගින් මූල්‍ය සමාගම් වලින් ඔබ්බට ගිය, මහජනතාවට සිය ධනය ආයෝජනය කිරීම සඳහා අවස්ථා ඉහළ නංවා ගැනේ.

විශ්‍රාම සේවා

- විශ්‍රාම ක්‍රමවේදය සංශෝධනය කෙරේ. සේවක අර්ථසාධක අරමුදල් පනත යාවත්කාලීන කෙරේ. එමගින් මහ බැංකුවට එය කළමනාකරණය කිරීමට ඇති අවස්ථාව වෙනස් කෙරේ. ඒ සඳහා ස්වාධීන නව මූල්‍ය ආයතයක් ලෙස සේවක අර්ථ සාධක අරමුදල යළි ස්ථාපිත කෙරේ.

- අනාගතයේ දී සේවක අර්ථසාධක අරමුදල බහුවිධ මහජන අරමුදලක් බවට පත් කෙරේ. පුද්ගලික අංශය මෙන් ම රාජ්‍ය අංශය ද එයට යොමුකරන අතර එය සියලුම වැඩ කරන ජනතාව වෙනුවෙන් වන පොදු මධ්‍යගත අරමුදලක් ලෙස සකස් කෙරේ.

- ඒ අනුව රජය මගින් දැනට ක්‍රියාත්මක කරන රජයේ සේවකයන්ට පමණක් රජයේ වියදමෙන් විශ්‍රාම වැටුප් ගෙවන ක්‍රමවේදයන් වෙනස් කෙරේ. ඒ අනුව රජයේ හෝ පුද්ගලික අංශයේ යැයි වෙනසක් නොකොට සියලුම වැඩකරන පුරවැසියන් හට සාධාරණ විශ්‍රාම වැටුපක් ලැබෙන අරමුදලක් නිර්මාණය කෙරේ. එම අරමුදලට සේවකයා සහ සේව්‍යයා යන දෙපාර්ශවයේ ම සහභාගීත්වය මත ගණනය කළ කොටසක් මාස් පතා තැන්පත් කිරීමට කටයුතු කෙරේ.

- එසේම එම මධ්‍යගත පොදු අරමුදලේ සියලුම වැඩකරන ජනතාව වෙනුවෙන් ගිණුම් ක්‍රියාත්මක කරන අතර ඒවා ඩිජිටල්කරණය මගින් විනිවිදභාවය හා වගවීම සනාථ කෙරේ.

- එම අරමුදල මගින් පවුලට ම සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු සම්පාදනය කෙරේ.

- එසේ ම එම අරමුදල ඇපයට ගෙන නිවාස ණය ලබා ගැනීමට ඉඩකඩ සැපයෙන අතර, ඒ මගින් රටේ සියලුම වැඩ කරන ජනතාවට නිවසක් හිමිකර ගැනීමට ඇති අවස්ථාව නිර්මාණය කෙරේ.

- අරමුදලේ තමන් ඉතිරිකළ මුදල විශ්‍රාම දිවිය අවසානයේ ලබා ගතහැකි ක්‍රම පුළුල් කෙරේ. ඒවා සිය කැමැත්ත සහ අවශ්‍යතාවය පරිදි තව දුරටත් ආයෝජනය කිරීමටත්, මාස්පතා හෝ කොටස් වශයෙන් ලබා ගැනීමටත් ඇති අවස්ථාවන් පුළුල් කෙරේ. මෙම අරමුදලේ ඇත්තේ ඔවුන් ඉපැයූ ධනය බැවින් සිය විශ්‍රාම වැටුප ගැන තීරණය කිරීමට පුරවැසියාට ඇති අයිතිය සුරැකේ.

ප්‍රවාහන

ප්‍රවාහනය පිළිබඳව දීර්ඝ ලෙස ප්‍රවාහන ප්‍රතිපත්තිය යටතේ සාකච්ඡා කර තිබේ.

වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම

රාජ්‍යයන් අපනයනය මූලික කරගත් නිෂ්පාදන ආර්ථිකයකට ගමන් කරන විට සිය නිෂ්පාදන සඳහා වෙළඳපොල බාධා අවම, තීරු බදු සහන ලැබෙන පහසු වෙළඳපොල මාර්ග නිර්මාණය කරගැනීම අත්‍යාවශ්‍ය වෙයි. ලෝකයේ විශේෂ ආර්ථික කළාප සහ රාජ්‍යයන් සමග එලෙස ඇතිකර ගන්නා වෙළෙඳ ගිවිසුම් මගින් එම වෙළඳපොල වෙත අපට පහසු පිවිසුමක් ලැබෙන අතර, එම පිවිසුම සාපේක්ෂව ලාභදායක බැවින්, එය හේතු කොටගෙන අප රටට නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා ආයෝජන ගලා ගෙන එනු ලැබේ.

ආයෝජකයන් විසින් යම්කිසි රටක්, සිය ආයෝජනය සඳහා තෝරා ගන්නා විට මෙම වෙළඳ ගිවිසුම් ගැන සැළකිලිමත් වන අතර, ඔවුන් නිෂ්පාදන කිරීමට බලාපොරොත්තු වන භාණ්ඩය අලෙවි කිරීම සඳහා බදු අවම, බාධා ආවම පහසු මාර්ගයක් තිබේ නම්, ඔවුන් මෙරටට ආයෝජන රැගෙන ඒමට පෙළඹෙයි. මෙය ගෝලීය තරඟකාරීත්වයක් වන අතර, මෙම වෙළඳ ගිවිසුම් ඇතිකර ගැනීමට අප විශේෂයෙන් කටයුතු කළ යුතුය. දැනට අප සතුව ඇත්තේ එවන් ගිවිසුම් තුනක් පමණක් වන අතර අප අපගේ රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා දියුණු කර ලෝකය සමග සාකච්ඡා කොට නව වෙළඳ ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වෙයි.

එසේ ම, ඒ සඳහා වෙළඳපොල මිතුරු විදෙස් සේවයක් පවත්වාගෙන යෑම අත්‍යාවශ්‍යය. අපගේ විදේශ ප්‍රතිපත්තිය තුළ වෙළඳපොල මිතුරු වීම පිළිබඳවත්, වෙළඳ ගිවිසුම් ඇතිකර ගනීම පිළිබඳවත් සාකච්ඡා කෙරේ.

සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය

අප විශ්වාස කරන පරිදි රටක සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සකස් විය යුත්තේ දිගුකාලීනව හැකි උපරිම විභව ආර්ථික වේගයක් පවත්වා ගන්නා අතර, කෙටිකාලීනව ආර්ථික වර්ධන වේගයේ සිදුවන උච්ඡාවචනයන් අවම කරගනිමින් ආර්ථික ස්ථායීතාවය පවත්වා ගැනීමට ඉඩ සලසන ආකාරයකිනි. ඉහත විස්තර කළ අපගේ ආර්ථික දේශපාලන උපාය මාර්ගවල අවසන් අභිලාශය වන්නේ දිගුකාලීනව හැකි උපරිම විභව ආර්ථික වේගයක් පවත්වා ගැනීම මගින් රටේ ඒක පුද්ගල ආදායම ඉහළ යාමට සලස්වා දශක කිහිපයක් ඇතුළත ශ්‍රී ලංකාව සංවර්ධිත රාජ්‍යයක් බවට පත් කිරීම සහ ඉන් පසුව එම තත්ත්වය ගිලිහෙන්නට නොදී තවදුරටත් වර්ධනය කර ගැනීමයි.

කෙසේ වුවද, දිගුකාලීන ඉලක්ක කරා යන අතර ඕනෑම රටකට වරින් වර යම් අභියෝග වලට මුහුණ දෙන්නට සිදුවීම සාමාන්‍ය තත්ත්වයකි. එම කෙටිකාලීන තත්ත්වයන් සාර්ථක ලෙස කළමනාකරණය කර ගනිමින් සාර්ව ආර්ථික තුලනය පවත්වා ගත හැකි මුදල් ප්‍රතිපත්තියක් හා රාජ්‍යමූල්‍ය ප්‍රතිපත්තියක් රටකට අවශ්‍ය වේ. අප පෙනී සිටින මුදල් ප්‍රතිපත්තිය හා රාජ්‍යමූල්‍ය ප්‍රතිපත්තිය පහත විස්තර කෙරේ.

මුදල් ප්‍රතිපත්තිය

ස්ථාවර හා ශක්තිමත් ජාතික මුදල් ඒකකයක් තිබීම සෑම දියුණු රාජ්‍යයකම පොදු ලක්ෂණයකි. එහෙත් අපේ ජාතික මුදල් ඒකකය එවැන්නක් නොවේ. එයට ශ්‍රී ලංකාවෙන් පිටතදී කිසිදු පිළිගැනීමක් නොමැත. එසේ වුවද, ශ්‍රී ලංකාවටත් වඩා කුඩා ඇතැම් රාජ්‍යයන් විසින් පෙන්වා දී තිබෙන්නේ නිවැරදි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මගින් දශක කිහිපයක් ඇතුළත මුදල් ඒකකයකට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගත හැකි බවයි.

වත්මන් ලෝකයේ සෑම දියුණු රාජ්‍යයක් මෙන්ම උද්ධමනය 2% කට ආසන්න මට්ටමක පවත්වා ගනී. ඒ නිසා, අපේ විණිමය අනුපාතය දිගින් දිගටම අවප්‍රමාණය නොවී ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමටනම් ශ්‍රී ලංකාවේ උද්ධමනයද 2% මට්ටමේ පවත්වා ගැනීමට සිදු වේ. කෙටිකාලීනව අසීරු ඉලක්කයක් වුවත්, අපගේ දිගුකාලීන ඉලක්කය

වනුයේ මෙයයි. මේ වන විට ලංකාවේ සාර්ව ආර්ථික සැලසුම වනුයේ උද්ධමනය 5% මට්ටමේ පවත්වා ගැනීමයි. මෙම ඉලක්කය දිගුකාලීනව 2% මට්ටම දක්වා අඩු කෙරෙන පරිදි අපගේ අනෙකුත් සාර්ව ආර්ථික ඉලක්ක සකස් කෙරෙනු ඇත. ඒ අනුව, පොලී අනුපාතිකද ආයෝජන ප්‍රවර්ධනය කෙරෙන පහළ මට්ටමකට පැමිණෙනු ඇත.

ස්වාධීනව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුවට පූර්ණ නිදහස ලබා දීම අපගේ ප්‍රතිපත්තියයි. එම නිදහස සමඟම අප විසින් ලබා දෙන උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ වගකීමට ද මහ බැංකුව යටත් කෙරෙනු ඇත. මෙම කාර්යයේදී විණිමය අනුපාතය නිසි පරිදි හැසිරවීමේ ඉලක්කය හා වගකීමද මහ බැංකුව වෙත පැවරෙනු ඇත.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

ඉහත විස්තර කළ උද්ධමන ඉලක්ක වලට හා එම ඉලක්කය කරා යාම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපත්තීන්ට බාධා සිදු නොවන පරිදි අපගේ රාජ්‍යමූල්‍ය ප්‍රතිපත්තිය සකස් වනු ඇත. මෙහිදී අයවැය හිඟයක් වෙනුවට තුලිත අයවැයක් පවත්වා ගැනීම ඉතා වැදගත්ය. කෙසේ වුවද, දශක හතක කාලයක් තිස්සේ එක දිගට අයවැය හිඟයක් නඩත්තු කිරීම නිසා ගොඩ ගැසී ඇති ණය බර හමුවේ තුලිත අයවැයක් ගැන සිතීම වහාම කළ නොහැක්කකි. ඒ නිසා, අපගේ මැදිකාලීන ඉලක්කය වනුයේ ක්‍රමිකව වැඩිවන ප්‍රාථමික අතිරික්තයක් පවත්වා ගැනීම මගින් ණය බර ටිකෙන් ටික අඩු කර ගැනීමයි. මෙම ඉලක්කය පෙරදැරිව අපගේ බදු ප්‍රතිපත්තිය සකස් කෙරේ.

බදු ප්‍රතිපත්තිය

බදු ආදායම යනු ව්‍යාපාරික කටයුතු වල නොනියැලෙන නූතන රාජ්‍යයක ප්‍රධාන ආදායම් ප්‍රභවයයි. එබැවින් රජයක් විසින් කළ යුතුයැයි අප විසින් විශ්වාස කරන මූලික කාර්යයන් කිරීමේ පිරිවැය ආවරණයකර ගැනීමට ප්‍රමාණවත් බදු ආදායමක්ද එකතුකර ගැනීමට අවශ්‍ය වේ. මෙම කටයුත්ත හැකි තරම් පාරදෘශ්‍ය ලෙස හා වගවීමකින් යුතුව සිදු කෙරෙනු ඇත.

පාරදෘශ්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක කොටසක් ලෙස බදු ආදායම් වැය කෙරෙන නිශ්චිත ආකාරයන් පිළිබඳව බදු ගෙවන්නන් දැනුවත් කෙරෙනු ඇත. ඒ අනුව, බදු ආදායම් නිශ්චිත වැය ශීර්ෂ හා ගලපනු ලැබේ. උදාහරණයක් ලෙස ඉන්ධන මත අය කරන බදු වලින් කොටසක් මාර්ග සංවර්ධන අරමුදලකට බැර කර මාර්ග සංවර්ධනය හා නඩත්තුව සඳහා එම අරමුදල යොදා ගැනීමට කටයුතු කෙරෙනු ඇත. මේ ක්‍රමය තුළ

දේශපාලන අධිකාරියේ අභිරුචිය මත බදු මුදල් වියදම් කිරීමට ඉඩ නොසැලසෙනු ඇත. එමෙන්ම එක් එක් වැය ශීර්ෂ යටතේ වන වියදම් අදාළ බදු ආදායම් හා ගලපා ගැනීමටද සිදු වනු ඇත.

පොදු සෞඛ්‍ය සේවා, පාසැල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, පොදු ප්‍රවාහනය ආදී වෙනත් කටයුතු වෙනුවෙන්ද ඉහත ආකාරයේ අරමුදල් පිහිටුවනු ලබනු ඇති අතර දිගුකාලීන ඉලක්කය වනුයේ මෙම අරමුදල් සතුව ආයෝජනය කළ හැකි අතිරික්තයක් පවත්වා ගැනීමයි. අදාළ අරමුදල් මූල්‍යනය කිරීම සඳහා තෝරාගත් නිශ්චිත බදු ආදයම් වෙන් කෙරෙනු ඇත. මේ ආකාරයේ විමධ්‍යගත කිරීම් තුළින් මධ්‍යම රජයේ මූලික වියදම් කොටස ඉතා කුඩාවනු ඇති අතර යම් තාවකාලික අරමුදල් හිඟයක් ඇති අවස්ථාවක වෙළඳපොලෙන් ණය ගනු වෙනුවට රාජ්‍ය අංශයේම අරමුදල් වලින් තාවකාලිකව ණය ගෙන හිඟය පියවා ගැනීමට ඉඩ සැලසෙනු ඇත.

ඉහත මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්හි ප්‍රතිඵලයක් ලෙස රටේ පෞද්ගලික අංශයේ ඉතිරි කිරීම් බැංකු පද්ධතිය තුළම රැඳීම නිසා පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම පහසුවෙන් සපුරමින් පොලී අනුපාතිකද පහත මට්ටමක පවත්වා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික ව්‍යවසායකත්වය වර්ධනය වී රජයේ බදු ආදායම් වසරින් වසර ක්‍රමයෙන් ඉහළ යනු ඇත. එමෙන්ම සාමාන්‍ය පොලී අනුපාතික පහළ යද්දී වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි සහ රටේ ආර්ථික වර්ධනයට වඩා හිතකර කොටස් ආයෝජන ආදිය සඳහා මහජනතාව වැඩිවැඩියෙන් පෙළඹෙනු ඇත.

නූතන අර්බුදය සහ එතෙර වීම

IMF වැඩසටහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම

ජාතික හරිත පෙරමුණ ලෙස අප ශ්‍රී ලංකාවේ වත්මන් අර්බුදය පිළිබඳව දිගින් දිගටම විසඳුම් ඉදිරිපත් කර ඇත්තෙමු. ගෙවුම් ශේෂ අර්බුදයකින් මතුව රටේ ආර්ථිකය දැවැන්ත කඩා වැටීමකට යොමු කළ පාලනයට එරෙහිව අරගලය තුළ අප සුවිශේෂී කාර්යයභාරයක් ඉටු කළෙමු. එහි දී අප විසින් යෝජනා කළ විසඳුම් තුළ අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ වැඩසටහනකට පිවිසිය යුතු බව අප පැහැදිළිව කියා සිටියෙමු.

එනයින් වත්මන් රජය විසින් එකඟ වී ඇති ආර්ථික ස්ථායීකරණ වැඩසටහනට අපද එකඟ වන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගයෙන් අදාළ වැඩසටහන ඉදිරියට ගෙන යෑමට කටයුතු කරන්නෙමු. ඒත් සමගම මීළඟට පැවරෙන වගකීම නම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමයි. විදේශීය ණය පමණක් නොව දේශීය ණය පවා ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවයක් මතුවන බව ද අප නිරන්තරයෙන් ප්‍රකාශ කළෙමු. එම නිසා නුදුරේ ම දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදුවිය හැක.

එසේම, IMF වැඩසටහනෙන් පසු ඇති කරගත් එකඟතා මත, බලශක්තිය වෙනුවෙන් වියදම ආවරණය වන මිල ක්‍රමයකට යෑම අත්‍යාවශ්‍ය වේ.

වත්මන් බදු ප්‍රතිපත්තිය සහ අනාගත ජාතික බදු ප්‍රතිපත්තිය

වත්මන් බදු ප්‍රතිපත්තිය හුදෙක් අර්බුදයෙන් එතෙර වීම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති තාවකාලිකව ප්‍රතිපත්තියක් පමණක්ය යන්න අපගේ කියැවීමයි. එම බදු ප්‍රතිපත්තිය රටේ දිගුකාලීන ජාතික බදු ප්‍රතිපත්තිය ලෙස සැලකිය නොහැකි ය. එහෙත් අර්බුදයෙන් එතෙර වන තුරු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් එකඟතාවය මත මෙම බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතු බව අප විශ්වාස කරන්නෙමු.

අර්බුදයෙන් එතෙර වීම පිණිස අප සැමවිසින් තනි තනිව හා රටක් ලෙස සාමූහිකව කළ යුතු කැපකිරීම් රාශියක් තිබේ. එනයින්, අධික බදු බර ඉවසා සිටීමට සිදුවීම මෙවන් අර්බුදයක් හමුවේ පුරවැසියන් ලෙස අපට මුහුණ දෙන්නට සිදු වන අනිවාර්යය අභියෝගයකි. ලෝකයේ මෙවන් අර්බුදවලින් එතෙර වූ අනෙක් රටවල පුරවැසියන් විසින් ද එසේ කර තිබේ.
එහෙත් පසු කාලීනව ජාතික බදු ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට අප කටයුතු කරන්නෙමු. එහෙත්, එම බදු ප්‍රතිපත්තිය හා එහි ප්‍රමිතීන් මේ

අවස්ථාවේ නිර්ණය කිරීම විද්‍යාත්මක නොවේ. එයට හේතුව රටේ ආර්ථිකයේ මේ මොහොතේ පවතින අවිනිශ්චිත හා අස්ථාවර ස්වභාවයයි.

අප තේරුම් ගත යුතු සත්‍යය නම් බදු යනු රජයේ ආදායමෙන් 90% කට එහා ගොඩ නගන ප්‍රධාන අදායමයි. රටක රජයක් පවත්වා ගැනීමට එම රටේ දළ දේශීය නිශ්පාදනයෙන් 15% ක් පමණවත් බදු ලෙස එකතු විය යුතු බව පිළිගැනේ. එහෙත් එම අගය අර්බුදය තුළ දී 8% කට ආසන්න වී තිබූ බව අප දනී. වත්මන් බදු ප්‍රතිපත්තිය මගින් එම අගය 12% දක්වා වැඩි කර ගැනීමට කටයුතු කළ ද නුදුරු අනාගතයේදී ම අපට බදු ප්‍රතිපත්තිය ප්‍රතිසංස්කරණ තුළින් දළ දේශීය නිෂ්පාදනයෙන් 15% ක් බදු ලෙස එකතු වන ක්‍රමයකට යා යුතු වෙයි. එම නව ප්‍රතිපත්ති තුළ බදු එකතු කරන පරාසය පුළුල් කිරීම අනිවාර්යය වෙයි. ඒ සඳහා අප පහත විසඳුම් යෝජනා කරන්නෙමු.

- e Governance ක්‍රමවේදය හැකි පමණ ඉක්මනින් රාජ්‍ය පරිපාලනය තුළට එක් කොට, රාජ්‍ය සේවා ඩිජිටල්කරණය කරවීම.

- පුද්ගල සහ සමාගම් එම ඩිජිටල් ක්‍රමවේදයන් තුළ පහසුවෙන් හඳුනාගත හැකි ක්‍රමයකට ගෙන ඒම.

- ආදායම් බදු දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කිරීම සහ වත්මන් අක්‍රමිකතා ඉවත් කොට එහි විනිවිදභාවය හා වගවීම සනාථ කිරීම.

- එමගින් බදු වංචා සහ අතපසු වීම් අවමකොට බදු ගෙවීම් පැහැර හැරීමට ඇති අවස්ථා අවම කිරීම.

- බදු ගෙවීම් පැහැර හැරීම් සඳහා වෙන ම විමර්ශන ඒකකයක් පිහිටුවීම සහ ඒ වෙනුවෙන් දඩ ක්‍රමයක් ඇති කිරීම.

- දේශීය වාණිජ බැංකු ජාල ගතකොට පුරවැසියන්ගේ සහ ආයතනවල ආදායම් හා මූල්‍ය ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කළහැකි ජාලගත ක්‍රමවේදයක් සකස් කිරීම. එමගින් මූල්‍ය කටයුතු පිළිබඳව, ආදායම් ඉපැයීම් පිළිබඳව විශ්ලේෂණය කිරීම.

- පරිභෝජනය මත පදනම් වූ බදු ක්‍රමයක් වෙනුවට ආදායම් මත පදනම් වූ නව බදු ප්‍රතිපත්තියකට පිවිසීම හා ක්‍රමිකව වක්‍ර බදු අඩු කොට සෘජු බදු ක්‍රමයකට මාරු වීම.

- රට තුළ ව්‍යාපාර හා කර්මාන්ත ඇති කිරීම, හා ක්‍රමිකව ආර්ථික සංවර්ධනයට යොමුකිරීම මගින් බදු එකතු කරන පාදම ඉහළ නංවා ගැනීම.

- අන්තර්ජාතිකව තරඟකාරී බදු ප්‍රතිපත්තියක්, නිදහස් වෙළඳ කළාප සඳහා මෙන්ම නව ආයෝජන සඳහා ක්‍රියාත්මක කිරීම.

- අනවශ්‍ය බදු සහන නොදී සිටීම සහ බදු ප්‍රතිපත්තිය මත සෘජු නියාමනයක් සිදු කිරීම.

මෙම ක්‍රමවේදයන් මගින් බදු එකතු කිරීම, බදු ආදායම ඉහළ නංවා ගැනීම හා එහි කාර්යක්ෂමතාවය ඉහළ නංවාගැනීමට කටයුතු කෙරේ. එම ජාතික ප්‍රතිපත්තිය නම්‍යශීලී ප්‍රතිපත්තියක් වන අතර රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය මත කරගෙන යන්නක් බැවින් ද, මහ බැංකුව ස්වාධීන කිරීමෙන් අනතුරුව මුදල් අච්චු ගසමින් අය වැය පරතරයන් පියවා ගැනීමට සීමා පැනවෙන බැවින් ද, අනාගත රජයකට ණය ලබා ගැනීමේ සීමා පැනවෙන බැවින්ද බදු යනු රජය සම්පූර්ණයෙන් රැඳී සිටින ආදායම වනු ඇත. අර්බුදයෙන් එතෙර වන තුරු එම බදු ප්‍රතිපත්තිය දීර්ඝකාලීන සහ ස්ථාවර බවට පත්කිරීම අපහසු වන අතර, අර්බුදයෙන් මිදුණු වහා ම, ස්ථාවර සහ දීර්ඝකාලීන ජාතික බදු ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු. එය අප ගොඩනගන දේශයේ දළ දේශීය නිශ්පාදනයෙන් 15% ක අගයකට ගෙනයාම අපගේ ඉලක්කයයි.

අපගේ ඉලක්කය

අපගේ ඉලක්කය ශ්‍රී ලංකාව අර්බුදයෙන් එතෙර කොට වසර 30 කින් සංවර්ධිත රාජ්‍යයක් කරා ගෙන යෑමයි. එය ඉටුකර ගැනීම අපහසු කටයුත්තක් නොවන බව අපි දනිමු. එහෙත්, එය ළඟා කරගත හැක්කේ දේශපාලන ස්ථාවරත්වය මෙන්ම ජාතික සමගිය පවත්වාගෙන යෑමෙන් පමණය.

ශ්‍රී ලංකාව බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රාජ්‍යයක් ලෙස, දේශපාලන බලහුවමාරුවකට පසු රටේ රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වී යෑමේ යම් සම්භාවිතාවයක් පවතියි. එය මෙතෙක් අතීතය දෙස බැලීමේදී සනාථ වන සත්‍යයකි. එසේම, කාලයෙන් කාලයට විවිධ ස්වරූපවලින් ජනවාර්ගික අර්බුද මතු වී රටේ ජනසමාජය අනාරක්ෂිත වීමේ අවධානමක් පවතී. මේ අස්ථාවරත්වයන් දෙකම, ආර්ථිකයක් ශක්තිමත් ලෙස ගොඩනැගීමට අවස්ථාව ලබා නොදේ. එබැවින් අප රටක් විදියට එය විසඳා ගත යුතුව තිබේ.

දීර්ඝකාලීන දේශපාලන ස්ථාවරත්වය මෙන් ම ආණ්ඩුවෙන් ආණ්ඩුවට ආර්ථික ප්‍රතිපත්ති නොවෙනස්ව පවත්වා ගැනීමට ජාතික වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. ඒ සඳහා රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ අත්‍යාවශ්‍ය වන අතර ඒවා වෙනම සාකච්ඡා කෙරේ. එසේ ම ජාතික සමගිය පවත්වා ගෙන යෑමටත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරයන් වන නිදහස, සමානාත්මතාවය, මානව හිමිකම් ආරක්ෂා කර ගැනීමත් දේශපාලනිකව ඉටු කරගත යුතු වෙයි.

එවිට, ආර්ථිකය සාර්ථකව වේගයෙන් වර්ධනය කොට ඉලක්ක කරා රැගෙන යාමට රටට හැකි වන අතර, අප සංවර්ධිත රාජ්‍යයක් බවට පත් වීම කිසිවෙකුට වළක්වාලිය නොහැකි ය.

අප රට සංවර්ධනය කිරීමේ අභියෝගය තවත් පරම්පරාවකට ඉතිරි නොකරන්නෙමු.

ජාතික හරිත පෙරමුණ

Membership
Registration Portal - register.ngf.lk
NGF Website - ngf.lk
NGF Email - hello@ngf.lk

ප්‍රධාන කාර්යාලය
312/B/3, නුවර පාර,
කඩවත.
ජාතික හරිත පෙරමුණේ ප්‍රකාශනයකි.